# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2016 මැයි 03** වන අඟහරුවාදා
2016 வைகாசி 03 செவ்வாய்க் கிழமை
Tuesday 03rd May 2016

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.36 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.36 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.36 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදනය
## ANNOUNCEMENT OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කාර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරමින් සිටින සෙනල් වෙල්ගම ගරු මන්ත්‍රීතුමාව එම සාමාජිකත්වයෙන් ඉවත් කොට කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව සඳහාත්,*

*කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරමින් සිටින ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාව එම සාමාජිකත්වයෙන් ඉවත් කොට ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කාර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව සඳහාත් 2016.05.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි මවිසින් නම් කරන ලද බව දැනුම් දෙනවා."*

# ලිපි ලේඛන පිළිගැන්වීම
## PAPERS PRESENTED

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩුකාර ලේකම්ගේ අංක 2/1/2/9 හා 2015.10.10 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි විගණකාධිපති විසින් 2015.09.18 දිනැතිව ඉදිරිපත් කරනු ලැබූ අංක W P 1/CB/B/WPC/3/14/20 දරන බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23/2 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව මෙම පළාත් සභාවට ඉදිරිපත් කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති බව දන්වා තිබෙනවා.

ඒ අනුව ඉහත කී අංක W P 1/CB/B/WPC/3/14/20 දරන හා 2015.09.18 දිනැති, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව මම මෙම සභාවට ඉදිරිපත් කරනවා.

එම විගණකාධිපති වාර්තාවන් කාර්ය පටිපාටි රීති අංක 96 (1) හි විධිවිධානවලට අනුව පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට ඉදිරිපත් කරනවා.

***එකී විගණකාධිපති වාර්තාව පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරන ලදී.***
*Relevant Auditor General's Report was referred to Provincial Public Accounts Committee.*

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Governmentand Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, පළාත් සභා අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම - 2015 වර්ෂය නැමැති ලේඛනය මම මෙම සභාවට පිළිගන්වනවා.

එහි පිටපත් සියලුම ගරු මන්ත්‍රීවරුන්ට අද දින න්‍යාය පත්‍රය සමගම ලැබෙන්නට සලස්වා තිබෙනවා. ඒ පිළිබඳ වැඩිදුර සාකච්ඡාව අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ සාකච්ඡා කළ හැකිව තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොදු කටයුතු විෂයයට එළැඹුණු විටදී ඒ පිළිබඳව අපි සාකච්ඡා කරනවා.

## කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා වාර්තා මම මෙම සභාවට පිළිගන්වනවා

i. 2016.03.30 වන දින හා 2016.04.06 වන දින පැවැති ගෘහ කාරක සභා රැස්වීම් වාර්තාව.

ii. 2016.04.20 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

## පෙත්සම්
PETITIONS

**ගරු නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගරු සභාපතිතුමනි, පානදුර, ගල්තුඩේ, දූවහන්දිය, අංක 175 හි පදිංචි පී. සුගතපාල පීරිස් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon.Gunasiri Jayanath - Chief Government Whip

ගරු සභාපතිතුමනි, පැපිලිවල, පල්ලේගම, අංක 37/C හි පදිංචි ඒ. හොලිපිටිය යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

ගරු සභාපතිතුමනි, පන්නිපිටිය, හිරිපිටිය, අංක 130/4 හි පදිංචි තිලක් ජයසුන්දර යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි**
Hon. Rev. Thebuwana Piyananda Thero

ගරු සභාපතිතුමනි, නැබඩ, තුඩුගල කන්ද, "සඳසිරි"හි පදිංචි ඒ.එස්. වන්නිආරච්චි යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera- Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, වත්තල, හැඳල, කෙරවල පිටිය, අංක 312/2 හි පදිංචි ආර්.ඒ.ඩබ්. යසිරස් අල්විස් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, කිරිවන්දල, ජාතික නිවාස යෝජනා ක්‍රමය, අංක B 04 හි පදිංචි කේ.ඒ. සෝමසිරි යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

ගරු සභාපතිතුමනි, පෙත්සම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය පෙත්සම සභාගත කිරීමෙන් අනතුරුව දැමීමට අවසර පතනවා.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Animal Production and Health and Agrarian Development.)

ගරු සභාපතිතුමනි, මහරගම, නල්ලවත්ත, අංක 82 හි පදිංචි ඩබ්. හෙලනි පෙරේරා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**01.**

**පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතුයටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/16/28)**

අ. හොරණ දික්හේනපුර මාර්ගය, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් කාපට් අතුරා තිබේද?

ආ. ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද?

ඇ. නිමකර ඇති ප්‍රමාණයේ දිග සහ පළල කොපමණද?

ඈ. එම පාරේ ගල් ඇතිරීමට වැය කළ මුදල කොපමණද?

ඉ. මෙම ව්‍යාපෘතිය ඉටු කරන ලද කොන්ත්‍රාත්කරු හෝ කොන්ත්‍රාත් සමාගම කුමක්ද?

ඊ. අදාළ මුදලට කර ඇති ඉදිකිරීම් ගැන ඔබතුමා සෑහීමට පත්වේද?

උ. සෑහීමට පත් නොවන්නේ නම්, ඒ සම්බන්ධව ගන්නා පියවර කුමක්ද?

**ගරු ලලිත් වනිගරත්න** (ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Fisheries, Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

අ. ඔව්.

ආ. මිලියන 79.51

ඇ. දිග 3.435 km
පළල 7.5 m

ඈ. මිලියන 11.2

ඉ. අකිල ඉංජිනියර්ස් / සෙලීනා කන්ස්ට්‍රක්ෂන් / ස්ටාර් කන්ස්ට්‍රක්ෂන්

ඊ. සොයා බලා දැනුම් දෙනවා.

උ. ඉදිරියේදී සොයා බලා කටයුතු කරනවා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, ඒ අතුරලා තිබෙන ගල් නිසියාකාරව අතුරා නැති නිසා දැනට ගැලවෙමින් යන තත්ත්වයක් මතු වෙලා තිබෙනවා.

**ගරු ලලිත් වනිගරත්න-අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

මගේ කාලයේ වුණු දෙයක් නොවෙයි. මේ ඔක්කෝම මම සොයා බලන්නම්.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ ගැන සොයා බලන්න කියලා.

**ගරු ලලිත් වනිගරත්න-අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

හොඳයි.

***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**02.**

**පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතුයටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/16/29)**

අ. 2012 වර්ෂයේදී රු. 164,232,954 ක් වැය කරමින් බස්නාහිර පළාතේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පෞද්ගලික ආයතනයක් හරහා කොන්ක්‍රීට් ඇතුරුම් යන්ත්‍ර 02 ක් හා කර්බර් ඇතුරුම් යන්ත්‍රයක් මිලට ගෙන තිබේද?

ආ. මිලදී ගෙන තිබේ නම් එම මුදල් වැය කළේ කිනම් ආකාරයටද?

ඇ. 2012 නොවැම්බර් මස 23 වන දින අදාළ යන්ත්‍ර අධිකාරිය වෙත භාර ගෙන ඇත්ද?

ඈ. එම යන්ත්‍ර මේ දක්වා ප්‍රයෝජනයට නොගෙන තිබේද?

ඉ. මෙම යන්ත්‍ර දෙක සඳහා වාර්ෂික රක්ෂණ වාරික මුදල කොපමණද?

ඊ. ප්‍රයෝජනයට නොගන්නා යන්ත්‍ර රක්ෂණය කිරීමෙන් අධිකාරිය පාඩු ලබන බව පිළිගන්නේද?

උ. මෙතෙක් කල් මෙම යන්ත්‍ර රක්ෂණය කිරීමෙන් අධිකාරිය ලැබූ පාඩුව කොපමණද?

ඌ. ඉහත සඳහන් විනාශකාරී මුදල් ආයෝජනය සම්බන්ධව ඔබතුමා ගන්නා පියවර කුමක්ද?

**ගරු ලලිත් වනිගරත්න**-අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

අ. ඔව්.

ආ. බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මුදල්.

ඇ. ඔව්.

ඈ. එම යන්ත්‍රය ප්‍රයෝජනයට ගෙන ඇත.

ඉ. රු. 1,064,000/- (රුපියල් දස ලක්ෂ හැට හතර දහසකි)

ඊ. නැත. යන්ත්‍ර ප්‍රයෝජනයට ගන්නා අතර, එම යන්ත්‍රවලට හානිවීමේ අවදානම වළක්වා ගැනීම සඳහා රක්ෂණය කරන ලදී.

උ. පාඩුවක් ලබා නොමැත. යන්ත්‍ර හා වාහන රක්ෂණය කිරීම රජයේ සාමාන්‍ය ප්‍රතිපත්තියයි.

ඌ. පැන නොනඟී.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු ඇමැතිතුමා දැනට සියලුම වාහන පාවිච්චි කෙරෙනවාද?

**ගරු ලලිත් වනිගරත්න**-අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

දැනට පාවිච්චි කරනවා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

පාවිච්චි කරන්නේ නැහැයි කියලයි දැනගන්න තියෙන්නේ. නිකම් රක්ෂණය කරලා තියෙනවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 03 යටතේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ගරු සෞඛ්‍ය ඇමැතිතුමාට ඉදිරිපත් කිරීමේ අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා සභාවේ නැහැ. ඔබතුමාට පිළිතුර සභාගත කරන්න පුළුවන්.

**ගරු සුමිත් ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumith Lal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, ලබන වාරයට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. තව තොරතුරු ටිකක් සොයා ගන්න තිබෙන නිසා.

***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**04.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/16/31)**

අ. බස්නාහිර පළාත් සභාව යටතේ පළාතේ ඇති ඉඩම් දීර්ඝ කාලීන හෝ කෙටි කාලීන බදු ක්‍රමය යටතේ බදු දී තිබේද?

ආ. i. ඉඩමේ නම හා ප්‍රමාණය,
ii. ඉඩම පිහිටි ස්ථානය,
iii. බදු කුලී පදනම,
iv. බදු ගැණුම්කරුගේ නම,
v. ආයතනයක් පවත්වාගෙන යන්නේ නම් ආයතනයේ නම,
vi. බදු දුන් දිනය,
vii. බදු කාලය අවසන් දිනය,
viii. 2016.03.15 දිනට හිඟ බදු කුලී ප්‍රමාණය,
වාර්තාවක් ලෙස ලබා දෙන්නේද?

ඇ. ඉහත "ආ" හි තොරතුරුවලට අනුව බදු දීමෙන් පසු නියමිත පරිදි බදු කුලී නොගෙවීම නිසා ගැටලු ඇති වී තිබෙන බදුකරුවන් හා එකී ආයතන නම් කරන්නේද?

ඈ. පළාත් සභාවට අයවිය යුතු හිඟ බදු ප්‍රමාණයේ මුළු එකතුව කීයද?

ඉ. බදු නොගෙවීම හේතුවෙන් පැන නැඟී ඇති එකී ගැටළු පිළිබඳව මෙතෙක් ගෙන ඇති පියවර කවරේද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

අ. ඔව්.

ආ. අමුණා ඇත.

ඇ. ඔව්.

ඈ. රු. 1,514,429,114.29

ඉ. මේ සම්බන්ධව පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මෙතුමා කාලයක් තිස්සේ බලාගෙන හිටපු දෙයක්. ගරු සභාපතිතුමනි, මට කාලය දෙන්න. පොඩි සටහනක් ඉදිරිපත් කරනවා.

1. හිඟ බදුකරුවන් පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත කැඳවීම.

I. කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දීර්ඝ කාලීන බදුකරුවන් පහත සඳහන් දිනයන්හි පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත කැඳවන ලදී.

2014.04.28
2014.04.29
2014.05.02
2014.05.05
2014.05.06
2014.05.08
2014.05.12
2014.05.19
2014.05.21
2014.05.22

} මෙම දිනවල කොළඹ දේශීය ලේකම් කොට්ඨාශයේ බදුකරුවන් 66 දෙනෙකු කැඳවා දැනුවත් කරන ලදී.

II. තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දීර්ඝ කාලීන බදුකරුවන් පහත සඳහන් දිනයන්හි දී පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත කැඳවා බදු මුදල් / හිඟ බදු මුදල් ගෙවන ලෙස දැනුවත් කරන ලදී.

2014.06.18
2014.06.20
2014.06.23
2014.06.25

} මෙම දිනවල තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බදුකරුවන් 81 දෙනෙකු කාර්යාලය වෙත කැඳවා දැනුවත් කරන ලදී.

2. පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ බදු කමිටුව රැස් වී හිඟ බදු අය කර ගැනීම / බදු ලේඛන යථාවත් කිරීම සම්බන්ධව තීරණ ගැනීම

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ බදු කමිටුව පහත දිනයන් හිදී රැස් වී ඉහත කරුණට අදාළව තීරණ ගෙන ඇත.

2013.12.05 - මහරගම, මහර සහ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අදාළව

2015.02.20 - හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අදාළව

2014.06.26 - මහරගම, පාදුක්ක සහ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අදාළව

2015.04.28 - කළුතර, කොලොන්නාව සහ සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අදාළව

| | | |
|---|---|---|
| 2015.09.09 | - | මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අදාළව |

3. හිඟ බදුකරුවන් වෙත බදු මුදල් / හිඟ බදු මුදල් ගෙවන ලෙසට ලිඛිතව දැනුම් දී ඇත.

4. පළාත් ඉඩම් කොමසාරිස් (බ.ප) සහ දිස්ත්‍රික් ඉඩම් නිලධාරී (කොළඹ) විසින් බදු මුදල් / හිඟ බදු මුදල් අය කිරීමට අදාළව ජංගම සේවා සහ වෙනත් වැඩ සටහන් සඳහා සහභාගී වූ අතර එම දිනයන් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 2014.07.01 | - | මොරටුව ලක්සිරිපුර / සමගිපුර |
| 2014.11.01 | - | මොරටුව දන්දෙණියවත්ත |
| 2015.03.23 | - | මොරටුව දන්දෙණියවත්ත |
| 2015.06.09 | - | මොරටුව ලක්සිරිපුර / සමගිපුර |
| 2015.10.13 | - | මොරටුව අධිමන්වත්ත |
| 2015.12.23 | - | මොරටුව අධිමන්වත්ත |
| 2015.12.30 | - | කොලොන්නාව |
| 2016.01.06 | - | මොරටුව ලක්සිරිපුර / සමගිපුර |
| 2016.02.29 | - | මොරටුව ලක්සිරිපුර / සමගිපුර |
| 2016.03.29 | - | කොලොන්නාව |

මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නේවාසික පදනම මත බදු දුන් ඉඩම් විශාල ප්‍රමාණයක් පවතින නිසා බදු අයකර ගැනීමට ජංගම සේවා වැඩ සටහන් වැඩි ප්‍රමාණයක් පවත්වා ඇත.

5. දිස්ත්‍රික් කාර්යාල මට්ටමින් පවත්වන ලද මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී ක්ෂේත්‍ර නිලධාරීන් හිඟ බදු මුදල් අයකර ගැනීම පිළිබඳ නිරන්තරවම උපදෙස් ලබා දී ඇත.

6. බස්නාහිර පළාත් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය වෙත බදුකරුවන් 2016.02.26 දින කැඳවීමට ක්‍රියා කරන ලද අතර එහිදී තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හිඟ බදු මුදල් ගෙවන ලෙස බදුකරුවන් දැනුවත් කරන ලද අතර, 2016.03.23 දින ද ගරු බස්නාහිර පළාත් ඉඩම් අමාත්‍යතුමන් සහ ලේකම් සමග ද තිඹිරිගස්යාය හිඟ බදු විශාල වශයෙන් පවතින ආයතන කිහිපයක් කැඳවා, බදු මුදල් අයකර ගැනීම පිළිබඳව සාකච්ඡා කරන ලදී. 2016.03.02 දින පළාත් ඉඩම් ලේකම් සහ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඉඩම් කොමසාරිස් (ඉඩම්), බස්නාහිර පළාත් කර්මාන්ත අධ්‍යක්ෂ සහ පළාත් ඉඩම් කොමසාරිස් සහභාගීත්වයෙන් රැස්වීමක් පවත්වා හිඟ බදු මුදල් ගෙවන ලෙස බදුකරුවන් දැනුවත් කරන ලදී.

මේ තියෙන්නේ මම ගත්තු පියවරවල්. මම මෙතැනදී පොඩි සඳහන් කිරීමක් කළ යුතුයි. මෙතැනදී මිලියන 1514 ක්, ගරු සභාපතිතුමනි, ගුවන් විදුලි සංස්ථාවේ තමයි 1019 ක් තියෙන්නේ. සභාව දැනුවත් කළ යුතුයි. මම දන්න ඉතිහාසයේවත් ඉඩම් අමාත්‍යාංශයක් තිබුණාට මෙහෙම ප්‍රශ්නයක් අහලා තිබුණෙත් නැහැ. මන්ත්‍රීවරු දැනුවත් වෙලා තිබුණෙත් නැහැ. ඒක නිසයි මම මේ කාලය ගත්තේ. දැන් විශාල මුදල් ප්‍රමාණයක් තිබෙනවා. ගුවන් විදුලි සංස්ථාවෙන් පමණක් 1019 ක්. ගණන ලොකු වෙන්න හේතුව - රාජ්‍ය ආයතනයක්. මම දන්නේ නැහැ ජීවිතයටවත් අය කර ගන්න පුළුවන් වෙයි කියලා. රාජ්‍ය ආයතනයකට කොහොමද නඩු දාන්නේ.

7. කළුතර දිස්ත්‍රික්කයේ හිඟ බදු අයකර ගැනීමට අදාළව ජංගම සේවා සහ වෙනත් වැඩ සටහන් රාශියක් පවත්වා ඇත.

ඊ. අදාළ නොවේ. මම මේ සියලුම විස්තර සභාගත කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ස්තූතිවන්ත වෙනවා මේ කරුණු ටික ඉදිරිපත් කිරීම ගැන. ජනතාවට අයිති සල්ලි විශාල ප්‍රමාණයක්. ඔබතුමන්ලා කරපු සාකච්ඡාවේදී ඇත්තටම පැහැදිලි වෙලා තිබෙන්නේ මොන වාගේ තත්ත්වයක්ද? පසුගිය කාලයේ මේ තරම් මුදලක් එකතු වෙන්න හේතු වෙලා තිබෙන්නේ. මොකද, දේශපාලඥයෝ හිටියා නේ?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඔව්. පසුගිය කාලයේ විශේෂයෙන්ම ආයතන දෙකක් තමයි ඔටර්ස් ක්ලබ් එකේ මිලියන 55 ක් තිබෙනවා. මේකේ වරින් වර එක එක නිලධාරීන් පත් වෙනවා. සමහර අය ඒ පිළිබඳව අවධානය යොමු කිරීමක් කරලාම නැහැ. සමහර අය ඒවා ගණන් නොගෙන හිටියා. දැන් ඒ අය ටික ටික ගෙවනවා කියලා ඊයේ පෙරෙයිදාත් ඇවිල්ලා යම්කිසි මුදල් ප්‍රමාණයක් ගෙවලා ගියා. දැන් එයිටි ක්ලබ් එක. මිලියන 34 යි. ඒක තමයි තිබෙන සාමාන්‍ය දෙක. එයිටි ක්ලබ් එකේත් පසුගිය දවස්වල ගරු ප්‍රධාන ඇමැතිතුමාත් එක්කත් සාකච්ඡා කරලා, ඒ අය යම්කිසි මුදල් ප්‍රමාණයක් බැන්දා. ඒකෙත් ඉදිරි කාලයේදී දෙනවා කියන පදනමේ ඉන්නේ. අනෙක් ඒවා සුළු සුළු - මේ සාමාන්‍ය ජනතාවටත් ගෙවල් දීපුවා, ඉඩම් දීපුවා විශාල ප්‍රමාණයක් ඉන්නවා. ගරු සභාපතිතුමනි, මට ඉඩම් අමාත්‍යාංශය ලැබිලා මාස 05 ක් ඇති. මේ මාස 05 ඇතුළත මම විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා, මේ මුදල් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හැබැයි ඊට කලිනුත් අමාත්‍යාංශයක ඇමැති වෙලා හිටියා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

එතකොට ක්‍රීඩා ඇමැති.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ අවසරය මත දෙවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. ඔබතුමා සභාගත කරපු ලේඛනයේ "ඉ" ප්‍රශ්නයට පිළිතුර දුන්නේ අදාළ නොවේ කියලා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මේ ප්‍රශ්නයට අදාළ නොවේ. නමුත් ඒ විස්තර ටික තමයි මම දුන්නේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

එතකොට ගරු සභාපතිතුමනි, දිගින් දිගටම මේ බදු නොගෙවීමට අදාළ කාරණාව ඔබතුමා දැනුවත් කළා කියලා කිව්වේ. නමුත් මේ ක්‍රියාවලියට අවනත වෙන්නේ නැත්නම් ඊට එහා ක්‍රියා මාර්ගයක් තිබෙනවාද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය ලේකම්තුමාත් එක්ක කථා කරලා ඔහුට විරුද්ධව අපි උසාවියේ නඩු පැවරීමක් කරන්න ඕනෑ. සමහර වෙලාවට ඒ පුද්ගලයෝ ඇවිල්ලා කියනවා අපි අරයාත් එක්ක කථා කර ගත්තා. මෙයාත් එක්ක කථා කර ගත්තා. මම නම් කියන්න යන්නේ නැහැ. අපට තව මාස කිහිපයක් දෙන්න. අපට මේවා සකස් කර ගන්න. මේවාට නිදහස් ඔප්පුවක් දීලා දැම්මා නම් අවසානයි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒකට නිශ්චිත කාල සීමාවක් අරගෙන ගොඩ දැම්මා නම් හරි.

**05.**

**රජිත රංගන හපුආරච්චිගේ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/16/32)**

අ. i. කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පවතින කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද?

ii. එයින් කොපමණ ප්‍රමාණයක් දැනට වගා කරන්නේද?

ආ. i. පසුගිය වර්ෂ 5 ඇතුළත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් කොපමණ මුදල් ප්‍රමාණයක් කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට වෙන් කර තිබේද?

ii. එලෙස මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබේ නම් එම ව්‍යාපෘති මොනවාද?

ඇ. i. ආඩිඅම්බලම, වල්පොල වෙල්යාය සංවර්ධනය කිරීම සඳහා එම ගොවි සංවිධාන මගින් ඔබතුමා වෙත ඉල්ලීම් කර තිබේද?

ii. ඒ සම්බන්ධයෙන් ඔබතුමා ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාද?

iii. එම ඉල්ලීම ඉටුකර ආඩිඅම්බලම, වල්පොල වෙල්යාය සංවර්ධනය කිරීම සඳහා ඔබතුමා ප්‍රතිපාදන වෙන් කරන්නේද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

අ. i. 745 HA

ii. යල කන්නයේ වගා කළ කුඹුරු ප්‍රමාණය - 71H
මහ කන්නයේ වගා කළ කුඹුරු ප්‍රමාණය - 147 H

ආ. i. අමාත්‍යාංශයේ විෂයය පථය යටතේ විෂයයන් රාශියක් පවතින නිසා කුමන විෂයයක් සම්බන්ධව උක්ත ප්‍රශ්නය යොමු කර ඇතිද යන්න පැහැදිලි නැත.

*ඒ පිළිබඳව අපේ අමාත්‍යාංශයෙන් කරපු දේවල් තිබෙනවා.* මම සභගාත කරනවා.

ii. සියලුම ව්‍යාපෘති ලේඛන සභාගත කරනවා.

ඇ. i. රුපියල් මිලියන 2.8 ක මුදලක් ඉල්ලා යෝජනාවක් ලැබී ඇත.

ii. 2016.03.03 දින ඇස්තමේන්තු සැකසීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

iii. ඇස්තමේන්තු ලැබුණු පසු සලකා බැලිය හැක.

**06.**

**රජිත රංගන හපුආරච්චිගේ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/16/33)**

අ. ඔබ අමාත්‍යාංශය යටතේ ඇති යෞවන කටයුතු යන්න ඔබ අමාත්‍යාංශය නිර්වචනය කරන්නේ කෙසේද?

ආ. තරුණයන් යනුවෙන් ඔබ අමාත්‍යාංශය හඳුන්වන්නේ කුමන වයස් සීමා තුළ සිටින අයද?

ඇ. යෞවන කටයුතු යන්න ඔබ අමාත්‍යාංශයට අදාළ කාර්ය භාරය කුමක්ද?

ඈ. ඒ එක් එක් කාර්ය භාරය සපුරාලීම සඳහා පසුගිය වසර තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති මොනවාද?

ඉ. එම ව්‍යාපෘති සඳහා වෙන්කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද?

ඊ. තරුණ කටයුතු ඉටු කිරීම සඳහා බස්නාහිර පළාත් සභාව තුළ නිලධාරීන් කොපමණ ප්‍රමාණයක් සිටීද?

උ. එවැනි නිලධාරීන් නොමැති නම් තරුණ කටයුතු ඉටු කිරීම සඳහා ඔබ අමාත්‍යාංශය ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාද?

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

අ. තරුණයා බලගැන්වීම, සහතිකකරණය හා හැකියාව ලබා දීම තුළින් තරුණයා සංවර්ධනය කිරීමට අදාළ සියලු කාර්යය යෞවන කටයුතු ලෙස අර්ථ දක්වයි.

ආ. අවුරුදු 15 – 29 ත් අතර වයස් කාණ්ඩයට ඇතුළත් අය.

ඇ. ක්‍රීඩා හා යෞවන කටයුතු යන්න එක් විෂයයක් වශයෙන් ගෙන කටයුතු කරන බැවින් පහත සඳහන් කටයුතු එම විෂයය යටතේ ඉටු කිරීමට හඳුනා ගෙන ඇත.

1. ලියාපදිංචි යෞවන සමාජ හා ක්‍රීඩා සමාජ හරහා තරුණයන් සෞඛ්‍ය සම්පන්න පිරිසක් බවට පත් කිරීමට අවශ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
2. සමාජ රෝග සම්බන්ධ දැනුවත් කිරීමට අවශ්‍ය වැඩ සටහන් පැවැත්වීම.
3. රස වින්දනය හා ආකල්ප වර්ධනය පිළිබඳ වැඩ සටහන් පැවැත්වීම.

4. නායකත්ව වර්ධන වැඩමුළු හා වැඩ සටහන් පැවැත්වීම.
5. විවේක අවස්ථාවන් යහපත් ලෙස ගත කිරීමට අවශ්‍ය පහසුකම් ග්‍රාමීය මට්ටමෙන් සලසා දීම.
6. තරුණ සේවා සභාව හා එක්ව තරුණයන් ඉලක්ක කර ගත් විවිධ තරග සංවිධානය කිරීම (නිවේදන, චිත්‍ර, ක්‍රීඩා තරග)
7. දැනුම මිනුම තරග සංවිධානය.
8. සෞඛ්‍ය හා ක්‍රීඩා වැඩ සටහන් සංවිධානය කිරීම.

ඇ. 1. යෞවන සමාජ හා ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා උපකරණ ලබා දීම.
2. පාසල් ළමුන්, පාසල් හැර ගිය ළමුන්, ක්‍රීඩා සමාජ සමාජිකයන් සඳහා සමාජ රෝග සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.
3. මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව විදහාපාන පාගමන් සංවිධානය කිරීම.
4. ක්‍රීඩා තරග පැවැත්වීම.
5. සංස්කෘතික හා කලා උළෙල සංවිධානය කිරීම.
6. ශාරීරික ව්‍යායාම මධ්‍යස්ථාන සංවර්ධනය හා ඊට සම්බන්ධ පුහුණු වැඩ සටහන් පැවැත්වීම.
7. කාය වර්ධන තරග සංවිධානය කිරීම.

ඉ. රුපියල් මිලියන 100 කට ආසන්න ප්‍රමාණයක් සෘජුව හා වක්‍රව තරුණ සංවර්ධනය සඳහා වෙන් කර ඇත.

ඊ. නැත.

උ. ප්‍රාදේශීය මට්ටමෙන් විසිරී සිටින ක්‍රීඩා නිලධාරීන්, සංස්කෘතික නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් මගින් සංවර්ධන කටයුතු ඉටු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇත. තවද ජාතික තරුණ සේවා සභාව හා ඒකාබද්ධ වී වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගරු සභාපතිතුමනි, ගරු ඇමැතිතුමා කිව්වා, යෞවන සමාජ හා ක්‍රීඩා සමාජවලට මුදල් වෙන් කරලා තිබෙනවා කියලා. නමුත් යෞවන සමාජවලට මුදල් වෙන් කිරීමේ ක්‍රමවේදයක් ක්‍රීඩා අමාත්‍යාංශය ඇතුළේ තිබෙනවාද? මා දන්නා පරිදි එහෙම ක්‍රමවේදයක් නැහැ. මුදල් වෙන් කිරීමේ හැකියාවක් නැහැ. ඔබතුමා වෙන් කළා කියලා කියනවා. එහෙම කරන්නේ කොහොමද කියලා පළමු අතුරු ප්‍රශ්නය අහනවා.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අපේ අමාත්‍යාංශය ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය. මම හිතනවා ගරු මන්ත්‍රීතුමා යෞවන සමාජවලින් බිහි වුණු කෙනෙක් කියලා. එහෙමද?

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

අනිවාර්යයෙන්ම. මම යෞවන පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරයා.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමාගේ දැනුම මම මගේ අමාත්‍යාංශයේ ඉදිරි කටයුතු සඳහා බලාපොරොත්තු වෙනවා. මම හරි කැමැතියි ඔබතුමා වාගේ මන්ත්‍රීවරුන්ට. ඔබතුමාට මගේ අමාත්‍යාංශයට ඇවිල්ලා විශේෂ සාකච්ඡාවක් පවත්වන්න අවස්ථාවක් දෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හැබැයි කථා කරන්න වෙලාවක් ගන්න බැහැ.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ඊළඟ ප්‍රශ්නය. ඔබතුමා කිව්වා නිලධාරීන් නැහැයි කියලා. එහෙම නිලධාරීන් නැතුව ඔය කටයුතු ක්‍රියාත්මක කළේ කොහොමද කියන එක සහ ක්‍රියාත්මක කළ වැඩ සටහන් කොයි කොයි ස්ථානවලද, මොන ආකාරයෙන් සිද්ධ වුණාද කියන එක අහනවා. මොකද, අපිත් මේ ක්ෂේත්‍රය තුළ ඉන්න නිසා කලින් කිව්වා වාගේ යෞවන පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරයා සහ ගම්පහ දිස්ත්‍රික්කයේ යෞවන සමාජ ක්ෂේත්‍රයේ හිටපු තරුණ නායකයෙක් මම. ඒ නිසා එහෙම දෙයක් අපි කවදාවත් දැකලා නැහැ. කොහේද තිබුණේ?

කොයි විධියටද ඒක කෙරුණේ කියන එක පිළිබඳව ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම හරිම සතුටු වෙනවා මේ වාගේ දක්ෂ (බාධා කිරීම්) යෞවන පාර්ලිමේන්තුවෙන් මේ සභාවට මන්ත්‍රීවරයෙක් තේරී පත් වෙලා අද අපත් සමග සම්බන්ධවීම ගැන. මම යළිත් වතාවක් මගේ අමාත්‍යාංශයට ආරාධනා කරනවා. ස්ථිවර වශයෙන්ම ඔබතුමාට වෙලාවක් ලබා දෙනවා. මේ සම්බන්ධව අපි සාකච්ඡා කරලා අභිවෘද්ධිය සඳහා කටයුතු කරනවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඔබතුමා Phone එක Auswer කරන්නේ නැහැලු.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමාගේ කථාව ප්‍රතික්ෂේප කරනවා. මගේ දුකරථනයේ තිබෙනවා නම් ඔබතුමාගෙන් ලැබුණු දුරකථන අංකයක්, මම ඒ සම්බන්ධව වග කියනවා.

**07.**

**පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/16/34)**

අ. වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉත්තැපාන ගොවිජන සේවා කාර්යාලය මගින් ඉත්තැපාන වගුරුබිම් ප්‍රදේශයේ පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා මූල්‍ය ආධාර ලබා දී තිබේද?

ආ. තිබේ නම් අක්කරයට ලබා දුන් මුදල කොපමණද? කී දෙනෙකුටද?

ඇ. ලබා දුන් මුදල වෙන වෙනම නම් වශයෙන් සඳහන් කරන්නේද?

ඈ. ආධාර ලාභීන් සියලු දෙනා දැනට ඉඩම් අස්වද්දා ප්‍රතිඵල ලබා ඇත්ද?

ඉ. ඉඩම් එළිපෙහෙළි කර නැති කී දෙනෙකුට මුදල් ලබා දී ඇත්ද?

ඊ. මෙම ව්‍යාපෘතිය සාර්ථක යැයි ඔබතුමා සෑහීමකට පත් වන්නේද?

උ. එසේ නොමැති නම් ඔබතුමා ගන්නා පියවර කුමක්ද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

අ. ලබා දී නොමැත.

ආ. අදාළ නැත.

ඇ. අදාළ නැත.

ඈ. අදාළ නැත.

ඉ. අදාළ නැත.

ඊ. අදාළ නැත.

උ. අදාළ නැත.

නමුත් පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාගේ දැනුවත් වීම සඳහා "ආ" සහ "ඇ" ප්‍රශ්නවලට ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු මන්ත්‍රීතුමාට පොඩි කරුණු පැහැදිලි කිරීමක් කරනවා.

ආ. මූල්‍ය ආධාර ලබා දී නොමැත. එහෙත් ප්‍රතිලාභීන් 130 දෙනෙකු සඳහා ද්‍රව්‍ය ආධාර පහත පරිදි ලබා දී ඇත.

බිත්තර වී බුසල් 142
පොලිසෙක් කවර 608
දැකැති 100
මූලික වල්නාශක (මිලි ලීටර් 400) 98
ද්විතික වල් නාශක (මිලි ලීටර් 200 සහ 400) 75

"ඇ" ප්‍රශ්නයත් මට අදාළ නොවුණත් ඔබතුමාගේ දැන ගැනීම සඳහා කියනවා.

ඈ. ඉත්තැපාන දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ අක්කර 23 දැනට සාර්ථකව ක්‍රියාත්මක වේ. ස්ථානීය වශයෙන් අක්කර 08 ක්ද ක්‍රියාත්මක වශයෙන් පවතී. ඒ අනුව මුළු ඉඩම් ප්‍රමාණය වන අක්කර 31 ක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතියි. එය ආසන්න වශයෙන් 44% පමණ ප්‍රතිශතය වේ.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ඔබතුමා මුදල් දීලා තිබෙනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

නැහැ මගේ අමාත්‍යාංශයෙන් මූල්‍යමය ආධාර දීලා නැහැ.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

කොහෙන් හරි මූල්‍යමය ආධාර -

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

කොහෙන් හරි කියලා කියන්න බැහැ. මම දීලා නැහැ. එහෙම නම් මධ්‍යම රජයෙන් දීලා ඇති.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගොවිජන සේවා ආයතන සඳහා දීලා තියෙන්නේ. සැම එකක්ම වවලාත් නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, මගේ අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමක් කෙරිලාම නැහැ. මම වගකීමක් ඇතුව කියනවා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මම හොයලා බලලා කියන්නම්.

**08.**

**එම්. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/16/35)**

අ. i. කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිල්ලවත්ත පිහිටි කුඩා වැව සංවර්ධනය සඳහා වැව් 1000 ක් සැකසීමේ පසුගිය රජයේ ව්‍යාපෘතිය යටතේ වියදම් කරන ලද මුදල් කොපමණද?

ii. ඒ කුමන වර්ෂයකද?

ආ. වැව් ප්‍රතිසංස්කරණයේදී වැව් බැම්ම නිසි ප්‍රමිතියකින් තොරව සැදීම නිසා වැව් ඉස්මත්තේ පිහිටි ගම්මාන සියල්ල වැසි කාලවලදී වතුරෙන් යටවන බව ඔබතුමා දන්නේද?

ඇ. i. මෙම වැව ප්‍රතිසංස්කරණයේන් පසු වගාබිම් සඳහා ජලය සපයන ලද්දේද?

ii. එසේ වගාවන් සඳහා වැව් ජලය යොදා ගන්නේ නම් වගා කළ බිම් හෙක්ටයාර් ප්‍රමාණය කොපමණද?

ඈ. i. වසර 08 කට අධික කාලයක් මෙම වැව් සොරොව්ව විවෘත කිරීමට නොහැකිව එහි සොරොව් යතුරු අස්ථානගතව ඇති බව ඔබතුමා දන්නෙහිද?

ii. ඊට වගකිව යුත්තේ කවුද?

ඉ. වැව් ප්‍රතිසංස්කරණයේදී එයින් ඉවත් කළ පස් වලට සිදු වූයේ කුමක්ද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

අ. i. අදාළ නොවේ (මධ්‍යම රජයට අයත් ව්‍යාපෘතියකි)

ii. අදාළ නොවේ.

ආ. නොදනී

ඇ. i. අදාළ නොවේ.

ii. අදාළ නොවේ.

ඈ. i. නොදනී.

ii. අදාළ නොවේ.

ඉ. අදාළ නොවේ.

නමුත් ගරු සභාපතිතුමනි, "ආ" ප්‍රශ්නය පිළිබඳව මම පොඩි දැනුම් දීමක් කරනවා. වැව් ප්‍රතිසංස්කරණයේදී වැව් බැම්ම නිසි ප්‍රමිතියකින් තොරව සැදීම නිසා වැව් ඉස්මත්තේ පිහිටි ගම්මාන සියල්ල වැසි කාලවලදී වතුරෙන් යටවන බව ඔබතුමා දන්නේද? කියන එක. මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු වෙත වාර්තා කර නොමැත. ආඩිඅම්බලම ගොවිජන සංවර්ධන නිලධාරීන්ගෙන් විමසූ විට වැව ඉස්මත්තේ ගම්මාන වැසි කාලවලදී ජලයෙන් යට නොවන බව අනාවරණය වී ඇත.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ගරු ඇමැතිතුමා අදාළ නොවේ කියලා පිළිතුරු දෙනවා. වැව ඉස්මත්ත ක්‍රීඩාවක් සඳහා තණකොල කපලා පිරිසිදු කරන්න යනකොට පළාත් සභාකාර ගොවිජන නිලධාරී ගිහිල්ලා නවත්වනවා. අදාළ නැත්නම් එහෙම මැදිහත් වෙන්නේ කොහොමද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මොකක්ද ගරු සභාපතිතුමනි?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වැව ඉස්මත්තේ තණකොළ කපන්න ගියාට පස්සේ නවත්වනවාලු.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ක්‍රීඩාවකට වැව් ඉස්මත්ත සුද්ධ කරන කොට තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ නිලධාරීන් ගිහිල්ලා නවත්වනවා. අදාළ නැත්නම් කොහොමද ඒ නිලධාරීන් නවත්වන්නේ?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

වැව් ඉස්මත්තේ මොනවා කරනවාද කියන එක මට කියන්න පුළුවන්කමක් නැහැ ගරු සභාපතිතුමනි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

තමුන්නාන්සේ පැහැදිලිව කියන්න මේක පළාත් සභාවට කිසි සම්බන්ධයක් නැද්ද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

නිලධාරීන් එක නවත්වන්නේ ඇයි?

තමුන්නාන්සේගේ නිලධාරීන් ගිහිල්ලා මැදිහත් වෙන්නේ ඇයි?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඒක මම හොයලා බලලා කියන්නම්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එතකොට මේවාට උත්තර දුන්නේ ඒ නිලධාරීන් නොවෙයිද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය, ගරු ඇමැතිතුමා හොයලා බලලා කියන්නම්ලු.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔබතුමාට දෙන දේ කියවන එක විතරද කරන්නේ? ඔබතුමාට දෙන කොලේ කියන එක විතරද මෙතැන කරන්නේ? කිසිම දෙයක් දන්නේ නැහැ කියලා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

එහෙම කථා කරන්න එපා. ගරු සභාපතිතුමනි, මා මෙතැන මොන ඇමැති වුණත් නිලධාරීන් කොළයක ලියලා දෙන එක තමයි මෙතැන කියවන්නේ. එහෙම වැරදි ප්‍රකාශ කරන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එහෙම කියන්න එපා. එහෙම කොළ කියවන ඇමැතිවරු වැඩක් නැහැ. අපේ ප්‍රශ්න විසඳන්නේ කොහොමද? අපි පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපේ ප්‍රශ්න විසඳන්නේ කොහොමද? ඇමැතිවරයා කියනවා නම් මේක අයිති නැහැ කියලා. නිලධාරීන් ගිහිල්ලා මොකටද ඇඟිලි ගහන්නේ? ප්‍රශ්න විසඳන්නේ කොහොමද? පැහැදිලිව කියන්න ඔබතුමාට අයිති නැද්ද කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පැහැදිලිව කියන්න ඔබතුමාට අයිති නැද්ද කියලා. අයිති නැත්නම් නැහැයි කියලා කියන්න. එතකොට මම මහ ආණ්ඩුවත් එක්ක බලාගන්නම්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ආණ්ඩුවත් එක්ක බලාගන්න, මේක ආණ්ඩුවේ එකක්. මධ්‍යම රජයේ එකක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පස්සේ ආයිත් කියන්න එපා අපි කිව්වේ නැහැයි කියලා. හරියටම කියන්න ඔබතුමා මේක දන්නවාද නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතන්නේ ගරු ඇමැතිතුමා ඒක උත්තරයක් විධියට දෙයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔබතුමා හොඳින් කියනවා නම්, මම කියනවා. කරුණාකරලා හොයලා බලලා මට වහාම ඒ ගැන උත්තරයක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා හොඳින් කියන්න. එතකොට ප්‍රශ්නය ඉවරයි.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, කවුරුත් මේ ප්‍රශ්නය මොකක්ද කියන එක දන්නේ නැහැ නේ? මම ප්‍රශ්නය කියවන්නම්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හැමෝම ප්‍රශ්නය කියවලා තියෙන්නේ. ප්‍රශ්නය අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. මේ සභාවේ හැමෝම කියවලා තියෙන්නේ. නිකම් බොරුවට කාලය නාස්ති කරන්න එපා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, මේක අපට අයිති එකක් නොවෙයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මම අහන්නේ මේක පළාත් සභාවේද? මහ ආණ්ඩුවේද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පැහැදිලි ප්‍රශ්නයක් අහන්නේ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

දැන් මේක අයිති මධ්‍යම රජයට.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එච්චරයි මට දැනගන්න ඕනෑ. මීට පස්සේ පළාත් සභා මැදිහත් වුණොත් ඒකත් මම බලාගන්නම්.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

එහෙම නම් මම කනගාටු වෙනවා. මධ්‍යම රජයේ එකක් බව දැනගෙන ප්‍රශ්නයක් ඇසීම ගැන. මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් ඇහුවාම එක පාරටම මධ්‍යම රජයේ කියලා ගහන එක හරි නැහැ නේ? ඒක මධ්‍යම රජයේ කියලා වාඩි වෙන එක සුදුසු නැති නිසා තමයි මම ඒ විධියට හරි කරුණු ටික කියාගෙන ගියේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බොහොම ස්තූතියි. මම ඇහුවේ ඔබතුමා පැහැදිලිව ඒ ගැන දන්නවාද කියලා විතරයි. බාගෙට උත්තර දෙන්න

බැහැ. මධ්‍යම රජය නම් මධ්‍යම රජය. පළාත් සභාව නම් පළාත් සභාව. ගරු සභාපතිතුමනි, අතුරු ප්‍රශ්න තුනක් අහන්න පුළුවන්. ඒකයි ඇහුවේ. පළාත් නිලධාරීන් ගිහිල්ලා මැදිහත් වෙනවා. අයිති නැත්නම් මැදිහත් වෙන්න බැහැ නේ? මට පැහැදිලි උත්තරයක් ඕනෑ. ඊළඟ පියවර ක්‍රියාත්මක කරන්න. ඇමැතිතුමා උත්තර දීලා වාඩි වෙන්න. (බාධා කිරීමක්)

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මීට පස්සේ කෙලින්ම අපේ එකක් නොවෙයි කියලා මම Reject කරලා දාන්නම්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දෙන්නම්, දෙන්නම්. තව තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නවලදී අනවශ්‍ය විවාදවලට යන්න එපා. මොකද, හේතුව - අනවශ්‍ය විවාදවලට යන්න එපා මොකද, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. සාමාන්‍යයෙන් අපේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

තමුන්නාන්සේලා කොහේද යන්නේ කියලා කවුරුවත් දන්නේ නැහැ. පළාත් සභාවේ නිලධාරීන් දන්නේ නැහැ කාටද අයිති කියලා. ඉතින් ඔබතුමාගෙන් අහනවා. ඔබතුමාත් අනන්, මනන්උත්තර නේ දෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය අනවශ්‍ය විවාදවලට යන්න එපා. කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. ගරු මන්ත්‍රීතුමිය, ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා අපේ ජ්‍යෙෂ්ට ඇමැතිවරයෙක්. එතුමා මීට පෙර අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයකට බොහොම ලස්සන උත්තරයක් දුන්නා. පැහැදිලි උත්තරයක් දුන්නා. ඒක නිසා ඔබතුමියගේ ප්‍රශ්නයටත් එතුමා ඉදිරි කාලය තුළ බොහොම - එහෙම තමයි. එක පාරට එතුමාට ප්‍රශ්නවලට යන්න බැහැ නේ?

න්‍යාය පත්‍රයේ අංක 09 යටතේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ නමින් ඇති ප්‍රශ්නය ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ගරු සභාපතිතුමනි, සති 02 ක කාලයක් ඉල්ලා සිටිනවා.

**10.**

**රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතුයටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/16/37)**

අ. ඔබතුමා අමාත්‍ය ධූර භාරගත් දින සිට ඔබ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා පත් කර ඇති සභාපතිවරුන්ගේ නම් (ආයතන සඳහා වෙන් වෙන් වශයෙන්) මොනවාද?

ආ. ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් (ආයතන සඳහා වෙන් වෙන් වශයෙන්) මොනවාද?

ඇ. ඔබ අමාත්‍ය ධූරය භාරගත් දින සිට ඔබ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල පුරප්පාඩු සඳහා බඳවාගත් පිරිස (ආයතන සඳහා වෙන් වෙන් වශයෙන්) කොපමණද?

ඈ. ඒ කුමන තනතුරු සඳහාද යන්න (ආයතන සඳහා වෙන් වෙන් වශයෙන්) දක්වන්න?

ඉ. ඔබ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල මෙතෙක් බඳවා නොගත් පවතින පුරප්පාඩු (ආයතන සඳහා වෙන් වෙන් වශයෙන්) මොනවාද?

ඊ. ඉහත කී ඔබ යටතේ පවතින ආයතන සඳහා නුපුහුණු හෝ ආධුනික වශයෙන් බඳවාගෙන ඇති

පිරිස (ආයතන සඳහා වෙන් වෙන් වශයෙන්) කොපමණද?

**ගරු ලලිත් වනිගරත්න-**අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

අ.

| | | |
|---|---|---|
| කර්මාන්ත අධිකාරිය | - | රෙහෙන්සිරි වරාගොඩ මහතා (2015.09.25 දින සිට) |
| පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය | - | එම්.එම්.එම්. අම්ජාඩ් මහතා (2015.09.25 දින සිට) |
| | - | ඩබ්.ඒ.ඩී.එම්.ජේ. ශාන්ති මහතා (2015.01.03 දින සිට) |
| මාර්ග සංවර්ධන අධිකාරිය | - | අයිවන් සනත්මහතා (2015.10.01 දින සිට) |
| | - | නුවන් වනිගරත්න මහතා (2015.12.23 දින සිට) |

ආ. ප්‍රඥප්තිය අනුව පත් කිරීම් කර ඇත.

ඇ. මාස 01 ක් කල් ඉල්ලමි.

ඈ. ඉහත පිළිතුර අදාළ වේ.

ඉ. මාස 01 ක් කල් ඉල්ලමි.

ඊ. මාස 01 ක් කල් ඉල්ලමි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ප්‍රශ්න කිහිපයකට කල් ඉල්ලලා තිබෙන නිසා අතුරු ප්‍රශ්නත් මම ඊළඟ සැරේම අහන්නම්. බොහොම ස්තූතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාරයකදී මම ඉදිරිපත් කරපු ප්‍රශ්න කිහිපයක් සම්බන්ධයෙන් මේ සභාවේදී වාර්තා කරනවා කියලා ගරු අධ්‍යාපන ඇමැතිතුමා පොරොන්දු වුණා. ඒ වාගේම ප්‍රධාන ඇමැතිතුමා. එකක් තමයි මගේ පෞද්ගලික ප්‍රකාශය කරන අවස්ථාවේදී පොරොන්දු වුණා, මම සඳහන් කරපු ප්‍රකාශය සම්බන්ධයෙන් අදාළ පරීක්ෂණ වාර්තාව ප්‍රධාන ලේකම්තුමියට ලැබිලා තිබෙනවා, ඒ සම්බන්ධයෙන් මේ සභාවේදී කරුණු ඉදිරිපත් කරනවා කියලා. ඒ සම්බන්ධයෙන් දැනගන්න කැමැතියි. ඒ වාගේම දවිසමර විදුහලේ විදුහල්පතිතුමා සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරලා තිබෙනවා. මම දන්න තරමින් පරීක්ෂණයක් කරලා නැහැ කියලා මම කිව්වා. ඔබතුමා මේ සභාවට ඒක ඉදිරිපත් කරනවා කියලා කිව්වා. ඒ නිසා මම කැමැතියි මේ සභාවේදී ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අදහස ඉල්ලා සිටින්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ සම්බන්ධයෙන් ගරු ඇමැතිතුමාට උත්තරයක් දෙන්න පුළුවන්ද?

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

පුළුවන්, පුළුවන්. මම බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. (බාධා කිරීමක්) මේ ප්‍රශ්නය අහන්නේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාද, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාද? මම බොහොම ස්තූතිවන්ත වෙනවා මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාට. මේක හරියට මතක තියාගෙනම මගෙන් විමසීම සම්බන්ධව. ස්ථිරව වශයෙන්ම ගරු මන්ත්‍රීතුමා මම ලබන සභා වාරයේ මේ සඳහා උත්තර සපයනවා. ඊට කලින් පිළිතුරු අවශ්‍ය නම් මාව පුද්ගලිකව ඔබතුමාට මේක -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

වෙලාවක් දෙනවාද එන්න කියලා. අරයාට වාගේම මෙයාටත් වෙලාවක් දෙන්න කෝ එන්න කියලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

විශේෂයෙන්ම වැඩ බලන පළාත් අධ්‍යක්ෂතුමා ඇතුළු නිලධාරීන් දෙදෙනෙක් සම්බන්ධයෙන් මම ප්‍රකාශයක් කළා. එහිදී ගරු ප්‍රධාන ඇමැතිතුමා ප්‍රකාශ කළා රාජකාරී වශයෙන් නිලධාරී හරහා ප්‍රධාන ලේකම්තුමියට මේ වාර්තාව ඇවිල්ලා තිබෙනවා කියලා. ඒ වාගේම ඊට කලින් එතුමාම පැහැදිලි කළා මම මේ වාර්තාව බලලා අදාළ ඉදිරි කටයුතු ඉදිරියේදී ගන්නම් කියලා. ඉතින් මේ වනකොට ඒ සම්බන්ධයෙන් අරගෙන තිබෙන ක්‍රියා මාර්ග මොනවාද කියලාත් මේ සභාවට දැනගන්න සලස්වනවා නම් හොඳයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, ඔබතුමාට අදාළ නැහැ. මේ ප්‍රශ්නය මම හිතන්නේ ගරු ප්‍රධාන ඇමැතිතුමාට අදාළ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මෙහෙමයි. ප්‍රශ්නයක් මතු වුණා නේ? මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා අධ්‍යාපන ඇමැතිතුමා අතට මේ පරීක්ෂණ වාර්තාව ලැබිලා නැහැයි කියලා. ඊට පස්සේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ප්‍රකාශයක් කළා, මේ වාර්තාව ප්‍රධාන ලේකම්තුමියට ලැබිලා තිබෙනවා. ඒ වාර්තාව බලලා අදාළ ඉදිරි කටයුතු කරන්නම් කියලා. පසුගිය සභාවේ හැන්සාඩ් වාර්තාවේ 32 වැනි පිටුවේ ඒක පැහැදිලිව තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

පොඩ්ඩක් පැහැදිලි කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා පොඩ්ඩක් ඒක ගරු ප්‍රධාන ඇමැතිතුමාට පැහැදිලිව ප්‍රකාශ කරන්න. එතුමා නිලධාරීන් තුන්දෙනෙක් සම්බන්ධව නම් තුනක් සඳහන් කළා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පසුගිය සභා වාරයේදී විශේෂයෙන්ම මූල්‍ය අක්‍රමිකතා - සැසිවලට සහභාගී වෙනවා කියලා ව්‍යාජ ලේඛන අත්සන් කරලා මුදල් ගත්ත ඒවා සම්බන්ධයෙන් සහ ජනාධිපතිතුමාගේ ඉල්ලීමක් පරිදි කරපු විමර්ශනයක් සම්බන්ධයෙන් මම කරුණු අනාවරණය කළා. එහිදී මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ පැත්තෙන් ප්‍රශ්නයක් මතු කළා එම වාර්තාව අධ්‍යාපන ඇමැතිතුමාට ලැබිලා නැහැයි කියලා, ඊට පස්සේ ගරු ප්‍රධාන ඇමැතිතුමා කිව්වා ඒක ප්‍රධාන ලේකම්තුමියට අදාළ නිලධාරීන් මගින් ලැබිලා තිබෙනවා. මම ඒක බලලා පියවරක් ගන්නම් කියලා. මේ හැන්සාඩ් වාර්තාවේ 32 වැනි පිටුවේ ඉතාම පැහැදිලිව තිබෙනවා. ඒ වාගේම මගේ ප්‍රකාශය හැන්සාඩ් වාර්තාවේ 27 වැනි පිටුවේ තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

කාලයක් දෙන්න. මම ගරු ප්‍රධාන ලේකම්තුමියගෙන් විමසලා උත්තරයක් දෙන්නම්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ගරු සභාපතිතුමා මාර්ගයෙන් මම පළාත් පාලන ලේකම්තුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි කරුණාකරලා ඒ පිළිබඳව විමසලා මාව දැනුවත් කරන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා අධ්‍යාපනය ගැන කථා කරපු නිසා මටත් වචන දෙක තුනක් කථා කරන්න තිබෙනවා. අධ්‍යාපනය ගැන කථා කරන කොට මේ වාගේ ප්‍රකාශයක් මටත් කරන්න සිදුවීම සම්බන්ධයෙන් මම කනගාටු වෙනවා. සභාපතිවරයා වශයෙන්. අද නිලධාරීන් සුනිල් විජේරත්නට නොවෙයි, බස්නාහිර පළාත් සභාවේ සභාපතිවරයාටත් අභියෝග කරනවා. මේක ඉතාම කනාගටුදායක සිද්ධියක්. ගරු ප්‍රධාන ඇමැතිතුමනි, මේ විධියට නිලධාරීන් හැසිරෙන්න ගියොත් එහෙම මේක බරපතළ කාරණාවක්. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා Details ඇතුව මේ ප්‍රශ්නය ඉදිරිපත් කළා. මේ කරුණු, මේ කරුණු කියලා. ඒවාත් සොයා බලන්න ඕනෑ. ඊට වැඩිය ප්‍රශ්නය තිබෙන්නේ ගරු ප්‍රධාන ඇමැතිතුමනි, අපේ අධ්‍යාපන ඇමැතිතුමාත් ඉන්නවා. මම මේක ද්වේශ සහගතව කරන ප්‍රකාශයක් නොවෙයි. මම ඉතාමත් කනගාටුවෙන් මේ වාගේ ප්‍රකාශයක් කරන්නේ. අද නිලධාරීන් මූලාසනයට අභියෝග කරනවා. ගම්පහ කලාපයේ යම්කිසි ප්‍රශ්නයක් පිළිබඳව එම කලාපයේ විෂයය අධ්‍යක්ෂවරු 11 දෙනෙක් විතර පෙත්සමක් අත්සන් කරලා ආණ්ඩුකාරතුමාට භාර දෙන්න යනවා, ගම්පහ කලාපයේම වෑන් එකකින්. PA 7822 නිශාන් වෑනට් රථයෙන් එනවා. රාජකාරී වෙලාවේ ඇවිල්ලා ආණ්ඩුකාරතුමාට පෙත්සමක් භාර දෙනවා. මට විරුද්ධව. සභාපතිතුමාට විරුද්ධව. මේ විධියට නිලධාරීන් හැසිරෙන්න ගියොත් එහෙම මේක

බරපතළ ප්‍රශ්නයක්. රාජකාරී වෙලාවේ රජයේ වාහනයකින් ඇවිල්ලා ආණ්ඩුකාරතුමාට 02.30 ට පෙත්සම භාර දෙනවා. ප්‍රධාන ලේකම්තුමියට 02.00 ට භාර දෙනවා. එතකොට ඒ පෙත්සමේ සඳහන් කරලා තිබෙනවා ඉතාමත් සාවද්‍ය කරුණු. මොකද, මම අවුරුදු 24 ක් අධ්‍යාපන අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙක්. මම වෙන කිසිම අමාත්‍යාංශයකට ගිහිල්ලා නැහැ. 1993 චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය මහ ඇමැතිනිය විධියට ඉන්න කාලේ මාව පත් කළේ අධ්‍යාපන අධීක්ෂණ මන්ත්‍රීතුමා වශයෙන්. ඊට පස්සේ මම චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය, මොරිස් රාජපක්ෂ මහ ඇමැතිතුමා, සුසිල් ප්‍රේමජයන්ත මහ ඇමැතිතුමා, රෙජිනෝල්ඩ් කුරේ මහ ඇමැතිතුමා, ප්‍රසන්න රණතුංග මහ ඇමැතිතුමා ඊට පස්සේ අපේ රංජිත් සෝමවංශ අධ්‍යාපන ඇමැතිතුමාගේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ මම වාඩි වෙනවා. මේ පෙත්සමෙන් කියන්නේ මම පසුගිය පෙබරවාරි මාසේ උපදේශක කාරක සභාවේදී ප්‍රකාශයක් කරලා නිලධාරීන් ඉස්සරහා පිට, උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරු ඉස්සරහා පිට තර්ජනය කළාලු ගම්පහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මාරු කරන්න කියලා. ඒ පෙත්සමේ එක කාරණාවක් ඒක.

ඊළඟ කාරණාව ගරු ප්‍රධාන ඇමැතිතුමනි, අධ්‍යාපන ඇමැතිතුමනි, අප්‍රේල් මාසේ 19 වැනිදා අපේ අධ්‍යාපන ඇමැතිතුමා මේ නිලධාරියාව කොළඹට ගෙනැල්ලා - එතුමා මෙන්න මේ වාගේ කතාවක් කියන්නේ. මම කලාප අධ්‍යාපන කාර්යාලයේදී පවත්වන ලද මාසික ව්‍යුහ කමිටු රැස්වීමේදී බස්නාහිර පළාතේ ගරු සභාපතිතුමාට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ පුටුව ලබා නොදීම. ඉතින් මම ඒ තරම් පල්ලෙහා මට්ටමට වැටෙන්නේ නැහැ ගරු ප්‍රධාන ඇමැතිතුමනි. මම අවුරුදු 24 ක් පළාත් සභාවේ ඉන්න මහජන නියෝජිතයෙක්. මම අමාත්‍යාංශයකට ගිහිල්ලා කවදාවත් ඇමැතිවරයාගේ පුටුවේ වාඩි වෙන්නේ නැහැ. මම කාර්යාලයට ගිහිල්ලා නිලධාරීන්ගේ පුටුවේ වාඩි වෙන්නෙත් නැහැ. මම පල්ලෙහාත් වාඩි වෙන්නේ. නමුත් ව්‍යුහ කමිටු රැස්වීමේදී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට යුතුකමක් තිබෙනවා මන්ත්‍රීවරුන්ට අවශ්‍ය ගරුත්වය, පෞරුෂය ආරක්ෂාව වන ආකාරයෙන් ඒක ලැහැස්ති කරන්න ඕනෑ. එහෙම නැතුව නිලධාරීන්ට ඕනෑ විධියට අපට හැසිරෙන්න බැහැ. ඒක එක කාරණාවක්.

දෙවැනි කාරණාව ගරු ප්‍රධාන ඇමැතිතුමනි, එක්තරා උත්සවයකදී මම ප්‍රධාන අමුත්තා. එතුමාම ලියලා තිබෙන කාරණා. කවුරු ලිව්වාද කියලා මම දන්නේ නැහැ. එතුමාත් එක්ක උත්සවයට නොගිය කාරණාවක් දාලා තිබෙන්නේ. චෝදනාවක්. ඉතින් මගේ ප්‍රධානත්වයෙන් තිබෙන උත්සවයක්. විදුහල්පතිතුමා සූදානම් මගේ ප්‍රධානත්වයෙන් උත්සවය කරන්න. නමුත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මම එන්න විනාඩි 05 කට විතර ඉස්සෙල්ලා කොහොම හරි එතැනට ගිහිල්ලා, පෙරහැරෙන් ගිහිල්ලා කොඩියත් උස්සලා ඉවරයි. ඒ වැරැදි කරපු දේවල්. ඉතින් ඒ වාගේ කාරණා සම්බන්ධයෙන් ගරු අධ්‍යාපන ඇමැතිතුමා අප්‍රේල් මාසේ 19 වැනිදා හදිසියේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා කැඳවූ බස්නාහිර පළාතේ අධ්‍යාපන ඇමැතිතුමා ඔහුට පවසා ඇත්තේ ගම්පහ අධ්‍යාපන කලාපයෙන් ඉවත් වන ලෙසටයි. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ඉවත් කිරීම නොකළහොත් පළාත් අධ්‍යාපන අමාත්‍යවරයාට විරුද්ධව එවා ඇති දෝෂාභියෝගය තමා භාර ගන්නා බව සඳහන් කරමින් පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා අපහසුතාවයට ලක් කරමින්, බලපෑම් කරමින් ගරු සුනිල් විජේරත්න සභාපතිතුමා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරිය ඉවත් කිරීමට දැඩි ලෙස බලපෑම් කර ඇත. ඉතින් බලන්න මේ පෙත්සම්වල කොපමණ සාවද්‍ය කරුණුද තියෙන්නේ? මේ පළාත් සභාවේ මූලාසනයට අභියෝග කරන්නේ. මට විතරක් නොවෙයි. අපි ඔක්කෝටම. මේක මන්ත්‍රීවරු 103 දෙනාටම කරන අසාධාරණයක්.

ඒක නිසා ගරු ප්‍රධාන ඇමැතිතුමනි, අධ්‍යාපන ඇමැතිතුමනි මේ කාරණා සම්බන්ධයෙන් අපේ අධ්‍යාපන අමාත්‍ය ලේකම් විජයබන්දු මහත්මයාට ලිඛිතව ඉදිරිපත් කළා. ඒ වාගේම ප්‍රධාන ලේකම්තුමියට දුරකථනයෙන් කථා කරලා කිව්වා. මම ලිඛිතවත් දීලා තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් කඩිනම් පරීක්ෂණයක් කරන්න. මෙහෙම යන්න ගියොත් බලන්න අපේ පෞරුෂය කොපමණ හැල්ලු වෙනවාද කියලා. අපේ තිබෙන කීර්ති නාමය, අවුරුදු 24 ක් තිස්සේ අපි ගොඩ නඟාගත්තු අපේ දේශපාලන ගමන් මහ මේ වාගේ නිලධාරීන් කරන අසාධාරණ, සාවද්‍ය පෙත්සම්වලින් - මේ ගැන අපට බලවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මේක හැල්ලු කරන්න එපා. ගරු අධ්‍යාපන ඇමැතිතුමා ඉන්නවා. ගරු ප්‍රධාන ඇමැතිතුමා ඉන්නවා. මේ ගැන ඔබතුමන්ලා සාධාරණ පරීක්ෂණයක් - අපට මේ පළාත් සභාව යන්න බැහැ. අපි ඔක්කෝම හැල්ලු වෙනවා. ඇමැතිතුමන්ලාත් හැල්ලු

[ගරු සභාපතිතුමා]

වෙනවා. ඒ නිසා ඔබතුමන්ලා මේ ගැන කඩිනම් ක්‍රියා මාර්ගයක් ගන්නය කියලා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ සභාවේ ගෞරවය ආරක්ෂා කරන්න.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව මම ඔබතුමා සමග කලින් සාකච්ඡා කළා. එතුමාව මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා සමග සම්මුඛ කළා. ආණ්ඩුකාරතුමාට එතුමාව මා අසලින් හිඳුවාගෙන දුරකථනයෙන් කථා කරලා මේ නිලධාරියාගේ හැසිරීම් රටාව ගැන ඉතාම හොඳ පැහැදිලි කිරීමක් කර ආණ්ඩුකාරතුමා එකඟත්වය පළ කළා මේ වාගේ නිලධාරීන් සම්බන්ධව අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නවා කියලා. මගේ ලේකම්තුමා ඒ සම්බන්ධව ප්‍රධාන ලේකම්තුමියට ලිපියක් ඉදිරිපත් කළා. එම ලිපියේ අඩුපාඩු සහිතව බැවින් යළි ඒ ලිපිය අපට හරවා එවනු ලැබුවා. අපි ඒ ලිපිය නිවැරැදි කර යළි හෙට උදෑසන ප්‍රධාන ලේකම්තුමියට යවනවා. ඒ අනුව ඔබතුමාට සිදු වූ සහ පොදුවේ සිදු වුණු අපහසුතාවය නිවැරැදි කිරීමට ස්ථිර වශයෙන්ම කටයුතු කරනවා.

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

ඇත්ත වශයෙන්ම ඒ අධ්‍යක්ෂතුමාට විරුද්ධව මේ වෙලාවේ මොක්ක හරි දැඩි පියවරක් ගන්න ඕනෑ. අපි මුළු සභාවම මේ පිළිබඳව කථා කරන්න ඕනෑ. අපේ සභාපතිතුමාට නේ අපහාස කරලා තිබෙන්නේ. අපේ සභාවේ ප්‍රධානියා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මම සභාපතිතුමා හරහා ගරු ඇමැතිතුමාව දැනුවත් කරන්න කැමැතියි. අද අධ්‍යාපන ක්ෂේත්‍රයම සියළුම මන්ත්‍රීවරුන්ව ගණන් ගන්නේ නැති තත්ත්වයකට පත් වෙලා. අද ව්‍යුහ කමිටුවකට ගියත්, ඒ කලාප අධ්‍යක්ෂවරු ව්‍යුහ කමිටුවේ පක්ෂ, පාට භේදයකින් තොරව මන්ත්‍රීවරු කියන දේ නොවෙයි ව්‍යුහ කමිටුවේ වෙන්නේ. ඒ නිලධාරීන්ට ඕනෑ දේ තමයි වෙන්නේ. සියලු වැඩවලදී. හොරණ ගත්තාම සංවර්ධන වැඩවලදී අපි කට්ටියම එකතු වෙලා සාකච්ඡා කරලා යවනවා. සාකච්ඡා කරලා යැව්වාට වෙන ඒවා තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා මේක සභාපතිතුමාට විතරක් නොවෙයි පළාත් සභාවටම වුණු දෙයක්. ඒ නිසා මම ඇමැතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මේ සභාවේ තීන්දුවක් ගන්න. මොකද, මේ අසත්‍ය කරුණු. උපදේශක කාරක සභාවේදී කිව්වා නම් ඒක දන්නවා. නැත්නම් පළාත් සභාවේ එහෙම ප්‍රකාශයක් කළා නම් පළාත් සභා මන්ත්‍රීවරු දන්නවා. ඉතින් මේක පැහැදිලිවම බොරුවක් කියලා දන්නවා. ඒ නිසා මම කියන්නේ, මේ කලාප අධ්‍යක්ෂවරු එකතු වෙලා - ඒ අත්සන් කරපු නිලධාරීන්වත් වෙනම ගෙනැල්ලා විනය පරීක්ෂණයක් කරලා ඒකට නිසි දඬුවමක් දෙන්න. දැන් මේක දිගින් දිගටම යනවා. දිගින් දිගටම ගියොත් එහෙම මන්ත්‍රීවරු සියලු දෙනාම හැල්ලුවට ලක් වෙනවා. ඒ නිසා කරුණාවෙන් ඉල්ලන්නේ ඇමැතිතුමනි, මේකට දැන් තීන්දුවක් අරගන්න. තීන්දුවක් අරගෙන මේ අයට නිසි දඬුවම් දෙන්න කියන එක ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, එක විනාඩියක් දෙන්න. ඔබතුමා කරපු ප්‍රකාශයත් එක්ක වරප්‍රසාද ප්‍රශ්නයක් මතු වෙන්නේ. අපට වරප්‍රසාද යටතේ 36 (1) ඉතාම පැහැදිලිව කියලා තිබෙනවා. ස්වාධීනව, නිදහසේ කටයුතු කරන්න තිබෙන අයිතිය මහජන නියෝජිතයෙකුට තිබෙන්න ඕනෑ කියලා. ගරු සභාපතිතුමනි, මීට කලින් මේ සභාවට සම්බන්ධයෙන් සභා කටයුතු කාරක සභාවට ලිපියක් ආවා. නිලධාරීන් සම්බන්ධව කථා කරන්න තිබෙන අයිතිය නතර කරලා ඒ සම්බන්ධව රීති සම්පාදනය කරන්න කියලා. මම හිතන්නේ ඒකේ දෙවැනි පියවර විධියට තමයි මේ කටයුත්ත අපි දකින්නේ. ඒ නිසා කිසිම නිලධාරියෙකුට මහජන නියෝජිතයෙකුට තිබෙන අයිතිය උදුර ගන්න පුළුවන් විධියට කටයුතු කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මම යෝජනා කරනවා, ඔබතුමාට මේ නිලධාරියාව අවදි කාරක සභාවට කැඳවන්න කියලා. අවදි කාරක සභාවට කැඳවලා, අවදි කාරක සභාවේ යම් පරීක්ෂණයක් කරලා ඒ නිලධාරියා සම්බන්ධයෙන් විනය ක්‍රියා මාර්ග ගන්න කියලා. එතුමාට එහෙම හානියක් වුණා නම් යන්න ඕනෑ ක්‍රියා පිළිවෙතක් තිබෙනවා. හැබැයි ආණ්ඩුකාරවරයා ළඟට කෙලින්ම යනවා කියලා කියන්නේ ඒක විශාල වැරැද්දක්. සාමාන්‍ය නීතියවත් දන්නේ නැතුව කරපු වැඩක්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ නිලධාරියාව අවදි කාරක සභාවට කැඳවන්න ඔබතුමා නියෝගයක් දෙන්න. අවදි කාරක සභාවේදී නිලධාරියාගේ විනය සම්බන්ධයෙන්

පරීක්ෂණයක් කරලා යම් කටයුතු කළ යුතුයි. නැත්නම් මේක පූර්වාදර්ශයක් වෙලා මන්ත්‍රීවරයෙකුට මහජනයාගේ ප්‍රශ්නයක්, නිලධාරියෙක් කරන අසාධාරණයක් සම්බන්ධයෙන් කථා කරන්න ඉඩ ඇති වෙන්නේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ඒ නිලධාරියාව මාරු කරන්න අපි අවශ්‍ය කටයුතු කළා. ඒ ලිපියේ තිබුණු යම් අඩුපාඩුවක් නිවැරැදි කිරීම සඳහා හෙට දවස ප්‍රයෝජනයට ගන්නවා. ඒ අවශ්‍ය කටයුතු ස්ථිර වශයෙන්ම ඉෂ්ට සිද්ධ වෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන ඇමැතිතුමා සඳහන් කරන ආකාරයට මේ නිලධාරියා සම්බන්ධයෙන් අමාත්‍යාංශය ක්‍රියා කරන්න බලාපොරොත්තු වෙන්නේ ස්ථාන මාරුවක් ලබා දීලා. ස්ථාන මාරුව කියන එක කරපු වරදට අදාළ දඬුවම නොවෙයි. ඒ වරදට අදාළ කරනු ලබන විනය ක්‍රියා මාර්ගයේ ප්‍රතිඵලයක් නොවෙයි ස්ථාන මාරුව කියන්නේ. ස්ථාන මාරුව, මේ කරලා තිබෙන කාර්යයට අදාළව ප්‍රමාණවත් වෙන්නේ නැහැ. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපේ රීති සංග්‍රහයේ පැහැදිලිව සඳහන් වෙනවා ජනාධිපතිවරයාගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ නම විතරයි කියන්න බැරි. නම නොකියා ඒ පුද්ගලයෝ පිළිබඳව පවා කථා කරන්න මේ සභාවට බලය දීලා තිබෙනවා. ඒ නිසා නිලධාරීන් කියන්නේ, මේ සභාවේ විෂයය පද්ධතිය ක්‍රියාත්මක කරන අය. ඒ අය සම්බන්ධව මේකේ කථා කරන්න බැරි නම් උපදේශක කාරක සභාවේ කථා කරන්න බැරි නම් මේ මන්ත්‍රීවරුන්ගේ අදහස් පළ කිරීමේ කටයුත්තට දැඩි ලෙස බාධාවක් වෙන්නේ. ඒ නිසා මේ නිලධාරියාව - පළමුවැනි කාරණය රාජකාරී වේලාව තුළ නිවාඩු නොලබා රාජකාරීමය කටයුත්තක් නොවන පෞද්ගලික කාර්යයක් සඳහා රාජකාරී වේලාව යොදවා ගැනීම. ඒ වාගේම අනුමත නිලධාරියෙකුගේ අනුමැතියට යටත් නොවී රජයේ වාහනයක් යොදවා ගැනීමෙන් පළාත් සභාවට කරන ලද පාඩුව. ඒ වාගේම මේ නිලධාරියා විසින් තමන්ගේ ආසන්නතම නිලධාරියා මාර්ගයෙන් ඉහළ නිලධාරියා ඇමතිය යුතුයි කියන මේ නිලධාරීන් සම්බන්ධයෙන් තිබෙන විනය නීති මාලාව උල්ලංඝණය කිරීම කියන මේ කාරණා සම්බන්ධයෙන් වෙනමම පරීක්ෂණයක් පවත්වලා ඒ කාරණා සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි නිදහසට කරුණු විමසලා යවන්න පුළුවන්කම තිබෙනවා, අදාළ නිලධාරීන්ට. ඒ වාගේම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා යෝජනා කරපු විධියට පොදුවේ අපි සියලු දෙනා විසින් ස්ථිර කරනවා, මම එකඟයි. අවදි කාරක සභාවට මේ නිලධාරියාව ගෙන්නලා නිදහසට කරුණු විමසලා සියල්ලට ආදර්ශමත් වන විධියට මේ කටයුත්ත කරන්න කියලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මේ සිද්ධිය ගැන ගොඩක් අය කථා කරපු නිසා මම දිගින් දිගට කථා කරන්නේ නැහැ. නමුත් කටාන කලාපයේ පාසලකත් ප්‍රශ්නයක් ඇති වුණා. ඇමැතිතුමාට ප්‍රශ්නයට මැදිහත් වෙන්න බැහැ. මොකද, නිලධාරීන් කියන දේ කරන්න සිද්ධ වෙලා තිබෙනවා. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකට ඕනෑ විධියට තමයි වැඩේ කෙරෙන්න ඕනෑ. අපේ ඇමැතිතුමාටවත් බලපෑමක් කරලා මේ වැරැද්ද නිවැරැදි කිරීමේ තත්ත්වයක් තිබුණේ නැහැ. මම පෞද්ගලිකවම සිද්ධිය දන්නවා. නමුත් මේ එකක් නොවෙයි. මෙහෙම රාශියක් වෙලා තිබෙනවා. මම නියෝජනය කරන උපදේශක කාරක සභාවට ලියුමක් එවනවා, මේ පළාත් සභාවේම ලේකම්තුමිය. නිලධාරීන් ගැන දිගින් දිගටම සභාවේ කථා කරනවා වැඩියි. මේක නවත්වන්න කියලා. එතැනදී මම කියනවා ලංකාවේ නීතිපතිවරයා ගැන විවිධ විවේචන ගියා. ජනාධිපතිවරයා ගැන යනවා. අගමැතිවරයා ගැන යනවා. කථා කරන්න බැරි කෙනෙක් නැහැ. මේ සභාව පාර්ලිමේන්තුව වාගේම උත්තරීතරයි. ඕනෑම දෙයක් කථා කරන්න පුළුවන්. මහජනයා නියෝජිතයෝ පත් කරන්නේ මේවායේ හරි වැරැදි හොයන්න. දැන් රජයෙන් වැටුපක් අරගෙන රාජකාරියක් කරන්න එනවා කියන එක නිලධාරීන්ට අමතක වෙලා තිබෙනවා. මේ අය හිතන්නේ, ඒ අයට ඕනෑ විධියට ප්‍රදේශයේ ඕනෑ දෙයක් කරන්න බලය දීලා තිබෙනවා කියන එක අරගෙන තමයි කරන්නේ. ඒ නිසා විශේෂයෙන් මම මතක් කරනවා, මේ පළාත් සභාවේ අහන ප්‍රශ්නවලදී කල් ගන්න ප්‍රශ්න එකක්වත් ආපහු එන්නේ නැහැ. ඒවාට උත්තර එන්නේ නැහැ. කල් ගන්න එවා යට යනවා. ප්‍රශ්නවලට ලිස්සා උත්තර දෙනවා. මේ සියල්ලම එකට අරගෙන ඔබතුමා ඉක්මන් විසඳුමක් දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala- Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ඇත්තටම ඔබතුමාට මේ කාරණාව සිද්ධ වීම පිළිබඳව අපි ඉතාම කනගාටුවට පත් වෙනවා. මේ තත්ත්වය උද්ගත වෙන්න මම දකින කාරණා කිහිපයක් තිබෙනවා. එකක් තමයි මේ නිලධාරීන් අනවශ්‍ය කාල පරිච්ඡේදයක් එකම තැන ඉන්නවා. විවිධ බලපෑම් මත ඒ අය එතැන තියාගෙන තිබෙනවා. ඒ අය පැලපදියම් වුණාම ඒ අය විශ්වාස කරනවා මෙතැන ඉන්න ප්‍රධානියා පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ටත් වැඩිය අපි තමයි. ඒ නිසා මේ නිලධාරීන්ට ඕනෑ දේවල් කරන තත්ත්වයට දවසින් දවසින් ඉඩ හැදෙනවා නම් හෙට අනිද්දා වනකොට මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ ආත්ම ගෞරුත්වය බිංදුවටම බහිනවා. මට මතකයි මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා උපදේශක කාරක සභාවකදී සම්මුඛ පරීක්ෂණයක් තියලා ඇති වුණු සිද්ධියක්. ඒ නිලධාරියා ඇවිල්ලා ඇමැතිවරයා හම්බ වුණා කිව්වාම,එතුමා අර සම්මුඛ පරීක්ෂණයෙන් පත් වෙලා ඉන්න නිලධාරියා පත් කරන්න අදාළ නිලධාරියා කැමැති නැහැ. ඇයි හේතුව ඇමැතිතුමා ඇවිල්ලා මුණ ගැහුනා කියලා. මේ ඉන්න රාජ්‍ය සේවකයෙකුට ඇවිල්ලා ඇමැතිතුමා මුණ ගැහෙන්න බැරිද? එතකොට හිතන්නේ ඇමැති ගාවට ගියා නම් මම මේක දෙන්නේ නැහැ. උඹ ඉන්න ඕනෑ මා ළඟ විතරයි කියලා. මේ තත්ත්වය මේක තුළ අපි අත්විඳලා තිබෙනවා. මේක මේ අධ්‍යාපන අමාත්‍යාංශයේ විතරක් නොවෙයි. අනෙක් අමාත්‍යාංශවල තත්ත්වයත් මේකයි.

ඒ නිසා අපි දන්නවා නිලධාරීන් පසුගිය කාලයේ කොයි තරම් වැරැදි කළාද කියලා. නිලධාරීන් අත්තනෝමතිකව වැරැදි කරලා තිබෙනවා. ඒවාට ක්‍රියා මාර්ග නැහැ. සමහර නිලධාරීන් හිතනවා මෙතැන බලධාරියා මම තමයි. ඇමැතිවරයා නොවෙයි කියලා. ඇමැතිතුමාත් හිතුවොත් එහෙම අනේ එයා දීර්ඝ කාලයක් තිස්සේ එතැන ඉන්නවා, එයාට අත්දැකීම් තිබෙනවා, එයා පළපුරුදු එක්කෙනා, මෙයා නැති වුණොත් මට යන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ, එතැනදී අනිවාර්යයෙන්ම වෙන්නේ අදාළ ඇමැතිවරයා අර නිලධාරියාට යට වෙන තත්ත්වයකට පත්වීමයි. ඒ නිසා මම කියන්නේ, ඇමැතිතුමන්ලා කොන්ද පණ ඇතුව වැඩ කරන්න. නිලධාරීන් ඕනෑ කෙනෙක් ඔබට මාරු කරන්න පුළුවන්. අපි ඒ වෙනුවෙන් ඔබත් එක්ක ඕනෑ වෙලාවක පෙනී හිටිනවා කියන එක විතරක් මතක් කරනවා. ඒ නිසා මේ සභාපතිවරයාට වුණු කාරණාව සම්බන්ධයෙන් එතුමාගේ ගෞරවය - එතුමා හොඳ සභාපතිවරයෙක්. එතුමා ආරක්ෂා කරලා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔබතුමා නියෝග දෙන්න අවදි කාරක සභාවට කැඳවන්න කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ගරු සභාපතිතුමනි, මේ සභාවේ මතු වුණු අදහසත් අනුව මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මතු කළ කාරණාවට අනුව වහාම අදාළ නිලධාරියා අවදි කාරක සභාවට කැඳවලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිලධාරියා විතරක් නොවෙයි ගරු ප්‍රධාන ඇමැතිතුමනි. අත්සන් කරපු අය, වාහනය සම්බන්ධ අය -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ඒ වාගේම පෞද්ගලික කාරණාවකට රජයේ වාහනයක් පාවිච්චි කරමින් ආණ්ඩුකාරතුමා හම්බ වුණු නිලධාරිනුත්, ප්‍රධාන ලේකම්තුමිය හම්බ වුණු නිලධාරීන් සියලු දෙනාටම දඬුවම් ලබා දෙන්න කියලා තමුන්නාන්සේ මගින් දැනුම් දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ ප්‍රශ්නය සම්බන්ධව ගරු ප්‍රධාන ඇමැතිතුමා, ගරු විපක්ෂ නායකතුමා ප්‍රධාන ගරු මන්ත්‍රීවරු රාශියක් අදහස් ප්‍රකාශ කළා. විශේෂයෙන්ම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කරුණු ඉදිරිපත් කළා, මේ නිලධාරීන් අවදි කාරක සභාවට ගෙන්වන්න කියලා. ඒ අනුව මම මේ අවස්ථාවේදී ලේකම්තුමාට නියෝග කරනවා ඒ සියලු නිලධාරීන් අපේ පළාත් සභාවේ අවදි කාරක සභාවට කැඳවන්න කියලා. කැඳවලා සාධාරණ පරීක්ෂණයක් කරලා ඉදිරියේදී ඒ පිළිබඳව ක්‍රියා මාර්ග ගන්නවා. ඒ නිසා ඉක්මණින්ම ඒ නිලධාරීන් සියලු දෙනාම අවදි කාරක සභාවට කැඳවන්න.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ගරු සභාපතිතුමනි, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා මතු කළ කාරණාව සම්බන්ධව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ ප්‍රශ්නයට උත්තරය.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ඔබතුමාගේ ප්‍රශ්නය සම්බන්ධව පැහැදිලි කිරීම. ප්‍රධාන ලේකම්තුමියගෙන් මම පොඩි වාර්තාවක් ගත්තා. ගරු සභාපතිතුමනි, අදාළ සිද්ධිය පිළිබඳව ප්‍රධාන ලේකම්තුමියගේ උපදෙස් පරිදි අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ විසින් පරීක්ෂණයක් ආරම්භ කර ඇත. පරීක්ෂණය පිළිබඳ අතුරු වාර්තාවක් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ විසින් ප්‍රධාන ලේකම්තුමිය වෙත භාර දී ඇති අතර, එම වාර්තාව එතුමිය විසින් අවශ්‍ය කටයුතු කිරීම සඳහා පළාත් අධ්‍යාපන ලේකම් වෙත යවා ඇත. ඒ අනුව ඔහු විසින් ඉදිරි කටයුතු කරනු ඇත. කෙසේ වුවද, අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ විසින් මේ පිළිබඳව වැඩිදුරටත් විමර්ශනය කරමින් සිටී.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එම පිළිතුරට බොහොම ස්තුතියි. ගරු අධ්‍යාපන ඇමැතිතුමා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera- Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු ප්‍රධාන ඇමැතිතුමාත් ඉන්නවා. සියලුම මන්ත්‍රීවරුන්ට මේක බලපානවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera- Chief Opposition Whip

ලක්ෂ 50 සඳහා ව්‍යාපෘති අපි නම් කිරීමේදී යම් යම් ව්‍යාපෘති දිසානායක අධ්‍යක්ෂතුමිය විසින් අපට කපලා එවලා තිබෙනවා. ඒවා ඇතුල් කරන්න බැහැයි කියලා. හැබැයි ගරු ප්‍රධාන ඇමැතිතුමා කිව්වා එතුමාගේ ලක්ෂ 25 ක් අපේ ලක්ෂ 50 තිබෙනවා. ඕනෑම යෝජනාවක් දාන්න පුළුවන් කියලා. උදාහරණයක් විධියට ගත්තොත් ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා, ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, උපාලි ගුණරත්න ගරු මන්ත්‍රීතුමා, මම ලක්ෂ 10, 15 වෙන් කරලා ශිෂ්‍යත්ව පෙරහුරු වැඩ සටහන් හැම අවුරුද්දේම කරනවා. ඒ සඳහා ලක්ෂ 10, 15 වෙන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරන්න දෙන්නේ නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera- Chief Opposition Whip

ඔව්. දෙන්නේ නැහැ. දැන් මෙතුමාගේ ලක්ෂ 25 ක් තිබෙනවා නම්, ඇයි මේකට ඇතුළත් කරන්න බැරි? මේවා හොඳ යෝජනා. අපි මේ කාටවත් ගිහිල්ලා මැෂින් එකක් දෙනවා නොවෙයි. ළමයින්ගේ අධ්‍යාපනය වැඩි කරන්න මෙය කරන්නේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දෙනවා. උදාහරණයක් වශයෙන් හර්ෂණ රාජකාරුණා මැතිතුමාගේ මේ යෝජනාවම අනුමත වෙලා. අපේ පළාත් සභාවේ මේක වෙන්නේ නැත්නම් ඔබතුමාගේ මුදල්වලින් අපට දෙන්න. මේක අධ්‍යාපනයට වෙන් කරන්නේ. හොඳ දෙයක්. මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න කියලා අවංක ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම සැලසුම් අධ්‍යක්ෂ දිසානායක මැතිනිය උත්සාහ කළා. මන්ත්‍රීවරු තුන් හතර දෙනාගේ නම් දාලා භාණ්ඩාගාර අධ්‍යක්ෂතුමාට ලිපි යැව්වා මේක ක්‍රියාත්මක කරන්නය කියලා. ඒකටත් උත්තරයක් නැහැ. මේ සම්බන්ධව කටයුතු කිරීම පිළිබඳව මම එතුමියව අගය කරනවා. මම ඉල්ලීමක් කරනවා. ගරු මහ ඇමතිතුමා වචනයක් දුන්නා නේ? අපේ ලක්ෂ 25 ක් තිබෙනවා නේ? අපේ ලක්ෂ 25 ට මේක ඇතුළත් කරලා දෙන්න. එච්චරයි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ශිෂ්‍යත්ව පෙරහුරු සම්බන්ධයෙන් අපි විශාල වැඩ සටහනක් සංවිධානය කරලා තිබෙනවා, කොළඹ, කළුතර සහ ගම්පහ. ඒ සඳහා පරිසර අමාත්‍යවරයා හැටියට මගේ ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. මම හිතන්නේ

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

අපේ පළාත් සභා ගරු මන්ත්‍රීවරු ඒ වැඩේට ප්‍රතිපාදන වෙන්න කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. හැබැයි, ඒ අයට ඒ වාගේ අධ්‍යාපනය වෙනුවෙන් තව වියදමක් මොනවා හරි වැඩ සටහනක් කරන්න තිබෙනවා නම් ඒක කරන්න. මම ඒකට අනුමැතිය ලබා දෙන්නම්. මම හිතන්නේ ශිෂ්‍යත්ව පෙරහුරු වැඩ සටහනට අපි විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා නේද අපේ සංවිධායකතුමා? මේ සැරේ දිස්ත්‍රික්කයේ ළමයින්ට නිදහසේ ඇවිල්ලා බලන්න පුළුවන් විධියට ඒ වැඩ සටහන හදලා තිබෙනවා. මම නම් හිතන්නේ නැහැ ඒ සම්බන්ධයෙන් අපේ මන්ත්‍රීවරු අමුතුවෙන් මුදල් වෙන් කරන්න ඕනෑය කියලා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera- Chief Opposition Whip

අපි හතර දෙනයි නේ කළේ ගරු මහ ඇමතිතුමා. අපටත් දෙන්න. රජයෙන් නේ -

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාත් කරනවා නේ?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මම නීතිය නම් දන්නවා. නමුත් නීතිය දන්නවා වුණත්, මේ පිළිබඳව එක වචනයක් කථා කරන්න ඕනෑ. දහවැනි අවුරුද්ද මම කළේ. ගරු මහ ඇමතිතුමා කරන එක වෙනම දෙයක්. ගරු සභාපතිතුමනි, මම නොකඩවා අවුරුදු 10 ක් කරපු ව්‍යාපෘතියට අනුමැතිය දෙන්න. ඡන්ද කාලයට විතරක් කරපු දෙයක් නොවෙයි. දහවැනි අවුරුද්ද තමයි මේ කරන්නේ මම. ලක්ෂ 10 ක් වෙන් කළේ. වහාම මේ පිළිබඳව තමුන්නාන්සේ අවධානය යොමු කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට දුන්නෙත් නැහැ. මමත් හැමදාම කරනවා නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera- Chief Opposition Whip

ගරු මහ ඇමතිතුමා ඔබතුමා අනුමැතියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඒ සාධාරණ ඉල්ලීමක් කරන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera- Chief Opposition Whip

සාධාරණ ඉල්ලීමක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම අවුරුදු 08 ක් ඔය ව්‍යාපෘතිය කරනවා. ශිෂ්‍යත්ව පෙරහුරුව ගාමිණී තිලකසිරි ගරු ඇමතිතුමා කරනවා. උපාලි ගුණරත්න ගරු මන්ත්‍රීතුමා කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera- Chief Opposition Whip

හැන්සාඩ් ගත වෙන්න කියන්න. නැත්නම් වෙන්නේ නැහැ නේ?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

මම කිව්වා නේ දෙන්නම් කියලා. මම කිව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙනවා. ප්‍රශ්නයක් නැහැ. ගරු මන්ත්‍රීතුමන්ලා අර කලින් පැන නැගුණු ප්‍රශ්නය සම්බන්ධයෙන් පොඩි රීති ගැටලුවක් තිබෙනවා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා යෝජනා කළා අදාළ නිලධාරීන් අවදි කාරක සභාවට ගෙන්වන්න කියලා. නමුත් මුදල් අවභාවිතාව සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නොමැති නිසා අපට සිද්ධ වෙනවා එහෙමනම් ඒ නිලධාරීන් සභා කටයුතු කාරක සභාවට කැඳවන්න. මොකද පොඩි රීති ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, අවදි කාරක සභාවට සාමාන්‍යයෙන් කැඳවන්නේ මුදල් අවභාවිත සම්බන්ධයෙන් වැරැදිවලට ලක් වුණු නිලධාරීන්. නමුත් වාහනය පාවිච්චි කරපු එක තමයි මෙතැන වැරැද්දක් වශයෙන් සිද්ධ වෙලා

තිබෙන්නේ. ඒ නිසා අපි ඔවුන්ව සභා කටයුතු කාරක සභාවට කැඳවන්න බලාපොරොත්තු වෙනවා.

අමාත්‍යාංශ නිවේදන/ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ යටතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවස්ථාව ඔබතුමාගේ ප්‍රකාශය ඉදිරිපත් කිරීමට.

## අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

MINISTRIES' ANNOUNCEMENTS / MINISTERS' STATEMENTS

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ගරු සභාපතිතුමනි, කසළ කළමනාකරණය පිළිබඳව පසුගිය කාලසීමාව තුළ විවිධ කථාබහට ලක් වුණා. ඒ අනුව මෙගා පොලිස් ආයතනයත්, ඒ වාගේම රජයේ විවිධ ආයතන කිහිපයකුත් මේ සඳහා මැදිහත් වෙලා තිබුණා. මේ පිළිබඳව පළාත් සභාව හැටියට, විශේෂයෙන්ම පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට මම පත් වෙන වෙලාවේදීම කිව්වා, මේ රටේ තිබෙන කැළිකසළ ප්‍රශ්නය මම විසඳනවා කියලා. ඒ අනුව අපේ වැඩ සටහන් අපි ක්‍රියාත්මක කරගෙන ගියා. ඒ වාගේම පසුගිය කාලවලදී විදේශ අයෝජකයන් විශාල පිරිසක් මේ පිළිබඳව සොයා බැලීමට මේ රටට පැමිණිලා තිබුණා. නමුත් ඒ අය විවිධ යෝජනා ඉදිරිපත් කර තිබුණත්, ඒ අයට මේ රටත් සමඟ මැදිහත් වෙලා කසළ කළමනාකරණය විධිමත් විධියට කරන්න පුළුවන් පසුබිමක් නිර්මාණය වෙලා තිබුණේ නැහැ. ඒ අයට විවිධ බාධකවලට, විවිධ හේතූන්වලට මුහුණ දෙන්න සිදු වුණා. සමහර විදේශ ආයෝජකයන් ප්‍රවීණයන් වුණත් අපේ ප්‍රධාන ව්‍යාපෘතිවලට මැදිහත් වෙන්න කැමති වුණේ නැහැ. ඒ පිළිබඳව තිබුණු විවිධ බාධක නිසා. කොහොම නමුත් පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට මම පත් වුණාට පස්සේ, ඒ සියලු දෙනාගේ විශ්වාසය දිනාගෙන කසළ කළමනාකරණ අධිකාරියත්, අපේ ගරු මන්ත්‍රීවරුත් අපත් විවිධ වැඩ සටහන් හැදුවා. අද මේ වන විට ඒ පිළිබඳව අපට රුපියලක්වත් වියදම් නොවන විධියට, නමුත් ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් සභාවේ කසළ කළමනාකරණ අධිකාරියට ආදායමක් ලැබෙන විධියට ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න පසුබිමක් අප නිර්මාණය කරලා තිබෙනවා. මේ පිළිබඳව පසුගියදා අතිගරු ජනාධිපතිතුමා පළාත් සභාවල මහ ඇමතිවරුන්, කැබිනට් මණ්ඩලය කැඳවපු වේලාවේදී මේ පිළිබඳව සාකච්ඡා කළා. ගරු අගමැතිතුමා, කැබිනට් ඇමතිවරු මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කළා. එහිදී මම පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට කැබිනට් මණ්ඩලයට පැහැදිලි කළා, මේ ප්‍රශ්නයට විසඳුමක් අපට ලබා දිය හැකියි. ඒ සඳහා සුදුසුකම් තිබෙන අය අපත් එක්ක ඉන්නවාය කියලා. ඒ අනුව කැබිනට් මණ්ඩලයේ තීන්දුව වුණේ, මේ වැඩේ කවුරු හරි කරන්න පුළුවන් කෙනෙක් ඉන්නවා නම් ඒක කරන්න ඕනෑය කියන එකයි. ඒ අනුව පසුගිය දිනක අතිගරු ජනාධිපතිතුමා මට කථා කරලා කිව්වා, මේ ව්‍යාපෘතිය - විශේෂයෙන්ම මීතොටමුල්ල ප්‍රධානව මේ කසළ කළමනාකරණය පිළිබඳව ඉක්මන් පියවරක් ගන්නය කියලා. ඒ අනුව මම කොළඹ නගරධිපතිතුමාවත්, අවශේෂ නිලධාරිනුත් කැඳවලා පැහැදිලි කිරීමෙන් අනතුරුව මීතොටමුල්ල කසළ අංගනය අපට ලබා දෙන්න කොළඹ නගර සභාව එකඟ වුණා. බස්නාහිර පළාතේ කසළ කළමනාකරණ අධිකාරියට. ඒ අනුව අපි එළැඹෙන පස් වැනිදා මීතොටමුල්ලේ ඒ කුණු කන්ද පිළිබඳ වගකීම අපි භාර ගන්නවා. අපට ඉදිරිපත් වුණු ආයෝජකයන් අතුරින් එක් ආයෝජකයෙක් අප දැනටමත් තෝරාගෙන තිබෙනවා. ඒ අනුව අපි අදාළ වැඩ කටයුතු මේ එළැඹෙන පස් වැනිදා උදේ 09.30 ට මීතොටමුල්ලේදී පටන් ගන්නවා. ඒ අවස්ථාවට සම්බන්ධ වෙන්නය කියලා මම ගරු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා. අපි පළමුවෙන්ම දැනට කොළොන්නාවේ ජනතාව පීඩා විඳින ඒ දුර්ගන්ධය වහාම නතර කරන්න අවශ්‍ය කරන මූලික පියවර අපි පස් වැනිදායින් පස්සේ ගන්න තීන්දු කරලා තිබෙනවා.

ඒ වාගේම ඒ අදාළ ආයෝජකයන් එක්ක අපි ගිවිසුමකට එළැඹිලා මාස තුනකින් ඒ අවශ්‍ය උපකරණ සවි කරන්නත්, මාස හයකින් දැනට කන්දක් හැටියට තිබෙන කුණු ගොඩ දවසට ටොන් 4000 බැගින් සුද්ධ කරලා එයින් කාබනික පොහොර ලබා ගන්නටත්, ඒ වාගේම විදුලිය ජනනය කරන්නත් අවශ්‍ය කටයුතු අපි භූමිය තුළදී සිද්ධ කරන්න බලාපොරොත්තු වෙනවා. මොකද, දැනට තිබෙන කුණු කන්ද අපේ පරිසරයට විශාල බලපෑමක් කරනවා. විශේෂයෙන්ම කැලණි ගඟට ඉතාමත්ම ආසන්නයේ තිබෙන්නේ. ඒක මහා බරපතළ ජාතික, පාරිසරික විනාශයකට පෙළඹෙමින් තිබෙනවා. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, මේ පළාත් සභාව නියෝජනය කරන සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේත්, ඒ වාගේම මේ සභාවෙන් පිටත ඉන්න සියලුම මහජනතාවගෙනුත්, වගකිවයුත්තන්ගෙනුත්

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

මේ ව්‍යාපෘතිය සාර්ථක කරගන්න අවශ්‍ය සහයෝගය බස්නාහිර පළාත් සභාවට ලබා දෙන්නය කියලා. ඒ අනුව ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් කොරියාවේ ගිහින් අත්හදා බලා තිබෙනවා. ව්‍යාපෘති පරීක්ෂා කරන්න යැව්වා. ඒ ව්‍යාපෘතිය අපේ රටේ ක්‍රියාත්මක කරන්නට සුදුසුයි කියලා ඒ අයත් ඒකට එකඟතාවය පළ කරලා තිබෙනවා. ඒ නිසා මම දැනුවත් කරනවා, මේ පිළිබඳව උනන්දුවක් තිබෙන ගරු මන්ත්‍රීවරු පස් වැනිදා උදේ 09.30 ට මීතොටමුල්ලට එන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ ආසනය නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂවල ගරු මන්ත්‍රීවරුන්ට අපි මේ පිළිබඳව දැනුම් දෙනවා. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත්, ඒ වාගේම කැබිනට් මණ්ඩලයටත් මම ස්තුතිවන්ත වෙනවා. අප කෙරෙහි විශාල විශ්වාසයක් තියලා මේ වගකීම සහ මේ වගකීමට වඩා අපි විශේෂයෙන්ම දැන ගන්න ඕනෑ. කසළ කළමනාකරණය පිළිබඳව තීන්දු තීරණ ගත හැක්කේ පළාත් සභාවට විතරයි. කසළ කළමනාකරණ අධිකාරියට විතරයි. ඒ අනුව එම වගකීම අපට භාර දීම පිළිබඳව අපි ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත්, කැබිනට් මණ්ඩයටත් මගේ ස්තුතිය පුද කරනවා. මේ වන කොට ජනාධිපතිතුමා මේකට පරිසර අධිකාරියේ සභාපතිතුමා ප්‍රමුඛ අවශේෂ නිලධාරීන් ද දැනුවත් කරලා තිබෙනවා, මහ ඇමතිතුමාත් එක්ක සම්බන්ධ වෙලා මේ ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කරන්නය කියලා. බොහොම ස්තුතියි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

තෝරාගෙන තිබෙන රට කොහේද?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

බ්‍රිතාන්‍යය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට න්‍යායපත්‍රයානුකූලව තිබෙන්නේ පෞද්ගලික පැහැදිලි කිරීම්. ඒ අනුව රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් ලබා දෙනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සභාවේ අවධානයට යොමු කරනවා. විශේෂයෙන් ගරු මහ ඇමතිතුමාගේ. මීගමුව මහ නගර සභාව විසින් ව්‍යාපෘතියක් ආරම්භ කරන්න ලක ලැහැස්ති වෙනවා. මිලියන 164 ක වාණිජමය පහසුකම් සහ පුස්තකාලයකින් සමන්විත වුණු ගොඩනැගිල්ලක්. ඊට පෙරාතුව මම මීගමුව මහ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සඳහන් කරන්න ඕනෑ. මේ වෙද්දී AD ලෝන් දෙකක් අරගෙන තිබෙනවා. ඒ වාගේම ඒවා ගෙවීමේදී එක ණය මුදලක වාරික ගෙවීම පැහැර හරිමින් තමයි නඩත්තු කරගෙන යන්නේ.

ඒ වාගේම මහ නගර සභාවේ බදු ගෙවන ජනතාවගේ ප්‍රධාන අවශ්‍යතාවයන් තුනක් තිබෙනවා. මළඅපහරණ පද්ධතිය මේ වෙද්දී අක්‍රියයි. කුරණ කියන ගම්මානයේ මනුෂ්‍යයන්ට දරුවන්ට ජීවත් වෙන්න බැහැ. මැස්සන්ගෙන් ඒ සමාජය, ජන ජීවිතය සම්පූර්ණයෙන්ම අඩාල වෙලා තිබෙනවා. දෙවැනි එක, කසළ කළමනාකරණය අන්තිමයි. මීගමුවේ බදු ගෙවන ජනතාව අවස්ථා දෙක තුනකදී පාරට බැස්සා. ඕවිටියා වත්තට කසළ බාන්නේ මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ තීන්දුවක් මත. මීගමුවේ සෞඛ්‍ය නිලධාරීන් මහේස්ත්‍රාත් අධිකරණයට ගෙන්නලා කාල සටහනක් හදලා අධිකරණයට කරුණු වාර්තා කරමින් තමයි කුණු ටික ඇදගෙන යන්නේ. තුන්වැනි එක, ආදාහනාගාරය. මේ වෙද්දී අක්‍රියයි. මළ මිනී වෙනත් නගරයකට ගෙනියනවා. මේ වාගේ පළාත් පාලන ආයතනයකින්, මීගමුව මහ නගර සභාවේ ජනතාව පීඩාවෙන් ගලවා ගැනීමට කටයුතු නොකොට මේ වාගේ දැවැන්ත අවශ්‍යතාවයන් තුනක් තිබෙද්දී මිලියන 164 ක් වියදම් කරලා පවරා ගත්තු ඉඩමක පුස්තකාලයක් ගොඩනඟන්න හදනවා. මේ කඩිමුඩියේ මෙය සූදානම්

කරලා, කඩිමුඩියේ මේකට ටෙන්ඩර් කැඳවලා, කඩිමුඩියේ මේක දෙන්න හදද්දී, මේ වෙද්දී විරසක වෙලා හිටපු නියෝජ්‍ය නගරාධිපතිවරයාත්, නගරාධිපතිවරයාත් දෙන්නම කේජු කැල්ල කන්න ගිජු වෙලා බොහොම මිත්‍රශීලාවෙන් කටයුතු කරනවා. මහ ඇමතිතුමාගේ නමත් දැලි ගෑවෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. පුස්තකාල ගණනාවක් මහ නගර සභාව විසින් මේ වෙද්දී පාලනය කරගෙන නඩත්තු කරගෙන යනවා. එහෙම යද්දී මේ කඩිමුඩියේ ලබන අවුරුද්ද මුල පළාත් පාලන ආයතන විසුරුවන්න තිබෙද්දී මේ මිලියන 164 ක් නගර සභාවේ සල්ලි නැති වෙලාවක බස්නාහිර පළාත් සභාවෙන් 80% ක් ණයක් අරගෙන ඉතිරි 20% නගර සභාවෙන් දාලා මේ ගොඩනැගිල්ල හදන්න හදන්නේ. දැවැන්ත අක්‍රමිකතාවයක් මේකේ තිබෙනවා. ඒ නිසා ගරු මහ ඇමතිතුමා විෂයය භාර අමාත්‍යවරයා හැටියට මම එතුමාගේ අවධානය යොමු කරනවා. මේක සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරලා කමිටුවක් පත් කරලා - මේ පුස්තකාල ගොඩනැගිලි හදන්න එපා කියලා අපි කියන්නේ නැහැ. මොකද හේතුව ඒක පවරාගත්තු ඉඩමක්. ඒ පවරා ගත්තු ඉඩමේ නිශ්චිත කාර්ය භාරය නොකළා නම් - මේක දැන් අවුරුදු ගණනකට ඉස්සෙල්ලා පවරා ගත්තේ. චන්ද්‍රිකා මැතිනිය ජනාධිපති ධූරය දරද්දී මේ ගොඩනැගිල්ල හදන්න දුන්නා. නමුත් ඒ අය අකාර්යක්ෂම නිසා, සැලැස්මක්, වැඩපිළිවෙළක් නොතිබුණු නිසා ඒ මුදල් අනුරාධපුරයේ පුස්තකාලයකට ගියා. දැන්, මේ ණයක් අරගෙන හදන්න හදන්නේ මොන හේතු මතද කියන එක ප්‍රශ්නයක්.

ඒ නිසා අපි කියනවා, මේ වාණිජ ගොඩනැගිල්ලක් සමග හදන්නේ නැතිව - පුස්තකාලය හදන්න අවශ්‍ය නම් මිලියන 30 ක්, 40 ක් වියදම් කරලා මේ පුස්තකාලය ගොඩනගන්න. ඒ නිසා මේක මම දැඩිව, මම ආසනයේ සංවිධායකවරයා හැටියටත්, පළාතේ මන්ත්‍රීවරයා හැටියටත්, මම විෂයය භාර අමාත්‍යවරයාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේක දැන් ටෙන්ඩර් කරලා ඉවරයි. මේක ගිහිල්ලා තිබෙන්නේ සුමනසේකර කන්ට්‍රැක්ෂන් කියන ආයතනයට. Vat සහිතව මිලියන 157 ක්. මේ තිබෙන්නේ හෙට පවත්වන මහ නගර සභාවේ මුදල් කාරක සභාවේ වාර්තාව. මම ඉතාමත්ම ගෞරවයෙන් මේ සභාවෙන් ඉල්ලනවා. මේ සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කරලා මේ පළාත් පාලන ආයතනය තුළින් කරන්න යන මේ දූෂිත ක්‍රියාව නතර කරලා ඒ අය නිවැරදි මාර්ගයට ගන්නය කියලා. මොකද, බස්නාහිර පළාත් සභාව රැකෙන්නේ, ආරක්ෂා වෙන්නේ ඒ පළාත් පාලන ආයතනවලින්. මේක මීගමුව මහ නගර සභාව. ඒ නිසා දුක් විඳින, පීඩාකාරී ලෙස ජීවත්ව ජනතාවගේ ප්‍රධාන කරුණු වන මළ අපහරණ පද්ධතිය, කුණු කළමනාකරණය සහ ආදාහනාගාරය කියන ඒ කරුණු කාරණා ටික පිළිසකර කරලා, ජනතාව පීඩාවෙන් ගැලවීමට කටයුතු කරන ලෙසත්, මේ දැවැන්ත ණයකට යන මෙම ව්‍යාපෘතිය ගැන සලකා බලන්න කියලා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලමින් කාලවේලාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අධ්‍යාපන ගරු ඇමතිතුමා එළියට යන්න ගිය වෙලාවේ නතර කර ගත්තේ එතුමාට බලපාන ප්‍රශ්නයක් සම්බන්ධව මෙම ප්‍රකාශය සිදු කරන නිසා. එතුමාත් යම් පිළිතුරක් දෙනවා නම් හොඳයි. මේ සභාවේ මීට පෙර ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමතිතුමා අධ්‍යාපන ඇමතිතුමා හැටියට කටයුතු කරන කාලයේ ගුරුවරුන් බඳවා ගැනීමේදී යම් ක්‍රමවේදයක් තිබුණා. විශේෂයෙන්ම උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීමේදී. අද ඒ තත්ත්වයට මොකද වෙලා තිබෙන්නේ කියන එක ගැන අපට ප්‍රහේලිකාවක්. පසුගිය කාලයේ ගුරු හිඟය ඇති වන කොට ඒ පොරොත්තු ලේඛනයේ හිටපු උපාධිධාරීන්ව මාස දෙක, තුන වාගේ කාල සීමාව තුළදී නියමිත පටිපාටිය අනුව බඳවා ගත්තා. නමුත් අද වන කොට ඒක ඇණහිටලා තිබෙන තත්ත්වයක් තමයි පෙනෙන්නේ. දැන් පසුගිය දවසක චෝදනාවක් ආවා, 2014 දී උපාධිය ලබපු අය ශ්‍රාවස්තියේ ලියාපදිංචි වෙන්න ගියාම බොහොම නරක විදියට නිලධාරීන් කථා කරලා, එහෙම ලියාපදිංචි කිරීමක් කරන්නේ නැහැ. ඒ නිසා කරුණාකර යන්න කියලා එළවලා තිබෙනවා. එතකොට ඒ ඇවිල්ලා අපට මේ පිළිබඳව කරුණු කියන කොට අපි දැන ගන්න ඕනෑ, ඉස්සෙල්ලා මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. ඒ නිසා මේ වේලාවේ ඔබතුමාගේ මාර්ගයෙන් පළාත් අධ්‍යාපන ගරු ඇමතිතුමාගෙන් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලනවා. මේ ගුරු පත්වීම් ලබා දීම පිළිබඳව, උපාධිධාරී ගුරු පත්වීම් විතරක් නොවෙයි. අනිකුත් පුරප්පාඩු තිබෙන ගුරු පත්වීම් ලබා දීමේදී අනුගමනය කරන, දැනට ක්‍රියාත්මක කරන ප්‍රතිපත්තිය මොකක්ද කියලා. අඩු ගණනේ ඒක අපිවත් දැන ගන්න ඕනෑ. ඒක පළමුවැනි කාරණාව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යහපාලනය.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ සභාවේ යහපාලන ප්‍රතිපත්තිය නැහැයි කියලා ගරු ප්‍රධාන ඇමතිතුමා කිව්වා. ඒක නිසා අපි ඒ ප්‍රතිපත්තියට නැහැ. ඉතින් අපිත් එක්ක එහෙම ගනුදෙනුවක් නැහැ නේ? ඉතින් ඒක නිසා යහපාලන ප්‍රතිපත්තියක් මේකේ නැහැ නේ? දෙවැනි කාරණාව, අනධ්‍යයන සේවකයින් බඳවා ගැනීම. දැන් පසුගිය දවසක මධ්‍යම රජයේ ජාතික පාසල්වලට තුන් සියයක් විතර අනධ්‍යයන කාර්ය මණ්ඩලයට බඳවා ගත්තා. නමුත් අපි මේ පළාත් සභාව ඇතුළේ කම්කරු පත්වීමක් දීගන්න බැරිව, මුරකරුවෙකුට පත්වීමක් දීගන්න බැරිව, කාර්යාල කාර්ය සහයෙකුට පත්වීමක් දීගන්න බැරිව අවුරුදු ගණනාවක් තිස්සේ හිර වෙලා ඉන්නවා. මේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කරන්න ඕනෑ. එක්කෝ පුළුවන්ද? බැරිද? එක්කෝ මධ්‍යම රජයත් එක්ක ගැටීමක් තිබෙනවාද? එහෙමත් නැත්නම් මේ තිබෙන ක්‍රමවේදයේ මොකක් හරි, මේවා අපි කියන්නේ නැහැ මන්ත්‍රීවරු අතර බෙදන්න ඕනෑය කියලා. නමුත් කොහොම හරි මේ පාසල්වලට උවමනා කරන අඩුපාඩු සම්පූර්ණ කරන්න ඕනෑ. මේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය නැතිව අද දෙමව්පියන් පාසල්වලට සේවකයින් ආලා ඔවුන්ගේ වැටුප දෙමව්පියන් විසින් ගෙවනවා. ආදි ශිෂයයන් ගෙවනවා. මේක එච්චර හොඳ ක්‍රියාදාමයක් නොවෙයි. ඉතින් ඒක නිසා මේ ප්‍රශ්නවලට කඩිනම් විසඳුමක් ඕනෑ. දැන් 2016 අවුරුද්දෙත් මැදක් වනතුරු ඇවිල්ලා තිබෙනවා. අද වනතුරු මේ ප්‍රශ්නයට තවම විසඳුමක් දෙන්න බැරිව ගියා. උපදේශක කාරක සභාවේ මේක කථා කරන්න ගියොත්, උදේ පටන් ගත්තාම හැන්දෑව වනතුරුම උපදේශක කාරක සභාව යනවා. අධ්‍යාපන විෂයයවත් ඉවර කරගන්න බැහැ. ඊට පස්සේ ආයේ වෙනම දවසක අනික් විෂයයන් ගැන දානවා. ඉතින් ඒක නිසා මේ වැඩ පිළිවෙළ පිළිබඳව - අපි ඔබතුමාත් එක්ක අමනාප නැහැ. ඔබතුමා දක්ෂ පුද්ගලයෙක්. නමුත් මෙය ක්‍රියාත්මක කිරීමේදී මීට වඩා වේගවත් වෙන්න ඕනෑය කියන එකයි මම මේ කියන්නේ. දැන් ප්‍රශ්නයක් නැගුණා නේ? යහපාලනය කියලා. යහපාලනය කියලා කියන්නේ, අපි මේ ඇමතිවරුන්ට කැමැතියි. තමුන්නාන්සේලා අකමැති වුණාට. නමුත් මේක ඇතුළේදී මේ කාර්ය භාරය හරියට සිද්ධ වෙන්නේ නැත්නම් අපේ විපක්ෂයේ කාර්ය භාරය අපට කරන්න සිද්ධ වෙනවා. අනිවාර්යයෙන්ම කරන්න සිද්ධ වෙනවා. ඒක නිසා ඔබතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ පිළිබඳව යම් ප්‍රකාශයක් කරන්නය කියලා.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රීතිය අනුව - මම කනගාටු වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දීර්ඝ වශයෙන් අවස්ථාව දෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම අතිශයින් කනගාටු වෙනවා. රීති සංග්‍රහය අද සභාවේ භාවිතා වෙන්නේ හරිම අවම විධියට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවස්ථාව දෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේ රීති සංග්‍රය උල්ලංඝණය වුණු අවස්ථා අදටම හය හතක් තිබෙනවා. හැමදාම තිබෙනවා. මමත් මූලාසනයේ හිටපු කෙනෙක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ නිසා සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට ඒකට පස්සේ අවස්ථාව ලබා දෙන්නම්. පිළිතුරු ලබා දෙන්නම්.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම සමාව ඉල්ලනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමාට විනාඩි තුනක අවස්ථාවක් ලබා දෙනවා.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමාවෙන්න. මම ලබන සභා වාරයට කලින් එතුමාට පැහැදිලි කිරීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු සභාපතිතුමා මෙතැන සිටියා නම් ඇත්තටම අවස්ථාව දෙනවා. මොකද එතුමාත් මේ පිළිබඳව දැඩි උවමනාවකින් ඉන්නවා. ඒ නිසා ඔබතුමා ඒ අවස්ථාව දෙන්න. මේ සභාවේ අද පටන් ගත්තු වෙලාවේ ඉඳලා කොපමණ නීති රීති උල්ලංඝණය කෙරුවාද? රීති උල්ලංඝණය කෙරුවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සිරිකමල් ගරු මන්ත්‍රීතුමා, අවස්ථාව දීම නොවෙයි ගැටලුව. මෙතුමාට ඒක ක්ෂණිකව කථා කරන්න පුළුවන්කමක් නැහැ.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම උත්තර දෙනවා. හැබැයි මම ඉල්ලීමක් කරනවා. මීට පසු සභාවලදී රීතිය උල්ලංඝණය කරලා අපට නියෝග පනවන්න එපා. අද අවසන් දවස සේ සළකා කටයුතු කරන්න. මොකද, රීති කඩලා මට කථා කරන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සිරිකමල් ගරු මන්ත්‍රීතුමා, විනාඩියකින් දෙකකින් උත්තර දෙන්න බැහැ නේ.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම එතුමාට අදට උත්තර දෙනවා. හැබැයි, ඔබතුමාගේ අවසරය මත. නමුත් ඔබතුමා මීට පස්සේ, මම ඉල්ලීමක් කරනවා. අපට එහෙම නියෝග කරන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කෙටියෙන් කියන්න.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

රීති කඩලා කථා කරන්න බැහැ. ප්‍රශ්නයක් තිබෙනවා. මෙතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. එතුමා ඒක දන්නවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කෙටියෙන් කියන්න.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගුරුවරුන් බඳවා ගැනීම සම්බන්ධව කඩිනම් ක්‍රියාමාර්ගයක් ගනිමින් සිටිනවා. ඇත්ත වශයෙන්ම ගුරු පුරප්පාඩු නැහැ. ගුරු පුරප්පාඩු පවතින්නේ, පත්වීම් ලබා දීලා දැනට ප්‍රසූත නිවාඩු මේ වන විට 1462 ක් තිබෙනවා. විදුහල්පති පුරප්පාඩු 449 ක් තිබෙනවා. එතකොට පන්ති කාමරයේ ගුරුවරයෙක් තමයි විදුහල්පති පුටුවට යන්නේ. ඒ පුරප්පාඩු ටිකත් මේකට එකතු වෙනවා. ඒ වාගේම ගුරු උපදේශකවරු 722 ක් ඉන්නවා. ඒ වාගේම සතියේ සිට අවුරුදු 03 දක්වා නිවාඩු ලබලා විදේශ ගත වුණු අය 600 ක් විතර ඉන්නවා. විවිධ තැන්වලට අනුයුක්ත වුණු ගුරුවරුන් ඉන්නවා. මේ ආදී වශයෙන් සැබෑ විධියට පන්ති කාමරයේ නැති ගුරුවරු 4300 ක් විතර ඉන්නවා. ඉතින් අපි මේ කාරණාව ඉතාම හොඳින් මේ අදාළ ආයතනත් එක්ක කථා කරලා, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවත් එක්ක කථා කළා. ගරු ආණ්ඩුකාරතුමාත් එක්ක පැය තුනහමාරක් මේ ප්‍රශ්නය සහ තවත් වැදගත් ප්‍රශ්න කිහිපයක් ගැන අපි කථා කළා. යහපත් තීන්දුවකට ආවා. ඒ අනුව එතුමාගේ එකඟතාවය මත අපට ගුරුවරුන් 450 ක් බඳවා ගන්න පළමු කොට ඉඩකඩ සලසා දුන්නා. දැන් මේ මැයි මාසය අවසන් වන විට ඒ ගුරුවරුන් 450 බඳවා ගන්න කටයුතු කරනවා. ඒ වාගේම මතක් කරන්න ඕනෑ. 2016/1 චක්‍රලේඛය අනුව අපි විධිමත් ක්‍රියා මාර්ග රාශියක් ගනිමින් ඉන්නවා. දැන් 80% ක් විතර වැඩ අවසන්. ඒ යටතේ ගුරුවරුන් තවත් 1500 ක් විතර ගන්න පුළුවන්කම ලැබෙනවා. 2016/1 චක්‍රලේඛයෙන් කියැවෙන්නේ කොපමණ පුරප්පාඩු තිබුණත් වෙනත් ස්ථානවලට අන්තර්ග්‍රහණය හෝ වෙනත් සේවාවන්වලට යොමු වී තිබුණත්, පන්ති කාමරයට

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

ගුරුවරයෙක් ලබා දීම තමයි වගකීම කියන එක. ඒ කාරණාව සම්බන්ධව අපි ජයග්‍රහණය කරලා තිබෙනවා. අපි හිතනවා මාස දෙකකදී විතර ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නයට සාධාරණ උත්තරයක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා. පවත්නා චක්‍රලේඛ සහ නීතිරීති අනුව මම ඉතාම කැපවීමෙන් සහ නිවැරැදිව මේකට කටයුතු කරමින් සිටිනවා.

ඒ වාගේම සමාන්‍ය සේවකයින් ගැන කථා කළා. ගිය කාල වකවානුවේ ප්‍රමාණයට වඩා වැඩිපුර බඳවාගෙන. මම හිටපු අය ගැන කවදාවක්වත් විවේචනය කරන්න කැමැති නැහැ. නමුත් මේ අහන නිසා කියන්නේ. ප්‍රමාණය ඉක්මවා බඳවාගෙන. මතුගමත් ගම්පහ දිස්ත්‍රික්කයේ ළමයින් ඉන්නවා. ඉතින් මම ඒවා මෙපමණ කලකට කියන්න ගියේ නැහැ. මේ මේ අහලා, අහලා අවසාන වශයෙන් මම වැරැදියි කියලා මාව ගස් බඳින කොට මට කියන්න වෙනවා. එතකන් මම කියන්නේ නැහැ. මම එහෙම පුරුදු වෙලා නැහැ. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් හැටියට.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

දැනුවත් වෙන්න කියන්න.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

දැනුවත්වීමට තමයි මේ කියන්නේ. මගේ දිස්ත්‍රික්කයේත් ඉන්නවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, සෑහීමකට පත් වෙනවාද?

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

විනාඩියක් දෙන්න. ඒ නිසා අපි මේ වනකොට තොරතුරු රැස් කරමින් ඉන්නවා. ඒ සම්බන්ධව කළමනාකරණ දෙපාර්තමේන්තුව -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කුළියාපිටියේ අය අනුරාධපුරයේ ඉන්නවා වාගේ. ජාතික පාසල්වල.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔව්. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවත් එක්ක කථා කරමින් ඉන්නවා. මම හිතනවා ඔබතුමාටත් සාධාරණ උත්තරයක් මාස දෙකකදී විතර අපට ලබා දෙන්න පුළුවන්කම ලැබෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. මීළඟට මංජුල ප්‍රසන්න ගරු මන්ත්‍රීතුමාට විනාඩි 03 ක අවස්ථාවක් ලබා දෙනවා.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු මහ ඇමතිතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමනි, මම හිතනවා විශේෂයෙන්ම බියගම කොට්ඨාශයේ කඳුබොඩ මහා විද්‍යාලය පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. කඳුබොඩ මහ විද්‍යාලය දීර්ඝ කාලයක් අපේ ප්‍රදේශයට විශාල සේවාවක් කරපු අධ්‍යාපන මධ්‍යස්ථානයක්. ඒ කඳුබොඩ පාසලේ විදුහල්පතිතුමියට විරුද්ධව පෙත්සම් ප්‍රදේශයේ මහජනතාව විටින් විට අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළා. මේ ඉදිරිපත් කළාට පස්සේ, අපි පසුගිය කාලයේ ව්‍යූහ කමිටුවේත් සාකච්ඡා කළා. මේ විදුහල්පතිතුමියට විරුද්ධව කැලණිය අධ්‍යාපන කලාප කාර්යාලයෙන් පරීක්ෂණයක් කළා. මම හිතන්නේ, ඒ පරීක්ෂණයේ ප්‍රතිඵලය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට යොමු කරලා තිබෙනවා. 2016.03.11 වැනිදා කැලණි කලාප අධ්‍යක්ෂතුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාට ලිපියක් එවලා තිබෙනවා. මේ විදුහල්පතිතුමිය සම්බන්ධයෙන් කරපු පරීක්ෂණයේ වාර්තාව යොමු කරලා. මම ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මෙම විදුහල්පතිතුමියට විරුද්ධව කරපු පරීක්ෂණයේ ප්‍රතිඵලය කුමක් වුණත් මේ විදුහල්පතිතුමිය හොඳ නම් ඒක හොඳයි. නරක නම් නරකයි. මාස හතරක් ගිහින්. හැකි ඉක්මණින් ඔබතුමා මැදිහත් වෙලා මේ කඳුබොඩ මහ විද්‍යාලයේ ගැටලුවට විසඳුම් ලබා දෙන්නය කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ එක්කම විශේෂයෙන්ම කථා කරන කොට ගරු ඇමතිතුමනි, පාසල්වලට ළමයින් ඇතුළත් කර ගැනීම. මේ හැම එකකටම,පසුගිය කාලයේ වුණු දේවල්වලට

ඔබතුමාට වගකීම භාර ගන්න බැහැ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ පසුගිය අවුරුදු කිහිපය තුළම බස්නාහිර පළාත අපි කොපමණ දියුණුයි කිව්වත් ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි, ගරු මහ ඇමතිතුමනි. මේ අධ්‍යාපන ක්ෂේත්‍රය ජරා ජීර්ණ වෙලා තිබෙන්නේ. ඒ පිළිබඳව සම්පූර්ණ වගකීම ඔබතුමාට පැවරෙන්නේ නැහැ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉන්න නිලධාරී මහත්වරු වග කියන්න ඕනෑ. විශේෂයෙන්ම පසුගිය කාලයේ බියගම මැතිවරණ කොට්ඨාශයේ විශාඛා බාලිකා විද්‍යාලය - මේ විද්‍යාලය හැදුවේ රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා. මේ විද්‍යාලයට සමහර වේලාවට අපි ළමයෙක් ඇතුළත් කරගන්න ගියාට පස්සේ, ගරු ඇමතිතුමනි ඔබතුමා කොපමණ උත්සාහ කළත් 2016.02.09 වැනිදා මම මෙම ලිපි සභාගත කරනවා. මේ ඉස්කෝලයට ළමයෙක් දාගන්න ගියාට පස්සේ - අපි මහජන නියෝජිතයන් වශයෙන් අපේ ගෙවල්වලට උදේ පාන්දර මිනිස්සු එනවා.

මම නියෝජනය කරන්නේ බියගම ආසනය. ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රුවන් විජේවර්ධන මැතිතුමා, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා බියගම ආසනය නියෝජනය කරන්නේ. නමුත් දෙවැනි මාසයේ නව වැනිදා විශාඛා බාලිකා විද්‍යාලයට ළමයින් පස් දෙනෙක් 2 වසරට දාලා තිබෙනවා. අපි ගියාම පළාත් අධ්‍යක්ෂතුමා කියනවා, 46 සීමාවට ලියුම් දෙන්නේ නැහැයි කියලා. නමුත් 45 සීමාවට අරන් ගියාම ගන්නේ නැහැයි කියනවා. නමුත් 46 සීමාවට එක දවසේ, 2016.02.09 වැනිදා විශාඛා බාලිකා විද්‍යාලයට ළමයින් පස් දෙනෙක් දාලා තිබෙනවා. මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලීමක් කරනවා. ගරු මහ ඇමතිතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරනවා. ගරු ඇමතිතුමනි, සාධාරණයක් ඉෂ්ට කරන්න. මෙතැන ගුණසිරි ජයනාත් මැතිතුමා ඉන්නවා. එතුමා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. අපි කැමැතියි. එතුමාට විශාල ප්‍රමාණයක් දෙන්න. නමුත් අපටත් යම්කිසි සාධාරණයක් කරන්න. මේ දේශපාලන බලධාරීන් වශයෙන්, මහජන නියෝජිතයන් වශයෙන් අපේ මහජන කාර්යාලවලට අපි ළඟට මිනිස්සු එනවා. විශාඛා බාලිකා විද්‍යාලයට ළමයෙක් දාගන්න, බියගම කණිෂ්ට විද්‍යාලයට ළමයෙක් දාගන්න, දරණගම සෝභිත විද්‍යාලයට ළමයෙක් දාගන්න අපට බැහැ. නමුත් ඔබතුමා යම්කිසි උත්සාහයක් දැරුවා. ඔබතුමාට ස්තුති කරනවා. නමුත් මේ අධ්‍යාපනයේ ඉන්න නිලධාරී මහත්වරු ඔබතුමන්ලා ගන්න තීන්දු ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒ නිසා ගරු අධ්‍යාපන ඇමතිතුමා, ගරු මහ ඇමතිතුමා ඊළඟ වර්ෂයේදී - 2016 ට තවම ළමයින් ඇතුළත් කරගෙන නැහැ. අපි ඉල්ලීමක් කරනවා. බියගම මැතිවරණ කොට්ඨාශයේ පාසල්වලට දාන කොට ගුණසිරි ජයනාත් මැතිතුමාට වැඩිපුර දුන්නාට මගේ විරෝධතාවයක් නැහැ. නමුත් ඒ හා සමානව එකක් හරි, දෙකක් හරි අපටත් ලබා දීලා මේ බියගම මැතිවරණ කොට්ඨාශයේ අධ්‍යාපන ක්ෂේත්‍රයට ඔබතුමාගේ සහයෝගය ලබා දෙන්න. මම හිතනවා, ගරු මහ ඇමතිතුමනි, ඔබතුමාත් මේකට මැදිහත් වෙලා මේ පාසල්වල විශාල අර්බුදයක් තිබෙනවා. විශාල ප්‍රශ්නයක් තිබෙනවා. මගේ ළඟ තිබෙනවා, විශාඛා බාලිකා විද්‍යාලයට එක ළමයෙක් ලකුණු 91 යි. සමහර ළමයින් ලකුණු 48 යි, 49 යි. ඔවුන් ඉස්කෝලේ යනවා. ලකුණු 91 ළමයා ගෙදර. ළමයින් හූල්ලනවා. මම හිතන්නේ මන්ත්‍රීවරුන්ගෙන් ගන්නේ නැත්නම් ඔබතුමන්ලා ක්‍රමයක් හදන්න. මන්ත්‍රීවරුන්ගෙන් ගන්නේම නැහැ. ඊළඟ ප්‍රමුඛතා ලේඛනය අදාළ කරගෙන ගන්න. එතකොට ඒක සාධාරණයි. නමුත් සමහර අවස්ථාවලදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් බහුතරය ගන්නවා. අපට එක්කෙනෙක්වත් නැහැ. ජනතාව අහනවා අපි පඹයෝද කියලා. ඒක නිසා ගරු අධ්‍යාපන ඇමතිතුමා, මහ ඇමතිතුමා දැනුවත් කරලා, මේවාට නිශ්ශබ්ද වෙලා ඉන්නේ නැතිව ඔබතුමන්ලා අදාළ නිලධාරීන් හරහා අපට දෙන්න. අපි ගම්වල අසරණ වෙනවා. 2016 අපි බලාගෙන ඉන්නවා, මේ පාසල්වලට සිසුන් ඇතුළත් කර ගැනීමේදී කොහොමද මේ බෙදුම් ක්‍රමය කරන්නේ. ආණ්ඩු පක්ෂයට බහුතරයක් දුන්නාට අපේ කිසිදු විරෝධතාවයක් නැහැ. නමුත් ඒ හා සමානව යම්කිසි කොටසක් අපටත් දෙන්න. අපටත් සාධාරණයක් ඉෂ්ට කරන්නය කියලා ඉල්ලනවා. නැත්නම් අපට ගම්වල ඉඳලා හමාරයි ගරු අධ්‍යාපන ඇමතිතුමනි. ස්තුතියි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මෙම සභාවේ අවධානය යොමු කරන්න කැමැතියි. බස්නාහිර පළාත් සභාවේ අපේ නිවාස අමාත්‍යවරයෙක් ඉන්නවා. ඒ වාගේම ඒ යටතේ ඉන්න කොමසාරිස්තුමියක් ඉන්නවා. එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි උපදේශක කාරක සභාවලට ගියාට පස්සේ ඇත්ත වශයෙන්ම නිවාස කොමසාරිස්ගේ කාර්ය භාරය, කර්තව්‍යය ගත්තාට පස්සේ එතුමියට ඇත්තටම වැඩක් නැහැ. රාජකාරියක් නැහැ වාගේ. එතකොට අපි අහන ප්‍රශ්නවලට ඒක මධ්‍යම

[ගරු සුනිල් වටගල]

ආණ්ඩුවේ. ඒ සම්බන්ධයෙන් මට කටයුතු කරන්න බැහැයි කියන එක තමයි කියන්නේ. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් ගරු අමාත්‍යතුමාගේත් අවධානය යොමු කරනවා. ඇත්ත මහජන ගැටලු වගයක්, නිවාසවලට අදාළ ගැටලු වගයක් බස්නාහිර පළාත් සභාවට අදාළව, විශේෂයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ පැන නඟිමින් තිබෙනවා. ඒවාට මැදිහත්වන ආකාරය පිළිබඳව අපි සාකච්ඡා කළ යුතුයි. විශේෂ ප්‍රශ්නයක් පිළිබඳව ඔබතුමාගේ මාර්ගයෙන් ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීට වර්ෂ කිහිපයකට පෙර අවිස්සාවෙල්ල පුවක්පිටිය කිරිවන්දල නිවාස 500 යේ නිවාස යෝජනා ක්‍රමය කියලා එකක් ආරම්භ කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒකට ඍජුව සම්බන්ධය මධ්‍යම රජය තමයි. මේ ඍජු සම්බන්ධය ඇති වෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමක අශෝක ලාල් ප්‍රොපටි ඩිවලොප්මන්ට් නමැති පුද්ගලික සමාගමකට පවරලා මිනිස්සුන්ට ගෙවල් හදලා දුන්නා. එතකොට මිනිස්සුන්ට ගෙවල් හදලා දීලා ඉවර වුණාට පස්සේ අදාළ වාරිකයක් නියම කරලා තිබෙනවා. ඒ මුදල් ගෙව්වාට පස්සේ ඔප්පුවක් ලබා දීම තමයි ඔවුන්ගේ කාර්ය භාරය වුණේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාම හාස්‍යයට කරුණ තමයි මේ අශෝක ලාල් ප්‍රොපටි ඩිවලොප්මන්ට් කියන සමාගම තමන්ගේ කාර්ය භාරය අත්හැරලා තිබෙනවා. නිවාසවලට අදාළ යටිතල පහසුකම් සැපයීම ඔවුන් අත්හැරලා තිබෙනවා. හැබැයි අත්හැරලා නැති එකක් තිබෙනවා. ඒ නිවාස වාරිකය හරි වෙලාවට ඇවිල්ලා ඉල්ලනවා. නිවාසයට අදාළ ගාස්තුව නිසි වෙලාවට ඇවිල්ලා ඉල්ලනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් ඛේදවාචකයක් ඇති වෙලා තිබෙනවා. සම්පූර්ණ මුදල් ගෙවපු අයටත් ඔප්පුවක් ලබා දෙන්නේ නැහැ. ඔප්පුවක් ලබා දෙන්න කටයුතු කරන්නේ නැහැ. අශෝක ලාල් ප්‍රොපටි ඩිවලොප්මන්ට් කියන සමාගම තමන්ගේ කාර්ය භාරය අත්හැරලා, ඒ විතරක් නොවෙයි. නාගරික සංවර්ධන අධිකාරියත් තමන්ගේ කාර්යය භාරය අත්හැරලා තිබෙන බවක් තමයි පෙනෙන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කාර්ය භාරයක් නැති නිවාස කොමසාරිස්තුමියට කාර්යයක් පවරන්න තමයි මම මේ හදන්නේ. ඇත්ත වශයෙන්ම මේ මධ්‍යම රජයත් එක්ක සම්බන්ධ වෙලා මෙන්න මේ අවිස්සාවේල්ල ආසනයේ තිබෙන, අවිස්සාවේල්ල, පුවක්පිටිය, කිරිවන්දල නිවාස 500 යේ නිවාස යෝජනා ක්‍රමය කියලා තමයි කියන්නේ. අක්කර 10 ක තිබෙන්නේ. අක්කර 10 ක පමණ වපසරියකින් යුත් නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක නිවාස සාදා ඒවා මධ්‍යම පාන්තික නිවාස ලෙස නම් කරලා අශෝක ප්‍රොපටි ඩිවලොප්මන්ට් සමාගම සමඟ 1998 ගිවිසුම්ගත වෙලා තිබෙනවා. එදා සිට මේ දක්වා කටයුතු කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් නාගරික සංවර්ධන අධිකාරියට අයත් මෙම ඉඩම තුළ සාදනු ලබන නිවෙස් අශෝක ප්‍රෙපටි ඩිවලොප්මන්ට් සමාගමේ ගිවිසුම් පත්‍රයේ ඇතුළත් කොන්දේසි ඉටු කරන්නේ නැහැ. ඒ පරමාර්ථවලට පටහැනිව කටයුතු කරමින් ඉන්නවා. විශේෂයෙන්ම බහුතරයක් නිවාස ලාභීන්ගේ නිවාස දැනටමත් නිම වී ඇති නමුත් ඔප්පු මේ දක්වා ලබා දීලා නැහැ. එපමණක් ද නොවෙයි. ඉඩම් කොටස්වල නිවාස ලාභීන් ඉහත සමාගමෙන් පරිබාහිරව තමන්ගේ වියදමින්, අන්තිමට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අශෝක ප්‍රොපටි ඩිවලොප්මන්ට් සමාගම මේ වැඩේ කරන්නේ නැති වුණාම මිනිස්සුන්ගේ වියදමින් ගෙවල් හදා ගත්තා. ගෙවල් හදාගෙන ඔප්පුවක් ඉල්ලුවාට පස්සේ ඒ ඔප්පුව ප්‍රතික්ෂේප කරමින් ඉන්නවා, අශෝක ලාල් ප්‍රොපටි ඩිවලොප්මන්ට් සමාගම සහ නාගරික සංවර්ධන අධිකාරිය.

ඒ අනුව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ තත්ත්වය මත තමුන්නාන්සේගේත් මැදිහත්වීමක් කරලා මේ සම්බන්ධයෙන් නිරීක්ෂණ වාර්තාවක් කැඳවලා, විශේෂයෙන් නිවාස කොමසාරිස්වරියට මේ සම්බන්ධයෙන් යොමු කරලා නිරීක්ෂණ වාර්තාවක් කැඳවලා මේ දැනටමත් අවිස්සාවෙල්ල, කිරිවන්දල, පුවක්පිටියේ මේ තිබෙන නිවාස යෝජනා ක්‍රමයේ මිනිස්සුන්ගේ ප්‍රශ්න හඳුනාගෙන ඔවුන්ට දැනට අවශ්‍ය වෙලා තිබෙන්නේ, ඔවුන් සාදා නිම කළ නිවාස වෙනුවෙන් ඔප්පුවක් ලබා ගැනීම. අන්න ඒ කාර්යය වෙනුවෙන් තමුන්නාන්සේගේ නිවාස කොමසාරිස්තුමිය යොමු කරන්නය කියන ඉල්ලීම මම මේ අවස්ථාවේ යෝජනාවක් ලෙසම ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න-අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

හොඳයි, ගරු මන්ත්‍රීතුමනි. එතුමාත් උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙක්. ඒ නිසා අපි සාකච්ඡා කරලා අවශ්‍ය කටයුතු සඳහා යොමු කරනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

බොහොම ස්තුතියි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මම ඊයේ සිට ක්‍රියාත්මක වැට් බදු වාගේම අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂාව ඉවත් කිරීම පිළිබඳවයි අදහස් මතු කරන්නේ. පසුගිය දිනවල මේ ආණ්ඩුව ජනතාවට අතිවිශාල පොරොන්දු රාශියක් ලබා දීලා, ජනතාවට සහන සලසනවා කියලා, ජනතාව සුබිත මුදිත කරනවා කියලා බලයට ආවේ. පෙරේදා මහ ඉහළින් කම්කරු දිනය සමරනවා. හැබැයි කම්කරු දිනය සමරන ගමන් කම්කරුවා, පීඩිතයා, දුප්පතා කබලෙන් ලිපට වැටෙන තත්ත්වයට අද වැට් බද්ද ක්‍රියාත්මක කරන්න කටයුතු කරලා තිබෙනවා. භාණ්ඩ 92 ක් අයින් කරනවා කියලා තිබුණා. සාමාන්‍යයෙන් අපි කියනවා, පරිප්පු කනවා කියලා. පරිප්පු, සීනි, කරවල, හාල් මැස්සෝ මේවාට වදින බද්ද ඉවත් කරලා නැහැ. ඒ වාගේම අනිකුත් තවත් ඍජු අතවශ්‍ය භාණ්ඩ ජනතාවට තිබෙනවා. මේ භාණ්ඩවලට ගහන බදු අඩු කරලා නැහැ. ඒ නිසා මේ ආණ්ඩුව එක පැත්තකින් ජනතාවට කොකා පෙන්වන්න හදනවා.

තමන් එක් පැත්තකින් සහන දෙනවා. අනික් පැත්තෙන් තමන් ජනතාව පීඩාවට පත් කරනවා කියන එකත් පැහැදිලිව කියනවා. මොකද, එක් ඇමතිවරයෙක් කිව්වා, එහෙම අත්‍යවශ්‍ය භාණ්ඩවලට නොගහනවා නම් ආදායම ගන්න බැහැයි කියලා. ඒක ඇත්ත. ඒකේ සාධාරණ, තාර්කික කාරණයක් තිබෙනවා. අපි ආර්ථික විද්‍යාවට ඉගෙන ගන්න කොටත් නම්‍ය සහ අනම්‍ය - එතකොට අනම්‍ය භාණ්ඩ කියන්නේ අතවශ්‍ය භාණ්ඩ විධියට. ඒ අතවශ්‍ය භාණ්ඩ තමයි පාරිභෝගිකයා ගන්නේ. රට පුරා ඉන්න වැඩි පිරිසක් ගන්නේ. එතකොට ඒ භාණ්ඩවලට ගැහුවොත් තමයි ආණ්ඩුවට ආදායම. හැබැයි ආණ්ඩුව කිව්වේ බදු බර ජනතාවට පටවන්නේ නැහැ. සියලු බර ආණ්ඩුව අරගෙන ආණ්ඩුව කටයුතු කරනවා කියලා. නමුත් අද සිද්ධ වෙමින් තිබෙන්නේ, ආණ්ඩුව දිගින් දිගට ජනතාව පීඩනයට පත් කරනවා. ඒ නිසා වහාම ජනතාවට අත්‍යවශ්‍ය භාණ්ඩ - අනිකුත් අත්‍යවශ්‍ය භාණ්ඩවලිනුත් මේ වැට් බදු අයින් කරලා ජනතාවට සහනයක් සලසන්න කටයුතු කරන්න කියන ඉල්ලීම එක් පැත්තකින් කරනවා.

ඒ වාගේම මේ රටේ නිදහස ලබා දුන්න, රටට සාමය ගෙනාපු නායකයා මහින්ද රාජපක්ෂ මැතිතුමා. ඊයේ දවසේ එතුමාගේ ආරක්ෂාවට සිටි කොමාන්ඩෝ භටයන් අනූ දෙනෙකුගෙන් පනස් දෙනෙක් ඉවත් කරලා තිබෙන්නේ. එතකොට මේ සිද්ධිය සිද්ධ වෙන්නේ පෙරේදා අපි අතිවිශාල මැයි රැළියක් කොළඹදී පවත්වලා විපක්ෂයේ ශක්තිය, ඒ වාගේම රටේ ජනතාවගේ කැමැත්ත කොතැනද තිබෙන්නේ කියන කාරණාව පැහැදිලිව පෙන්නුවා. ඒ නිසා එය පෙන්නුවායින් පස්සේ පහු වැනිදාම එතුමාගේ ආරක්ෂාව අඩු කරනවා. අද රනිල් වික්‍රමසිංහ මහත්මයා, අද මෛත්‍රීපාල සිරිසේන මහත්මයා උදේ යාපනයට ගිහිල්ලා දවල් වන කොට එන්න පුළුවන්කම ලැබුණේ, ගමේ ගිහිල්ලා එනවා වාගේ එන්න පුළුවන්කම ලැබුණේ මහින්ද රාජපක්ෂ මැතිතුමා ජීවිත පරිත්‍යාගයෙන් මේ රටේ දශක තුනක තිබුණු ත්‍රස්තවාදය අවසන් කරපු නිසා. එවැනි දෙයක් කරපු නායකයෙකුට මේ විධියට ආරක්ෂාව, ජනාධිපතිවරයෙකුගේ ආරක්ෂාව අනික් අයට සමාන කරනවා නම් යුද්ධයක් කරපු නැති, ඩීල් දාලා එල්.ටී.ටී.ඊ. එකත් එක්ක කටයුතු කරපු, රට බෙදන තැනට කටයුතු කරපු අයට දෙන ආරක්ෂාවයි, සැබවින්ම යුද්ධය අවසන් කරලා ත්‍රස්තවාදීන්ගේ ඉලක්කයක් බවට පත් වුණු (බාධා කිරීමක්) –

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. Nimal R. Peiris

මේ ගරු මන්ත්‍රීතුමා -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

පිස්සු කියවන්නේ නැතිව ඉන්න මන්ත්‍රීතුමා. විනාඩි තුනයි තිබෙන්නේ. මඟුලක් කියෝනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

පිස්සොත් එක්ක මේ වැඩේ කරන්න බැහැ.

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. Nimal R. Peiris

ලැජ්ජා නැතිව කථා කරනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

විනාඩි තුනයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි තිබෙන්නේ. මේ පිස්සෝ දැම්මාම මේ වැඩේ කරන්න බැහැ.

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. Nimal R. Peiris

යුද්ධය කරපු නායකයා සරත් ෆොන්සේකා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා. ඔබතුමාට අවස්ථාව දෙන්නම්. බාධා කරන්න එපා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමා කවදාවත් මිනිස්සු වෙනුවෙන්, රට වෙනුවෙන් සභාවේ කථා කරන්නේ නැහැ. නිකන් බොරුවට මගදී පිස්සෙක් වාගේ පනිනවා.

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. Nimal R. Peiris

සතෙක් වාගේ ඇදගෙන ගිහිල්ලා පළි ගත්තේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

හැසිරීම අනුව තමයි උගතෙක්ද, පිස්සෙක්ද, වැදගතෙක්ද බවට පත් වෙන්නේ. පිස්සෙක් වාගේ හැසිරෙනවා නම් කරන්න දෙයක් නැහැ. මන්ත්‍රීවරයෙක් වුණත්. (බාධා කිරීම්) ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පැහැදිලිවම කියන්න ඕනෑ රටේ ත්‍රස්තවාදය අවසන් කරපු එතුමාට තවමත් ජීවිත තර්ජන තිබෙනවා. ඒ වාගේම එල්.ටී.ටී.ඊ. අය දැනටත් අත්අඩංගුවට ගන්නවා. අවිආයුධ විතරක් නොවෙයි. එල්.ටී.ටී.ඊ. මරාගෙන මැරෙන ඇඳුම් කට්ටල පවා අහුවෙමින් තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළ එතුමාගේ ආරක්ෂාව, සැබෑ ලෙසම මේ රටේ විරුද්ධ පක්ෂයේ නායකයා ටී.එන්.ඒ. නායකයා වුණාට රටේ ජනතාවගේ හදවතේ ඉන්න, ජනතාව ඉන්න නායකයා මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි විපක්ෂය ගත්තාම ඊළඟ ආණ්ඩුව හදන්න ඉන්න නායකයා. එවැනි නායකයෙකුගේ ආරක්ෂාව අඩු කරලා අර සාමාන්‍ය මට්ටමට දැම්මාම මොකක්ද මේ නින්දිත, තුච්ඡ, ම්ලේච්ඡ වැඩේ. මේ තුළින් පැහැදිලිව -

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. Nimal R. Peiris

ආරක්ෂාවට තමයි පොලිසිය ඉන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ජනාධිපතිතුමාගේ පුතාට දීලා තිබෙනවා 20 කට වැඩිය කොමාන්ඩෝ බලකායක්. දන්නේ නැත්නම් ගිහිල්ලා ජනාධිපතිතුමාගෙන් අහගන්න. ජනාධිපතිතුමාගේ දරුවන්ට, අනික් අයට දෙන්න පුළුවන් නම් රට බේරපු නායකයාට දෙන්න බැරි නම් ඒ කියන්නේ මේක පෞද්ගලික පළි ගැනීමක්. ඒ නිසා පෞද්ගලික පළිගැනීම් කිරීම තුළින් රටේ නායකයා විධියට කටයුතු කරපු, අනාගතයේ විපක්ෂයේ නායකයා විධියට කටයුතු කරන්න ඉන්න නායකයාට යම්කිසි මචිල් ගහකට හරි හානියක් වුණොත් ඒකේ සම්පූර්ණ වගකීම මේ යහපාලන රජයේ ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු හැමෝම භාර ගන්න ඕනෑ. මොකද මේ රට බේරගත්ත නායකයා. ඒක පැහැදිලියි. මෙතුමන්ලාට මෙහෙම කෑ ගහන්න පුළුවන් වුණේ, එදා ඇමති කෙනෙක් විධියට මෛත්‍රීපාල සිරිසේන මහත්මයාටත් වෙඩි නොවදින වාහනයක් දීලා, කොමාන්ඩෝ භටයන් දීලා ආරක්ෂාව සැපයුවා. එහෙමනම් යුද්ධය අවසන් කරපු නායකයා විධියට මෙතුමාට කිසියම් හානියක් වෙන්න ඉඩ තිබෙනවා කියන එක පැහැදිලියි. පසුගිය දිනවල ආරක්ෂක තත්ත්වයන් වාර්තා කරලා තිබුණා. එතුමාට දැඩි ජීවිත තර්ජන තිබෙනවා කියලා. ඒක නිසා මේක ම්ලේච්ඡ ක්‍රියාවක්. මේ පහත් ක්‍රියාව තුළින් එතුමාගේ ගමන, රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් ගන්නා ඉන්න තීන්දු තීරණ නවත්වන්න පුළුවන් කියලා හිතනවා නම් ඒක විහිළුවක්. එතුමා ජීවිත පරිත්‍යාගයෙන් එදත් රට වෙනුවෙන් කටයුතු කළා. හෙටත් රට වෙනුවෙන් ඒ ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කරනවා කියන කාරණාව මතක් කරමින් එතුමාගේ ආරක්ෂාව සපයන්න ඉහළ බලධාරීන්ට අඩුම ගණනේ නැණස පැදේවා කියා ප්‍රාර්ථනය කරමින් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. බල්ලෝ බැඳලා දාන්නත් කියලා බොහොම පැහැදිලිව කියනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක වාද විවාද කරන්න ඕනෑ කාරණාවක් නොවෙයි. මම ඇත්තටම කථා කරන්නේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂාව

අඩු කිරීම සම්බන්ධව. අපි කවුරුත් පිළිගන්නවා, මේ රටේ අවුරුදු 30 ක් තිස්සේ මහ යුද්ධයක් තිබුණා. ඒ යුද්ධයේදී අපි සියලු දෙනාගේ ජීවිතවලට තර්ජනයක් තිබුණා. පුංචි දරුවාගේ පවා, පාසල් යන දරුවාගේ පවා ජීවිතවලට ලොකු තර්ජනයක් තිබුණා. ගමේ පාසලේ දරුවාගේ පවා ආරක්ෂාවට තර්ජනයක් තිබුණා. ගමේ පාසලත් මුර කරන තැනට ආවා. ඉතින් මෙහෙම තිබුණු රටක්.

ඒ වාගේම වාහනයක පාර්සලයක් තිබුණත් එදා අපි කවුරුත් දන්නවා. අපි කවුරුත් පිළිගත යුතු එකක් තිබෙනවා. මේක සරත් ෆොන්සේකාටද, මහින්ද රාජපක්ෂටද අරයාටද මෙයාටද කියන එක නොවෙයි. පැහැදිලිවම මම කියන්නේ මේ යුද්ධය කරපු අය. මේ යුද්ධයට නායකත්වය දීපු අය. ඒ නිසා මම පැහැදිලිව කියන්නේ, මේ යුද්ධයට නායකත්වය දීලා අපි සියලු දෙනාටම, මුළු රටටම අභය දානය දුන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමා. මුළු රටටම (බාධා කිරීම්) අභය දානය දුන්නේ කවුරුත් පිළිගන්න ඕනෑ, මහින්ද රාජපක්ෂ මැතිතුමා. ඉතින් ඒක නිසා එතුමාගේ ආරක්ෂාව පනස් දෙනෙකුගෙන් අඩු කරලා තිබෙනවා. ආරක්ෂාව අඩු කරලා ඊට පස්සේ කියනවා අපි මේ පැත්තෙන් පොලිසියෙන් දෙනවා කියලා. මේකේ කාරණාව ඒක නොවෙයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ කාරණාව විශේෂ පුහුණුවක් ලත් අය තමයි මේ මහින්ද රාජපක්ෂ මැතිතුමා ළඟ ඉන්නේ. විශේෂ පුහුණුවක් ලබපු අය. වෙන අය දීලා හරි යන්නේ නැහැ. මේ කණ්ඩායම මහින්ද රාජපක්ෂ මැතිතුමා ළඟ ඉන්නවා නම් හොඳයි. ඒකට හේතුව තමයි දැන් ඔය එල්.ටී.ටී.ඊ. එකෙන් නිදහස් කරන අය එක්කෙනෙක්වත් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා එක්කවත්, රනිල් වික්‍රමසිංහ මහත්මයා එක්කවත් නැතිව වෙන කෙනෙක් එක්කවත් වෛරයක් නැහැ. වෛරය තිබෙන්නේ යුද්ධය අවසන් කරපු, මේ එල්.ටී.ටී.ඊ. ප්‍රශ්නය සහමුලින්ම අවසන් කරපු මහින්ද රාජපක්ෂ මැතිතුමා එක්ක. ඒක නිසා අපි කනගාටු වෙනවා. අද අපි මේ ජීවතුන් අතර ඉන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමා නිසා.

අපි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාටත්, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාටත් දෙන්නටම කියනවා මේ ඉරිසියාකම් කරන්න එපා. වෛර කරන්න එපා. වෛර නොකර මේ රට බේරගත්ත, මුළු රටටම අභය දානය දීපු මේ නායකයාගේ ආරක්ෂාව තර කරන්න. ආරක්ෂාව තර කරන්න කියන්නේ වෙන මොකුත් නිසා නොවෙයි. මේ එල්.ටී.ටී.ඊ. අය අද නිදහස් කරනවා. ඒ අයගේ සම්පූර්ණ වෛරය තිබෙන්නේ මෙතුමාත් එක්ක. ඒ නිසා මේක අපට පෙනෙන්නේ මෙතුමාගේ ජීවිතයට හානියක් කිරීම සඳහා තමයි මේ ආරක්ෂාව අඩු කිරීම හරහා වෙන්නේ. ඒ නිසා කරුණාකරලා මෙන්න මේ ආරක්ෂාව තර කරන්න කටයුතු කරන්නය කියලා ගෞරවයෙන් අපි රජයෙන් ඉල්ලා සිටිනවා. අපේ ගරු මන්ත්‍රීතුමාට පැහැදිලිව කියනවා, මේ අපි සියලු දෙනාම අද ජීවතුන් අතර ඉන්නේ එතුමා නිසා කියන එක පොඩ්ඩක් අවධාරණය කරගන්නය කියලා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

## මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය : දෙවන වර කියැවීම

FINANCIAL (AMENDMENT) STATUTE : SECOND READING

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,*"බස්නාහිර පළාතේ 2015 අංක...... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය"* මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.***
*Question having asked, got adopted subjected to amendments of Committee on Statutes and Law.*

## මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය : තෙවන වර කියැවීම

FINANCIAL (AMENDMENT) STATUTE : THIRD READING

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,*"බස්නාහිර පළාතේ 2016 අංක ...... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය"* මම සංශෝධිතාකාරයෙන් ඉදිරිපත් කරනවා.

***සංශෝධිත ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Amended, Question put and agreed to*

## බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති
REGULATIONS DRAFTED UNDER PAWNBROKERS' STATUTE

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2015 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ 53 වන වගන්තියේ විධිවිධාන යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් පැවරී ඇති බලතල අනුව සාදනු ලැබ,*

*අංක 1937/20 හා 2015 ඔක්තෝබර් මස 22 වන බ්‍රහස්පතින්දා දාතමින් යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රය (IV(අ) වැනි කොටස - පළාත් සභා) මගින් ප්‍රකාශයට පත් කරන ලද,*

*"බස්නාහිර පළාතේ 2015 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ රීති නම් වූ රීතීන්"*

*යථෝක්ත ප්‍රඥප්තියේම 53(4) උපවගන්තියට අනුකූලව අනුමැතිය සඳහා මෙම පළාත් සභාවට 2015.12.22 දින ඉදිරිපත් කර ඇති අතර,*

*ඉදින් එදින, එහිදී ගත් තීරණය පරිදි, 2016.03.24 දින පැවති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී ඒ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කර, එම කාරක සභා නිර්දේශයන් ඇතුළත් වාර්තාව 2016.04.05 දින මෙම පළාත් සභාවට පිළිගන්වන ලද හෙයින් එම රීතීන් සම්බන්ධයෙන් ලද, එම කාරක සභා නිර්දේශයන් පිළිබඳවද සැලකිලිමත්ව ක්‍රියා කළ යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## පළාත් සභා අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය
AMENDING THE LIMITATIONS OF PROVINCIAL COUNCIL ADVANCE ACCOUNTS

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම - 2015 නැමති උපලේඛනයේ දැක්වෙන පරිදි අත්තිකාරම් සීමා සංශෝධනය කිරීමේදී 2014 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇති හෙයින්ද,*

*එම සංශෝධනයන් සිදු කිරීම සඳහා පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සභාවේ අනුමැතියට යටත්ව ලබා දී ඇති හෙයින්ද,*

*එම උපලේඛනයේ දැක්වෙන පරිදි එක් එක් අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අනුමත කරයි." යන යෝජනාව ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## රීති අංක 107 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 107

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව ඊට ආනුෂංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

**ගරු එස්. කුහවරදන්**
Hon. S. Kuhawarthan

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මේ යෝජනාව දැන් තමයි ලැබුණේ. මේ යෝජනාව සම්බන්ධයෙන් උසාවියේ නඩුවක් යනවා. අපේ Rules of procedure එක අනුව 67(7) තිබෙනවා, උසාවියේ නඩුවක් යනවා නම් ඒ සම්බන්ධයෙන් යෝජනාවක් පළාත් සභාවේ ගෙනෙන්න බැහැ. අපේ කාලය නාස්ති කරන්නේ නැතිව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නඩු අංකය මොකක්ද?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒක වෙනත් කාරණාවක්.

**ගරු එස්. කුහවරදන්**
Hon. S. Kuhawarthan

නැහැ. නැහැ. මේකට නඩුවක් යනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා නඩු අංකය ඉදිරිපත් කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒකට හානියක් වෙන්නේ නැහැ. අධිකරණයේ ප්‍රශ්නයක් නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera- Chief Opposition Whip

මෙතුමා ඉදිරිපත් කරන්නේ වෙන අර්ථයෙන් යුත් යෝජනාවක්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අධිකරණයට බලපෑමක් වෙන්නේ නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera- Chief Opposition Whip

ඔබතුමාගේ කථාවේදී ඒ අදහස ප්‍රකාශ කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කථාවේදී නඩු අංකයත් එක්ක ඉදිරිපත් කරන්න.

**ගරු එස්. කුහවරදන්**
Hon. S. Kuhawarthan

මේකට නඩුවක් වෙනම යන කොට අපට සභාවෙන් ඒ යෝජනාව submit කරන්න පුළුවන්ද?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

නඩු කියන ඒවා කථා කරලා තිබෙනවා. නමුත් ඒකට බලපෑමක් වෙන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා මේ කථා කරන දෙයටම අදාළද කියන එක සම්බන්ධව තේරුම් ගන්න -

**ගරු එස්. කුහවරදන්**
Hon. S. Kuhawarthan

සම්බන්ධයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera- Chief Opposition Whip

අර්ථ වෙනස්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අර්ථ වෙනස් වෙන්න පුළුවන්. ඔබතුමා අපට ඒක නඩු අංකයත් එක්ක ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔව්, අපි දන්නේ නැහැ නේ. පස්සේ දවසක ගේන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera- Chief Opposition Whip

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා යෝජනාව ගේන්න.

***අනතුරුව,ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Accordingly, question put and agreed to.*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION :

## උතුරු පළාත් සභාව සම්මත කරන ලද ශ්‍රී ලංකාව ප්‍රාන්තවලට කැඩීමේ යෝජනාව ප්‍රතික්ෂේප කරන අතර ව්‍යවස්ථා හා නීති විරෝධී ක්‍රියා පිළිබඳව නීතිමය පියවර ගත යුතු බවට රජයට යෝජනා කිරීම
WHILE REJECTING THE MOTION ADOPTED BY NORTHERN PROVINCIAL COUNCIL TO DIVIDE SRI LANKA INTO PROVINCIAL CONTROL UNITS, PROPOSING TO THE GOVERNMENT THAT LEGAL ACTION SHOULD BE TAKEN AGAINST ANTI-CONSTITUTIONAL AND ILLEGAL ACTS

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,*"දෙමළ භාෂාව පදනම් කරගෙන උතුරු හා නැගෙනහිර පළාත් එකතු කර එක් ප්‍රාන්ත පාලනයකුත් රටේ සෙසු පළාත් හත (7) එකතු කොට සිංහල භාෂාව පදනම් කරගෙන තවත් ප්‍රාන්ත පාලනයකුත් ඇති කළ යුතු යැයි උතුරු පළාත් සභාව යෝජනාවක් ඉදිරිපත් කර සම්මත කරගෙන ඇත. මෙය ශ්‍රී ලංකාව තුළ භාෂාව පදනම් කරගෙන ෆෙඩරල් ආණ්ඩු දෙකක් ඇති කිරීමට කරන යෝජනාවකි. භූමිය, භාෂාව, ජන වර්ගය හා ආගම පදනම් කරගෙන ප්‍රාදේශීය බල බෙදීමකින් ජනතාවගේ ප්‍රශ්න විසඳිය නොහැකි අතර එමගින් ඇති වන්නේ වාර්ගික අනන්‍යතාවයක් මත විභේදයක් ඇතිවීම පමණි.*

*තිස්වසරක බෙදුම්වාදී ත්‍රස්තවාදයකට මුහුණදුන් රටක් ලෙස එය නිමා කිරීමෙන් පසු රටේ ජාතික සංහිඳියාව, සමගිය, සහජීවනය ගොඩනැගෙමින් පවතින අවස්ථාවක මෙවැනි යෝජනාවක් ගෙන ඒමෙන් සිදුවන්නේ සංහිඳියාවට බාධාවකි. ජන කොටස් අතර අවිශ්වාසය, සැකය වර්ධනයවීමක් පමණි. තවද මෙම යෝජනාව පළාත් අතර භේදකාරී තත්ත්වයක් ඇති කිරීමට හේතුවන අතර ජාතික ඒකාග්‍රතාවයට ද හානිකරය. රටේ ජාතික ආරක්ෂාවට, ස්වෛරීත්වයට තර්ජනයක් ඇති කරන බැවින් මෙම යෝජනාව සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාගේත්, ගරු අගමැතිතුමාගේත්, උතුරු පළාත් ආණ්ඩුකාරතුමාගේත් වහා අවධානය යොමු කළ යුතු බවත් ඒ සඳහා ව්‍යවස්ථාමය හා නෛතිකමය රාමුව තුළින් මැදිහත්වී මෙම යෝජනාව ප්‍රතික්ෂේප කළ යුතු බව බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටී."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera- Chief Opposition Whip

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ යෝජනාවට මම සංශෝධනයක් ඉදිරිපත් කරනවා.

*"සහ විපක්ෂ නායක ආර්. සම්බන්දන් මහතා හා අනුගාමිකයන් උතුරේ හමුදා කඳවුරුවලට බලෙන් ඇතුල්වීම ආදී රාජ්‍ය ආරක්ෂාවට තර්ජනය වන ක්‍රියා නැවැත්වීම හා උතුරේ ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථානවල බෞද්ධ ප්‍රතිමා ඇතුළු ඉදි කිරීම් නැවැත්වීම ආදී බලහත්කාරී ක්‍රියා නැවත ඇති නොවීමට රජය වග බලා ගත යුතු අතර, තරාතිරම නොබලා සිදු කරන ලද ව්‍යවස්ථා විරෝධී හා නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් නීතිමය පියවර ගත යුතු යැයි මෙම සභාවට යෝජනා කර සිටී."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඒකට වෙනම යෝජනාවක් ගේන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

කාලයක් නැහැ නේ?

**ගරු ලෙනාඩ් කාරුණාරත්න**
Hon. Leonard Karunaratne

මේකට අදාළ නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මන්ත්‍රීතුමා එකඟයි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එතුමාගේ යෝජනාවේ මූලික අදහස එතකොට වෙනස් වෙනවා. ඒකයි කියන්නේ. ඔය යෝජනාවත් ගෙනෙන්න. අපි සහයෝගය දෙන්නම්. අවුලක් නැහැ. ඇයි එහෙම කරන්නේ?

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

යෝජනාවක් හැටියට ගේන්න ඕනෑ නැහැ. ඒකට සංශෝධනයක් ඉල්ලන්නේ. නිශාන්ත ගරු මන්ත්‍රීතුමා එකඟ වෙනවා නම් ඒකේ ගැටලුවක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සංශෝධනයට ගරු මන්ත්‍රීතුමා එකඟද?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ එකඟයි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

සම්පූර්ණයෙන් පරස්පර විරෝධීයි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒක මෙතුමාගේ කැමැත්ත.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එතුමාගේ කැමැත්ත වෙනම දෙයක්. නමුත් මූලික යෝජනාවට පරස්පර අදහසක් තිබෙන්නේ. ඒකයි කියන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඉතින් යෝජනාව ගෙනෙන මන්ත්‍රීවරයාට කැමැති නම්. පුළුවන් කියලා තිබෙන්නේ. රීතිවල තිබෙන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඉතින් ඔබතුමා කථාවේදී කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගෙත් සංශෝධනයක් තිබෙනවා. මම එතුමාගේ එකඟතාවය මත මේ සංශෝධනය කරන්නේ. එතුමාගේ යෝජනාවේ අවසාන කොටසට,

*"මෙම යෝජනාව ප්‍රතික්ෂේප කරන අතර, එම යෝජනාව තුළින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, උතුරු පළාත් සභාව හා ප්‍රධාන අමාත්‍යවරයා හා එයට පක්ෂව ඡන්දය දුන් අය උල්ලංඝණය කර තිබෙන බැවින් ඔවුන්ට විරුද්ධව වහා නීතිය ක්‍රියාත්මක කර අත්අඩංගුවට ගත යුතු යැයි යෝජනා කරමි."*

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එම සංශෝධනයන්ට එකඟයි.

***ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් සභාභිමුඛ කරන ලදී.***
*Question, as amended proposed*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය අප්‍රේල් 22 වැනිදා උතුරු පළාත් සභාව මගින් යෝජනාවක් සම්මත කර ගනු ලැබුවා. එම යෝජනාවේ ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙන්නේ භාෂාව පදනම් කරගෙන ශ්‍රී ලංකාව තුළ ෆෙඩරල් රාජ්‍යයන් දෙකක් ඇති කළ යුතු බවයි. භාෂාව පදනම් කරගෙන ශ්‍රී ලංකාව තුළ ෆෙඩරල් රාජ්‍යයන් ඇති කළ නොහැකි බව අපි පැහැදිලිව කියන්න ඕනෑ. ඒ වාගේම මෙවැනි යෝජනා මීට ප්‍රථමත් දෙමළ දේශපාලනය තුළින් ඉදිරිපත් වෙලා තිබෙනවා. නිදහසින් පස්සේ මේ රටේ අවස්ථා ගණනාවකදී මේ ආකාරයටම ෆෙඩරල් යෝජනා ඉදිරිපත් වුණා. නිදහසට පෙරත් මේ ආකාරයටම මේ රට දෙකඩ කිරීම සඳහා, ෆෙඩරල් රාජ්‍යයක් හැදීම සඳහා විවිධ යෝජනා ඉදිරිපත් වුණා. ජී.ජී. පොන්නම්බලම් පනහට පනහ ඉල්ලමින් මධ්‍යයේ බලය හරි හරියට බෙදා ගන්න

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

එක් අවස්ථාවකදී ඔවුන් ඉල්ලා සිටියා. නමුත් ඒ යෝජනාවත් අපේ සමාජයේ ප්‍රතික්ෂේප කළා. ව්‍යවස්ථාදායක සභාව තුළ එම යෝජනාව පරාජයට පත් වුණා.

ඒ වාගේම තමයි 1949 එස්.ජේ.වී. චෙල්වනායගම් තමිල් අරුසු කච්චි කියන පක්ෂය පිහිටෙව්වා. ඒ තමිල් අරසු කච්චි කියන පක්ෂයේ තේරුම වෙන මොකක්වත් නොවෙයි. වෙනම දෙමළ රාජ්‍යයක් සඳහා වූ පක්ෂය කියන එක. සිංහල ජනතාව අතර එම පක්ෂය පිළිබඳ ඇති වුණු භීතිය අඩු කිරීම සඳහා තමයි එයට ෆෙඩරල් පක්ෂය කියලා පසුව නම් කරනු ලැබුවේ. එස්.ජේ.වී. චෙල්වනායගම් එදා පැහැදිලිවම උතුරු හා නැගෙනහිර පළාත් දෙමළ ජනතාවගේ නිජබිම් විධියට සලකලා ඒ ප්‍රදේශවලට වෙනම දෙමළ රාජ්‍යයක් පිහිටුවන්න ඕනෑය කියන ඒ ස්ථාවරයේ ඉඳගෙන හර්තාල් ව්‍යාපාර කරගෙන ගියා. උද්සෝෂණ කරගෙන ගියා. සත්‍යාග්‍රහ ව්‍යාපාර කරගෙන ගියා. ඒ විතරක් නොවෙයි. උතුරු - නැගෙනහිර ප්‍රදේශවලින් සිංහලයින් පලවා හැරියා. ඔවුන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය මුදා හැරියා. අපට පෙනෙනවා මේ ආකාරයට දිගින් දිගටම මේ ෆෙඩරල් යෝජනා ඉදිරිපත් වෙලා තිබෙනවා. එදා බණ්ඩාරනායක - චෙල්වනායගම් අතර ගිවිසුමක් ඇති වුණා. ඒ ගිවිසුම පිටුපස්සෙත් තිබුණේ, මේ ආකාරයේම යෝජනාවලියක්. උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලට වෙනම ස්වයං පාලනයක්, ඒ වාගේම ෆෙඩරල් පාලනයක් ලබා ගැනීම තමයි ඔවුන්ගේ අදහස වුණේ. නමුත් මේ රටේ බහුතර සිංහල ජනතාවගේ සිතුම් පැතුම් නොතකා හැරලා කටයුතු කරන්න ගියපු හැම අවස්ථාවකදීම එම යෝජනා ප්‍රතික්ෂේප වුණා. ඒවා ක්‍රියාත්මක කරගන්න බැරි වුණා. ඒවාගේම තමයි ඩඩ්ලි - චෙල්වනායගම් අතරත් ඒ ආකාරයටම ගිවිසුමක් ඇති වුණා. නමුත් මේ රටේ බහුතර ජනතාවගේ විරෝධතාවය නිසා, මහා සංඝරත්නයේ විරෝධය නිසා, දේශප්‍රේමී ජාතිමාමී බලවේගවල විරෝධය නිසා එදා ඒක අකුළ ගන්න සිදු වුණා. එහෙමනම් මේ ෆෙඩරල් යෝජනාවලිය අද ඊයේ ආපු එකක් නොවෙයි. නිදහසට පෙර සිටම මේ රට තුළ වෙනම රාජ්‍යයක් හැදීම සඳහා ගෙනාපු යෝජනාවලියක්.

ඊට පස්සේ අපට වැදගත් අවස්ථාවක් හඳුන්වා දෙන්න පුළුවන්. 1976 වඩුක්කොඩෙයි සාකච්ඡාව. ඒ වඩුක්කොඩෙයි සාකච්ඡාවේදී සියලුම දෙමළ දේශපාලන පක්ෂ එකතු වෙලා - නමුත් ඒකට අපි කියන්න සතුටුයි. එදා වතුකරයේ නායකයා විධියට කටයුතු කරපු සෞම්‍ය මූර්ති තොණ්ඩමන් මැතිතුමා ඒකට එකතු වුණේ නැහැ. ඔහු ඒකෙන් ඉවත් වුණා. නමුත් අනික් සියලුම දෙමළ දේශපාලන පක්ෂ එකතු වෙලා උතුරු - නැගෙනහිරට වෙනම රාජ්‍යයක් ලබා ගැනීම සඳහා යෝජනාවක් සම්මත කර ගත්තා. ඒ තමයි වඩුක්කොඩෙයි සම්මුතිය කියලා කියන්නේ. එදා අපි දැක්කා, අප්පාපිල්ලේ අමිර්තලිංගම් තමයි ඒකට නායකත්වය දුන්නේ. එදා දකුණේ ජනතාවත් එක්ක සහයෝගයෙන් කටයුතු කරන්න හිටපු, විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ. තිරුචෙල්වම්, ඒ කියන්නේ නීලම් තිරුචෙල්වම් මහත්මයාගේ පියා, එතුමා එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාත් එක්ක සහයෝගයෙන් කටයුතු කළා, මධ්‍යස්ථ දෙමළ නායකයෙක් විධියට. නමුත් මොකද සිද්ධ වුණේ? එතුමාගේ මධ්‍යස්ථභාවයට එරෙහිව එදා අප්පාපිල්ලේ අමිර්තලිංගම් විශාල ජාතිවාදයක්, බෙදුම් වාදයක් අවුස්සාගෙන ගියා. ඒකේ අවසාන ප්‍රතිඵලය තමයි වේලුපිල්ලේ ප්‍රභාකරන් බිහි වීම. තිස් අවුරුදු යුද්ධයකට රට ගමන් කළා. ඒකෙන් දෙමළ සමාජයට වුණු සුගතියක් නැහැ. දෙමළ සමාජය තව තවත් අගාධයට ගියා. සමාජයීය වශයෙන්, දේශපාලනමය වශයෙන්, ආර්ථික වශයෙන්, සංවර්ධනය පැත්තෙන් දෙමළ සමාජය විශාල පසුබෑමකට ලක් වුණා.

අපි බලන්න ඕනෑ, අද විශේෂයෙන්ම මුස්ලිම් ජනතාව සහ වතුකරයේ ඉන්දියානු සම්භවයක් සහිත දෙමළ ජනතාව මේ රටේ බහුතර සිංහල ජනතාවත් එක්ක සාමයෙන් සමගියෙන් සහජීවනයෙන් ජීවත්වීම නිසා ඔවුන් සමාජ ආර්ථික දේශපාලනමය වශයෙන් ඉස්සරහාට ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම ඔවුන් අද අපේ රටේ අනිකුත් ජන කොටස් එක්ක සහයෝගයෙන් සහජීවනයෙන් කටයුතු කරනවා. නමුත් උතුරේ මේ ෆෙඩරල් යෝජනා ඉල්ලපු මේ දෙමළ දේශපාලනය නිසා අද මොකද වෙලා තිබෙන්නේ? දෙමළ ජනතාව අද කබලෙන් ලිපට වැටිලා තිබෙනවා. ඔවුන්ට ලැබුණු අයිතියක් නැහැ. මේ අවුරුදු 30 ක් අරගල කළා. ඊට පෙර සිට ප්‍රජාතන්ත්‍රවාදීව අරගල කළා. සටන් කළා. උද්සෝෂණ කළා. හර්තාල් ව්‍යාපාර කළා. එදා අපේ සමාජය අරගෙන බැලුවාම සෑම ක්ෂේත්‍රයකම දෙමළ සමාජය ඉස්සරහායින් සිටියා. පරිපාලන ක්ෂේත්‍රයේ, වෛද්‍ය ක්ෂේත්‍රයේ, ඉංජිනේරු ක්ෂේත්‍රයේ, නීති ක්ෂේත්‍රයේ මේ හැම ක්ෂේත්‍රයකම දෙමළ ජනතාව විශාල භූමිකාවක් ඔවුන් ඉෂ්ට

කළා. නමුත් අද ඔවුන්ට මොකද වෙලා තිබෙන්නේ. මොවුන්ගේ අවුරුදු 30 ක අරගලය විතරක් නොවෙයි, අඩ සියවසක අරගලය ඇතුළේ ඔවුන් ගොඩක් පස්සට ගිහිල්ලා තිබෙනවා.

ඒක නිසා දැන් ත්‍රස්තවාදය පරාජය කරලා මේ මැයි 19 වැනිදාට අවුරුදු 07 ක් පිරෙනවා. එහෙමනම් නැවත වතාවක් මේ ෆෙඩරල් යෝජනාවලිය ගෙන ඒම තුළින් ඔවුන් බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? දෙමළ සමාජයට සුගතියක් අත්පත් කර දෙන්නද? එහෙම නැත්නම් දෙමළ සමාජය නැවත වතාවක් මේ ෆෙඩරල් යෝජනාව හරහා ඔවුන් බෙදුම්වාදය දෙසට තල්ලු කරන්නද උත්සාහ කරන්නේ. ඒ නිසා පැහැදිලිව කියන්න ඕනෑ. මෙවැනි යෝජනාවක් ගෙන ඒම තුළින් රට තුළ ගොඩනැගෙමින් තිබෙන ජාතික සංහිඳියාව, සහජීවනය බිඳ වැටෙනවා. ඒ වාගේම අපි කියන්න ඕනෑ. දෙමළ දේශපාලනයට තවමත් පුළුවන් වෙලා නැහැ මේ රටේ බහුතර ජනතාව තුළ විශ්වාසයක් දිනාගන්න. සම්බන්දන් මැතිතුමාට, ඒ වාගේම විග්නේෂ්වරන් මැතිතුමාට, සුමන්දිරන් මැතිතුමාට, ඒ වාගේම අනෙකුත් ඔය ගජේන්ද්‍ර පොන්නම්බලම්ලා ඇතුළු දෙමළ දේශපාලනයේ නිරත වන අයට පුළුවන්කම ලැබිලා නැහැ, මේ රටේ බහුතර ජනතාව තුළ තවමත් විශ්වාසනීයත්වය තහවුරු කරගන්න. ඔවුන් පිළිබඳව අපට අවිශ්වාසය ඇති වන ආකාරයට, සැකය වැඩි වන ආකාරයට තමයි ඔවුන්ගේ දේශපාලනය හසුරුවන්නේ සහ ඔවුන් කටයුතු කරමින් තිබෙන්නේ. ඒ නිසා උතුරු පළාත් සභාව ගෙනැල්ලා තිබෙන මේ යෝජනාව රටේ ජාතික සංහිඳියාවට, සහජීවනයට කිසිසේත් හිතකර වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157(අ) වගන්තියේ පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. මේ රටේ මහජන නියෝජිතයින් හැම කෙනෙක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිගන්නා බවට දිවුරනවා. 157අ.(1) හි පැහැදිලිව සඳහන් වෙනවා,

> *"ශ්‍රී ලංකාවේ දේශය තුළ වෙනම රජයක් පිහිටුවීමට, කෙළින්ම හෝ අන්‍යාකාරයකින්, ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී හෝ ආධාර කිරීම, අනුබලදීම, අනුග්‍රහය දැක්වීම, මුදල් යෙදවීම, ධෛර්ය දීම හෝ දේශනා කිරීම කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය."*

ඒ වාගේම,

> *"ශ්‍රී ලංකාවේ දේශය තුළ වෙනම රජයක් පිහිටුවීම තම අරමුණුවලින් නැතහොත් පරමාර්ථවලින් එකක් ලෙස කිසිදු දේශපාලන පක්ෂයක් හෝ වෙනත් සංගමයක් හෝ සංවිධානයක් විසින් නොපිළිගනු ලැබිය යුතු ය."*

එහෙම නම් කිසිම පක්ෂයකට තමන්ගේ ප්‍රතිත්පති ප්‍රකාශනවල සඳහන් කරන්න බැහැ, ශ්‍රී ලංකාව බෙදනවා කියලා. ශ්‍රී ලංකාව තුළ ෆෙඩරල් රාජ්‍ය හදනවා කියලා. එහෙම යෝජනා කරන්න බැහැ. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි හැම කෙනෙක්ම දිවුරනවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 අ(7) වන ව්‍යවස්ථාව සහ 161 (අ) (iii) වන ව්‍යවස්ථාව

> *"............................. වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කරන බවට ද ශ්‍රී ලංකාවේ දේශය තුළ වෙන ම රජයක් පිහිටු වීමට, කෙළින් ම හෝ අන්‍යාකාරයකින්, ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී ආධාර දීම, අනුබල දීම, අනුග්‍රහය දැක්වීම, මුදල් යෙදවීම, ධෛර්ය දීම හෝ දේශනා කිරීම නොකරන බවට ද ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි/දිවුරුම් දෙමි."*

ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතරවන උපලේඛනයේ, 32 වන, 53 වන, 61 වන, 107 වන සහ 165 වන ව්‍යවස්ථා.

> *"............................. වන මම, ........................... ධූරයෙහි කාර්ය සහ කර්තව්‍ය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ නීතියට අනුකූලව අවංකව ඉටු කරන බවට ද ශ්‍රී ලංකා ජනරජයට පක්ෂපාත වන බවට ද මාගේ උපරිම ශක්ති ප්‍රමාණයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කරන බවට ද / ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි/ දිවුරුම් දෙමි."*

මෙක පැහැදිලිව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා. ඒ වාගේම

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

මේ සැම මන්ත්‍රීවරයෙක්ම, පළාත් සභා මන්ත්‍රීවරු ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, නාගරික සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු සියලු දෙනා මේ දිවුරුම ලබා දීලා තිබෙනවා. මේ ප්‍රතිඥාව ලබා දීලා තිබෙනවා. එසේ නම් මේ ආකාරයට උතුරු පළාත් සභාව ගෙනෙන මෙම යෝජනාව තුළින් රටේ සංහිඳියාව ගොඩනැඟෙන්නේ නැහැ. රටේ ජාතික ඒකාග්‍රතාවයට මේක හානි කරයි. ජාතික එක්සත් භාවයට හානි කරයි. රටේ ජාතික ආරක්ෂාවට මේක හානි කරයි. ඒ නිසා මේ යෝජනාව අපි පැහැදිලිව ප්‍රතික්ෂේප කළ යුතුයි.

ඒ වාගේම මම කියන්න ඕනෑ, අද විපක්ෂ නායක ආර්. සම්බන්දන් මැතිතුමා කරන ප්‍රකාශ අරගෙන බලන්න. පසුගිය අප්‍රේල් 16 වැනිදා කිලිනොච්චියට ගිහිල්ලා උතුරු පළාත් සභාවේ මන්ත්‍රීවරු හම්බ වෙලා එතුමා කියන්නේ මොකක්ද? ෆෙඩරල් ලබා ගන්න පුළුවන්. එතෙක් වැඩ අවුල් කරන්න එපා කියලා එතුමා කියනවා. එහෙම නම් මොකක්ද මේ කියන්නේ? ෆෙඩරල් ආණ්ඩුවක් ගන්න පුළුවන් කියලා. අපි පැහැදිලිව කියන්න ඕනෑ, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ, "*මෛත්‍රී පාලනයක් ස්ථාවර රටක්*" කියන එකේ කිසිම තැනක සඳහන් කරලා නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ෆෙඩරල් ආණ්ඩුවක් ලබා දෙනවා කියලා. එහෙම ජනවරමක් ලැබිලා නැහැ. ඒක ඉතා පැහැදිලිව අපි කියන්න ඕනෑ. ඒ වාගේම එතුමා ඒකේ සඳහන් කරලා තිබෙන්නේ මොකක්ද?

"*කරන ව්‍යවස්ථා සංශෝධන රටේ ස්වෛරීභාවය ආරක්ෂාව සහ ස්වෛරීත්වය සඳහා ඇති ඉඩකඩ වැඩි දියුණුවන්නා වූ සංශෝධනයක් මිස ඊට හානිකර වන්නා වූ කිසිදු සංශෝධනයක් සිදු නොකරන බවට ද මම සහතික වෙමි.*"

මේකයි අපට ලැබිලා තිබෙන ජනවරම. ඒ නිසා මේ ජනවරමට දෙමළ ජනතාවත් දායක වෙලා තිබෙනවා. උතුරේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඡන්දය දීපු හැම කෙනෙක්ම මේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුමත කරලා තිබෙනවා. ඒ නිසා මේ ප්‍රතිපත්ති ප්‍රකාශය උල්ලංඝනය කරන්න කිසි කෙනෙකුට අයිතියක් නැහැ. ඒකට ජනවරමක් නැහැ. ඒක Violate කරන්න බැහැයි කියන එක ඉතා පැහැදිලිව මම කියන්න ඕනෑ.

ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය මාසයේ අගෝස්තු මාසයේ පැවැත්වුණු පාර්ලිමේන්තු මැතිවරණය. එතැනදී එක්සත් ජාතික පෙරමුණේ රනිල් වික්‍රමසිංහ ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කරපු පංචවිධ ක්‍රියාවලියේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉතා පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා - කිසිදු ආකාරයකට ෆෙඩරල් පාලනයක් දෙනවාය කියලා එහි සඳහන් කරලා නැහැ. ඒකේ සඳහන් කරලා තිබෙන්නේ,

නිවහල් රටක් - නිදහස් මිනිසෙක්

ඒකේ කියලා තිබෙන්නේ මොකක්ද?

"*ඒකීය රාජ්‍යයක් යටතේ සියලු දෙනාගේ සම්මුතියෙන් සිදු කළ හැකි උපරිම ආකාරයේ බලය බෙදීමකට පියවර ගන්නෙමු.*"

සම්මුතියකින් පමණයි එවැන්නක් කරන්න පුළුවන්. ඒ කරන්න පුළුවන් වෙන්නේත් රටේ ඒකීයභාවය ආරක්ෂා කරමින්. ඒකයි අපට ලැබිලා තිබෙන ජනවරම. පාර්ලිමේන්තු මැතිවරණයේදීත් ඒ වාගේම ජනාධිපතිවරණයේදීත් ලැබිලා තිබෙන ජනවරම ඒකයි. ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ. මෙවැනි යෝජනාවක් තුළින් අද මොකක්ද උත්සාහ කරන්නේ. අද විපක්ෂ නායක ආර්. සම්බන්දන් මැතිතුමා කියනවා, ද්‍රවිඩ ජනයා අකමැති ව්‍යවස්ථාවක් ගේන්න දෙන්නේ නැහැ. මොකක්ද මේ කියන්නේ? ද්‍රවිඩ ජනතාවගේ කැමැත්ත මතද මේ රටේ ව්‍යවස්ථාව හදන්න ඕනෑ. ඒ කියන්නේ, මේ නැවත වතාවක් යෝජනා කරන්නේ, නකුට විසින් බල්ලා වනන ප්‍රතිපත්තියකට රට ගෙනියන්නයි මේ හදන්නේ. මේ රටේ බහුතර සිංහල ජනතාවගේ, ඒ වාගේම අනෙකුත් මුස්ලිම් ජනතාවගේ, වතුකරයේ ඉන්න දෙමළ ජනතාවගේ මේ අයගේ සිතුම් පැතුම් අභිලාෂයන් තේරුම් ගන්නේ නැතිව මේ දෙමළ ජනතාවගේ උවමනාවට පමණක් මේ රටේ ව්‍යවස්ථාව හදන්න බැහැ. ඒක මේ රටේ ඉතිහාසයට පටහැනියි. ඒ වාගේම අපි කියන්න ඕනෑ. මේ රටේ සංස්කෘතියට, මේ රටේ ශිෂ්ටාචාරයට පටහැනියි. මේ රටේ ශිෂ්ටාචාරය, සංස්කෘතිය, ඉතිහාසය නිර්මාණය කරපු මේ රටේ බහුතර සිංහල ජනතාවගේ සිතුම් පැතුම් නොසලකා හැරලා මේ රටේ ව්‍යවස්ථා හදන්න බැහැ. ඒ ව්‍යවස්ථා හදන්න ගිය හැම අවස්ථාවකම ඒවා අසාර්ථක වුණා. මේ රටේ ජනතාව ප්‍රතික්ෂේප කළා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ හැම යෝජනාවක් තුළින්ම අපට පෙනෙන්නේ, වෙන මොකක්වත් නොවෙයි. දැන් ඒ අය වතුකරයටත් බෙදුම්වාදය යෝජනා කරනවා. වතුකරයටත් බෙදුම්වාදය යෝජනා කරනවා,

*"වතුකරයේ ද්‍රවිඩ ජනතාවටත් වෙනම කලාපයක් ඕනෑ. උතුරු පළාත් සභාව ඉල්ලයි."*

*"උඩරට කලාපීය කවුන්සිලය නමින් වෙනම කලාප සභාවක් වතුකරයට දෙන්න කියලා යෝජනාවක්."*

එහෙම නම් මේ බෙදුම්වාදය නේද මේ රට ඇතුළේ පෝෂණය කරන්නේ. ඒ වාගේම අද නැගෙනහිර පළාත උතුරට එකතු කරන්නය කියලා උතුරු පළාත් සභාවට කරන්න තිබෙන, එවැනි යෝජනාවක් ගේන්න තිබෙන අයිතිය මොකක්ද? නැගෙනහිර පළාතේ සිංහල, දෙමළ මුස්ලිම් ජනතාව සම සමව ජීවත් වෙනවා. ඒ වාගේම නැගෙනහිර මුස්ලිම් ජනතාව දෙමළ භාෂාව කථා කළාට, ඔවුන්ට වෙනම අනන්‍යතාවයක් තිබෙනවා. භාෂාව මත ඔවුන් දා ගන්න බැහැ. උතුරේ දෙමළ ජනතාව වුණාට ඔවුන්ට වෙනම අනන්‍යතාවයක් තිබෙනවා. ඒ වාගේම තමයි නැගෙනහිර පළාතේ ජීවත් වන දෙමළ ජනතාවටත් වෙනම අනන්‍යතාවයක් තිබෙනවා. ඒ නිසා අපි කියන්න ඕනෑ. නැගෙනහිර පළාත උතුරට එකතු කරන්න කිසිම අයිතියක් නැහැ. එවැනි යෝජනාවක් ගෙන ඒම තුළින් මේ රට තුළ පළාත් අතර ඇති කරන්නේ භේදකාරී තත්ත්වයක්. අසමගියක් ඇති කරන්නේ. ඒ නිසා උතුරු පළාත් සභාව ගෙනැල්ලා තිබෙන මේ යෝජනාව රටේ යහපතට කිසිසේත් හේතු වෙන්නේ නැහැ. ඒ නිසා අපි මේ යෝජනාව මුළුමනින් ප්‍රතික්ෂේප කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි මෙවැනි යෝජනා තුළින් නැවත වතාවක් 26,000 ක් රණවිරුවෝ ජීවිත පූජා කරලා, ඇස්, ඉස්, මස්, ලේ දන් දීලා මේ දිනා ගත් නිදහස, මේ සාමය අද දෙමළ සමාජයටත් ලැබිලා තිබෙනවා. ආර්. සම්බන්දන් මැතිතුමාට අද නිදහසේ දේශපාලනය කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ ඒකයි. විග්නේෂ්වරන් මැතිතුමාට උතුරු පළාත් සභාව ලැබුණේ, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා උතුරු පළාත් සභාව පිහිටවපු නිසා. ඒ නිසා අපි කියන්න ඕනෑ. අද උතුරු පළාත් සභාවෙන් මෙවැනි යෝජනා ගෙන එන එක අද අපි තේරුම් ගන්න ඕනෑ. ඔවුන් අද ඒ නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය පාවිච්චි කරන්නේ මේ රට බෙදන්න නම්, මේ රට තුළ අසමගිය ඇති කරන්න නම්, සංහිඳියාව ඇති කරන්න නම් ඒකට අපි කිසිසේත් ඉඩ දිය යුතු නැහැ.

එදා අපි පැහැදිලිව කිව්වා. උතුරු පළාත් සභාව පිහිටුවන්න කලින් විශේෂයෙන්ම මේ දෙමළ ජාතික සන්ධානය කියන්නේ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ, කොටි සංවිධානයේ දේශපාලන පෙරමුණ විධියටයි කටයුතු කළේ. ඒ දේශපාලන පෙරමුණට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්න ඕනෑය කියලා අපි එදා පැහැදිලිව කිව්වා. එදා ඉන්දියාව මොකද කළේ? ඉන්දියාව 1962 දී මදුරාසියේ වෙනම පාලනයක් ඇති කරන්න, වෙනම ද්‍රවිඩ ස්ථානයක් ඇති කරන්න, අසාගම් ව්‍යාපාරය, අපි දෙමළ ව්‍යාපාරය ඇති කරලා අන්න දොරෙයිලා සටන් කර ගෙන යන කොට එදා නේරු මොකද කළේ. ඒ සියලුම දේශපාලන ව්‍යාපාර තහනම් කළා. ඔවුන් අවසානයේ පිළිගත්තා ඉන්දියාවේ එක්සත්භාවය. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ ආකාරයමට තමයි මේ දෙමළ ජාතික සන්ධානයේ ක්‍රියා කලාපය සම්බන්ධයෙනුත් අනුගමනය කළ යුතුව තිබුණේ. නමුත් අවාසනාවට හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ පියවර ගත්තේ නැහැ. කොටි සංවිධානයේ දේශපාලන පෙරමුණට එරෙහිව නීත්‍යානුකූලව පියවර ගත්තේ නැහැ. එදා ඒ පියවර අරගත්තා නම් අද ඔවුන් මේ ආකාරයට කටයුතු කරන්නේ නැහැ.

ඒ නිසා අපි කියන්න ඕනෑ. මේ යෝජනාව තුළින් රටේ ජාතික සමගිය, සංහිඳියාව, සහජීවනය, ඒකාග්‍රතාවය බිඳ වැටෙනවා. එවැන්නකට කිසිසේත් අපි ඉඩ දිය යුතු නැහැ. මෙතැන පක්ෂ වශයෙන් අප අතර මතවාදී වෙනස්කම් තිබෙන්න පුළුවන්. දේශපාලන වෙනස්කම් තියෙන්න පුළුවන්. දේශපාලන වශයෙන් බෙදිලා ඉන්න පුළුවන්. නමුත් අපි කියන්න ඕනෑ. රට බෙදන්න දෙන්න බැහැ. රට ෆෙඩරල් කරන්න දෙන්න බැහැ. මේ රට අපි එක රටක් විධියට තියා ගන්න ඕනෑ. දකුණේ අන්තවාදයක් ගැන කථා කරනවා. දකුණේ අන්තවාදයක් පෝෂණය කරන්න හේතුවක් නැහැ. උතුරෙනුයි අද මේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. ඒ නිසා දකුණේ නොසන්සුන්තාවයක් ඇති වෙලා තිබෙන්නේ. එදා 1972 දී කොල්වින් ආර්. ද සිල්වා, ලංකා සම සමාජ පක්ෂයේ එතුමා තමයි එදා ව්‍යවස්ථාව සම්පාදනය කරන කටයුත්තේ හිටපු ප්‍රමුඛයා. එතුමා තමයි රටේ ඒකීයභාවය ඒකට ඇතුළු කළේ. ඒ වාගේම අපි කියන්න ඕනෑ, බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දෙන්න කියන

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

කාරණය ඇතුළු කළේ. ඒ නිසා 72 ව්‍යවස්ථාව 78 දී වෙනස් කළෙත් නැහැ. ඒකීයභාවය රැකුණා. ඒ නිසා මේ ආණ්ඩුවට කිසිම විධියකට - අපි ඒ ආණ්ඩුවේ පාර්ශවකරුවෝ තමයි. ඒ නිසා අපි කියන්න ඕනෑ. කිසිසේත් ජනවරමක් නැහැ මේ රට බෙදන්න. මේ රට බෙදන්න එවැනි ජනවරමක් ලැබිලා නැහැ. ඒ නිසා මේ යෝජනාව අපි ප්‍රතික්ෂේප කළ යුතුයි. මේ හරහා බලාපොරොත්තු වෙන්නේ විශේෂයෙන්ම අද රට ඇතුළේ නොසන්සුන්තාවයක් නිර්මාණය කරන්න. ඒ නොසන්සුන්තාවය නිර්මාණය කිරීම හරහා ඔවුන් විශේෂයෙන්ම උත්සාහ කරන්නේ, තමිල්නාඩුවේ ජූනි මාසයේ පැවැත්වෙන ප්‍රාන්ත මැතිවරණයට අවශ්‍ය ආකාරයට උතුරේ දේශපාලනය හසුරුවන්නයි මේ සූදානම් වෙන්නේ. එහෙම නම් ජයලලිතාගේ අද ප්‍රධාන සටන් පාඨයක් වෙලා තිබෙනවා, උතුරට ඊළාම් රාජ්‍යයක් දීනා දෙනවාය කියන එක. ඒ වාගේම උතුරට ෆෙඩරල් අරන් දෙනවාය කියන එක. ඒ නිසා මේ තමිල්නාඩුවේ දේශපාලනයට ලංකාවේ උතුරේ දේශපාලනය අද ෆුට්බෝලයක් බවට පත් කර ගනිමින් තිබෙන්නේ. ඒ නිසා අපි පැහැදිලිව ඉල්ලා සිටින්න කැමැතියි. මේ යෝජනාව හරහා අද සම්බන්දන් මැතිතුමා හැසිරෙන ආකාරය බලන්න. මොකක්ද අද එතුමා කියන්නේ? මේ මම නොවෙයි කියන්නේ. සම්බන්දන් මැතිතුමා.

*"කොටින්ගේ සන්නන්ද අරගලය සාධාරණයි?"*

කොටින්ගේ සන්නද්ධ අරගලය සාධාරණයි කියලා රටේ විපක්ෂ නායකවරයා කියන කොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ 26,000 ක් ජීවිත පූජා කරපු රණවිරුවන්ගේ පවුල්වලට ඇති වන හැඟීම මොක්කද? ඒ වාගේම තමයි 24,000 ක් අතපය නැතිව අද අබ්බගාතයෝ බවට පත් වෙලා ඉන්න ඒ රණවිරුවන්ට ඇති වන හැඟීම මොකක්ද? මේ රටේ බහුතර ජනතාව තුළ ඇති වන හැඟීම මොකක්ද? අපි කියන්න කැමැතියි. කොටින් කරපු අරගලය, ප්‍රභාකරන් කරපු අරගලය සාධාරණයි කියලා කියනවා නම්, අපි කියන්න කැමැතියි, ඒ ප්‍රභාකරන්ගේ ඒ ව්යරු ත්‍රස්තවාදය, ඒ ම්ලේච්ඡ ත්‍රස්තවාදය සහමුලින් විනාශ කරපු එක සිය දහස් ගුණයක් සාධාරණයි කියලා. ඒ නිසා මේ කාරණය සම්බන්ධයෙන් අපි පැහැදිලිව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නේ, මෙවැනි යෝජනාවක් ගෙන ඒම තුළින් ශ්‍රී ලංකාවට කිසිසේත් අනාගතයේදී ඉදිරියට යන්න පුළුවන්කමක් නැහැ. අද වන කොට අපට දැන ගන්න ලැබෙනවා,

*"මරාගෙන මැරෙන ඇඳුම් සමඟ හිටපු කොටියා කොටු වෙයි."*

පසුගියදා කිලිනොච්චියේදී Suicide ජැකට් එකක් අහු වුණා. දැන් කොටි සංවිධානයේ නායකයෝ, නැවත වතාවක් භාර වුණු අය, පුනරුත්ථාපනය වුණු අය අද පොලිස් ත්‍රස්ත විමර්ශන ඒකකයෙන් අත්අඩංගුවට ගන්න පටන් අරගෙන තිබෙනවා. නගුලන් අත්අඩංගුවට ගත්තා. රාම් අත්අඩංගුවට ගත්තා. තමිල් අරුසුකච්චි පක්ෂයේ තරුණ පෙරමුණේ නායකයා, මන්නාරමේ නායකයා ඔහු අත්අඩංගුවට ගත්තා. මම මේ ගැන ඇහුවා සුමන්දිරන් මන්ත්‍රීතුමාගෙන්. ඔබතුමන්ලාගේ පක්ෂයේ නියෝජිතයෙක් නේද මේ මන්නාරමේදී අත්අඩංගුවට අරගෙන තිබෙන්නේ කියලා. එතුමා මට කිව්වා. පසුගිය වසරේ තිබුණු ජනාධිපතිවරණයේදී පක්ෂය ගත්ත තීරණයට විරුද්ධවයි ඔහු හිටියේ. ඒ නිසා ඔහුගේ සාමාජිකත්වය අත්හිටවපු කෙනෙක්. ඒ නිසා ඔහු අපට සම්බන්ධ නැහැ. ඔහුගේ හිතෛෂීභාවයක් තිබෙනවාය එල්.ටී.ටී.ඊ. සංවිධානයට කියලා. ඒ නිසා පැහැදිලිව අපි කියන්න ඕනෑ. නැවත වතාවක් මේ Suicide ජැකට් එක හරහා අපට පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. කොටි සංවිධානය නැවත ප්‍රතිසංවිධානය වීමක් තිබෙනවා. විශේෂයෙන්ම ඔවුන්ට උවමනාවක් තිබෙනවා, මේ ත්‍රස්තවාදය පරාජය කරපු නායකයින්, හමුදා නායකයින් ඇතුළු අපේ සන්නද්ධ ප්‍රධානීන්ගෙන් පළිගැනීමේ උවමනාවක් තිබෙනවා. ඒක ලෝකය පුරා අපට දැක ගන්න පුළුවන්. අපි ඉන්දියාවේ දැක්කා. ඉන්දිරා ගාන්ධිගෙන් පළිගත්තා. ඒ වාගේම අවුරුදු 15 කට පස්සේ ඒ ත්‍රස්තවාදය පරාජය කරන්න කටයුතු කරපු ජෙනරාල්වරයා බ්‍රිතාන්‍යයේදී ඝාතනය කරන්න උත්සාහ කළා. ඒ නිසා මේ පිළිබඳව අපි සියලු දෙනාම වගකීමෙන් කටයුතු කරන්න ඕනෑ. ජාතියේ වගකීම ඉස්සරහා කෝලම් නටන්න බැහැ. ඒ නිසා හැම කෙනෙකුම රටේ ජාතික ආරක්ෂාව ප්‍රමුඛ කාරණය විධියට සලකන්න ඕනෑ. රටේ ඒකීයභාවය ප්‍රමුඛ කාරණය විධියට සලකන්න ඕනෑ. ඒ වාගේම අපි කියන්න ඕනෑ. කිසිසේත් රටේ ඒකීයභාවය උල්ලංඝනය කරන්න පුළුවන්කමක් නැහැ. ඒක අනුල්ලංඝනීය කොන්දේසියක් විධියට පිළිගත යුතුයි කියන එකයි අපේ අදහස. ඒ නිසා මෙම යෝජනාව මේ සභාවට මම ඉදිරිපත් කරන්නේ, උතුරු පළාත් සභාවෙන් ගෙනෙන

මේ යෝජනාව හරහා අනිවාර්යයෙන්ම ඉදිරි කාලයේදී මේ රට තුළ විශාල නොසන්සුන්තාවයක් ඇති වෙනවා. බෙදීමක් ඇති වෙනවා. එය අප අතර ඇති වෙමින් තිබෙන විශ්වාසය, ඒ වාගේම අපි අතර ඇති වෙමින් තිබෙන සහජීවනය සම්පූර්ණයෙන්ම මේකෙන් බිඳ වැටෙන්න පුළුවන්. ඒ නිසයි අපි කියන්නේ. මේ සම්බන්ධයෙන් වගකීමෙන් රටේ නායකයින් කටයුතු කළ යුතු නිසා අද මේ පළාත් සභාවේ ඉන්න සියලුම මන්ත්‍රීවරුන්ගෙන් මම ඉල්ලා සිටින්න කැමැතියි. අපි මේ යෝජනාව ප්‍රතික්ෂේප කරමු. අපට බෙදිලා දේශපාලනය කරන්න පුළුවන්. හැබැයි, රට බෙදුණොත් ආපහු කවදාවත් අපට දේශපාලනය කරන්න ඉඩක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා බෙදුණු රටක ජීවත් වෙනවාට වඩා හොඳයි අපි සියලු දෙනා මේ බෙදුම්වාදය පරාජය කරන්න එක්සත්ව, එක්සිත්ව මේ ගෙනෙන යෝජනා - දේශපාලන පෙරමුණෙන් මේ යෝජනාව ආවත්, ඒ වාගේම වෙන ආකාරයකින් පළාත් සභාව හරහා මේ යෝජනාව ආවත් අපි ඒක පරාජය කරන්න කටයුතු කරන්න ඕනෑය කියන ඉල්ලීම කියමින්, ඔබ සියලු දෙනාගේ සහයෝගය මේ යෝජනාවට ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ හිතවත් ජාතික හෙළ උරුමයේ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව සම්බන්ධයෙන් මට කියන්න තිබෙන්නේ, අර කථාවක් තිබෙනවා බල්ලෝ බිරුවාට කඳු පාත් වෙන්නේ නැහැයි කියලා. (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බල්ලෙක්ද බිරුවේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කරුණාකරලා පොඩ්ඩක් මේක අහගන්න කෝ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම මේ කථාවක් කිව්වා විතරයි. (බාධා කිරීම්) ඔබතුමන්ලාට තවම මේක තේරුම් ගන්න බැරි වෙලා තිබෙන්නේ. ඒකයි මම මේ කියන්න හදන්නේ. තවමත් තේරුම් ගන්න බැහැ.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඔබතුමාට තේරුම් යන කොට රටම විනාශයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රශ්නය ආවාට පස්සේ අපේ ජනාධිපතිතුමා ප්‍රකාශයක් කළා. මේ පළාත් සභාවල දහස් ගණන් යෝජනා ගේනවා. ගෙනාවාට එකක්වත් ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ නිසා තමයි මම කිව්වේ, බල්ලෝ බිරුවාට කඳු පාත් වෙන්නේ නැහැයි කියලා. ඒ නිසා අද මේ යෝජනාව ගෙනෙන එකෙන් - මේ යෝජනාවට 200% ක් මම එකඟයි. මම කියන්නේ මේ යෝජනාව ගෙන ඒමෙන් අද මොනවාද අපි කරන්නේ? මේකට තවත් ඔක්සිජන් දාන එක තමයි අපි කරන්නේ. උතුරේ ගෙනාපු යෝජනාව ඇවිල්ලා පුස්සක්. මේ දකුණ අවුස්සන්න ගෙනාපු දෙයක්. අපි තවත් ගින්දර දාන එක තමයි කරන්නේ. දැන් අපේ නිශාන්ත ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ - එතුමා ව්‍යවස්ථාව කියෙව්වා. මම ආයිත් කියන්න ඕනෑ නැහැ නේ? ඒ අනුව මේ යෝජනාව ඇත්තටම ව්‍යවස්ථා විරෝධීයි. අපි මොනවාටද මෙපමණ කලබල වෙන්නේ. අපි ඇයි මෙපමණ කලබල වෙන්නේ? දැන් උතුරේ ඉන්නේ සුළුතරයක්. දමිළ ජනතාව ඇවිල්ලා 15% ක් විතර සුළුතරයක් තමයි ඉන්නේ. ඒකෙනුත් ගොඩක් ඉන්නේ මේ රටෙන් පිට. මේ ලංකාවේ ගොඩක් දෙනෙක් නැහැ. අනික් කොටස ඇවිල්ලා - හරි නම් අපේ මන්ත්‍රීතුමා මේක කථා කරනවා නම්, එතුමාගේ නායකයා කථා කරන්න ඕනෑ. සම්බන්දන්ට විපක්ෂ නායකකම දෙද්දී ඒකට විරුද්ධ වෙන්න තිබුණා. දැන් එතුමාම කියනවා නේ මේ කොටියෝ නියෝජනය කරන්නේ සම්බන්දන්ලා කියලා. ඒ වෙලාවේ විරුද්ධ වෙන්න තිබුණා නේ? සම්බන්දන්ට විපක්ෂ නායකකම දෙද්දී. ඇයි කට වහගෙන හිටියේ? කොටින්ට ඔක්සිජන් දෙන්නද ඒ වෙලාවේ කට වහගෙන හිටියේ. ඒ විපක්ෂ නායක තනතුරේ හයිය අරන් නේද අද එතුමා කථා කරන්නේ.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ආණ්ඩුව අවුල්ද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ආණ්ඩුවේ කිසිම අවුලක් නැහැ.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මට පේන්නේ අවුල් වාගේ. තව මාස පහ හයයි ආණ්ඩුව යන්නේ ඔහොම.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපට කලබල වෙන්න කිසිම අවශ්‍යතාවයක් නැහැ. ඉතාමත් පැහැදිලිව එතුමාම කියෙව්වා ජනාධිපතිවරණයේ දුන්න ඒ පොරොන්දු පත්‍රය මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා මොනවාද ප්‍රකාශ කරලා තිබෙන්නේ කියලා. අගමැතිතුමා මොනවාද කියලා තියෙන්නේ කියලා. ඉතාමත් පැහැදිලිව කියනවා ඒකීය රටක්. අපි ප්‍රාන්ත ක්‍රමයට විරුද්ධයි. මේ රට - (බාධා කිරීම්) ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කෝකිලා මන්ත්‍රීතුමියට වෙලාවක් දෙන්න කථා කරන්න. මොකද, මීට ඉස්සෙල්ලාත් ඔය වාගේ කලබලේ කෑ ගහලා තමයි අනා ගත්තේ. ඔය කියන ප්‍රාන්ත ක්‍රමයක් මේ රට තුළ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමිය බාධා කරන්න එපා. මම හිතන්නේ බාධා කළොත් ශ්‍රීනාත් මන්ත්‍රීතුමා පැය දෙකක් විතර කථා කරයි. ඒ නිසා කථාව සීමා කරන්න වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔය කියන ප්‍රාන්ත ක්‍රමයක් මේ රට තුළ ඇති කරන්න, මේ රට එපමණ ලොකු රටක් නොවෙයි. අපි පළාත් සභාවකුත් වෙන් කරලා දීලා තිබෙන්නේ ඉතාමත් අමාරුවෙන්. පළාත් සභා මේ රටට ගෙනාවේ මේ ජාතික ප්‍රශ්නයට විසඳුමක් හැටියට. රට බෙදන්න නොවෙයි. රටේ කෑල්ලක් කඩලා වෙනම ෆෙඩරල් පාලනයක් දෙන්න නොවෙයි. ඒකට අපි විරුද්ධයි. ඒකට මමත් විරුද්ධයි. හැබැයි, අපි කියන්න ඕනෑ, අපි සුළුතරයක් යෝජනාවක් ගෙනාපු පළියට අපි කලබල වෙන්න හොඳ නැහැ. අපි මේ රටේ අලුත් ආණ්ඩුව, අලුත් ජනාධිපතිතුමා, සංහිඳියාව වෙනුවෙන් විශාල කැප කිරීම් කරලා තිබෙනවා. ඒකෙන් එකක් තමයි ඔය සම්බන්දන් මහත්තයාට විපක්ෂ නායකකම දීම කියන එක මම තේරුම් අරගෙන හිටියේ ඒ විධියට. එහෙමවත් හිත හදා ගන්න පුළුවන් වුණා අපට.

අද ලෝකය පිළිඅරගෙන තිබෙනවා. ලෝකය අපට උදව් කරන්න ඉදිරිපත් වෙලා තිබෙන්නේ. අපි සංහිඳියාව වෙනුවෙන් ක්‍රියා කරලා තිබෙනවාය කියන එක අද ලෝකය පිළිඅරගෙන තිබෙනවා. අපි එහෙම කරලා තිබෙද්දී මේ අලුත් රජය - උතුරේ මෙහෙම යෝජනාවක් ගේන එක වැරදියි. මේ රට දෙකට බෙදන්න, කඩන්න, ජාතිවාදී ප්‍රශ්නය ඇති කරන්න මෙන්න මේවාවලට ඔක්සිජන් දාන අය තමයි අද මෙවැනි යෝජනාවක් ගෙනැල්ලා මේ රටේ දකුණ අවුස්සන්න, ගිනි තියන්න හදන්නේ මේ යෝජනාවෙන්. ඒක තමයි ඇත්ත කථාව. අපට එපමණ කලබල වෙන්න දෙයක් නැහැ. ඔබතුමාත් මේ රජයේම පාර්ශවකරුවෙක්. මේ රජයේ පාර්ශවයක් හැටියට ජනාධිපතිතුමා කිව්වා නම්, අපට කලබල වෙන්න දෙයක් නැහැයි කියලා. මේ පළාත් සභාවේ යෝජනාවක් කියන්නේ, නිකම්ම නිකම් පුස්සක් කියලා. ඉතින් ඇයි අපි නිකම් කලබල වෙලා මේ වාගේ යෝජනාවක් ගේන්නේ. මේ සම්බන්දන්ලාට, උතුරේ පළාත් සභාවට අපි මේ ලෝකය පුරා අද ප්‍රසිද්ධියක් ලබා දෙනවා. ජාතිවාදය අවුස්සන්න නැවත වරක් ඔක්සිජන් දෙන එක තමයි අද අපි මේ යෝජනාවෙන් කරන්නේ. ඒ නිසා මම ඉතාමත් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. අපි කලබල වෙන්න හොඳ නැහැ. කලබල වෙලා තමයි 1983 දී මෙහේ ගිනි තියන්න පටන් ගත්තේ. කොළඹ 13 ක් මැරුණු හින්දා ගිනි තියන්න පටන් ගත්තේ. කලබල වෙලා තමයි මහින්ද රාජපක්ෂ කොටියාට සල්ලි දීලා, 2000 දී රනිල් වික්‍රමසිංහව පැරැද්දුවේ. ඒ කලබල වුණු නිසා. අන්න ඒ නිසා කලබල වෙන්න එපා. අපට අලුත් ජනාධිපතිවරයෙක් ඉන්නවා. අලුත් අගමැතිවරයෙක් ඉන්නවා. අලුත් ආණ්ඩුවක් තිබෙනවා. ඒගොල්ලන්ට කලබලයක් නැත්නම් මොකද මේ හෙළ උරුමයේ දෙන්නෙක් තුන් දෙනෙක් කලබල වෙලා තිබෙන්නේ. මොකක්ද කලබලය? ඇයි මේ ඔක්සිජන් දෙන්න හදන්නේ. මම මීට ඉස්සෙල්ලාත් කිව්වා. මේ සුළු පක්ෂ කරන්නේ මොකක්ද? රටේ පොඩිම දෙයක් ආවොත් ඒ ප්‍රශ්නය විශාල කරලා පෙන්වලා

තමන්ගේ ඡන්ද පදනම වැඩි කර ගන්න හදන එක. දේශපාලන බංකොලොත් භාවයෙන් ගොඩ එන්න හදන එකක් තමයි මේක.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

අපිට වුණාම -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ආ දැන් කට ඇරුණාද? මම හිතුවා මෙපමණ වෙලා හොඳට අහගෙන හිටියා කියලා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

කට කොහොමත් ඇරෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් තමයි බංකොලොත්කාරයෝ එළියට එන්නේ. දැන් තමයි ඔක්සිජන් ටිකක් ලැබිලා තිබෙන්නේ. අන්න ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාමත් පැහැදිලිව උතුරේ ගෙනාපු යෝජනාවට දකුණේ සිටින සියලුම ජාතීන් විරුද්ධයි කියන එක අපි කවුරුත් දන්නවා. අද සියලුම දෙනා නිදහසේ ඉන්නේ. මම මේකත් කියන්නම්. ඔබතුමන්ලා ඉතාමත් සන්තෝෂ වෙයි. එදා මේ රටේ ජනතාව කරපු කැප කිරීම වාගේම මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා - එදත් කිව්වා. අදත් කියනවා. මේ යුද්ධය වෙනුවෙන් දේශපාලන නායකත්වය දුන්නා. ඒක ඇත්ත කථාව. ඒ වාගේම මේ රටේ ජනතාව ඊට වඩා ලොකු කැප කිරීම් කළා. හැබැයි, මේවාවල වාසිය ගන්න එක එක කුඩා දේශපාලන පක්ෂ දැගලුවා. විමල් වීරවංශලා කෑ ගහගෙන ගියේ එදා ඒකයි. ජාතික හෙළ උරුමය ඔපමණවත් ආවේ මේ ජාතිවාදී ප්‍රශ්නය අවුස්සලා. එදා බේරුවල මුස්ලිම් ජනතාවගේ ප්‍රශ්නය ඇවිස්සුවේ කවුද? ඒක පිටිපස්සේ හිටියේ කවුද? අපි දන්නවා කවුද හිටියේ කියලා. ජාතික හෙළ උරුමයේ උදය ගම්මන්පිලලා හිටියා කියලා එදත් මම කිව්වා. හැබැයි, එතකොට මේගොල්ලෝ කෑ ගැහුවා නැහැයි කියලා. අද ගම්මන්පිලලා මේගොල්ලන්ට හොඳ නැහැ. අද ඒගොල්ලෝ නැතිව මේකෙන් පෝෂණය වෙන්න හදනවා. ඒ නිසා සුළු පක්ෂවලට අපි කියනවා. නැවත වරක් රට ගිනි තියන්න හදන්න එපා. මේ රට ගිනි තියන්න හදන්නේ. මේ සුළු දේශපාලන පක්ෂවල පැවැත්ම සඳහා මේ රටේ දකුණේ ජනතාව අවුස්සන්න කරන වැඩ මේවා. අපි කවුරුත් කලබල වෙන්න එපාය කියන්නේ ඒකයි. අපි කලබල වුණොත් එදා 1983 වාගේ නැවත වරක් මේ රටේ ජනතාව පටන් ගනියි, මෙහෙත් මොන මොනවාහරි කරන්න. අන්න ඒක තමයි අද මේ සුළු පක්ෂවලට අද ඕනෑ වෙලා තිබෙන්නේ. අන්න ඒක තමයි අද ඔබතුමන්ලා මෙවැනි යෝජනාවක් ගෙනැල්ලා බලාපොරොත්තු වෙන්නේ.

උතුරු පළාත් සභාවේ යෝජනාවක් ගෙනාවා කියලා කවුද ගණන් ගන්නේ? මේ යෝජනාව ගේනකල් නොවෙයි මේගොල්ලෝ කොටියෝ වෙලා හිටියේ. ඊට ඉස්සෙල්ලාත් කොටියෝ. ත්‍රස්තවාදය වෙනුවෙන් තමයි ඒගොල්ලෝ පෙනී සිටියේ. උතුරු පළාත් සභාවේ මීට පෙරත් එක එක යෝජනා ගෙනාවා. හැබැයි, මුකුත් කිව්වේ නැහැ. කට වහගෙන හිටියා. දැන් අද මොකද එකපාර කලබල වෙලා, කුලප්පු වෙලා තිබෙන්නේ? කරුණා අම්මාන්ලාව තියාගෙන හිටියේ මේගොල්ලෝ. පිල්ලෙයාන්ලාව තියාගෙන හිටියේ. උප සභාපති කර ගෙන හිටියේ. දැන් මොකක්ද තිබෙන කලබලය. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මට තිබෙන ප්‍රශ්නය මේ හෙළ උරුමය - (බාධා කිරීම්) අපට ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලාගේ ස්ථාවරය ඉස්සෙල්ලා කියන්න. ඔබතුමන්ලා ඉන්නේ කොයි පැත්තේද කියලා ඉස්සෙල්ලා කියන්න. ස්ථාවරය ඉස්සෙල්ලා කියන්න. ඔබතුමන්ලා ඉන්නේ සම්බන්දන්ලාත් එක්කද? පිල්ලෙයාන්ලාත් එක්කද? කරුණා අම්මාන්ලාත් එක්කද? මහින්ද රාජපක්ෂ එක්කද? මෛත්‍රීපාල සිරිසේනත් එක්කද? (බාධා කිරීම්) කාත් එක්කද ඉන්නේ. මොන ආණ්ඩුවේද ඉන්නේ? ආණ්ඩු විරෝධීද? ආණ්ඩු පක්ෂයේද? කියන්න. අපට කියන්න. මේ වාගේ පොඩි පොඩි දේවල් අවුස්සාගෙන, මේ වාගේ පොඩි පොඩි දේවල් අල්ලා ගෙන දේශපාලන වාසි ගන්න හදන්න එපා. ඉස්සෙල්ලාම සංඝරත්නය පාවා දුන්නා. මේ රටේ බෞද්ධකම නැති කළේ ඔබතුමන්ලා. සංඝරත්නය, හාමුදුරුවන්ව දේශපාලනයට ගෙනැල්ලා මොනවාද කළේ? මේ රටේ හාමුදුරුවන්ට, සිවුරට තිබෙන ගරුත්වයත් නැති කළා. ඒක තමයි කළේ. ඤානසාර හාමුදුරුවෝ වාගේ අය අද මේ වාගේ නටන්නේ ඇයි? මේ ඉන්න හෙළ උරුමයට පින් සිද්ධ වෙන්න තමයි අද ඒවා කරන්නේ. සෝම හාමුදුරුවන්ට පින් සිද්ධ වෙන්න. සෝම හාමුදුරුවන්වත් විකුණා ගත්තා. උන් වහන්සේගේ

[ගරු ශ්‍රීනාත් පෙරේරා]

ජීවිතයත් නැති කර ගත්තා. (බාධා කිරීම්) අන්න ඒ නිසා මේ පොඩි පොඩි දේවල් අල්ලා ගෙන උඩ පනින්න හදන්න එපා. දැන්වත් යථාර්ථය තේරුම් ගන්න. ඉවසීමෙන් වැඩ කළේ නැත්නම් මේ රටේ නැවත වරක් ගිනි බෝලයක් ඇවිස්සෙනවාය කියන එක හොඳට මතක තියා ගන්න. මේ රට ගිනි තියන්න අවශ්‍ය ඔක්සිජන් ටික දාන්න එපා ආයිත් පාරක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවා හොඳයි ප්‍රසිද්ධියට. අද හොඳ වෙලාවට සිරස ඇවිල්ලා නැහැ. රූපවාහිනිය ඇවිල්ලා නැහැ. අපේ සභාවේ එක විතරයි තිබෙන්නේ. නැත්නම් මේගොල්ලෝ මීට වඩා දඟලනවා. අද දේශපාලනයේත් වෙලා තිබෙන්නේ මේක තමයි. රඟපෑමම තමයි තිබෙන්නේ. රඟපාන්න, රඟපාන්න මනාප ටික වැඩි වෙනවා. (බාධා කිරීම්) අපේ මේ මන්ත්‍රීතුමා හිතුවා සිරස ඇවිල්ලා කියලා. එතුමාත් ගෙනැල්ලා සංශෝධනයක් එවුවා. ඒ සිරස නොවෙයි. මේ සභාවේ අය මේ ඇවිල්ලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි පසුගිය රජය ගරු හිටපු ජනාධිපතිතුමාගේ, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය, එතුමාගේ සහෝදරයා බැසිල් රාජපක්ෂ මහත්තයා මේ සියලු දෙනාම පැරදුනාට පස්සේ එක කථාවක් කිව්වා. අපි උතුරට, නැගෙනහිරට, දකුණට පුළුවන් තරම් සංවර්ධනය කළාය කිව්වා. හැබැයි, අපට සංහිඳියාව ඇති කර ගන්න බැරි වුණාය කිව්වා. දැන් මේ අලුත් රජය හදන්නේ, අලුත් ජනාධිපතිතුමා හදන්නේ මේ සංහිඳියාව ඇති කර ගන්න. ඒ සංහිඳියාව ජනතාව එක්ක ඇති කර ගෙන යද්දී මේ කොටි හිතවාදී, දේශපාලනය කරන අය සුළු පක්ෂවල අය හදනවා මේකට ගිනි තියන්න. ඒක තමයි ඇත්ත කථාව. අපි පුළුවන්තරම් හදන්න ඕනෑ දමිළ ජනතාවගේ හිත දිනා ගන්න. නැත්නම් ඒගොල්ලන්ව අවුස්සන්වත්, එහෙන් යෝජනාවක් ගෙනාවාය කියලා අපි කලබල වෙලා මෙහෙත් ඇවිස්සුවොත් වෙන්නේ නැවත වරක් ජාතිවාදය ඇවිස්සෙන එකයි. එක පැත්තක් උඩ බලාගෙන බිරුවාට වැඩක් නැහැ. අනික් පැත්තෙනුත් බිරුවොත් තමයි ඝට්ටනයක් ඇති වෙන්නේ. ඒ ඝට්ටනය ඇති කරන්න අවශ්‍ය ඔක්සිජන් ටික තමයි අද මේ දාන්න හදන්නේ. ඒ නිසා අපි ඉතාමත් පැහැදිලිව කියනවා, දකුණේ ජනතාවට කලබල වෙන්න එපා. මෙවැනි යෝජනා ගෙනාවාට කලබල වෙන්න එපා. කිසි දිනක මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා හෝ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ඉන්න එක්සත් ජාතික පක්ෂය මේ රට ෆෙඩරල් ක්‍රමයට බෙදනවාටවත්, ප්‍රාන්ත ක්‍රමයට බෙදනවාටවත් අපි ඉඩ දෙන්නේ නැහැයි කියන එක අපි ඉතා පැහැදිලිව කියනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ කාලය ලබා දීම ගැන. අපි කනගාටු වෙනවා. මේ සුළු පක්ෂවලින් අපි ඉල්ලා සිටිනවා. ජනප්‍රිය දේශපාලනය කළාට කමක් නැහැ. ජාතිවාදය අවුස්සලා ජනප්‍රිය දේශපාලනය කරන්න එපා. ඒකේ ඵලවිපාක විඳින්න වෙන්නේ අපේ දරුවන්ටයි. අන්න ඒ නිසා ඉවසීමෙන් කටයුතු කරන්නය කියලා ඔබතුමන්ලා සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කථා කරන කොට බාධා කිරීම් කළා. මම හිතන්නේ, හොඳ කරුණු ටිකක් ඉදිරිපත් වුණා. දහවල් ආහාර ලැහැස්ති කරලා තිබෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමන්ලාට කථා කරන්න නිදහස තිබෙනවා. මීළඟට ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මම නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා මෙම යෝජනාව ගෙන ඒම සම්බන්ධව. එතුමා නොගෙනාවා නම් මම මේ යෝජනාව ගේන්න ලැහැස්ති වෙලයි හිටියේ. ඒකට විවිධ මත තිබෙනවා. විවිධ තර්ක තිබෙනවා. ඒ වාගේම මෙම යෝජනාව සැහැල්ලුවෙන් ඉවත් කළ යුතු යැයි කියලත් අපේ මන්ත්‍රීවරු කියනවා. හැබැයි, අපි විශ්වාස කරන්නේ, එදා රට පිළිගත් ආයතනයක. අපි දැන් මේ පළාත් සභාව පාර්ලිමේන්තුවට පස්සේ රට, ලෝකය පිළිගන්න ආයතනයක්. මේක උත්තරීතර ආයතනයක්. මෙවැනි ආයතනයක් තුළ තමයි එදා වර්ධරාජා පෙරුමාල් ඊලාම් රාජ්‍යයක් ගැන කිව්වේ. ඒ කිව්වාම එතුමාගේ ආණ්ඩුවම අහෝසි කරලා දැම්මා. පළාත් සභාවම විසුරුවලා දැම්මා. එතුමාට යන්න සිද්ධ වුණා. හැබැයි, අද මේ කියන්නේ රට පිළිගත්ත, ලෝකය පිළිගත්ත උත්තරීතර නීතිමය ආයතනයක් ඇතුළේ මේ ජනතා නියෝජන මන්ත්‍රණ සභාවක් තුළ. මේ සභාව

තුළ ගන්න තීන්දුවලට නීතිමය තත්ත්වයන් ඇති වෙනවා. මේ නීතිමය තත්ත්වයන් ජාත්‍යන්තර වශයෙන් බලපානවා. ජාත්‍යන්තර ජනමතය, ජාත්‍යන්තර ඩයස් පෝරාව වාගේම දෙමළ ජනතාවට අර කියපු ඔක්සිජන් ලැබෙනවා. ජාතිවාදීව අපට වෙනම පළාතක් වෙනම ඊළමක්, එහෙම නැත්නම් අපට වෙනම ෆෙඩරල් එකක් කියන කාරණාව. ඒ නිසා මේක හැල්ලුවෙන්, සැහැල්ලුවෙන් බැහැර කරලා, අපේ ජනාධිපතිතුමා දෙන්නේ නැහැ. අපේ අගමැතිතුමා දෙන්නේ නැහැ. එහෙම කියලා අත අරින්න පුළුවන්නම් අපි කාටත් සද්ද නැතිව ඉන්න පුළුවන්. එහෙම නම් ආණ්ඩුව කියපු දේවල් ඔක්කොම කරලා තිබෙනවා නම් එහෙම, හිතන්න පුළුවන් හරි ඒ ප්‍රශ්නයත් විසඳෙයි කියලා. හැබැයි, ආණ්ඩුව කියපු දේ නොවෙයි නේ වෙන්නේ? ජනතාවට දුන්න සහන පොරොන්දු නොවෙයි නේ දෙන්නේ? එදා ගොවියාට දුන්න සහනාධාර වැඩි කරනවා කියන කොට තිබුණු පොහොර සහනාධාරයත් අහිමි කරනවා. සහතික මිල 50 ක් දෙනවා කියලා අද 18 ට වත් විකුණා ගන්න බැරි තැනකට ඇවිල්ලා තිබෙනවා. ප්‍රේමදාස මහත්තයාම දුන්න පාසල් දරුවාගේ නිල ඇඳුම අද වවුචරයක් දීලා නැත්තට නැති කරමින් යමින් තිබෙනවා. සමෘද්ධි සහනාධාරය කපමින් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේ යෝජනාවට අදාළද?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

යෝජනාවට අදාළයි. ඉන්න, යෝජනාවට සම්බන්ධ කරන්න. ඒ වාගේම රටේ කම්කරුවාගේ කම්කරු දිනය සමරන්නේ කොහොමද? කම්කරුවාගේ විශ්‍රාම වැටුප කැපුවේ මේ ආණ්ඩුව. එහෙම තත්ත්වයක් තුළ ජනතාවට විශ්වාස කරන්න පුළුවන්ද මේ ආණ්ඩුව මේ ජනතාවගේ ප්‍රශ්න විසඳයි කියලා. එහෙම නැත්නම් අනික් අතට මේ වාගේ යෝජනා ඒකපාර්ශවිකව අතහැරලා, ඒවා වැඩක් නැහැයි කියලා කියයි කියලා. අද පත්තරේ සම්බන්දන් මහත්තයා කියනවා, යහපාලන ආණ්ඩුව නොවෙයි මොන ආණ්ඩුව තිබුණත් ද්‍රවිඩ ජනතාවට විසඳුමක් දෙන්නේ නැත්නම් පවතින්න බැහැ. ඉස්සරහාට යන්න දෙන්නේ නැහැයි කියලා. මොකක්ද කියන්නේ? එතුමා ඒ කියන්නේ, මේ යහපාලන රජය. අපි මේක කියෙව්වාම. යහපාලන රජයේ, බලයේ අපිත් කොටස්කරුවෝ. මේ ආණ්ඩුව හැදුවේ අපි. ඒ නිසා මේ ආණ්ඩුවේ කොටස්කරුවෝ විදියට අපටත් සාධාරණ ඉල්ලීම් තිබෙනවා. මේ ආණ්ඩුව ඒවා ලබා දිය යුතුව තිබෙනවා කියලා. මේක සාධාරණ ඉල්ලීමක් කියලා කවුද කියන්නේ?

මෙතුමා කියන විදියට අපි ඉපදෙන්නත් පෙර තමයි ෆෙඩරල් ඉල්ලුවේ. ෆෙඩරල් ඉල්ලුවා වාගේම සමහර ද්‍රවිඩ නායකයෝ ජාතිවාදීව සිංහලයන්ගේ හම අරගෙන සපත්තු හදලා කකුලේ දා ගෙන යන්න ඕනෑය කියලා ජාතිවාදීව අපි ඉපදෙන්නත් පෙර මේ රටේ සමහර දෙමළ නායකයෝ කියලා ජාතිවාදය වපුරලා තමයි දශක තුනක යුද්ධයකට මුල පැදුවේ. නිකම් නොවෙයි. ඒ මුලින් මුලින් දාපු බීජ ටික එකතු වෙලා තමයි මිනිස්සුන්ගේ ජනමතය වන්නේ, අපට වෙනම රටක් ඕනෑය කියලා. තමිල්නාඩුවේ ඉන්නවානේ අපි වාගේ හතර පස් ගුණයක් ජනතාව. කෝටි හයකට වැඩි ප්‍රමාණයක්. එහෙම නම් එහේ නේ ඊලාම් රාජ්‍යයක් හැදෙන්න ඕනෑ. දෙමළ ජනතාව වැඩි ප්‍රමාණයක් ඉන්නවා. මෙතුමාත් කිව්වා නේ 15% ක් ඉන්නේ කියලා. ඒ අඩු ප්‍රමාණයක් ඉන්න තැනක වෙනම ෆෙඩරල් ඉල්ලලා කටයුතු කිරීම - මේක අද වෙන්නේ නැති වෙන්න පුළුවන්. හෙට වෙන්නේ නැති වෙන්න පුළුවන්. හැබැයි, වසර ගණනාවක් යන කොට ජනමතය තුළ හැදිලා - මොකද, දැන් පුනරුත්ථාපනය කළ කොටි හොඳයි කියලා හිතාගෙන එළියට දානවා. හැබැයි, ටික දවසක් යන කොට ආයිත් ඒගොල්ලන්ගේ කාඩර් එක හදාගෙන, ඒගොල්ලෝ සූදානම් වෙනවා. එදත් එහෙමයි වුණේ. නිකම්ම ප්‍රභාකරන් බිහි වුණේ නැහැ. දේශපාලනය කරන අය ජනමතය හැදුවා. යම් ආයතනවල කථා කළා. හැබැයි, එල්.ටී.ටී.ඊ. එක වෙනම සන්නද්ධ වෙලා, ඒ ඉල්ලීම කළ ඒ නායකයෝත් මරලා, ඒ ඉල්ලීම අරගෙන යන්න ඉස්සරහාට තවත් පියවර රාශියක් ඉදිරියට තියලා දශක තුනක් තිස්සේ ලේ ගංගා, මිනී කඳු මේ රටේ වැපිරුවා. මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවක්, තමුන්නාන්සේලාගේ දරුවෝ, මේ රටේ පුංචි දරුවාගේ සිට ලේ කිරිකැටියාගේ ඉඳන් පෙති පෙති ගහලා මරණ යුද්ධයක් ඇති වුණේ මේ විෂ බීජය වපුරපු නිසයි. ඒ නිසා මේ විෂ බීජය පොඩ්ඩ පොඩ්ඩ පුළුල් වෙලා පැතිරිලා යනවා. මේකට නිකම්ම නිකම් හිටියොත් - දැන් පසුගිය කාලයේ මේ ආණ්ඩුව එන්න ඉස්සෙල්ලා මේ විෂ බීජය තිබුණේ නැහැ. මේ රටේ මේ සම්බන්දන්වත් වෙනත් කෙනෙකුවත් මේ ආණ්ඩුව එන්න ඉස්සෙල්ලා ෆෙඩරල් ඕනෑ කියන කාරණාව කිව්වේ

නැහැ. මහින්ද රාජපක්ෂ මැතිතුමා දශක තුනක ත්‍රස්තවාදය අවසන් කරලා, යුද්ධය අවසන් කරලා, ඒ පළාතේ ජනතාවට නිදහස දුන්නා. තමුන්නාන්සේලාගේ කාලයේ සාම කාලයක් තිබුණා. 2002 – 2004 දක්වා. අපිත් උතුරට ගියා. අපි ගියේ එල්.ටී.ටී.ඊ. එකෙන් වීසා අරගෙන. අපි ගියේ එල්.ටී.ටී.ඊ. එකේ ආයුධ මැද්දේ. අපි බෝට්ටුවෙන් යන කොට එල්.ටී.ටී.ඊ. කාරයෝ බර ගණනක් ඒගොල්ලන්ට ඕනෑ විධිටය පාලනය කරමින් ගියේ. පුදුම සාමයක් එදා තිබුණේ. ඒ සාමය තවදුරටත් ගියා නම් රට විනාශ වන නිසා තමයි අද තමුන්නාන්සේලාත් එක්ක ඉන්න චන්ද්‍රිකා නෝනා එදා ඇමතිකම් අයින් කරලා, එදා ඒ බලය නැති කළේ. රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ. තමුන්නාන්සේලාත් එක්ක අද එකට හිටපු අය. ඒ චන්ද්‍රිකා මැතිනිය එදා කිව්වේ මේ සාම ගිවිසුම රටේ නායිකාවටත් හොරෙන් ඇති කරලා ආයුධ දීලා, සල්ලි දීලා ඒ එල්.ටී.ටී.ඊ. එකත් එක්ක සාමය කියලා පවත්වාගෙන ගියේ රට බෙදීමේ දිසාවට කියන කාරණාව. ඒ නිසා තමයි එතුමිය ඒක ඒ වෙලාවේ අවස්ථානුකූලව කටයුතු කළේ. එහෙම කටයුතු කරලා, අපට කියන්න බැහැ නැවත නැවතත් ඉතිහාසය වෙනස් කළා. අද එකක් කියලා හෙට තව එකක්. එක මතයක ඉන්න ඕනෑ. රටේ ජනතාවට පැහැදිලි වෙන්නේ, යම් කෙනෙක් කියන ප්‍රකාශයක් විහිළුවක් නොවෙන්නේ යම් මතයක් යම්තාක්කල් ස්ථාවරව දරනවා නම්. හරි විධියට දරනවා නම්. මේ අද එකක් කියනවා. තව දවසක තව එකක් කියනවා. තවත් දවසක තව එකක් කියනවා. ලොසින්ජරයක් ලබා දුන්නත් මොනවා හරි සහනයක් ගන්න. මෙතුමන්ලා කියනවා, සම්බන්දන්ලා, TNA එක, ඒ වාගේම විග්නේෂ්වරන්ලා එල්.ටී.ටී.ඊ. එකට පක්ෂපාතියි. හිතවත්. එල්.ටී.ටී.ඊ. යේ කොටස්කරුවෝ. අද නොවෙයි එදත් හිටියා කියලා. එදා සරත් ෆොන්සේකා මහත්තයා ඡන්දය ගන්න කොට ඔය කට්ටියගේ සහාය ගත්තා.

ඒ වාගේම මහින්ද රාජපක්ෂ මැතිතුමාට විරුද්ධව අපේම ලේකම්තුමා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එහා පැත්තට ගිහිල්ලා ඡන්දය ඉල්ලන කොට ඔය කට්ටියගේ සහාය ගත්තා. එතකොට ඒ සහාය මෙතුමාගේ කථාවේදීත් කියවුණා. මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ කටයුතු හරියට කළේ නැහැයි කියලා. හැබැයි, එතුමා ඒක හරියට කරපු නිසා තමයි සම්බන්දන්ලා විග්නේෂ්වරන්ලා එතුමාත් එක්ක විරුද්ධ වුණේ. (බාධා කිරීම්) මම ඔබතුමාට බාධා කළේ නැහැ. අහගෙන ඉන්න. වෙලාව යන එක විතරයි වෙන්නේ. මම මගේ කරුණු ටික කියනවා තව පැය දෙකක් හරි. ඔබතුමන්ලා බාධා කළොත්. වෙන කරන්න දෙයක් නැහැ නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අර ටිකත් එක්කම කියන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මට ඔබතුමා කියන ඒවා කියන්න ඕනෑ නැහැ නේ? ඔබතුමාට වෙලාවක් දුන්නා. දිගට ඇදගෙන ගියා නේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සම්බන්දන්ලා එල්.ටී.ටී.ඊ. කාරයෝ කියනවා නම් සම්බන්දන්ලාත් එක්ක කොහොමද ගිවිසුම් ගහලා ආණ්ඩුව හදන්න, ජනාධිපතිකම් ගන්න එකතු වුණේ. එදා පෙනුනේ නැද්ද? මෙතුමන්ලාගේ පක්ෂයටත් ඒකේ පොඩි චෝදනාවක් තිබෙනවා. අපි එදා කිව්වෙත් ඒකයි. මහින්ද රාජපක්ෂ මැතිතුමා හරියට මේක කරපු නිසා තමයි යුද්ධය අවසන් කරලා, සංවර්ධනය කරලා රට හදන තැනට එන කොට තමයි සම්බන්දන්ලාට තේරුණේ ආයිත් අපට ඊළමක් හම්බ වෙන්නේ නැහැ. ආයිත් ෆෙඩරල් හම්බ වෙන්නේ නැහැ. දෙමළ ජනයාට ස්වයං බලයක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මහින්ද වට්ටන්න පුළුවන් මොකා එක්කද එකතු වෙන්නේ, ඒ මොකෙක් එක්ක හරි එකතු වෙලා මහින්දව වට්ටලා, අපි උතුරෙන්නේ පැරදුණේ. නැගෙනහිරින්නේ පැරදුණේ. අපට ලක්ෂ හතරක වෙනසක් නේ තිබෙන්නේ. ලක්ෂ දෙකක් මෙහා පැත්තට පැන්නා නම් මහින්ද මහත්තයා දිනනවා නේ? උතුරේ ඡන්ද ටිකෙන් තමයි අද මේ ආණ්ඩුව තියෙන්නේ. (බාධා කිරීම්) අමතක කරන්න එපා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති වුණේ උතුරේ ඡන්ද ටිකෙන්. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති ධූරයට එන්නේ උතුරේ ඡන්දයෙන්. එහෙම ඇවිල්ලා අද කියනවා එල්.ටී.ටී.ඊ. ලු.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

උතුර කියන්නේ ලංකාවේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමාගේ වෙලාව අරගෙන කියන්න. මට කියන්න දෙන්න කරුණාකරලා. එදා ඡන්දය ගන්න කොට

තමුන්නාන්සේලාගේ පක්ෂයේ හිටපු තිස්ස අත්තනායක මැතිතුමා කිව්වා රහස් ගිවිසුම් ගණනාවක් තිබෙනවාය කියලා. අද ඒවා එක එක එළියට එනවා. ඡන්දය වෙලාවේදී පැහැදිලිවම කිව්වා ටී.එන්.ඒ. එකතු කර ගන්නේ, ෆොන්සේකා මහත්තයා එකතු කර ගන්නේ, ජේ.වී.පී. එක එක පැත්තකින් සම්බන්ධ කර ගන්නේ මොන මොනවා හරි කාරණා කියලා. ජේ.වී.පී. එකට මේ විපක්ෂයේ සංවිධායකකම. මේ පොඩි පිරිසකට ලැබෙන්නේ. ටී.එන්.ඒ. එකට විපක්ෂ නායකකම. මේ පුංචි පිරිසකට ලැබෙන්නේ වෙන හේතුවක් නිසා නොවෙයි. එදා එකඟ වුණු විධියට රටේ ජනාධිපතිතුමා, අගමැති පත් වන කොට විපක්ෂ නායකත් පත් කරපු පළමුවැනි අවස්ථාව. ඉතින් ඒ නිසා පැහැදිලියි. ගිවිසුමක් තිබුණා. ඒ ගිවිසුම අනුව ඔවුන්ට යම් දේවල් ලබා දිය යුතුයි. ඒවා තමයි මේ ඉල්ලන්නේ. ඒ ඉල්ලන දේ දෙන්නේ නැත්නම් ඒ අය අරගල කරන තැනට එනවා. (බාධා කිරීම්)

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඕගොල්ලෝ ඉන්දියාවට ගිහිල්ලා 13 ප්ලස් දෙනවා කියපු ඒවා තමයි දැන් මේ ඉල්ලන්නේ. වෙන කවුරුත් පොරොන්දු වුණු ඒවා නොවෙයි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

පොඩ්ඩක් බලන්න මොළේ උඩද ඉන්නේ කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මහින්ද රාජපක්ෂ පොරොන්දු වුණු ඒවා තමයි ඔය ඉල්ලන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඇහුම් කන් දෙන්න පුරුදු වෙන්න. වාචාලයෙක් වෙන්නේ නැතිව. වාචාලයෙක් වෙන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇත්ත කියද්දී වාචාලයෝ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමා දැන් මෙපමණ වෙලා කථා කළා නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතින් ඔබතුමා ඇත්ත ටිකක් කියන්න කෝ?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමාගේ ඇත්තයි මගේ ඇත්තයි වෙනස්. ඔබතුමාට එදා එල්.ටී.ටී.ඊ. එකත් එක්ක එකතු වෙලා ආණ්ඩු හදන්න, ජනාධිපතිකම් ගන්න කොට හොඳයි. දැන් කියනවා ඒක එල්.ටී.ටී.ඊ. තමයි කියලා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, (බාධා කිරීම්) මගේ කථාව මම දීර්ඝ කරනවා. මට කරන්න දෙයක් නැහැ. බාධා කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ රටේ පුංචි ජන සංඛ්‍යාවක් ඉන්නේ. මේ රටේ විශාල භූමි විෂමතා නැහැ. එහෙම භූමි විෂමතා, විශාල ජන සංඛ්‍යා වෙනස්කම්, ජාතීන් අනුව වෙනස්කම්, ජාතීන් 75 ක් විතර ඉන්නවා නම්, භාෂා හත් අටසියයක් කථා කරනවා නම් ෆෙඩරල් හැදුනාට කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඉන්දියාවේ පවා ෆෙඩරල් කිව්වත් අපි දේශපාලන විද්‍යාව ඉගෙන ගන්න කොට අර්ධ සන්ධීය රාජ්‍යයක්. සම්පූර්ණ ෆෙඩරල් නොවෙයි. අගමැතිට, ජනාධිපතිවරයාට, ආණ්ඩුකාරවරයාට බලය තියාගෙනයි ඒ දීලා තිබෙන්නේ. මේ දැන් ඉල්ලන්නේ මොකක්ද? මේ ඉල්ලන්නේ මුළු දකුණම එකක් කර ගනිල්ලා. උතුර එකක් කර ගන්නවා. දෙකයි. මේක මාර තීන්දුවක්. අපටත් පළාත් සභා ෆෙඩරල් හදන්නේ ඒ අය. එහෙම නම් මේකේ මොකක්ද තිබෙන සදාචාරය එක පැත්තකින්. අනික් පැත්තෙන් මේක නොසලකා හරින්නේ ඇයි? මේ මතය තුළින් තමයි එදා

ප්‍රභාකරන්ලා බිහි වුණේ. ඒ නිසා හෙට දවසේ ප්‍රභාකරන්ලා බිහි වෙන්න අවශ්‍ය විෂබීජ, වසුරු වපුරමින් තිබෙන්නේ. ඒ තැනට යන්න අපි ඉඩ දෙනවාද නැද්ද කියන කාරණාවයි මේකෙන් මතු වෙන්නේ.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි පැහැදිලිවම කියනවා. එක පැත්තකින් මේ යෝජනාව ප්‍රතික්ෂේප කරන්න ඕනෑ. ඒ වාගේම මේ මොකක්ද උල්ලංඝනය කරන්නේ. මේ රටේ අපි දැන් උසාවියට ගිහිල්ලා මොනවා හරි කිව්වා කියලා නැත්නම් එළියේදී කිව්ව එකෙන් උසාවියට අපහාසයක් වුණා නම් - මමත් දැන් එහෙම අපහාස වුණාය කියලා අධිකරණයට ගිය කෙනෙක්. ගෝඨාභය මහත්තයා එළියට ආපු වෙලාවේ පිරිත් කියන්න හාමුදුරුවරු ගියාම, අපිත් ගියා කියලා ජයමිණී මන්ත්‍රීතුමන්ලා, අපි දැන් උසාවියේ දාලා තිබෙනවා. අපහාස කළාය කියලා. අපි දන්නේ වත් නැහැ එහෙම තීන්දුවක් තිබුණාය කියලා. හැබැයි, උසාවිය තිබෙන්නේත් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යට. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවනේ තමයි අධිකරණය ස්ථාපිත කරලා තිබෙන්නේ. අධිකරණයෙන් තමයි බලය එන්නේ ඔය හැම නෛතික ආයතනයකටම. අධිකරණයට බලය එන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්. එහෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තමයි මේ එල්.ටී.ටී.ඊ. එකට ඕනෑ දේ කරන මහ ඇමතිවරයා අද කරලා තිබෙන්නේ. එතුමාත් එක්ක ඉන්න ඒ අනික් පිරිස් කරලා තිබෙන්නේ. එහෙම නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උසාවියට අපහාස කළාට වඩා බරපතළ නැද්ද? එදා වරදරාජා පෙරුමාල්ව අයින් කළා නම් අද මෙතුමාව අයින් කරන්න ඕනෑ. මේ පළාත් සභාව විසුරුවා හරින්න ඕනෑ. මම හිතනවා, නායකයෙක් කොන්ද පණ ඇතිව හිටියා නම් පළාත් සභාව විසුරුවා හරිනවා. මේ තිබෙන අය ගිවිසුම් ගහලා ආපු නිසා මේ පළාත් සභාව විසුරුවන්නේ නැතිව යන්නේ. මේ තුළ වෙන්නේ රට බෙදන තැනට අනාගතයේ අපේ දරුවන්ට අනාගතයක් නැති වන එක. රටට හෙටක් නැති වන එක. ජාතිය ආයිත් ලේ විලක් මැද අඳෝනා නගන්න වෙන තැනකටයි පත් වෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා අපට වගකීමක් තිබෙනවා මේ යෝජනාව මුලින්ම - අර කථාවක් තිබෙනවා නේ? අඬුවෙන් කපන්න තියා ගන්න නරකයි. මුලින් ගලවන්න පුළුවන්කම තිබෙනවා නම්. නියපොත්තෙන් කඩන්න පුළුවන් නම් කියලා. ඒ නිසා මේ ආපු මුල් යෝජනාව. මේ යුද්ධයෙන් පස්සේ ආපු මුල් යෝජනාව. මහින්ද මහත්තයා සිටිද්දී මොකෙක්වත් කට ඇරියේ නැහැ. (බාධා කිරීම්) පොඩ්ඩක් අහගෙන ඉන්න. ඒ කථා කළේ නැත්තේ උතුරේ හමුදාව - (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදය.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ? ප්‍රජාතන්ත්‍රවාදය ගැන අහලා තිබෙනවා නම්, ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ වල් බූරු නිදහසක් නොවෙයි. ප්‍රජාතන්ත්‍රවාදය තුළ අනෙක් අයගේ අයිතීන් උල්ලංඝණය නොවෙන්න ඕනෑ. අනික් අයගේ අයිතීන් උල්ලංඝනය කරන ප්‍රජාතන්ත්‍රවාදයක් රටක ස්ථාපිත වෙන්නේ නැහැ. බහුතරයගේ මතයත් එක්ක සාධනීය විධියට ගැලපෙන්න ඕනෑ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කලබල වෙන්න එපා. එහෙම එකක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මූලාසනය අමතන්න. උත්තර දෙන්න යන්න එපා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මම උත්තර දෙන්නේ නැහැ. මම ටිකක් අසනීපයෙනුත් ඉන්නේ. මගේ කථාව කරන්න දෙන්නේ නැහැ. (බාධා කිරීම්) මටත් කියන්න තිබන්නේ බල්ලෝ බිරුවාට කඳු පාත් වෙන්නේ නැහැ. සඳට නරි හූ කියනවා. නරි හූ කිව්වාට සඳ බිමට එන්නේ නැහැ. ඒ වාගේ තමුන්නාන්සේලා ඔතැන බිරුවා කියලා, නරි වාගේ

හු කිව්වා කියලා මගේ කථාව අවසන් වෙන්නෙත් නැහැ. ඒ නිසා පැහැදිලිව කියන්න ඕනෑ මහින්ද මහත්තයාගේ කාලයේ මේ රටේ මේ සියලු ජනතාවට නිදහස ලබා දුන්නා. අභය දානය දුන්නා. ඒ අභය දානය නිසයි අදත් අපි පාසල්වල මුර කරන්න යන්නේ නැත්තේ. අපි රස්සාවල්වලට යන කොට භයක් හැකක් නැතිව යන්නේ. මේ නිදහස ලැබුණු තත්ත්වය තුළ. ඒ නිසාම තමයි අපි කිව්වේ, මේ ආණ්ඩුව එන කොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කිව්වේ, මේ ආණ්ඩුව වෙස් මුහුණක් දාගෙන එන්නේ. මේ අය කියන දේ නොවෙයි කරන්නේ. මෙතුමන්ලා ඒත් එක්ක දීග කාලා තමයි අද මේ යෝජනාව ගේන්නේ. ඒ නිසා එතුමාට අයිතියක් තිබෙනවා ඒ යෝජනාව ගේන්න. දීග කැවා වුණත්. අපි ඒකට ගරු කරනවා. හැබැයි, අපි මෙය කිව්වා. මේ කට්ටිය එකතු වෙලා ගන්නේ, ඒගොල්ලන්ට ඕනෑ යෝජනාව. ඒගොල්ලන්ට අවශ්‍ය දේ එකඟ වෙලා කලින් මේවාවලට යෝජනා සම්මත කර ගත්තා. ඒ යෝජනා අනුව තමයි ආණ්ඩුවක් හදන්න සහයෝගය දුන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

තිස්ස අත්තනායක කිව්වා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

හැබැයි, එදා අවසාන වෙන කල් සමහර ජනතාව නොමග යවමින් කටයුතු කළා. ජනතාව නොමග යවමින් කටයුතු කරලා අවසානයේ බලය ගත්තා. දැන් බලය අරගෙන රට හදන්නෙත් නැහැ. වරාය නවත්වනවා කිව්වා. ආයිත් දෙනවා. වෙන වැඩ නවත්වනවාය කියනවා. අධිවේගී මාර්ග නවත්වනවාය කියනවා. ආයිත් දෙනවා. මේ කිව්ව ඒවා බොරු කියන එක පැහැදිලියි. එහෙම නම් උතුරත් එක්ක ගහපු ගිවිසුම්, සම්බන්දන්ලාත් එක්ක ගහපු ගිවිසුම් තමයි එළියට එන්නේ. අඬන්න ඕනෑලු නේ කිරි එරෙන්න. ඒ නිසා උන් අඬන්න පටන් අරගෙන. මේ අම්මලා තාත්තලාගේ කිරි එරෙන්න. අපි පැහැදිලිව කියනවා. මේ සම්බන්දන්ලා කිරි එරෙන්න හදන්නේ මේ ආණ්ඩුව හදපු උන් එක්ක. ආණ්ඩුවේ බත් බැලයන් එක්ක තමයි මේ - (බාධා කිරීම්)

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ශ්‍රීපති කියපු ඒවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා. ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඉතින් මට කියන්න දෙන්නේ නැහැ නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මට කොපමණ බාධා කරනවාද? පැහැදිලිව මේ යෝජනාව ප්‍රතික්ෂේප කරන ගමන් අපි කියනවා, රටේ ත්‍රස්තවාදය අවසන් කරලා මේ රටට නිදහස, සාමය දීලා මහින්ද රාජපක්ෂ මැතිතුමා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, බැසිල් රාජපක්ෂ මැතිතුමා රට හදන වැඩ පිළිවෙළක් කර ගෙන ආවා. ඒ වැඩ පිළිවෙළ තමයි අද නතර කරලා ටී.එන්.ඒ. එකට අවශ්‍ය පසුබිම හදලා දෙමින් තිබෙන්නේ. ඒ නිසා මේ පසුබිම තුළ රට බෙදීමේ දිසාවට යනවා. මේකේ කියලා තිබෙනවා, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදනවා. අපි ඒකෙන් බලාපොරොත්තු වෙනවා ඒගොල්ලන්ගේ අයිතීන් තහවුරු කරන්නය කියලා. අපි දන්නවා, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් එන්නේ ඇයි කියලා. එන්නේ විධායක බලය අඩු කරනවාය කියලා. හැබැයි වෙන්නේ, උතුරට අවශ්‍ය ඊළමක් දෙන තරමට, බලතල දෙන තැනට යමින් තිබෙන තත්ත්වයක්. අන්න ඒ නිසා ඒකට විරුද්ධව මුල් පියවරේ කටයුතු කරන්න ඕනෑ. ජාත්‍යන්තර ජනමතය හදන්න දෙන්න නරකයි. ඒ වාගේම උත්තරීතර සභාවක කටයුතු කරලා තිබෙන්නේ. ඒ උත්තරීතර සභාව තුළ ගත් තීන්දු වැරදියි. ඒ තීන්දු ගත්ත අයට - (බාධා කිරීම්) මම මේකට සංශෝධනයක් ගෙනාවා. පැහැදිලිවම සංශෝධනයක් ගෙනාවා. මේ ගෙනාපු යෝජනාව තුළින් මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා තිබෙනවා. ඒ නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කළා නම්, ඔබතුමන්ලා නීතිය ඉදිරියට අරගෙන, අත්අඩංගුවට අරගෙන අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. එහෙම කටයුතු කරන්නේ නැත්නම් මේ රටේ නායකයන්ගේ, පාලකයන්ගේ කොන්ද පිළිබඳ ප්‍රශ්නයක් දැනෙනවා. ඒ නිසා අපි කියනවා පැහැදිලිව. මම මෙතුමාටත් කියනවා. එතුමාගේ නායකයනුත් එක්ක පාර්ලිමේන්තුවේත් කථා කරන්න ඕනෑ. එළිපිටත් කථා කරන්න ඕනෑ. මේ යෝජනාවේ මුල් ටිකේ මෙතුමා මොනවා කියලා තිබුණත් අග තිබෙන්නේ බොහොම සරළව මේක සාකච්ඡා කරලා අවධානය යොමු කරන්නය කියලා. ඒකට මගේ එකඟතාවයක් නැහැ. සාකච්ඡා කරලා නිකම්

[ගරු ජගත් කුමාර]

බොරු කථාවක්. මේකට අවශ්‍ය පියවර, දඬුවම් ලබා දෙන්න අවශ්‍ය කටයුතු කළ යුතුයි කියන කාරණාව කියමින්, මහින්ද රාජපක්ෂ මැතිතුමා හිටියා නම් අද මේ රට මේ අගාධයට වැටෙන්නේ නැහැයි කියලත් කියමින් මම මහින්ද රාජපක්ෂ මැතිතුමාට ජය වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් (බාධා කිරීම්) මම ඒ වාගේ දේශපාලනය කරන්නේ නැහැ. නරි හූ කිව්වාට සඳ පාත් වෙන්නේ නැහැ. ඒ වාගේම බල්ලෝ බිරුවාට කඳු පාත් වෙන්නේ නැහැ. ඒ නිසා මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එක්ක අපි ආයිත් අලුත් රටක් හදනවාය කියලත් මේ වෙලාවේ මතක් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී සිරිකමල් පිලිෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සිරිකමල් පිලිෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***
*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Sirikamal Filician de Silva M.P.C took the Chair.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට අවස්ථාව ලබා දෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පක්ෂ විපක්ෂ මන්ත්‍රීතුමන්ලාට ඉතාමත් ගෞරවයෙන් සඳහන් කරන්නට ඕනෑ. යම්කිසි වැදගත් මාතෘකාවක් අපි කථා කරන කොට දවසින් දවස අපි වැදගත් භාවය අරගෙන ඉස්සරහාට යන්න ඕනෑ. සභාවක් හැටියට. වල්පල් කථා කරලා අපේ කාලය නාස්ති කරන්නේ නැතිව. ඒ නිසා මේ යෝජනාව ගැන කථා කරන කොට අපි දන්නවා. අපි පසුගිය කාලයේ ලබපු අත්දැකීම්. අපි ලබපු දේශපාලන අත්දැකීම් අනුවත්, ඉතිහාසයේ කියවීම් අනුවත් අපි දැක්කා, රටට හිතකර නායකයන් රාශියක් බිහි වුණා. ඒ අතර තමුන්ගේ වාසිය විතරක් හිතන, තමුන්ගේ ලාභ ප්‍රයෝජන ගැන හිතන අන්තවාදී පිරිසකුත් බිහි වුණා. (බාධා කිරීම්) මම ඔබතුමා ගැන - ඔබතුමා 2005 සල්ලි මල්ල අරගෙන යන කොට ඔබතුමාත් ගියාද කියලා මම අහනවා කථා කරන්න ඉස්සෙල්ලා. කට වහගෙන ඉන්න. මම කියනවා, මෙහිදී මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කියන්නට ඕනෑ රට ජාතිය ගැන කැක්කුමක් තිබෙන සැබෑ නායකයින්ට පමණයි මේකට කථා කරන්න පුළුවන්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

සිරිකොතට ගහන කොටත් මහින්ද මහත්තයා තමයි රනිල්ව ආරක්ෂා කළේ. රනිල්ටත් ආරක්ෂාව දුන්නේ මහින්ද මහත්තයා තමයි අද අගමැති වෙන්න -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මම කියනවා, උතුරේ තරුණයෙක් තුවක්කුවක් අරගෙන පත්තු කළොත් පත්තු වෙනවා. දකුණේ තරුණයෙක් තුවක්කුවක් අරන් පත්තු කළත් පත්තු වෙනවා. බස්නාහිර තරුණයෙක් තුවක්කුවක් අරන් පත්තු කළත් පත්තු වෙනවා. ඒ වාගේම නැගෙනහිර පත්තු කළත් පත්තු වෙනවා. හැබැයි, මේ ජාතිවාදය කර පින්නාගෙන තමුන්නාන්සේලා (බාධා කිරීම්) උඩ ගෙඩි දෙන්න එනවා නම්, අපේ තුවක්කුත් පත්තු වෙනවා කියලා මම පළමුවෙන්ම කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන අද සිද්ධ වෙන්නේ මොකක්ද? අපි සමස්ත ශ්‍රී ලාංකීය ජාතිය ගැන අපි කථා කරන්නේ. මෙහිදී මුස්ලිම්ද? මේගොල්ලෝ දෙමළද? මේගොල්ලෝ සිංහලද? කියන එක නොවෙයි. සමස්ත ශ්‍රී ලාංකීය ජාතිය වෙනුවෙනුයි අපි කථා කරන්නේ. අද ශ්‍රී ලංකාවට වෙලා තිබෙන්නේ මොකක්ද? මේ අඳු මුළුවල බංකොලොත් දේශපාලනය කරන මිනිස්සු මේ මාතෘකාව අරගෙන රටේ වැදගත් කාලය, ධනය, ශ්‍රමය නාස්ති කරන කොට අපි රටක් හැටියට ඉස්සරහාට යන්නේ නැහැ. හැමදාම යන්නේ පස්සට. මේකට හේතුව මොකක්ද? ඉස්සරහාට යන්න උවමනාව තිබෙන නායකයෝ, හැමදාම රට ඉස්සරහාට අරගෙන යන නායකයින්ට මොකක් හරි අංචියක් ඇදලා තමන්ගේ වාසියක් කර ගන්න හදනවා. අපි කනගාටු වෙනවා. අද

ජාතිවාදී පක්ෂ තිබෙනවා. ආගම්වාදී පක්ෂ තිබෙනවා. ඒ වාගේම ධනවාදී පක්ෂ, සල්ලි හම්බ වෙනවා නම්, ඇමතිකම් හම්බ වෙනවා නම්, අනේ පැත්ත අමතක වෙනවා. මේ යෝජනාව ගෙනාපු (බාධා කිරීම්)

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකරලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ යෝජනාව ගෙනාපු ගරු මන්ත්‍රීතුමා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු මන්ත්‍රීතුමනි, රීති ප්‍රශ්නයක්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

රීති අංකය කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

රීති ප්‍රශ්නයක්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අනේ ඉඳගන්න. ඔබතුමා දන්න රීති.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

රීති අංකය කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36(1).

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මොකක්ද රීති අංකය කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වරප්‍රසාද ප්‍රශ්නයක්. 36 (1).

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

වරප්‍රසාද ප්‍රශ්නයක් නේ? රීති ප්‍රශ්නයක් නොවෙයි. වරප්‍රසාද ප්‍රශ්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඒකට අවස්ථාව දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාගෙන් අහන්නද එහෙම නම් ප්‍රශ්නය.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මගෙන් ඇහුවත් කමක් නැහැ. මමත් උත්තරය දෙන්ම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමන්ලාගේ ඒකාබද්ධ විපක්ෂයේ ඉන්න නායකයා වාසුදේව නානායක්කාරගේ මස්සිනාගේ කට්ටිය තමයි ඔය යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ උතුරු පළාත් සභාවේ. ඉතින් එතුමාට විරුද්ධව යෝජනාවක් ගේන්න කෝ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ ප්‍රශ්නය වරප්‍රසාදයක් වෙන්නේ කොහොමද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒකාබද්ධ විපක්ෂය. මස්සිනාලා දෙන්නා. දුවලා පුතාලා බන්දලා මේ දකුණ ගිනි තියන්න හදන්නේ මස්සිනාලා එකතු වෙලා. වෙන කවුද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම රීතියක් නැහැයිලු.

[සභාවේ ඝෝෂා]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සැම මන්ත්‍රීවරයෙකුගේම ජාත්‍යාලය දැන් ඇවිස්සිලා තිබෙන්නේ. ඒ නිසා මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා කිව්වා, පසුගිය කාලයේ කොටි හිතවාදීව එක්සත් ජාතික පක්ෂයත්, දැනට මේ ආණ්ඩු කරන අයත් කටයුතු කරනවාය කියන අර්ථයෙන් කථා කළා. අපි ඇත්තටම දන්නවා. 2005 වර්ෂයේ මෙතුමා කියනවා ඡන්ද සුළු සංඛ්‍යාවකින් පැරදුණාය කියලා. එහෙම නම් 2005 අපි කීයෙන්ද පැරදුනේ කියලා ඔබතුමා මතක් කරලා බලන්න. එදා ඒ ජයග්‍රහණය අරගෙන සල්ලිවලට මන්ත්‍රීවරු අරගෙන තමයි ඔය දේශපාලන ගමන ආවේ. නමුත් මම කියන්නේ. මින් ඉදිරියටවත් ඒවා නවතින්න ඕනෑ. සල්ලිවලට අරගෙන දේශපාලනය කරන එක, පැරදුණු අය අරගෙන දේශපාලනය කරන එක (බාධා කිරීම්)

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

දැනුත් ඔය අරගෙන තිබෙන්නේ. සරත් ෆොන්සේකාව ගත්තේ කොහොමද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි මේ පවතින ආණ්ඩුවට කඩේ යන්නෙත් නැහැ. තිබුණු ආණ්ඩුවට කඩේ යන්නෙත් නැහැ. (බාධා කිරීම්) මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්න කැමැතියි අඩුම වශයෙන් මේ පළාත් සභාව හරි ඉස්සරහාට - සැබෑ ශ්‍රී ලංකාවට හිතවාදී මන්ත්‍රීවරු පිරිසක් හැටියට කටයුතු කරනවා නම් අපට ආඩම්බර වෙන්න පුළුවන්. හැබැයි, මේ යෝජනාව ගෙනාවේ හෙට අනිද්දා මටත් මේ ගැන කෑ ගහන කොට ආයිත් ඇමතිකමක් හම්බ වෙයි එහෙම කියලා හිතා ගෙන නම් අපි අතිශයින් කනගාටු වෙනවා. මේ ගෞරවනීය සභාවට අපි ප්‍රකාශ කරන්න කැමැතියි. ඇත්ත වශයෙන් අපි දන්නවා. මෙතැන ඉතාම අත්දැකීම් බහුල, ඒ වාගේම මේ පළාත් සභාවට විශාල සේවාවක් කරපු මන්ත්‍රීවරු රාශියක් ඉන්නවා. හිටපු ඇමතිතුමන්ලා ඉන්නවා. ඒකේ පක්ෂ විපක්ෂ භේදයක් නැතිව රට ගැන හිතන මන්ත්‍රීවරු රාශියක් ඉන්නවා. ඒ සියලු දෙනාටම මම කියනවා. මේ ජාතිවාදීන්ගේ, මේ අන්තවාදීන්ගේ කූට උපක්‍රමවලට අහු වෙන්න එපා. අපි එකතු වෙලා, සැබෑ ශ්‍රී ලාංකීය ජාතිය වෙනුවෙන් පෙනී සිටිමු. එහෙම නම් මේ අන්තවාදීන්ට නටන්න දීපු යුගය අපි අවසන් කරන්න ඕනෑ. දකුණේ වේවා, උතුරේ වේවා, නැගෙනහිර වේවා. අපි අද මුස්ලිම් ජාතිය ගැන කථා කළොත් වැඩියෙන්ම කුඩු ගෙනැල්ලා රට කන්නේ මුස්ලිම් ජාතිය. එහෙම නම් එදා සිංහල මිනිස්සු හිටියා. කෝටි ගණනක් සල්ලි දෙන කොට කොටින්ට බෝම්බ ගෙනැල්ලා හංගා ගන්න දීපු අය හිටියා. එහෙම නම් උන් ඔක්කොම අන්තවාදියෝ. උන් ජාතිවාදී. එහෙම නම් රට විනාශ කරන බලවේග.

මේ සියල්ලටම එරෙහිව නැගී සිටින්න නම්, ශ්‍රී ලංකාවට ආදරය කරන සැබෑ මිනිස්සු ටික එකතු වෙන්න ඕනෑ. ඒක ශ්‍රී ලංකා ද යූ.එන්.පී. ද කියලා නැහැ. (බාධා කිරීම්) තමුන්නාන්සේලා නියෝජනය කරන්නේ මොන පක්ෂයේ වුණත්, පිට කොන්දක් ඇතිව කථා කරන්න. පිට කොන්දක් ඇතිව වැඩ කරන්න. එහෙම නම් අපි අද කියනවා, අපි එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළත්, ශ්‍රී ලාංකීය ජාතිය වෙනුවෙන් ඒ රට ආරක්ෂා කර ගන්න අපි එකෙන්ම පෙනී සිටිනවාය කියන එක තමුන්නාන්සේලාට අපි කියන්න කැමැතියි. එහෙම නම් අපි කියනවා. සම්බන්ධන් වුණත් - එදා ආයුධ අරගෙන කරපු යුද්ධය නවත්වලා අද අපි මේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට සියලු දෙනාම ගෙනාවා. (බාධා කිරීම්) එදා ජේ.වී.පී. එක ආයුධ අරගෙන රටේ මිනී මැරුම් සිද්ධ කරන කොට, ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට ගෙනැල්ලා අද මේ වාගේ වැදගත් සභාවකට ඇවිල්ලා, ඒ අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කරලා දෙනවා. ඒ වාගේම තමයි අද අපි දෙමළ ජාතියට දීලා තිබෙනවා අවස්ථාවක්. තමන්ගේ අදහස් උදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් දීලා තිබෙනවා. හැබැයි, අපේ අගමැතිතුමා කැලෑ නීතිය පාවිච්චි කරන්නේ නැහැ. මේ ඕනෑම ද්‍රවිඩ පුද්ගලයෙක් වැරැද්දක් කරලා තිබෙනවා නම් නීත්‍යානුකූලව ඕනෑම පුරවැසියෙකුට පුළුවන්, නීතිය ඉස්සරහාට ගිහිල්ලා ඒ වැරැද්දට කටයුතු කරන්න හැකියාව තිබෙනවා. එහෙම නම් අපි සුදු වෑන් සංස්කෘතිය ක්‍රියාත්මක කරන්නෙත් නැහැ. කැලෑ නීතිය ක්‍රියාත්මක කරන්නේත් නැහැ. මෙතැනට දෙන්න ඕනෑ බෙහෙත හරියට දෙනවා. හැබැයි, මෙතැනදී මම කියනවා.

අන්තවාදී පක්ෂ සියල්ලම හිතට ගන්න ඕනෑ. තමුන්නාන්සේලා මේවා අරගෙන ලාභ මාතෘකා සොයා ගෙන තමුන්ගේ බංකොලොත් දේශපාලනය ගොඩ දා ගන්න යන්න එපා. අපි ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ආරක්ෂා කරන්න එදත් කැප වුණා. හෙටත් කැප වෙනවා කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතුවේ මෙම යෝජනාව ගේන්න තිබුණේ ඇත්තටම පාර්ලිමේන්තුවේ චම්පික ඇමතිතුමා. මෙතුමා මේ යෝජනාව ගේන කොට මට හිතුණා, බළලුන් ලවා කොස් ඇට බාවනවාද කියලා. මේ යෝජනාව ඇත්තටම ගේන්න තිබුණේ එතුමායි. පාර්ලිමේන්තුවේදී රතන හාමුදුරුවෝ කථා කරන්න තිබුණේ. මාධ්‍ය සාකච්ඡාවක් තියලා. නමුත් මේ මාධ්‍ය සාකච්ඡාවට ආවෙත් අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ මන්ත්‍රීතුමා. එතුමා තමයි දැන් හෙළ උරුමයේ පළිහ වෙලා තිබෙන්නේ. එතුමාව දාලා තමන්ගේ ප්‍රතිපත්ති ආරක්ෂා කරනවා. මෙවැනි යෝජනාවක් මම ගේන්න හිටියේ. හදිසි යෝජනා ගෙනැල්ලා න්‍යාය පත්‍රයේ තිබෙන මේ මන්ත්‍රීවරුන්ගේ යෝජනා පස්සට යන නිසා මේ යෝජනාවත් මේකට අන්තර්ගත කරන්න අපි එකතු වුණා. මේ යෝජනාව ගේන්න හේතුවක් තිබෙනවා. මේ සංශෝධනය ඉදිරිපත් කරන්න.

මැයි පළමුවැනිදා පත්තරේ - ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් කරුණාසේන හෙට්ටිආරච්චි මහත්තයා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ පන්ති සගයා. එතුමාගෙන් ප්‍රශ්න අහන කොට එතුමා කියනවා, මීට කලිනුත් මේ වාගේ දෙයක් වෙලා තිබෙනවාද කියලා. එතුමා කියනවා, මීට කලිනුත් සම්බන්දන් මහත්තයා හමුදා කඳවුරකට ඇතුළත් වෙන්න ගිහිල්ලා එතුමාට මම කථා කරලා ඉඩ සලසලා දුන්නාය කියලා. මේ පළමු වන වතාව නොවෙයි මේ සම්බන්දන් මහත්තයා මේ හමුදා කඳවුරකට ඇතුළත් වෙලා තිබෙන්නේ. මීට කලිනුත් ඇතුළත් වෙලා, ඒවාට ගිහිල්ලා නොයෙක් ප්‍රශ්න දාගෙන. ආරක්ෂක ලේකම්තුමා තමයි මේවා සෙට්ල් කරලා තිබෙන්නේ. මේ පළමුවැනි වතාව නොවෙයි. මේ දෙවැනි වතාවේ කරපු නිසා තමයි මම මේ සංශෝධනය ගෙනාවේ.

*"විපක්ෂ නායක ආර්. සම්බන්දන් මහතා සහ අනුගාමික උතුරේ හමුදා කඳවුරකට බලෙන් ඇතුළු වීම ආදී රාජ්‍ය ආරක්ෂාවට තර්ජනය වන ක්‍රියා නැවැත්වීම හා උතුරේ ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථානවල බෞද්ධ ප්‍රතිමා ඉදි කිරීම නැවැත්වීම ආදී බලහත්කාර ක්‍රියා නැවත ඇති නොවීමට රජය වගබලා ගත යුතු අතර, තරා තිරම නොබලා සිදු කරන ලද ව්‍යවස්ථා විරෝධී හා නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් නීතිමය පියවර ගත යුතු යැයි"* කියන සංශෝධන යෝජනාව ඉදිරිපත් කරනවා.

බැරි වෙලාවක්වත් වෙන කවුරු හරි මේවා කළා නම්, මේ අයට නීතිමය කටයුතු කරනවා. තමුන්නාන්සේලාට මතක ඇති එක්සත් ජාතික පක්ෂයේ හිටපු ලේකම්තුමාට සිදු වුණු දේ. එතුමා කිව්වා, මෙහෙම ගිවිසුමක් තිබෙනවා. මේ අය සියලු දෙනා සම්බන්දලත් එක්ක එකතු වෙලා උතුරට ස්වයං පාලනයක් දෙන්න එකතු වෙලා තිබෙනවා. ඒ කිව්වා කියලා එතුමාව හිරේ දැම්මා. ඒක තමයි හිටියේ. ඒක කිව්වා කියලා තමයි හිරේ දැම්මේ. (බාධා කිරීම්)

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හොර ලේඛන.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

හොර ලේඛන නොවෙයි. ඇත්ත දැන් නේ එළිවෙන්නේ. ඒවා ඇත්ත ලේඛන.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

පෞද්ගලිකව එහෙම දෙමළ මිනිස්සු එක්ක සිංහල මිනිස්සු විවාහ වුණාය කියලා අපි ඒවාට බාධා කරන්නේ නැහැ. ඒක අයිතිය. අපේ ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා විවාහ වුණෙත් ලංකාවෙන් නොවෙයි. ඉන්දියාවෙන්. ඒවා ගැටළුවක් නැහැ. අපි කියන්නේ ඒක හොඳයි. එතුමාට එහෙම වෙන් කරන්න -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු මන්ත්‍රීතුමා -

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මේ වාගේ මෝඩ තර්කවලට, ඒ වාගේ පල්ලෙහාට වැටෙන්න එපා. ඔබතුමාගේ තාත්තාගේ ගෞරවය ආරක්ෂා කරන්න. එතුමා එපමණ පල්ලෙහාට (බාධා කිරීම්) මේ ආදර්ශය දීලා තිබෙනවා. පූර්වාදර්ශ තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේ ඔය මෝඩ වැඩේ කරන්න එපා. තාත්තාගේ ගෞරවය ආරක්ෂා කරන්න. තාත්තාව පැරැද්දුවා වාගේ මොලේ උඩ වාඩි වෙන වැඩ කරන්න එපා. කථා කරන්න ඉඩ දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මූලාසනය අමතන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඒ නිසා මේක බරපතළ ප්‍රශ්නයක්. බෞද්ධ සිද්ධස්ථානවලට ගිහිල්ලා ඉදි කිරීම් කරන්න දෙන්නේ නැත්නම්, ඒවා නවත්වනවා නම්, බුදු පිළිම ඉදි කරන්න දෙන්නේ නැතිව ඒවා නවත්වනවා නම් මේක බරපතළ ප්‍රශ්නයක්. මේ ප්‍රදේශවල ඕනෑ තරම් කෝවිල් හැදෙනවා. පල්ලි හදනවා. පන්සල් ඉදි වෙනවා. කවුරුවත් සිංහල මිනිස්සු ගිහිල්ලා බාධා කරන්නේ නැහැ. මේක වැරදියි. කවුරු කළත් (බාධා කිරීම්)

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අයියා අලියාගේ පැත්තේ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

අයියා කොහේ හිටියත් වැඩක් නැහැ. මේ මගේ ප්‍රතිපත්තිය. ඕගොල්ලන්ගේත් තිබෙනවා. එක්කෙනෙක් එක පැත්තක. අනික් කෙනා තව පැත්තක. ඒක තමයි හැටි. ඒවා අපට වෙනස් කරන්න බැහැ. අතේ ඇඟිලි පහක් තිබෙනවා. (බාධා කිරීම්) ඒ නිසා තමුන්නාන්සේලා බාධා කරන්න එපා. මේ 1956 අගෝස්තු ෆෙඩරල් සම්මේලනයේ තමයි පළමුවෙන්ම මේ ෆෙඩරල් යෝජනාව ආවේ. ඉලංගෙයි තමිල් අරුසුකච්චි පක්ෂයේ ස්වාධීන ඉල්ලීම මොනවාද? ස්වාධීන දෙමළ රාජ්‍යයක් හෝ භාෂාව වශයෙන් අනන්‍ය වූ ෆෙඩරල් රාජ්‍යයක් ස්ථාපිත කිරීම. දෙමළ භාෂාවට නිසි තැන ලබා දීම සහ රාජ්‍ය භාෂාව සිංහල භාෂාව හා සමාන වැදගත්කමක් ලබා දීම. පුරවැසිභාවය පිළිබඳ නීති වෙනස් කොට වතුකර දෙමළ ජනතාවට පුරවැසිභාවය හා ඡන්ද අයිතිය ලබා දීම. සාම්ප්‍රදායික දෙමළ ජනයා වාසය කරන ප්‍රදේශවල සිංහල ජනතාව පදිංචි කිරීමට විරුද්ධ වීම. මේක තමයි ඒ සම්මේලනයේදී සම්මත කර ගත්තේ. ඒ අනුව බණ්ඩාරනායක මහත්මයා, චෙල්වනායගම් මහත්තයා ගිවිසුම ගහලා මේවායේ ගොඩක් ප්‍රශ්න විසඳිලා ඉවරයි. දෙමළ භාෂාවට නිසි තැන ලැබිලා තිබෙනවා. මේ පදිංචි කිරීමේ ප්‍රශ්නය ඉවර කරලා තිබෙනවා. දැන් මේ අයට අවශ්‍ය වෙලා තිබෙන්නේ දෙමළ භාෂාව කථා කරන වෙනම රාජ්‍යයක්. මෙන්න මේක තමයි බරපතළකම. උතුරේ සාමාන්‍ය දෙමළ මිනිස්සු ඉල්ලන්නේ නැහැ. මේකයි බරපතළ ප්‍රශ්නය. 22 වැනිදා ලංකාදීප පත්තරේ තිබෙන එක. දෙමළ භාෂාව, විග්නේෂ්වරන් මහත්මයා කරන ලද ප්‍රකාශය. දෙමළ භාෂාව කථා කරන (බාධා කිරීමක්) කමක් නැහැ.

දෙමළ භාෂාව කථා කරන ජනතාවට ෆෙඩරල් පාලනයක් සහිත වෙනත් ප්‍රාන්තයක් ස්ථාපිත කළ යුතු බවට වන විපක්ෂයේ යෝජනාව ඊයේ 22 වැනිදා ඒකමතිකව සභා සම්මත විය. දෙමළ ජනතාව වෙනුවෙන් ස්ථාපිත කරන ලද එම ප්‍රාන්තය දැනට පවතින උතුරු - නැගෙනහිර පළාත් දෙකම එකට එක් කළ යුතු බවට සම්මත වූ එම යෝජනාවේ සඳහන් වන බව උතුරු පළාතේ දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රී කේ.ජී. සිවාජිලිංගම් මහතා ලංකාදීපයට පැවසීය. උතුරු පළාත් ප්‍රධාන අමාත්‍ය සී. විග්නේෂ්වරන් මහතා ඉදිරිපත් කළ මේ යෝජනාව එතුමා ස්ථිර කළ බවද සිවාජිලිංගම් මහතා සඳහන් කළේය. උතුරු - නැගෙනහිර පළාත් ඒකාබද්ධ කිරීමට යෝජිත දෙමළ ජනතාවගේ ප්‍රාන්තය සඳහා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔය පත්තරේ දිනේ කවදාද?

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මේ 23 වැනිදා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පෙන්වන්න. පත්තරේ දිනේ පෙන්නන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

23 වැනිදා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පත්තරේ නම පෙන්නන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ලංකාදීප.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඕක සභාගත කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔය කියවන එක සභාගත කරන්න. සභාගත කරන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා ඔය ලියවිල්ල සභාගත කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සභාගත කරන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සභාගත කරනවා. තමුන්නාන්සේ වාඩි වෙන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

2016.04.23 වැනිදා පත්තරේ සභාගත කරනවා. උතුරු - නැගෙනහිර පළාත් ඒකාබද්ධව ස්ථාපිත කිරීමට යෝජිත දෙමළ ජනතා ප්‍රාන්ත සඳහා අවශ්‍ය බලතල ලබා දිය යුතු අතර, එම පළාත් සභා අතර ප්‍රාන්ත පාර්ලිමේන්තුවක්, එම පළාත් සභාවට පළාත් පාර්ලිමේන්තුවක් පවත්වාගෙන යෑමට අවසර ලබා දිය යුතු බවද එම යෝජනාවේ සඳහන් වන බවද ඔහු සඳහන් කළේය.

මේ පළාත් සභාවට වෙනම පාර්ලිමේන්තුවකුත් ඉල්ලලා තියෙන්නේ. එහෙමයි සම්ප්‍රදාය. මේක තමයි බරපතළකම. නිකම්ම නිකම් හුදෙක් යෝජනාවක් විතරක් නොවෙයි. වෙනම පාර්ලිමේන්තුවක් ඉල්ලනවා. රටක තියෙන්නේ, එක පාර්ලිමේන්තුවයි. මේ වෙනම පාර්ලිමේන්තුවක්. පැහැදිලිවම රටවල් දෙකක් නිර්මාණය කිරීමටයි මේ යෝජනාව සම්මත කරලා තියෙන්නේ. ඒකයි තිබෙන භයානකකම. හුදෙක් නිකම් යෝජනාවක් වශයෙන් පැත්තකට දාන්න බැහැ. දෙමළ ජනතාව වෙනුවෙන් ස්ථාපිත කෙරෙන ප්‍රාන්ත සහ රටේ පළාත් සභාවට ලබා දිය යුතු සියලු බලතල රටේ අනෙකුත් පළාත් සභා සඳහාද ලබා දිය යුතුයි කියලා තියෙනවා. ඒ නිසා මේක අපි සභාගත කරනවා. මීට වඩා වෙලාව ගන්නේ නැහැ. මේකයි බරපතළකම. මේ ප්‍රාන්තයට වෙනම පාර්ලිමේන්තුවකුත් ඉල්ලනවා. රටකට තියෙන්න ඕනෑ එක පාර්ලිමේන්තුවයි. පාර්ලිමේන්තු දෙකක් කියන්නේ රටවල් දෙකක්. මේකයි භයානකකම. තමුන්නාන්සේලාට මේක බරපතළ නැති වුණාට, මේක බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධව කටයුතු කරපු මේ සියලු දෙනාට නීතිමය කටයුතු කරන්න දැනගන්න ඕනෑ.

මේ සංහිඳියාව පුදුම සංහිඳියාවක්. සිංහල බෞද්ධ අයිතිය වෙනුවෙන්, මුස්ලිම් අයිතිය වෙනුවෙන්, සිංහලයා සිංහලයාගේ අයිතිය වෙනුවෙන් කථා කළාම ඒක ජාතිවාදය. දෙමළ සන්ධානයේ මන්ත්‍රීවරු ගිහිල්ලා පන්සල් හදන එක නවත්වලා, බස් කුඩු කරලා, ගහලා එවන එක. අර මොරටුවේ ගිය සමහර කට්ටිය කපලා එව්වා. අඩුම තරමේ ඒවාට කිසිම ජාතිවාදයක් නැහැ. මේක පුදුම සංහිඳියාවක්. බහුතර ජනතාවක් ඉන්න අපේ ජනතාවට වුණු අසාධාරණය වෙනුවෙන් කථා කරන මිනිහා ජාතිවාදියා කියලා හංවඩු ගහලා ලෝක ප්‍රජාවට මේක තමයි ප්‍රජාතන්ත්‍රවාදය කියලා පෙන්වන මේ කෙහෙල්මල් සංහිඳියාව නැවත්විය යුතුයි.

අපේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පුදුම නායකයෙක්. එතුමාව මරන්න ආපු කෙනාටත් නිදහස දෙනවා. මරන්න ආපු කෙනාවත් එල්.ටී.ටී.ඊ.

[ගරු සලෝචන ගමගේ]

කාලේ නිදහස් කරලා යැව්වා. ඉතින් අපේ - උතුරේ කඳවුරේ රිමාන්ඩ් කළා. එක රණවිරුවෙක් හත් දෙනෙක් කපලා මැරුවා කියලා මරණ දඬුවම දුන්නා. එතුමාට දෙන්න සමාවක් නැද්ද? එල්.ටී.ටී.ඊ. කාරයා තමන්ව මරන්න ආපු කෙනාට සමාව දෙනවා නම් මේ හත් දෙනා මැරුවා කියලා සැක කරලා ඇතුළේ දාගෙන ඉන්න හමුදා රණවිරුවාට සමාව දෙන්න බැරිද? එතුමාගේ සංහිඳියාව මේකද? ඒ වාගේ රණවිරුවන් ගණනාවක් රිමාන්ඩ් කරලා ඉන්නවා. ඒ අයත් මේ එල්.ටී.ටී.ඊ. කාරයෝ නිදහස් කරපු විධියට නිදහස් කරන්න කියන එකයි අපේ ඉල්ලීම. එල්.ටී.ටී.ඊ. කාරයන්ට බෙදන හැන්දෙන් හමුදාවේ අයටත් බෙදීමේ වරදක් නැහැ. මේක අපේ සංහිඳියාව නම් මෛත්‍රීපාල මහත්මයා කරන්න ඕනෑ ඒකයි. ඒ නිසා එකම දේ රවුම් කර කර කියන්න මම උත්සාහ කරන්නේ නැහැ.

එල්.ටී.ටී.ඊ. කාරයෝ, මේ වෙනුවෙන් කඩේ යන අය කියවන්න ඕනෑ පොත් දෙකක් ලියලා තියෙනවා. අර එල්.ටී.ටී.ඊ. නායකයා තමිලිනී. ඒක පරිවර්තනය කරයි සිංහලට. ඒකේ අනුවර්ථනය අපි කියෙව්වා. ඒවායේ තිබෙන අර්ථය ගත්තොත් මේ අය නැවත ගෙදරල් ඉල්ලන්නේ නැහැ. ඒ නිසා පසුගිය දවසක එල්.ටී.ටී.ඊ. එකේ මරාගෙන මැරෙන බෝම්බ කට්ටල අහුවුණා. ඒ බෝම්බ කට්ටල අහු වුණාම හමුදාවෙන් මොකක්ද කිව්වේ? ෆ්‍රිජ් එකේ තිබෙන මාළු ගන්නේ උයන්න මිසක්, ආපහු ෆ්‍රිජ් එකට දාන්න නොවෙයි කියලා. ඒක නිසා බරපතළ තත්ත්වයක් තිබෙන්නේ. හංගලා තිබෙන හමුදා ඇඳුම් එළියට ආවේ කාව හෝ මාරාගෙන මැරෙන්න. ඒ නිසා මේ රට බේරා ගත්තු නායකයාටත් එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ප්‍රශ්නය තවම තියෙනවා. අළු යට ගිනි පුපුරු වාගේ තිබෙනවා. ඒ නිසා අපට සැකයක් තිබෙනවා මේ ඊනියා බෙදුම්වාදී හවුල එකතු වෙලා මහින්ද රාජපක්ෂ මහත්මයා මරා ගනීද කියන බය අපි තුළ තිබෙනවා. ඒ නිසා බරපතළ ප්‍රශ්නයක්. ඒ හමුදා ඇඳුම් එළියට ඇවිල්ලා ක්‍රමානුකූල ආරක්ෂාව අයින් කළා. අද ඉඳලා ආරක්ෂාව අයින් කරලා එතුමාට සාමාන්‍ය ජනාධිපති කෙනෙකුට තිබෙන ආරක්ෂාව විතරක් දීලා එතුමා මරා ගන්න නම් මේ ලැහැස්ති වෙන්නේ, අන්න ඒක තමයි තිබෙන බරපතළ තත්ත්වය. ඒ නිසා මේ යෝජනාව ගෙන එමින් අපි ඉල්ලා සිටින්නේ, මේ ආරක්ෂාව ඇති කරලා, මේ නිදහසින් මහින්ද රාජපක්ෂ මහත්තයා මරා ගන්න පාර කපන්න එපා කියන ඉල්ලීම කරමින් මේ යෝජනාව පහු වෙලා හෝ අපේ පැත්තට නැවත ඇවිල්ලා, මේ පැත්තේ කකුල් දෙක තියලා ජාතිය ගැන කැක්කුමක් ඇති වෙලා මේ යෝජනාව ගෙන ආවා නම් ඒ පිළිබඳව අපි අපේ ගෞරවය පුද කරනවා. එදා ඉඳලා පාඨලී ඇමැතිතුමා - මම හිතන්නේ මෙතුමාට කථා කරන්න බැරි වෙලා ඇති. එතුමාගේ ප්‍රශ්න තියෙනවා. එතුමාට FCID එකට යන්න වෙයිද? හෙට පොලීසියට යන්න වෙයිද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

පාර්ලිමේන්තුවේ ඇමැතිවරු ගැන නමින් කථා කරන්න එපා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මේ ගැටළු වෙලා තිබෙන්නේ. කෙසේ වෙතත් මේ යෝජනාව පහු වෙලා හරි ගෙනාපු එක ගැන අපි ස්තුතිවන්ත වෙනවා. ඒ නිසා අපි එතුමාට කියනවා. එතුමාගේ පක්ෂ ලේකම්තුමා වාගේ පාර්ලිමේන්තුවේ ඉදිරියට ඇවිල්ලා මේ හඬ ගෙනැල්ලා සිංහල ජනතාවගේ නැති වන අයිතිය වෙනුවෙන් පෙනී සිටින ශක්තිය ධෛර්ය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ආනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ විවාදය ආරම්භයේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා සඳහන් කළා මේ විවාදයේ කථා යන පිළිවෙළ දෙපක්ෂයට මාරුවෙන් මාරුවට දෙනවා කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සමාවෙන්න. තව මන්ත්‍රීවරු 16 දෙනෙක් කථා කරන්න ඉන්නවා. එතකොට ආණ්ඩු පක්ෂයෙන් මන්ත්‍රීවරු 11 දෙනෙක් ඉන්නවා. ආණ්ඩු පක්ෂයට කථා දෙකක් විතර දීලා තමයි විපක්ෂයට කථාවක් දෙන්න වෙන්නේ. ඒකයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

හැබැයි යෝජනාව යන්නේ අපි ඉන්න නිසා. නැඟිටලා ගියොත් මේක නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු ආනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ මේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කියපු තැනින් මම - ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා සහ රොස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කිව්වා මේක දහලන්න ඕනෑ, කැඟහන්න ඕනෑ දෙයක් නොවෙයි. සාමාන්‍යයෙන් මේ කථා කියනවා. ඒවා එපමණ ගණන් ගත යුතු නැහැ කියලා. එහෙම කියන කොට මම දන්න ඉතිහාසයත් එක්කලා, දැනෙන දේ අනුව මට කථා කරන්න සිද්ධ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා දෙමළ ජනතාවට උවමනාවට එක පාරට ආවේ නැහැ. මේවා ඇති කරපු මිනිස්සු ඉන්නවා. ජාත්‍යන්තරයට අද නොවෙයි, එදත් මේ දේ කරන්න ඕනෑ වුණා. අපි ඉතිහාසයට ගියොත් අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය දන්නවා ඇති 1919 ජාතික සංගමය බිහි වුණා. ඒ ජාතික සංගමයේ සිංහල, දෙමළ එකමුතුව මේ රට නිදහස් කර ගන්න, යටත් විජිත වාදයෙන් රට නිදහස් කරන්න මේ ජාතික සංගමය පිහිටුවනවා. ඒ ජාතික සංගමයේ සභාපති තමයි අරුනාචලම් මහත්තයා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මන්ත්‍රීතුමා ඒ කාලේ හිටියා නේ?

**ගරු ආනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

එතුමිය නීතිය කරන නිසා දන්නවා ඇති නේ? ජාතික සංගමයේ සභාපති අරුනාචලම් මහත්තයා වුණාම, එවකට හිටපු ආණ්ඩුකාරතුමාට ප්‍රශ්නයක් මේ සිංහල, දෙමළ එකමුතුව. මේ එකමුතුව කඩන්න තිබෙන එකම දේ තමයි එතුමා 1920 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඒක ගෙනාවා. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මොකද කළේ? දැම්මා බස්නාහිර පළාත (බාධා කිරීමක්) මමත් හොයාගෙන නේ ආවේ. කථා කරන්න හොයාගෙන එන්න එපැයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආසන හතරකට. ඒ ආසන හතරට දානකොට එක නීතියක් දැම්මා. තමන්ගේ ඡන්ද කොට්ඨාශයේ අවුරුදු පහකට වැඩිය පදිංචි වෙලා ඉන්න ඕනෑ. පොන්නම්බලම් රාමනාදන් මහත්තයාටත්, පොන්නම්බලම් අරුනාචලම් මහත්තයාටත් යාපනයෙන් ඡන්දය ඉල්ලන්න බැහැ. යාපනයෙන් ඡන්දය ඉල්ලන්න බැරි වුණාම, ඒ අය අනිවාර්යයෙන් කොළඹින් ඉල්ලන්න ඕනෑ. කොළඹින් ඒ අය ඉල්ලන කොට කොළඹ ඉන්න සිංහල කට්ටියට බැහැ. දෙකක් දුන්නාම තුනයි ඉතුරු වෙන්නේ. අන්න එදා පටන් ගත්තා මෙන්න මේ බෙදීම. එදා ආණ්ඩුකාරවරයා කල්පනා කරලා ඒ ගැටේ ගැහුවා. ගැටේ හැහුවාම ඒ ප්‍රශ්න ඇදුනාම 1921 දෙමළ මහජන සභාව බිහි වුණා. අන්න බෙදුණා. ඒ බෙදුණු දා ඉඳලා මේ ගැටය දෙපැත්තට යනවා. මේ යෝජනාව කරපු ගරු මන්ත්‍රීතුමා 1948 න් එහාට ඔය දේ කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඉතිහාසයේ තිබෙනවා. එදා ඉඳලා මේ දෙගොල්ලෝ බෙදිලා ගියා. එදා සුද්දාගේ උවමනාව අද ඉෂ්ට කරන්නේ විග්නේෂ්වරන්ලා. ඒ යෝජනාව ඉෂ්ට කරනවා. එදා සුද්දාට උවමනාව තිබුණේ මේ රට වෙන් කරන්න. අද විග්නේෂ්වරන් කරනවා. මම හිතන්නේ මේ ෆෙඩරල් කියන එකේදී එකට ජීවත් වෙන්න බැරි විසම්මුතියක් තිබෙන උදවිය වෙනම ජීවත් වෙන්න එකතු වෙලා ඉන්න එක තමයි ෆෙඩරල් කියන්නේ. මම දන්න තරමින් වැරැදි වෙන්න පුළුවන්. මම දන්නේ නැහැ. ඒ ෆෙඩරල් කියන එකේදී ජාතියේ අනන්‍යතා සංස්කෘතිය තමන්ට ක්‍රියාත්මක කරන්න බැරි නම් තමයි ඒ අය වෙන් වෙන්නේ. යාපනේ ඉන්න අයට කෝවිලට යන්න, කඩේට යන්න, තමන්ගේ ආගම අදහන්න, තමන්ගේ සංස්කෘතිය අදහන්න, තමන්ගේ සංස්කෘතිය ක්‍රියාත්මක කරන්න මේ ඉන්න සිංහල ජනතාව බලපෑමක් කරන්නේ නැහැ. මේ ඉන්න කෝවිලට යන අයට බලපෑමක් කරන්නේ නැහැ. අපි මුස්ලිම් කඩෙන් කනවා. Nolimit එකෙන් බඩු ගන්නවා. ග්ලිට්ස් එකෙන් බඩු ගන්නවා. සිංහල කඩෙන් බඩු ගන්නවා. බාධාවක් නැහැ. මෙහෙත් නැහැ. එහෙත් නැහැ.

එහෙම් නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ භාෂාව මත පදනම් කරගෙන මේ යන්නේ වෙන ඉලක්කයකට. මේ යනවා නොවෙයි. මේ දෙමළ ජනතාව අරගෙන යනවා.

[ගරු ආනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා]

උදාහරණයක් ගත්තොත් දැන් බලන්න යුගොස්ලාවියාව. අර ඔබතුමා කිව්වා වාගේ මේවා අද කැඩෙන්නේ නැහැ. හෙට කැඩෙන්නෙත් නැහැ. උදාහරණයක් ගන්න. ජේ.ආර්. ජයවර්ධන මහත්තයාට 1977 සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනයගේ රජය පරදින කොට පේදුරුතුඩුවේ ඉඳන් දෙවුන්දරතුඩුවට පයින් යන්න පුළුවන්කමක් තිබුණා. නමුත් 1994 සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ දුවට චන්ද්‍රිකා මැඩම්ට ආණ්ඩුව දෙන කොට මට මතකයි 1995 දී ජෙයරාජ් මැතිතුමාත් එක්කලා, මෙතුමන්ලා අපි සාම කාලයේ මඩු පල්ලි ගියා. හරියටම වවුනියාවේ ටවුමේ ඉඳන් කිලෝ මීටර් දෙකයි අපට යන්න පුළුවන් වුණේ කොටි වැට. එහෙම නම් ආපස්සට හම්බ වනකොට එතැනින් එහාට සියල්ල කොටි - එහෙම නම් නියපොත්තෙන් කඩන්න පුළුවන් වුණු දේ එදා කඩා ගන්නේ නැතුව පොරොවෙන් නොවෙයි, කාලතුවක්කු නොවෙයි, මල්ටි බැරල්වලින් ගහලා ඒක අවසන් කරන්න සිද්ධ වුණා. රටක් ජාතියක් විනාශ වෙලා මේ රට ජාත්‍යන්තරයේ අපකීර්තියට පත් වෙලා.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා අපි සුළු කොට තකන්න නරකයි. නිකම් උදාහරණයක් ගන්න. ඔබතුමා කිව්වා ජාතිවාදය අවුස්සන්න එපා කියලා. අපේ මේ පැත්තේ මන්ත්‍රීවරයෙක් කථා කරන කොට, පොඩි වැරදි වචනයක් කියන කොට ඔබතුමන්ලා ඒකට කොපමණ වේගයෙන් ගහනවාද? කොපමණ කෑගහනවාද? මේ පොඩි වචනයකට. මේ පොඩි වචනයක් කියන කොට ඒ වචනයට කොපමණ ගහනවාද? ඔහෙන් පොඩි වචනයක් කිව්වාම අපි කොපමණ ගහනවාද? යම් බෙදීමක් තිබෙනවා. යම් මතවාදයක් තිබෙනවා. එහෙම නම් මේ මතය අවුස්සන ඒ වාගේ යෝජනාවක් - එහෙම නම් ඒ පළාත් සභාවේ කියන්නේ, බයිලා නම් අපිත් ගහන්නේ බයිලා. එහෙම නම් මේවා කියලා වැඩක් නැහැ. මේ පළාත් සභාව වැඩක් නැහැ. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති කරපු මේ පළාත් සභාව වැඩක් නැහැ. පළාත් සභාවේ කියන දේවල් පිළිගන්නේ නැත්නම් ඒවාට වටිනාකමක් නැත්නම්, වලංගුතාවයක් නැත්නම්, යම් තැකීමක් නැත්නම් ඒ පළාත් සභාව වැඩක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක පිළිගන්නේ නැති එක වෙනම දෙයක්. නමුත් මතයක් තිබෙනවා. ඒ මතය දිනෙන් දින, දිනෙන දින ඒ අය ගෙන යන්නේ ජත්‍යාන්තරයට. මේ බලන්න ඒ අය ෆෙඩරල් ඉල්ලනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගණන් ගන්න එපා.

**ගරු ආනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගණන් ගන්නේ නැතුව ඉන්න බැහැ. ගණන් ගත්තේ නැත්නම් එදා 1921 දෙමළ මහජන සභාව පිහිටවූව දවසේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කිව්වේ පළාත් සභාව.

**ගරු ආනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

පළාත් සභාව ගණන් ගන්නේ නැති එක වෙනම දෙයක්. එහෙම නම් කොහොමද අද පළාත් සභාව දක්වා මේක වෙන් වුණේ. අද ඉඩම් බලතල, පොලිස් බලතල ඉල්ලපු අය ෆෙඩරල් ඉල්ලනවා. යුගොස්ලෝවියාව ෆෙඩරල් රාජ්‍යයක්. මම ඉතාලියේ හිටියා. ඉතාලියට ආසන්නව යුගොස්ලෝවියාව. මොන්ටිනෝගෝ, කොසෝවා, සර්බියාර්, සෝවේනියා රටවල් හතරකින්ද, පහකින්ද ෆෙඩරල් රාජ්‍යයක්. ෆෙඩරල් රාජ්‍යයක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මධ්‍යම රජය ශක්තිමත් වූ තාක්කල් ෆෙඩරල් රාජ්‍යය තිබෙනවා. මධ්‍යම රජය දුර්වල වුණාම ෆෙඩරල් රාජ්‍යය කැඩිලා යනවා. අද යුගොස්ලෝවියාව වාගේ රටවල් පහක්. මොකද, අල්ලපු රටට උවමනා වුණා මේක කඩා දාලා තම තමන්ට හිතවත් රාජ්‍යයන් බිහි කරන්න. තව උදාහරණයක් ගමු රුසියාව. රුසියාව සෝවියට්දේශය වශයෙන් ෆෙඩරල් රාජ්‍යයක් තිබුණා. බොරිස් යෙල්ට්සින් වාගේ දුර්වල නායකයෙක් ආවා. මොකද, වුණේ? ගොර්බචොක් දුර්වල නායකයෙක් ආවා. පෙදෙස්ත්‍රොයි ආවා. පෙදෙස්ත්‍රොයි ඇවිල්ලා රුසියාව කෑලි කෑලිවලට කඩලා දැම්මා. ඒක නවත්ත ගන්න නම් රුසියාවට පුළුවන්කමක් තිබුණේ නැහැ. මොකද, ධනවාදී පැත්ත එහෙට මෙහෙට ඇද්දා. ගන්න සුඩානය. මේ වාගේම කෑල්ලක් ඉල්ලා හිටියා. අන්තිමට මොකද වුණේ? උතුරු සහ දකුණු සුඩානය කැඩිලා ගියා. ඊළඟට ඉන්දුනීසියාවේ ඊස්ට්මෝරේ. මොකද වුණේ? ඊස්ට්මෝරේ වෙනම රාජ්‍යයක් හැටියට කැඩිලා ගියා. ලෝක ඉතිහාසයේ ගන්න උදාහරණ තිබෙනවා. දැන් මේ ගන්නේ මේක කඩලා දාලා වෙන් කරන්න. යුරෝපයට

හිතවත්කම් තිබෙන රාජ්‍යයක් මේ ආසියාව තුළ නැහැ. ඒගොල්ලන්ට මේ ආසියාව පාලනය කරන්න, ආසියාවට ගහන්න, ආසියාව යට කර ගන්න, වෙනම රජ්‍යයක් ඕනෑ. තමන්ට ශක්තියක් තිබෙන ඊශ්‍රායලය තියාගෙන මැද පෙරදිග පාලනය කරනවා වාගේ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවායේ යට ජාත්‍යන්තරය ඉන්නවා. මේවා ක්‍රියාත්මක වෙන්නේ ඒ අයට ඕනෑ විධියට. දෙමළ ජනතාවට, අහිංසක මිනිස්සුන්ට ඕනෑ විධියට නොවෙයි. ඒක නිසා අපේ රටේ දෙමළ, සිංහල, මුස්ලිම් නායකයෝ දැන ගන්නවා මේ යන්නේ මොන ඉලක්කයටද? දැන් බලන්න විග්නේෂ්වරන් මහත්තයා ඉදිරිපත් කරපු යෝජනාවේදී - නිකම් බලන්න. ජේ.ආර්. ජයවර්ධන මහත්තයා 1987 පළාත් සභාව පිහිටවපු දවසේ, මේ යෝජනාව ගෙනාපු දවසේ උතුරු සහ නැගෙනහිර තාවකාලිකව ඒකාබද්ධ කළා. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් වෙන් කරන කල්, හිටපු ආග්‍රවිනිශ්චයකාර සරත් එන්. සිල්වා තාවකාලික කළා. අවුරුදු 15 ක් 20 ක් විතර තාවකාලිකයි. අවුරුදු 20 ක් තාවකාලිකයි. මේ දෙන දේවල්, ගහලා ගත්තොත් ආයිත් ගහලා ගන්න පුළුවන්. ලියලා දෙන කිසිම දෙයක් ආයිත් ගහලා ගන්න බැහැ. මම මේ කියන්නේ උතුරු - නැගෙනහිර එකතු කළා නේ? ශ්‍රේෂ්ඨාධිකරණයට යනකල් බැරුව ගියා නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා කියන තරම් සුන්දර නැහැ. මේවායේදී අපි පළාත් සභාවක් වශයෙන් හැම කෙනාම මෙයට විරුද්ධ වෙන්න ඕනෑ. පොදුවේ විරුද්ධ වෙන්න ඕනෑ. අපේ නායකයන්ට අපි බලපෑම් කරන්න ඕනෑ. මේවා තුළදී නායකයෝ, නායකයෝ විධියට හැසිරෙන්න කියලා. එහෙම නැත්නම් දවසක - දැන් බලන්න ඉල්ලුවේ මොකක්ද? උතුරු - නැගෙනහිර වෙනම ඒකකයක්. වෙනම ෆෙඩරල් ආණ්ඩුවක්. මධ්‍යම කඳුකරයට පරිපාලන ඒකකයක්. ඒ මදිවාට මුස්ලිම් ජනතාවගේ හිත් දිනාගන්න නැගෙනහිරත් වෙනම පරිපාලන ඒකකයක්. හරි. දැන් අද වනකොට මේ කෙළඹ සිංහල, මුස්ලිම් සහ දෙමළ ජනගහනය වැඩියි. තවත් අවුරුදු 20 ක් 25 ක් ගියාම දෙමළ ජනගහනය වැඩි වුණා කියලා හිතමු කෝ? මුස්ලිම් ජනගහනය වැඩි වුණා. එදාට කියනවා, මේ කොළඹ ප්‍රදේශයට වෙනම පරිපාලන ව්‍යුහයක් දෙන්න. මෙන්න මේ වී ඇටයක් විතර පුංචි රට ඔහොම කැලි කැලි කඩලා දෙන්න ගියාම අපේ දරුවෝ නොවෙයි, දරුවන්ගේ දරුවෝ දේශ සීමාවලට මරා ගන්නවා. අපට ඒක නවත්වන්න බැහැ. එදාට ඒ අය අපට සාප දෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිසා මේ වාගේ අධම යෝජනාවලට එක තැනින්ම කතිරේ දාන්න ඕනෑ. නීතිය ඉදරියට පමුණුවලා දඬුවම් දෙන්න ඕනෑ. මම හිතන්නේ එදා ප්‍රේමදාස මහත්තයා හරි තීන්දුවක් ගත්තා. අනෙක් එක ඉවසීම හොඳ ගුණාංගයක්. හැබැයි ඕනෑවට වැඩිය ඉවසීම මානසික රෝගයක්. මම ජනාධිපතිතුමාටයි, අගමැතිතුමාටයි ඒක මතක් කරනවා. මොකද, ඒ කියන කථා ඔක්කෝම සැහැල්ලුවෙන් අයින් කරන්න බැහැ. දැන් අද ජනාතා විමුක්ති පෙරමුණ පූසෝ වාගේ අහගෙන ඉන්නවා. මේවා වෙන්න, මහින්ද රාජපක්ෂ මහත්තයා ගෙදර යවන්න පෙරමුණ ගත්තේ ජනතා විමුක්ති පෙරමුණ. A, B, C, D දෙන කොට, A අයින් කරන කොට B උඩට එනවා කියලා දැනගන්න ඕනෑ. මට මතකයි කෝච්චිය යාපනේට දාලා, යාපනේ ස්ටේෂන් එකෙන් බැහැලා මහින්ද රාජපක්ෂ මහත්තයාට මාධ්‍යවේදියෙක් මයික් එක ඇල්ලුවා. ඔබතුමා මොකද, කියන්නේ පොලිස් හා ඉඩම් බලතල දෙනවාද කියලා. මහින්ද මහත්තයා කිව්වේ ඊලාම් සිහිනය අත අරින්න කියන්න එදාට බලාගමු කියලා. ඒ යාපනේ දෙමළ ජනතාව ඉදිරියේ. ඊට මාස ගණනකට ඉස්සෙල්ලා ඉන්දියාට ගියා. ඉන්දියාවේදී ඇහුවා පොලිස් හා ඉඩම් බලතල දෙනවාද කියලා. එතුමා කෙලින්ම කිව්වා දෙන්නේ නැහැ කියලා. නිකම් හිතන්න කෝ? කටාන ආසනය මම ගත්තොත් කටාන ආසනයේ පාසල් 45 යි. ඒ 45 න් රද්දොළුව පඤ්ඤානන්ද ජාතික පාසල විතරයි මධ්‍යම රජයට අයිති. ඉතුරු පාසල් ඔක්කෝම අයිති පළාත් සභාවට. පඩි ගෙවන්නේ, පාලනය ඔක්කෝම අපි. කටාන ආසනය තුළ පාරවල් ගත්තොත් පාරවල් 04 යි මධ්‍යම රජයට අයිති. ඉතුරු ඔක්කෝම පළාත් සභාවට අයිති. එහෙම නම් පළාත් පාලනය, පාලනය වෙන්නේ, මෙහෙය වන්නේ, අධීක්ෂණය කරන්නේ පළාත් සභාවෙන්.

එහෙම නම් මේ පොලිස් සහ ඉඩම් බලතල දුන්නු දවසට වෙනම රාජ්‍යයක් දෙන්න ඕනෑ නැහැ. මොකක්දෝ මන්දා ජාතියේ වාසනාවකට ජේ.ආර්. ජයවර්ධන මහත්තයා මේ පළාත් සභා ක්‍රමය ඇති කරන දවසේ හිතලා හෝ නොහිතා මම දන්නේ නැහැ, පළාත් 09 ක්ඇති කළා. පළාත් 09 ක් ඇති කරන කොට එතුමා එදා හිතන්න ඇති උතුරු සහ නැගෙනහිර වෙනම පළාතක් ඉල්ලපු දවසට, වෙනම පාලනයක් ඉල්ලපු දවසට දකුණේ බස්නාහිර නැත්නම් දකුණු පළාත් සභාව, නැත්නම් මධ්‍යම පළාත් සභාව, උතුරු මැද පළාත් සභාව වෙනම රාජ්‍යයන් ඉල්ලපන් කියපු දවසට ලංකාව කැලි 09 කට කැඩෙනවා.

[ගරු ආනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා]

මේ පුංචි රට කෑලි 09 කට කඩන්න ඉඩ දෙන්නේ නැහැ ජාත්‍යන්තරයට. ඒ නිසා එදාට මේක ඉෂ්ට වෙන්නේ නැහැයි කියලා හිතාගෙන ජේ.ආර්. ජයවර්ධන මහත්තයා එහෙම කරන්න ඇති. මට හිතෙනවා ජේ.ආර්. ජයවර්ධන මහත්තයා එහෙම හිතලාද මේක දැම්මේ කියලා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා එසේ මෙසේ යෝජනා නොවෙයි. ඒ කෙසේ වෙතත් මම මේ යෝජනාව ගෙනාපු අපේ ගරු මන්ත්‍රීතුමාට උත්තර දෙන්න ඕනෑ. හිටපු ඇමැතිතුමාට. අර දිට්ඨධම්මවේදනීය කර්මය පඩිසන් දෙනවා වාගේ එතුමන්ලා කියපු කරපුවාම දැන් එතුමන්ලාටම අනෙක් පැත්තට පඩිසන් දෙනවා. මම හිතන්නේ අපේ සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඕක එතුමා ලවා නොවෙයි කියවන්න ඕනෑ. එතුමන්ලාගේ යාළුවෝ නේ විග්නේෂ්වරන්. මචං ඔන්න ඕක අයින් කර ගනින් බං කියලා කිව්වා නම් වැඩේ ඉවරයි නේ? ඔය එකට ඉන්න කට්ටිය නේ? මචං ඕක අයින් කර ගන්න කිව්වා නම් වැඩේ ඉවරයි. ඒගොල්ලොත් දැන ගන්න ඕනෑ මේගොල්ලන්ට කඩේ යනකොට, මේගොල්ලෝ කළේ - රජ කාලේ හිටියා සක්කඩයා. රජ කාලේ හිටියා සක්කඩයා කියලා එක්කෙනෙක්. සක්කඩයා කියන්නේ රජ්ජුරුවෝ කියන කෙනා. අඩු ගාණේ ලැජ්ජාවට පස්ස හෝදන්නේත් නැහැ. සුදු රෙද්දෙන් වහගෙන ඉන්න ඇඟ සක්කඩයා තමයි පස්ස හෝදන්නේ. ඒ සක්කඩයාගේ ජොබ් එක කරපු මේ කට්ටිය දැන ගන්න ඕනෑ දැන් මේක උදා වෙනවා කියලා. මේගොල්ලෝ තමයි මේවාට වගකිව යුත්තේ. අද ඒගොල්ලෝ තුළින්ම මේ යෝජනාව ගෙනාවා. හැබැයි මේ යෝජනාව රට ගිනි තියන යෝජනවක් වෙන්න බැහැ. ඔබතුමන්ලාට මේකෙන් වාසි ප්‍රයෝජන අත්වන යෝජනාවක් වෙන්න බැහැ. ඔබතුමා මේ ගිය ආණ්ඩුව පෙරළලා මහින්ද රාජපක්ෂ එලවපු පාප කර්මයෙන් ගැළවෙන්න මේ යෝජනාව ගෙනැල්ලා බැහැ. විග්නේෂ්වරන් ගෙනාපු යෝජනාවට පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් මගේ දැඩි විරෝධය ප්‍රකාශ කරනවා.

ඒ වාගේම මම යෝජනාවක් වශයෙන් කරනවා. මගේ යෝජනාව පිළිගන්න එකක් නැහැ. අපි මේ බස්නාහිර පළාත් සභාව - මේ රටේ ආදායමෙන්, ලංකාවේ බහුතර ආදායමෙන් බදු 30% ක් 40% ක් විතර මේ බස්නාහිර පළාත් සභාවෙන් ලැබෙන ආදායම බස්නාහිර පළාත් සභාවෙන් යෝජනාවක් ගෙනාවොත් අපේ මේ බස්නාහිර පළාත් සභාවෙන් ගන්න බදු සල්ලි ටික ඇයි මේ ලංකාවේ දුප්පත්ම පළාත්වලට දෙන්නේ? ඒ බදු සල්ලි ටික අපිම පාලනය කරලා මේ පළාත් සභාව දියුණු කරන්න අපටත් ෆෙඩරල් රාජ්‍යයක් ඉල්ලුවොත්. හේතුවක් නේ? ඒගොල්ලෝ භාෂා මත මේවා කරනවා. අපි අපේ ධනය සහ ආර්ථිකය මත මේ වාගේ යෝජනා කරනවා. අපේ බදු සල්ලි 40% ක් එකතු කරලා රජයට දෙනවා. ඒ සල්ලිවලින් දුප්පත් පළාත් සභා මෙහෙයවනවා. එහෙම නම් අපි යෝජනාවක් ගෙන එන්න ඕනෑ අපේ සල්ලි පිටට යන්න ඕනෑ නැහැ. මේ බස්නාහිර පළාත් සභාව දියුණු කර ගන්න,ඒ සඳහා බස්නාහිර පළාත් සභාවෙන් වෙනම ෆෙඩරල් ඒකකයක් හදලා අපි ඉල්ලන්න ඕනෑ. ස්තුතියි.

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

***[නැඟී සිටියේය. ]***
*[Stood.]*

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය මේ සභාවේදී කියලා තිබෙනවා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි දන්නවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න කෝ? මොකක්ද කියලා දන්නේ නැහැ නේ? ඔබතුමා කියන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එතුමා හිටියෙත් නැහැ.

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

මම හිටියේ නැති වුණත් මගේ ජාතිය වෙනුවෙන් මට කථා කරන්න පුළුවන් නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා කථා කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මෙතැන විහිළු කරන තැනක් නොවෙයි. පැහැදිලිව අහගන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එහෙම කියන්න එපා. ඔබතුමිය කරුණාකරලා වාඩි වෙන්න. එතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නේ.

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

මගේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මගේ ජාතිය වෙනුවෙන් කථා කරන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නේ. අවස්ථාව දෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔබතුමා හිටියෙත් නැහැ.

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

ඔබතුමියට එහෙම කථා කරන්න බැහැ. මගේ ජාතිය වෙනුවෙන් මම මේ කථා කරන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔබතුමා හිටියෙත් නැතුව කොහොමද? මට උත්තර දෙන්න අවස්ථාවක් ඕනෑ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හරි. ඔබතුමා කථා කරන්න.

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

මුස්ලිම් ජාතිය මේ රටට කුඩු ගෙනැල්ලා රට විනාශ කරනවා කියලා කථාවක් කියලා තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කිව්වා. ඔබතුමා හිටියේ නැහැ.

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

හිටියේ නැති එක මෙතැන ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

ඒ ප්‍රශ්නය මොකක්ද කියලා පැහැදිලිව -

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

දැන් සභාවේ ඉන්නවා නේ? එතුමිය කොහොමද එහෙම කියන්නේ? මුස්ලිම් ජාතිකයන් විතරද මේ රටට කුඩු ගේන්නේ?

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

ඒ ප්‍රකාශය කළාද නැද්ද?

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

ජාතියක් කියලා එතුමිය කොහොමද හංවඩු ගහන්නේ? මේ රටට එදා ඉඳලා කුඩු ගෙනාවේ කවුද කියලා මම කියලා දෙන්නම්. එල්.ටී.ටී.ඊ. කාලයේ ඉඳලා කවුද ගෙනාවේ? එල්.ටී.ටී.ඊ කාරයින්ට දුන්නේ කවුද? අපේ පැත්තේ හිටියා ඩේල්වල කට්ටිය. උන්ට කවුද නැව්වලින් ගෙනත් දුන්නේ කියලා මම කියන්නම්. මෙතුමිය දන්නේ නැත්නම් දන්නේ නැති දේවල් කථා කරන්න එපා. ජාතියට අවනම්බු කරන්න එපා. කරුණාකරලා මුස්ලිම් ජාතිය තියලා කියන්න එපා. අද සෑම ජාතියක්ම සෑම ජාවාරමක්ම කරනවා. අපිත් ඒක දන්නවා. ඒ නිසා ජාතියට අත දික් කරලා මේ වාගේ කථා කියන්න එපා කියලා ඉල්ලා සිටිනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පැහැදිලිව කිව්වා සිංහල මිනිස්සු කොටි බෝම්බ හංගගෙන ඉන්න උදව් කරලා සල්ලි ගත්තා. සමහර මුස්ලිම් මිනිස්සු ඇවිල්ලා කුඩු ගෙනැල්ලා මේ රට විනාශ කරනවා. එතකොට සිංහල මිනිස්සුත් මේ විනාශය කරනවා. මේ අන්තවාදීන්, ජාතිවාදීන් හැම ආගමේම, හැම කුලේම හැම තැනම ඉන්නවා කියලා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සමහර කියලා කිව්වාද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ ටික අහගෙන හිටියේ නැහැ. ඒ ටික අහගෙන හිටියේ නැතුව ඇවිල්ලා කථා කරන්න එපා, මෝඩ තාලෙට. එච්චරයි මට කියන්න තියෙන්නේ.

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

සමහර කියලා ඔබතුමිය කියලා නැහැ නේ? දැන්නේ සමහර කියලා කිව්වේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කොහෙත් ඉන්නවා අන්තවාදීන්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කේ.ටී. කුරුසාමි ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මම දෙමළ භාෂාවෙන් කථා කරන්න ආසයි. නමුත් මම සිංහලෙන් කථා කරනවා. වචනවල වැරැදි තියෙනවා නම් සමාවෙන්න. ජාතික හෙළ උරුමයේ මන්ත්‍රී නිශාන්ත ශ්‍රී වර්ණසිංහ මැතිතුමා යෝජනාවක් ගෙනැල්ලා තියෙනවා. මුලින්ම මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ රටේ ජාතික හෙළ උරුමය ජාතිවාදය ඇති කරපු පක්ෂයක් හැටියට තමයි අපි නම් දන්නේ. අද කථා කරපු මන්ත්‍රීවරුත් කිව්වා. මේ යෝජනාවේදී එතුමා කියලා තිබෙනවා,

"*තිස්වසරක බෙදුම්වාදී ත්‍රස්තවාදයකට මුහුණදුන් රටක් ලෙස එය නිමා කිරීමෙන් පසු රටේ ජාතික සංහිඳියාව, සමගිය, සහජීවනය ගොඩනැගෙමින් පවතින අවස්ථාවක මෙවැනි යෝජනාවක් ගෙන ඒමෙන් සිදුවන්නේ සංහිඳියාවට බාධාවකි. ජන කොටස් අතර අවිශ්වාසය, සැකය වර්ධනයවීමක් පමණි. තවද, මෙම යෝජනාව පළාත් අතර භේදකාරී තත්ත්වයක් ඇති කිරීමට හේතුවන අතර ජාතික ඒකාග්‍රතාවයට ද හානිකරය*" කියලා.

ඒ නිසා ඒ ඡේදයට මම ඇත්තටම ස්තුතිවන්ත වෙනවා. මේ රටේ ජාතිවාදය ඇති කරපු පක්ෂයක් වන ජාතික හෙළ උරුමයේ මන්ත්‍රීතුමා අද ඒක කියනවා නම්, ඇත්තටම මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මගේ කථාව පටන් ගන්න ඉස්සෙල්ලා එක පැත්තකින් මම කියනවා. ගරු මන්ත්‍රීතුමා, මේ රටේ යළිත් වතාවක් එල්.ටී.ටී.ඊ. සංවිධානය හෝ මේ රට බෙදන්න, නැත්නම් මිනිස්සු මරන්න කවුරු හරි යළිත් වරක් ආයුධ ඔසවනවා නම්, ඔබතුමන්ලාත් එක්ක අත්වැල් බැඳගෙන අපත් ඉදිරියට එන බව ඉස්සෙල්ලාම මම කියන්න කැමැතියි. අපි කොළඹ ජීවත් වන දෙමළ ජනතාව. මම ඇත්ත කියන්නම්. උතුරේ සමහර මිනිස්සු අද කොළඹ ඇවිල්ලා යනවා. අල්ලපු මිනිහා ආයුධ ගන්නවා නම්,ඒකට ඉඩ නොදෙන බව ඒගොල්ලොත් ඒක කියයි. ඒ මිනිස්සුත් කැමැති නැති බව විශ්වාසවන්තව මම ඔබතුමාට මේ අවස්ථාවේදී කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්න ඕනෑ පොදු විපක්ෂය කියලා කථා කරන මන්ත්‍රීවරුන්ට ඇත්තටම දේශපාලනය කරන්න යම්කිසි දෙයක් නැති වෙලා තිබෙනවා. අද මෛත්‍රී රනිල් එකඟතාවයෙන් යන මේ යහපාලනයේ පොදු විපක්ෂය කියලා නැත්නම් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට කඩේ යන මන්ත්‍රීවරුන්ට මේ රටේ දේශපාලනය පවත්වාගෙන යන්න විධියක් නැතුව තිබෙන නිසා තමයි අද ඕනෑ නැති ප්‍රශ්න ඔක්කෝම ඇති කරන්නේ.

[සභාවේ ඝෝෂා]

ඇත්තටම මම කියනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ආණ්ඩුව පාර්ශවයෙන් ගෙනාවේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දෙමළ

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

දෙමළ මන්ත්‍රීවරයෙක් කථා කරන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

දෙමළද, සිංහලද, මුස්ලිම්ද මම බස්නාහිර පළාතේ මහජන නියෝජිතයෙක්. මම මේ ඇත්ත කියන්නේ. පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න. ඔබතුමන්ලා අද කථා කරනවා, අවුරුදු 50 ක ඉතිහාසයක් ගැන. ඇත්තටම අවුරුදු 50 ක ඉතිහාසයේ මේ රටේ මොකක්ද වෙලා තියෙන්නේ? ඔක්කෝම ගෙනැල්ලා කියවනවා. එහෙම නම් ඔබතුමන්ලා පිළිගන්නවාද අවුරුදු 50 කට කලින් ශ්‍රී ලංකාවට නිදහස ලබා දුන්නු දෙමළ නායකයින්ව, සිංහල නායකයෝ ඔළුවේ තියාගෙන උස්සගෙන ආපු එක. අවුරුදු 50 කට කලින්. ඇයි ඒක කියන්නේ නැත්තේ? එක පැත්තකින් කියනවා,රටේ යුද්ධය දිනන්න නායකත්වය දුන්නේ මහින්ද රාජපක්ෂ කියලා. ඇත්තටම අපි පිළිගන්නවා. එහෙම නම් ඇයි ඔබතුමන්ලා පිළිගන්නේ නැත්තේ ඒ හමුදා නායකත්වය සරත් ෆොන්සේකා දුන්නා කියන එක. (බාධා කිරීමක්) නැහැ, කවුරුත් කිව්වේ නැහැ. ඔබතුමන්ලා අද කථා කරන කොට සරත් ෆොන්සේකා මහත්තයා ගැන කථා කළේ නැහැ. ඔබතුමන්ලා මහින්ද රාජපක්ෂ මහත්තයා ගැනමයි කථා කරන්නේ. ඇත්තටම අද ඔබතුමන්ලාට යළිත් වරක් කියනවා - (බාධා කිරීමක්)

ඔබතුමන්ලාට යළිත් වරක් කියනවා. මේ එල්.ටී.ටී.ඊ. ය ඇති වෙලා තිබෙනවා. අරවා හම්බ වුණා. මේවා හම්බ වුණා කියලා. ඇත්තටම මට ඊයේ පෙරේදා අපේ රනිල් වික්‍රමසිංහ ගරු අග්‍රාමාත්‍යතුමා කියපු කථාවක් කියන්න වෙනවා. එහෙම එල්.ටී.ටී.ඊ. කවුරු හරි අහු වෙනවා නම්, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් ප්‍රශ්න කරන්න ඕනෑ. මේ රටේ එල්.ටී.ටී.ඊ. නැති කළේ කවුද? නැහැයි කියලා කිව්වේ කවුද? නැවත වරක් එල්.ටී.ටී.ඊ. ය ඉන්නවා කියලා ඇයි කියන්නේ? තමන්ගේ දේශපාලනය ගෙනියන්න යමක් නැහැ. නැති නිසා කියනවා යළිත් වරක් එල්.ටී.ටී.ඊ. ඉන්නවා. අරවා හම්බ වුණා, මේවා හම්බ වුණා කියලා. නැහැ. මේ රටේ නැහැ. යළිත් එල්.ටී.ටී.ඊ. කියන එක නැහැ. මම කියනවා, ඔබතුමන්ලාගේ මනාපය වෙනුවෙන් (බාධා කිරීමක්) ඔබතුමන්ලාගේ දේශපාලන භාවිතා වෙනුවෙන් මනාපය වැඩි කර ගන්න යළිත් වරක් එල්.ටී.ටී.ඊ. ඇති කරන්න එපා. මේ රටේ නැහැ. එල්.ටී.ටී.ඊ. ඇති කරන්න එපා.

**ගරු ආනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ආයුධ එවන්නේ නිකන් දෙන කොටද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා කථා කරන වෙලාවේ බොහොම සාවදානව ඇහුම්කන් දුන්නා. දැන් බාධා කරන්න එපා.

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

දැන් බලන්න අපට ඇත්තටම සන්තෝෂයි. එදා හිටපු සිංහල නායකයන්ට යාපනයට යන්න බැරි තත්ත්වයක් තිබුණා. ඒක අපි පිළිගන්නවා. නමුත් අද බලන්න. මෛත්‍රීපාල සිරිසේන අතිගරු ජනාධිපතිතුමා යනවා. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා යනවා. ගිහිල්ලා දෙමළ මිනිස්සුන්ගේ හිත දිනාගෙන ඉන්නවා. එදා පාර්ලිමේන්තුවට දිනන්න පුළුවන් නම් එන්න එන්න තවත් ඒ ඡන්දය වැඩි වෙනවා. ඒක තමයි අපි ඇති කරන්න ඕනෑ. ඒක තමයි අපි ඇති කරලා තියෙන්නේ. අද රනිල් - මෛත්‍රී පාලනය කියන්නේ, ඒක තමයි ඇති කරගෙන ඉන්නේ. (බාධා කිරීමක්) ඇත්තටම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔය වාගේ නායකයෙක් -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා කථා කරන්න.

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කථා කළොත් මම කථා කරන්නේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔබතුමා මනෝ ගනේෂන්ට එන්න කියන්න.

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට දැන ගන්න ඕනෑ මේ සම්බන්දන්ට විපක්ෂ නායක ධුරය දුන්නයි, දුන්නයි කියනවා නේ? මේ විපක්ෂ නායක ධුරය නිකම්ද දුන්නේ? ඇත්තටම පාර්ලිමේන්තුවේ වැඩි -

**ගරු ආනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කඩේ ගියාට. කඩේ ගියාට.

[සභාවේ ඝෝෂා]

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

වැඩි ඡන්දය ගණනක් තිබෙන නිසා අද විපක්ෂ නායක ධුරය දීලා තිබෙනවා. එක පැත්තකින් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අපේ රටට විරුද්ධව ඇවිල්ලා තිබෙන චෝදනාවලට අද මුහුණ දෙන්න අපි ඔක්කෝම එකමුතුව ඉන්නවා කියලා කියන්න තමයි මෛත්‍රී - රනිල් අද සම්බන්දන්වත් එකතු කරගෙන චෝදනා ඔක්කෝම පිටුදැකලා තිබෙන්නේ. අර සම්බන්දන්ව ඇතුල් කරපු නිසා. අපේ රට ආරක්ෂා කරන්න මිසක් නිකන් දීලා නැහැ. අද පාර්ලිමේන්තුවේ වැඩි සීට් ගණනක් ඒ අයට තිබෙනවා. අද පොදු විපක්ෂය කියන ඔබතුමන්ලා ඔක්කෝම එකතු වෙලාත් විපක්ෂ නායක ධුරය ගන්න බැහැ නේ? ඒ නිසා ඇත්තටම පොදු විපක්ෂ කියලා මන්ත්‍රීවරු තිස් දෙනෙක්, හතලිස් දෙනෙක් එකතු වෙලාත් ඇයි විපක්ෂ නායක ධුරය ගන්න බැරි? නීතිය පැත්තෙන් බැහැ. නීතිය පැත්තෙන් සම්බන්දන් මැතිතුමාට පුළුවන් නිසා තමයි ඒක ලබා දීලා තිබෙන්නේ. අනෙක් එක ඔබතුමන්ලා කියනවා වාගේ අද සිංහල මිනිස්සු පිළිගත්තු නායකයෝ තමයි සම්බන්දන්, විග්නේෂ්වරන්, සුමන්දිරන් කියන්නේ. හොඳට සිංහල දන්න, හොඳට සිංහල ඉගෙන ගෙන තිබෙන හොඳ නායකයෝ. ඔබතුමන්ලා හිතනවා වාගේ නොවෙයි. ඔබතුමන්ලා වාසියට - මම සියලු දෙනාම කියන්නේ නැහැ. හොඳ මන්ත්‍රීවරු ඉන්නවා. මෙතැන එක්කෙනෙක් දෙන්නෙක් තමන්ගේ මනාපය වැඩි කරන්න, එහෙම නැත්නම් තමන්ගේ දේශපාලනය පවත්වාගෙන යන්න පොඩි පොඩි දේවල් කියනවා. අද තිබෙන පාලනය, යහපාලනය කියන්න - අද සිංහල ජනතාව -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද, කවුද?

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

මහ අහන්නේ මෛත්‍රී කියන්නේ, රනිල් කියන්නේ සිංහල බෞද්ධ නායකයෝ නොවෙයිද? ඒගොල්ලෝ කොහොමද එතැන ඉන්න එල්.ටී.ටී.ඊ. අයට, යාපනේ අයට මේ රට පාවා දෙන්නේ? එහෙම දෙන්නේ නැහැ. එහෙම දෙන්න සිංහල නායකයෝත් ඒකඟ වෙන්නේ නැහැ. ඒ අයත් එක්ක එකතු වෙලා ඉන්න අපි, දෙමළද, මුස්ලිම්ද අපිත් කවදාවත් එකඟ වෙන්නේ නැහැ. ඒ නිසා කරුණාකරලා තමන්ගේ දේශපාලනය පවත්වාගෙන යන්න, ඔය වාගේ ජාතිවාදය ඇති කරලා අපේ ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමා කියපු විධියට යළිත් වරක් මේ රටේ ගිනි ගස්සන්න එපා. ඇත්තටම මේ බලන්න -

**ගරු ආනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඔය කථාව කියන්න එපා කියන්න. ඔය කථාව කියන්න එපා කියන්න.

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

දැන් ඊලාම් කියන වචනය අමතක කරලා ඉවරයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඕක උතුරු පළාත් සභාවට කියන්න.

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

දැන් ආයෙත් ෆෙඩරල් කියලා ඔසවාගෙන ඉන්නවා. ඇත්තටම විග්නේෂ්වරන් කිව්වේ සිංහල ජනතාව හරියට දැනුවත් වෙන්න ඕනෑ ෆෙඩරල් කියන්නේ මොකක්ද කියලා. ෆෙඩරල් කියන්නේ රට බෙදීමක් නොවෙයි. රට බෙදනවා නොවෙයි. තමන්ගේ අයිතිය ඉල්ලනවා. එහෙම -

[සභාවේ ඝෝෂා]

අද පළාත් සභාවට තිබෙන 17 වැනි සංශෝධනය කියන්නේ මොකක්ද? අද 17 වැනි සංශෝධනයේ තිබෙන බලතල අපේ පළාත් සභාවලට දීලාද තියෙන්නේ? එහෙම දීලා තිබෙනවා නම් ඇයි අපි මේ වාගේ රණ්ඩු කරන්නේ? ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ කරුණාකරලා අපේ ඔබතුමන්ලාගේ දේශපාලන වාසිවලට යළිත් වරක් මේ ජාතිවාදය ගේන්න එපා. අපි ඔක්කෝම එකහව -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක විග්නේෂ්වරන්ට කියන්න.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

උතුර පළාත් සභාවට කියන්න.

**ගරු. ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

**நீங்கள் பேய்த்து சொல்லுங்க** -

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

අපි ජීවත් වෙන්නේ 2016. වුණු දේ වෙලා ඉවරයි. යළිත් වෙන්න ඕනෑ හොඳ දෙයක්. ඒක නිසා අද රනිල් - මෛත්‍රී ගෙන යන ඔය යහපාලනයට ඔබතුමන්ලා උදව් කළේ නැති වුණත් කරුණාකරලා බාධා කරන්න එපා. මේ රට හොඳට යනවා කියලා කියමින් මට වෙලාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ද්‍රවිඩ භාෂාවෙන් කථා කරන්නේ නැතුව අපි හැමෝටම තේරෙන විධියට සිංහල භාෂාවෙන් කථා කිරීම පිළිබඳව.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාවට වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුවන්ත වෙනවා. ඒ වාගේම මම ස්තුතිවන්ත වෙනවා, මම සතුටු වෙනවා ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඒ වාගේම අපේ කේ.ටී. කුරුසාමි ගරු මන්ත්‍රීතුමා කථා කළාට පස්සේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම ගැනත්. ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, කේ.ටී. කුරුසාමි ගරු මන්ත්‍රීතුමා නොදැනුවත්කමට හරි මෝඩකමට හරි හුඟක් ඇත්ත දේ කිව්වා. ඉතින් ඒ ගැන අපි විශේෂයෙන් සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ සාකච්ඡා කරන කාරණය නිදහසින් පස්සේ මේ රට මුහුණ දීපු සංකීර්ණම ප්‍රශ්නය. ඒ වාගේම අභියෝගාත්මකම ප්‍රශ්නය. මේ ප්‍රශ්නය නොදැන කථා කිරීම, මේ ප්‍රශ්නය අධ්‍යයනය නොකර කථා කිරීම, මේ ප්‍රශ්නය භාගෙට දැනගෙන කථා කිරීම, මේ ප්‍රශ්නය ව්‍යාකූලව කථා කිරීම, මේ රට ඇතුළේ නැවත වතාවක් බෙදුම්වාදයක් නිර්මාණය කරන තැනකට යන්න බලපානවා කියන කාරණය අපි හැමෝම මතක තියාගන්න ඕනෑ. ඒ නිසා මේක ගැන ඉතාම නිරවුල් මනසකින්, ඉතාම පැහැදිලිව සාකච්ඡා කරන එක තමයි මේ රට ඇතුළේ නැවත බෙදුම්වාදයක් නිර්මාණය නොවෙන්න අපි ගත යුතු ක්‍රියා මාර්ගය කියන විශ්වාසය මා තුළ තිබෙනවා. ඔබතුමා දන්නවා මේ ප්‍රශ්නය නිසාම මේ රට තුළ දේශපාලන පක්ෂ ගණනාවක් බිහි වුණා. මේ ප්‍රශ්නය නිසාම මේ රට ඇතුළේ ජීවිත ගණනාවක් නැති වෙලා ගියා. මේ ප්‍රශ්නය නිසාම ජාවාරම්කාරයෝ මුදල් හම්බ කෙරුවා. මේ ප්‍රශ්නය නිසාම අධිරාජ්‍යවාදීන්ට මේ රට මංකොල්ල කෑමේ ඉඩකඩ, අවස්ථාව නිර්මාණය වෙලා තිබුණා. ඒ නිසා අපි නැවත වතාවක් එවැනි තැනකට නොඑන්න නම් මේ ප්‍රශ්නය නිවැරැදිව තේරුම් අරන් කථා කළ යුතුයි කියන කාරණය තමයි මගේ අදහස.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විශ්වාස කරන කාරණාවක් තමයි ෆෙඩරල් යෝජනාව හැමදාම ආවේ

[ ගරු මහේෂ් අල්මේදා]

උතුරෙන් කියන කාරණාව. නමුත් ෆෙඩරල් ගැන දකුණේ සමාජය බරපතළ විදියට සාකච්ඡා කෙරුවා. මා පුංචි කාරණයක් කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 1926 ජුනි මාසේ 17 වැනිදා Ceylon Mornning Leader කියන පත්තරේට එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා ලිපියක් ලිව්වා. මේක පොඩ්ඩක් දිගයි. මම ඔබතුමාගෙන් අවසර ඉල්ලා සිටිනවා, මේකේ තිබෙන කාරණය සරලව මේ සභාවට කියන්න. මේකේ බණ්ඩාරනායක මැතිතුමා කියනවා,

"*ලංකාවේ සුළු ජන කොටස් එකිනෙකා දෙස බලන්නේ සැකයෙනි. ඔවුන් අතර වෙනස්කම් ඇති මූලික ඒවා නොවේ යැයි සිතීම සාවද්‍යය. අවුරුදු 100 කට පෙර නම් එවැනි වෙනස්කම් තිබුණේ නැත. එම වෙනස්කම් මතු නොවූයේ, ද්‍රවිඩයන්, පහතරට සිංහලයන් හා උඩරට සිංහලයන් යන කොටස් ඉංග්‍රීසීන් විසින් පාලනය කරනු ලැබූ නිසාය.*" සුද්දෝ පාලනය කරන කොට මේ රට කෑලිවලට බෙදිලා තිබුණු නිසා ජාතීන් වෙනම තියාගෙන හිටපු නිසා ප්‍රශ්නය මතු වුණේ නැහැ. ඒක තමයි බණ්ඩාරනායක මහත්තයා කියන්නේ. "*එහෙත් ලංකාවේ ජනයා ආණ්ඩු බලය තමන් අතට ගැනීමට අවශ්‍යයැයි කථා කිරීමට පටන් ගත් මොහොතේ පටන්ම යට ගැසී තිබුණු වෙනස්කම් ගිනි අඟුරු මෙන් මතු වෙන්නට පටන් ගත්තා කියලා. ඉතිහාසය දෙස බලන විට පෙනෙන දෙයක් නම් දෙමළ, පහරට සහ උඩරට සිංහල යන ජන කොටස් අවුරුදු 1000 කට වඩා මේ රටේ ජීවත් වී සිටි නමුදු ඔවුන් එක් වීම සඳහා කිසිඳු සූදානමක් පෙන්වා නැත. ඔව්හු තම තමන්ගේ චාරිත්‍ර වාරිත්‍ර, භාෂා සහ ආගම් වෙන වෙනම පත්වාගෙන ගිහිල්ලා තිබෙනවා.*" මේක බණ්ඩාරනායක මහත්මයා කියලා තිබෙනවා. *මේ වෙනස්කම් ක්‍රමයෙන් අහෝසි වී යනවා ඇතැයි සිතීම මෝඩකමක් කියලා තමයි එතුමා කියලා තිබෙන්නේ. මේ සංස්කෘතික අනන්‍යතාවයන් ජාතීන්ගේ එකි නෙකට වෙන් වෙලා තිබෙනවා. මේවා සදාකාලිකව තිබෙනවා.* ඒක තමයි බණ්ඩාරනායක මැතිතුමා කියලා තිබෙන්නේ. එහෙම කියලා එතුමා අවසානයේ කියනවා, *ලංකාවේ එක් පළාතක සම්පූර්ණ ස්වයං පාලන අයිතිය තිබිය යුතුය. දිවයිනේ විශේෂයෙන් ආදායම් වියදම් ගැන තීරණය කිරීමට මන්ත්‍රණ සභා එකක් හෝ දෙකක් තිබිය යුතුය. මේ ක්‍රමයට විරුද්ධව දහසකුත් එකක් තර්ක විතර්ක ඉදිරිපත් විය හැකි වුවත්, එම විරෝධතා අඩු වී ගියාට පසු ෆෙඩරල් ආණ්ඩුක්‍රමය ලංකාවට තිබෙන එකම විසඳුම බවට පත් වනු ඇත* කියලා එතුමා කියලා තිබෙනවා. බණ්ඩාරනායක මහත්තයා කිව්වේ, මේ රට ෆෙඩරල් වෙන්න ඕනෑ කියලා. මේ ෆෙඩරල් යෝජනාව 1988 ක්‍රියාත්මක වුණා. දැන් මේ රට ෆෙඩරල් වෙලා ඉවරයි. දැන් මේ රට ප්‍රාන්ත 09 කට බෙදිලා ඉවරයි. දැන් මේ රටේ මූලික ව්‍යවස්ථාවෙන් නීති සම්පාදනය කිරීමේ අයිතිය පළාත් ආණ්ඩුවලට දීලා ඉවරයි. ඒ නිසා මේක ෆෙඩරල් රාජ්‍යයක්. මේකට කථා කරන වචනය මොකක්ද කියලා අපට තේරුම් කරන්න බැහැ. මේක ෆෙඩරල් කියන්නත් පුළුවන්, වෙන වචන කියන්නත් පුළුවන්. මහචාර්ය ඩයිසි කිව්වා ප්‍රාදේශීක ස්වාධීනත්වය සහ ජාතික එක්සත්කම එකට ආරක්ෂා කරන කොට ඒක තමයි සන්ධීය රාජ්‍යය කියලා. ඒ නිසා මේක එහෙම තිබෙන රාජ්‍යයක්.

හැබැයි මේ රාජ්‍ය එහෙම තිබුණත් ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයට එනකල්ම උතුරට ඒ පළාත් සභාව හදල තිබුණේ නැහැ. එතුමා මේ රටට අවශ්‍ය කරන ප්‍රජාතන්ත්‍රවාදය දුන්නා. උතුරු පළාත් සභාව හදලා දුන්නා. හැබැයි අපට එතැනදී වැරදුණා. උතුරේ පළාත් සභාව හදන කොට උතුරේ මහ ඇමැති වුණේ උතුරු මිනිස්සු මුහුණ දීපු ඓතිහාසික ප්‍රශ්න තේරුම් ගත්තු නායකයෙක් නොවෙයි. විග්නේෂ්වරන් ජීවත් වුණේ දකුණේ සමාජයේ. විග්නේෂ්වරන් හැදුණේ දකුණේ සමාජයෙන් පෝෂණය වෙලා. විග්නේෂ්වරන් සුද්දාගේ නීතිය මේ රට තුළ ක්‍රියාත්මක කරන්න කටයුතු කරපු කෙනෙක්. විග්නේෂවරන් මේ රටේ දකුණේ ආණ්ඩුව තහවුරු කරන්න තමන්ගේ තීන්දු තීරණ දීපු කෙනෙක්. ඔහුව උතුරට ගෙනිහිල්ලා දාලා තමයි උතුරේ ආණ්ඩුකාරයා බවට පත් කළේ. මේකේදී අපට ඉතාම පැහැදිලියි විග්නේෂ්වරන් උතුරට ගෙන ගියේ දෙමළ ඩයස් පෝරාව. විග්නේෂවරන් උතුරට ගෙන ගියේ දෙමළ ඩයස් පෝරාවේ උවමනාවට. ඒක නිසා විග්නේෂ්වරන්ට උතුරේ මහ පොළොවේ මිනිස්සු මුහුණ දෙන ප්‍රශ්න, ගැටළුවලට උත්තර සොයා දීමේ උවමනාවක් නැහැ. ඒ නිසා තමයි අපි මෙතුමා ගෙනාපු යෝජනාවට විරුද්ධ වෙන්නේ. විග්නේෂ්වරන්ට උවමනා වෙලා තිබෙනවා, සමාකාමී දකුණේ සමාජයක් හැදෙන එක වළක්වන්න. ඒක තමයි ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වේ. විග්නේෂ්වරන්ට අවශ්‍ය වෙලා තිබෙනවා දකුණේ සමාජය නැවත වතාවක් ගිනි තියන්න. අද ඒක ගිනි තියන්න අවශ්‍ය කරන වටපිටාව නිර්මාණය වෙලා ඉවරයි. දකුණේ සමාජය ඇතුළේ පවතින ආණ්ඩුවට විරුද්ධව විශාල කැරැල්ලක් මතු වෙමින් එනවා. දකුණේ සමාජයේ

මිනිස්සුන්ට පේනවා මේ ආණ්ඩුව යන්නේ කොහාටද කියලා. දකුණේ සමාජයේ මිනිස්සු තේරුම් ගන්නවා මේ ආණ්ඩුව පාලනය කරන්නේ කවුද කියලා. මේ ආණ්ඩුව අධිරාජ්‍යවාදීන්ගේ උවමනාවට ක්‍රියා කරන ආණ්ඩුවක් බව අපි හැමෝටම පේනවා. මේ ආණ්ඩුව ණය ගන්න යන්නේ කොහෙන්ද? මේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය නිර්මාණය කරන්නේ කවුද? මේ ආණ්ඩුව මහජනයාට සලකන්නේ කුමන බෙදීම් ඇතුවද? මේ රටේ කම්කරුවන්ට වරප්‍රසාද දෙනවාද? මේ රටේ සාමාන්‍ය මිනිස්සුන්ට වරප්‍රසාද දෙනවාද? කාගේ උවමනාවටද ක්‍රියාත්මක වෙන්නේ? ඒ නිසා දකුණේ සමාජය මේ විරෝධාකල්ප එක්ක අලුත් දේශපාලන ව්‍යාපාර මතු වෙමින් එනවා. ඒවා මර්දනය කරන්න නම් දකුණේ සමාජය ඇතුළේ ව්‍යාකූලත්වයක් හදලා දේශපාලන පරිසරය අවුල් කරන්න ඕනෑ. ඒ අවුල් කරන්න අවශ්‍ය යෝජනාව තමයි උතුරේ ගේන්නේ. ඒ නිසා මේක ෆෙඩරල් කරන්න, උතුරේ මිනිස්සුන්ට අයිතිවාසිකම් දෙන්න ගෙනාපු යෝජනාවක් නොවෙයි. මේ යෝජනාව දාලා බලාගෙන හිටියා කවුද මේකේ එල්ලෙන්නේ කියලා. මම නම් හිතුවේ මේ යෝජනාවේ එල්ලෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ කියලා. මම උදෙත් කිව්වා. මම හිතුවා වහාම කියයි කියලා මච්චිම නැත්නම් මරණය. දැන් සටනට වරෙල්ලා කියලා. හැබැයි වාසනාවට ජේ.වී.පී. එක,ඒක කිව්වේ නැහැ. නමුත් ජාතික හෙළ උරුමය ඒ යෝජනාව තමන්ගේ අතට ගත්තා. දැන් මේ දකුණේ සමාජය කුලප්පු කිරීමේ ක්‍රියා මාර්ග ඇති වෙමින් යනවා.

ඒ නිසා මේ යෝජනාවේ පැටලෙන හැම වෙලාවකම අපට සිද්ධ වෙන්නේ, නැවත වතාවක් මේ ආණ්ඩුවේ මර්දනයට යටත් වෙන්න. ඒ නිසා දකුණේ සමාජයේ මතු වන නායකයෝ සියල්ල මර්දනය කරන්න අවශ්‍ය පරිසරය තමයි මේ නිර්මාණය කරන්නේ. මේ යෝජනාව ඇතුළේ තිබෙන්නේ ඒක. ඒ නිසා මේකේ අහු වෙන හැමෝම මේ රට නැවත බෙදුම්වාදකයකට ගෙනියන්න අවශ්‍ය පරිසරය නිර්මාණය කරනවා කියන කාරණය තමයි අපට කියන්න තිබෙන්නේ. ඒ නිසා අද එය නිර්මාණය වීගෙන යනවා. මෙතුමා කිව්වා නගුනල් අත්අඩංගුවට ගත්තා කියලා. රාම්ලා අත්අඩංගුවට ගත්තා කියලා කිව්වා. අපි මතක් කරලා දෙන්න ඕනෑ ජිනීවාවල අපේ රටට විරුද්ධව මානව අයිතිවාසිකම් පිළිබඳ යෝජනාව සම්මත කරද්දී ඒකේ පළමුවැනි කාරණාව තමයි එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නායකයෝ ගණනාවක් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් අතුරුදන් කරලා දැම්මා කියන එක. ඒ ලියපු නම්වල තිබෙන නම් තමයි ඔය මතු වන නායකයෝ. අද දකුණේ තිබෙන ආණ්ඩුවට උවමනා වෙලා තිබෙනවා, ඒ නායකයෝ තවම ජීවත් වෙලා ඉන්නවා කියන කාරණය තහවුරු නොකර ඉන්න. ඒ නිසා ඒ නායකයෝ එක එකා උස්සනවා රට රට ගිහිල්ලා. දැන් හතර දෙනෙක් උස්සගෙන ගියා. එදා අපට කිව්වා සුදු වෑන් එකෙන් ඇවිල්ලා උස්සගෙන ගියා කියලා. අදත් වෑන් එකෙන් තමයි උස්සන් යන්නේ. ළමයි එක්ක රට කකා ඉන්න, බිරින්දෑවරුන් එක්ක ජීවත් වන නායකයෝ තමයි උස්සගෙන යන්නේ. මේ රටට, මේ ආණ්ඩු කියන්න ඕනෑ ඒ දෙමළ නායකයෝ කොහේද හැංගුවේ කියලා. ඔවුන්ගෙන් මොනවද ප්‍රශ්න කෙරුවේ? ඔවුන්ගෙන් මොනවාද හෙළිදරව් කර ගත්තේ? මේ රටේ ජාතික ආරක්ෂාව ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා, මේ අල්ල ගත්තු අයගෙන් කියලා මේ රටේ ජනතාවට හෙළිදරව් කරන්න ඕනෑ. හැබැයි ආණ්ඩුව ඒක කරන්නේ නැහැ. ආණ්ඩුවට උවමනා වෙලා තිබෙනවා, ජිනීවාවල මතු වුණු ප්‍රශ්න එහෙම්ම වහලා තියලා මේ රටේ පාලනය ඉස්සරහාට ගෙනියන්න. ඒ නිසා නායකයෝ අද එළියට ගන්නවා. ඒ නාකයෝ හරහා මතු වුණොත් ජාතික ආරක්ෂාවට තර්ජනයක් කියලා මේ රටට කියන්න ඕනෑ. ඒ නිසා අද එහෙම තත්ත්වයක් පැහැදිලි වෙන්නේ නැහැ.

ඒ නිසා මේ කුමන්ත්‍රණය තමයි අදියරෙන් අදියර ඉස්සරහාට එන්නේ. ඒ කුමන්ත්‍රණයේ පියවරක් විධියට තමයි මේ යෝජනාව මේ පළාත් සභාවට ආවේ. මොකද, ඉතාම පැහැදිලිව ලංකාවේ ප්‍රබල දේශපාලන පක්ෂ දෙකම කිව්වා, එහෙම කාරණාවක් සිද්ධ වෙන්නේ නැහැ කියලා. භාෂාව පදනම් කරගෙන වෙනම ආණ්ඩු බිහි වෙන්න තිබෙන ඉඩකඩට ඉඩ දෙන්නේ නැහැ කියලා දේශපාලන පක්ෂ දෙකම කිව්වා. එහෙම ආණ්ඩු දෙක කියනවා නම්, එහෙම තර්ජනයක් නැත්නම්, මේ රට ෆෙඩරල් වෙලා ඉවර නම් මේ ඇවිල්ලා තිබෙන පළාත් සභාවල තව තව බලය දීලා සදාකාලික සාමයක් ඇති කරන්න උවමනාවක් තිබෙනවා නම් මොකටද මේ යෝජනාව ගෙනැල්ලා නැවත වතාවක් මේ ප්‍රශ්නය මතු කරන්නේ? ඒ නිසා දකුණේ සමාජය, සාමකාමී සමාජය අවුල් කරන යෝජනාවක්. ඒ සමාජය කුලප්පු කරන යෝජනාවක්. මේ යෝජනාවේ අපි එකතු වෙලා ඉස්සරහාට ගියොත් නැවත වතාවක් අර කියන ජාතිවාදය මතු වෙනවා. අපි කියන්න ඕනෑ උතුරේ විග්නේෂ්වරන් බලයට පත් කළා වාගේම තමයි දකුණේ

[ ගරු මහේෂ් අල්මේදා]

සම්බන්දන්ව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකවරයා කරන එකත් කළේ, දෙමළ ඩයස් පෝරාව. ඒ නිසා අපට විපක්ෂ නායක වෙන්න බැහැ තමයි මන්ත්‍රී ආසන තිහ හතලිහක් තියාගෙන. මොකද, අපට ආණ්ඩුවේ සහයෝගය නැහැ. නමුත් සම්බන්දන්ට ආණ්ඩුවේ සහයෝගය තිබෙනවා. ඩයස් පෝරාවේ සහයෝගය තිබෙනවා. අධිරාජ්‍යවාදීන්ගේ සහායෝගය තිබෙනවා. අපි එහෙම අධිරාජ්‍යවාදීන්ට කත් අදින විපක්ෂයක් නොවෙයි. අපි මේ රටේ සැබෑ මහජනතාවගේ උවමනාව නියෝජනය කරන විපක්ෂයක්. ඒ නිසා අපි මේ රටේ ජනතාවට කියනවා, මේ යෝජනාවල පැටලෙන්න එපා කියලා. මේ ගේන ගිනි තැබීම්වල පැටලෙන්න එපා කියලා. දකුණ සාමකාමීව තිබුණොත් මේ අරගලය සාමකාමීව ගෙන ගියොත් තමයි මේ රට නිවැරැදි තැනට ගෙනිහිල්ලා මේ රටේ මිනිස්සුන්ට අවශ්‍ය කරන අයිතිවාසිකම් දිනා ගැනීමේ තත්ත්වය නිර්මාණය කර ගන්න පුළුවන්කම ලැබෙන්නේ. මේ යෝජනාව හරහා මේ ආණ්ඩුවට බලය තහවුරු කරගෙන යන්න පුළුවන්. මේ රටේ ජනතාව කැලි කඩන, ජාතීන් එකිනෙකා වෙන් කරලා තිබෙන ඒ වාගේම දකුණේ සමාජය අරගලයකට ගෙනිහිල්ලා මර්දනය ක්‍රියාත්මක කරලා නායකයෝ සියල්ල මර්දනය කරලා 88 – 89 වාගේම නැවත වතාවක් මේ රට මළ කඳන්, මළ මිනී ගොඩක් බවට පත් කරලා පාලනය ගෙනි යන්න උත්සාහයකට සහයෝගය පළ කරන යෝජනාවක් විධියට තමයි අපි මේ යෝජනාව දකින්නේ. ඒ නිසා මේ යෝජනාවට මම පෞද්ගලිකව තරයේම විරුද්ධයි කියන කාරණය කියමින්, මේ යෝජනාවට වේලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගෙන එන ලද යෝජනාව පිළිබඳව පක්ෂව සහ විපක්ෂව දෙපාර්ශවයේම උදවිය තමන්ගේ අදහස් විවිධාකාර අන්දමට පළ කරනු ලැබුවා. කොහොම වුණත් අවසාන වශයෙන් කථා කරපු අපේ සහෝදර මන්ත්‍රීතුමා මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ කථාව තුළ මේ සාකච්ඡාව සහ මේ යෝජනාව සම්බන්ධයෙන් වැදගත් කාරණා කිහිපයක් මතු වුණු බව මමත් පිළිගන්නවා. නිශාන්ත වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේ අවසානයේ බලාපොරොත්තු වෙන්නේ මොකක්ද කියන එක පිළිබඳව යෝජනාවේ අවසාන ඉල්ලීම දිහා බැලුවාම පැහැදිලි වෙනවා. මේ යෝජනාවේ අවසානයේ සඳහන් වෙන්නේ අතිගරු ජනාධිපතිතුමාගේත්, අගමැතිතුමාගේත්, උතුරු පළාත් ආණ්ඩුකාරතුමාගේත් වහා අවධානය යොමු කළ යුතු බවත්. ඒ සඳහා ව්‍යවස්ථාමය හා නෛතික රාමුව තුළින් මැදිහත් වී මෙම යෝජනාවේ ප්‍රතික්ෂේප කළ යුතු බව බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටී. මේ යෝජනාව ප්‍රතික්ෂේප කිරීම කියන කාරණය පදනම් වෙන්නේ ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් එක්ක. නෛතික රාමුවත් එක්ක. එතකොට මේ කාරණය සම්බන්ධයෙන් උතුරේ මහා ඇමැති විග්නේෂ්වරන් මැතිතුමා ඒ ගෙනාපු යෝජනාව මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ කථාවේත්, සාලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවේත් කාරණා දෙකක් කියැවුණා. සාලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා මහින්ද රාජපක්ෂ මහත්තයා උතුරු පළාත් සභාව පිහිටවපු නිසා තමයි විග්නේෂ්වරන් එහේ මහ ඇමැති වෙන්නේ කියලා. එහෙම නම් විග්නේෂ්වරන් මහ ඇමැති වුණු නිසා තමයි මේ යෝජනාව එන්නේ කියන එකත් සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා පිළිගන්න ඕනෑ කාරණයක්. ඒ කාරණය නොකළා නම් අද මෙහෙම දෙයක් වෙන්නේ නැහැ. ඒ තිබුණු ආකාරයට තිබුණා නම්. එතකොට උතුරේ ඡන්ද ටික දිහා බලාගෙන දකුණේ නායකයෝ යම් යම් අවස්ථාවල ගත්තු තීන්දු තීරණවල තිබෙන වැරැදි අඩුපාඩුකම් නිසා ඔබතුමා කියන විධියට දකුණ යම් යම් අවස්ථාවල ගිනියම් වෙන්න පටන් ගත්තා. 2005 අවුරුද්දේ මහින්ද රාජපක්ෂ මහත්තයා එමිල් කාන්තන් හරහා කොටි සංවිධානයට කෝටි ගණනක මුදල් දුන්නා කියලා කිව්වේ වෙන කවුරුවත් නොවෙයි, ඒ ආණ්ඩුව නියෝජනය කරපු ටිරාන් අලස් මන්ත්‍රීතුමා තමයි ප්‍රසිද්ධියේ පාර්ලිමේන්තුවේදීත් ඉන් පිටතදීත් ඒ කාරණය ගැන කිව්වේ. එහෙම නම් හැම අවස්ථාවකදීම උතුරේ කොටින්ට ඒක වැඩෙන්න පැවැත්ම හදා ගන්නට යම් යම් ආධාර උපකාර දීමට දකුණේ දේශප්‍රේමීන් යැයි කියා ගන්නා උදවිය පවා උදව් කරලා තිබෙනවා කියන කාරණය දේශපාලන ඉතිහාසය තුළ අපට දක්නට ලැබෙන කාරණයක්.

දැන් මේ කාරණය සම්බන්ධයෙන් යෝජනාව ගෙන එන අවස්ථාවේ ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා, මේක අධිකරණයක් ඉදිරියේ සාකච්ඡාවට භාජනය වෙලා තිබෙන නිසා කථා කරන්න බැහැයි කියලා. මේ කාරණය සම්බන්ධයෙන් ලංකාවේ උපරිමාධිකරණය පසුගිය දවසක විග්නේෂ්වරන්

මහ ඇමැතිතුමා ඇතුළු පිරිසට නොතිසි නිකුත් කළා ඉදිරි දිනක උපරිමාධිකරණයේ පෙනී ඉන්නය කියලා. මෙන්න මේ නෛතික රාමුව ඇතුළේ මේ ක්‍රියා මාර්ගය සම්බන්ධයෙන්, මේ යෝජනාව සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක විය යුතු තත්ත්වයක් තිබෙනවාද නැද්ද කියන සාකච්ඡාව කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් දකුණේ උදවිය මේ කාරණය පසුගිය මැයි දිනය ඉලක්ක කර ගනිමින් දකුණේ යම් යම් දේශපාලන පක්ෂවල උදවිය මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කියපු විධියට මේක දේශපාලන වාසියකට හරවා ගත්තා. ඒ දේශපාලන වාසියට හරවා ගැනීමට කාට හරි යෝජනා කරන්න පුළුවන් මේ සම්බන්ධතාවය ගොඩ නැඟෙන උදවිය උතුරේ මහ ඇමැතිතුමා අතරේ ඉන්නවා කියන එක. ඒ උතුරු මහ ඇමැතිවරයාගේ ඥාතිවරයා දකුණේ ජාතිවාදය අවුස්සන කල්ලියේ ප්‍රධාන භූමිකාවක්ව ඉන්නවා. ඒ භූමිකාව හරහා එන යෝජනාවක්ද කියන එකත් අද මේ සාකච්ඡාව ඇතුළේ අපටත්, ජනතාවටත් සැකයක් තිබෙනවා. දැන් පසුගිය කාල වකවානුව පුරා - ඔබතුමාගේ නොවෙයි. ප අකුරෙන් පටන් අරන් අගට මැද ඉතුරු වෙලා ගිය එක්කෙනාගේ. මේ කාරණා සම්බන්ධයෙන් දැන් පසුගිය 2015 ජනවාරි 08 වැනිදා මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ජනාධිපති ධූරය අවසන් වනකොටත් උතුරේ හිටපු මහ ඇමැතිවරයා විග්නේෂ්වරන් මැතිතුමා. එතකොට 2015 ජනවාරි 08 වැනිදා වනකල් උතුරේ මහ ඇමැතිවරයාගේ භූමිකාවත්, 2015 ජනවාරි 08 වැනිදායින් පස්සේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ජනාධිපති ධූරය මාරු වීමත් එක්ක විග්නේෂ්වරන්ගේ ක්‍රියාදාමයත් කියන දෙකේ කාරණා දෙපැත්තට ගෙනැල්ලා සංසන්දනය කිරීමේදී මහ ඇමැතිවරයාගේ හැසිරීම වෙනස්වීම පිළිබඳව කරුණු වටහා ගන්න එක අමාරුකමක් නැහැ. එහෙම නම් මේවා දකුණේ ජනතාවට හිතෙනවා නම්, දකුණේ සිංහල ජනතාව කල්පනා කරනවා නම් මේ උතුරේ මහ ඇමැතිවරයා ක්‍රියාත්මක වෙන්නේ දකුණේ යම් යම් දේශපාලන කල්ලි කණ්ඩායම්වල ඕනෑ එපාකම් ඉෂ්ට කිරීම සඳහාත් කියලා. ඒකේ වැරැද්දක් පේන්නත් නැහැ. 2015 ජනවාරි 08 යි, 2015 ජනවාරි 08 න් පස්සෙයි මහ ඇමැතිවරයාගේ ක්‍රියාදාමයන් දිහා හොඳින් බැලීමේදී ඒ කාරණය අපට පැහැදිලි වෙනවා.

දැන් මේ යෝජනාව ඇතුළේ සංහිඳයාව කියන කාරණය පිළිබඳව තිබෙනවා. උතුරේ විද්‍යා දැරියව දූෂණය කරලා මරණ කොට ලංකාවේ ජනාධිපතිවරයාට පුළුවන්කම තිබෙනවා ද්‍රවිඩ කියන පදනමින් තොරව, ද්‍රවිඩයෙක් කියන අරමුණෙන් තොරව දරුවෙක් කියන පදනමෙන් අරගෙන, මේක අපරාධයක් කියන පදනමෙන් අරගෙන ලංකාවේ ජනාධිපතිවරයා විද්‍යා දැරියගේ මරණය සම්බන්ධයෙන් ඒ ගෙදරට ගිහිල්ලා ඒ දෙමව්පියොත් එක්ක සාකච්ඡා කරනවා. නීතිය ඉදිරියට අපරාධකාරයෝ ගේන්න කටයුතු කරන්න ඕනෑ වටපිටාව සකස් කරලා දෙනවා. දකුණේ සේයා සඳෙව්මි දැරිය දූෂණය කරලා මරණ කොට ලංකාවේ ජනාධිපතිවරයා එතැනට ගිහිල්ලා ඒකට අවශ්‍ය වටපිටාව නිර්මාණය කරපු උදවියව අත්අඩංගුවට ගන්න, සේයා සඳෙව්මි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න දකුණේ ජනාධිපතිවරයා කටයුතු කරනවා. එහෙම නම් උතුරටත්, දකුණටත් එක හා සමානවම සිංහලද, ද්‍රවිඩද, මුස්ලිම්ද කියන පදනමින් තොරව තමන්ගේ ජනාධිපති ධූරයේ වගකීම ඉෂ්ට කරන අවස්ථාවක් මේක. අගමැති ධූරයේ වගකීම ඉෂ්ට කරන අවස්ථාවක් මේක. ඒ ධූරයන්හී වගකීම්, ජන පදනම, භාෂාව මත පදනම් වෙන්නේ නැතුව, පුද්ගලයෝ මත පදනම් වෙන්නේ නැතුව ශ්‍රී ලාංකික කියන ජාතිය මත පදනම් වෙලා කටයුතු කරන ආණ්ඩුවක් හැදිලා තිබෙන වෙලාවේ මේ දේවල් මේ ආකාරයට ක්‍රියාත්මක වීම තුළ යටි උසිගැන්වීම් සහ දකුණේ දේශපාලන කණ්ඩායම්වල ශක්තිය ලැබිලා තිබෙනවා කියන එක සහ ඕනෑ එපාකම් තිබෙනවා කියන එක තමුන්නාන්සේලා අපට පිළිගන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඒ වාගේම විග්නේෂ්වරන් මහත්තයා ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු විනිශ්චයකාරවරයෙක්. එතුමා නීතිය පිළිබඳව ඔබතුමන්ලාට වඩා අපට වඩා හොඳින්ම දන්න තැනැත්තෙක්. එතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙක් විධියට කටයුතු කරපු කෙනෙක්. එතකොට විග්නේෂ්වරන් මහත්තයා හොඳාකාරවම දන්නවා මේ පළාත් සභාවක් තුළ මේ ආකාරයේ යෝජනාවක් ගෙනැල්ලා 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මත එහෙමත් නැත්නම් පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මේක කවදාවත් සාර්ථක කර ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාවේ 4 වැනි උපලේඛනය යටතේ දිවුරුම් දීලා තමයි අපි කවුරුත් මේ තැනට එන්නේ. මේ රටේ භෞමික අඛණ්ඩතාවය, ස්වෛරීත්වය ආරක්ෂා කරන්න පොරොන්දු වෙලා මේ 4 වැනි උපලේඛනයේ දිවුරුම අපි ලබා දෙනවා. ඒ අනුව 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 ඒ ට අනුව ජනාධිපතිවරයාට පුළුවන්කම තිබෙනවා,

[ ගරු කේ.ඩී. අරුණ දීපාල් ]

ඕනෑම අවස්ථාවක මේ සීමාව පන්නලා යනවා නම්, මේ සීමාවෙන් ඔබ්බට ගිහිල්ලා පරිපාලනමය වශයෙන් සහ වෙනත් ආකාරයට මේක අවුලක් බවට පත් කරන්න හදනවා නම් 154 ඒ ව්‍යවස්ථාවේ විධාන අනුව, ක්‍රියා කිරීම පැහැර හැරීම යටතේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ලබා දුන්න පළාත් සභාව නැවත පවරා ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ වාගේම 154 (ඕ) යටතේ ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුවේ එකඟතාවය මත මේ බලය පවරා ගැනීමේ හැකියාව තිබෙනවා. මේක මේ ඔබතුමන්ලා අපි කථා කරන, අපි දන්න නෛතික සීමාවෙන් ඔබ්බට ගිහිල්ලා විග්නේෂ්වරන් මහත්තයා මේ කාරණය දන්නවා.

හැබැයි මේක ගේන්නේ එහෙම දන්න කෙනෙක්. එහෙම නීතිය ගැන අවබෝධයක් තිබෙන කෙනෙක්. මේ යෝජනාවක් විතරක්. ඵලයක් නැති, හරයක් නැති, ප්‍රතිඵලයක් නැති, අනාගතයක් නැති යෝජනාවක්. උතුරේ ගේන්නේම දකුණේ ඕනෑකමට කියන එකයි ඔය කියන දකුණේ නායකයින්ගේ ජාතිවාදය අවුස්සලා - මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා හොඳට ඒ කාරණය කිව්වා. දකුණේ නායකයන්ට ඕනෑකම තිබෙන්නේ - මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කථාව හැරෙව්වා ජාතිත්‍යන්තර ඕනෑ එපාකම් පැත්තට. ජාත්‍යන්තර ඕනෑ එපාකම් පැත්තට නොවෙයි දකුණේ ආණ්ඩුව අවුල් කරන්න ඕනෑකම තිබෙන්නේ දකුණේ කල්ලිවාදී දේශපාලන පක්ෂවලට. බලය ගිලිහුණාට පස්සේ තමන්ගේ පැවැත්ම ආරක්ෂා කර ගන්න ජන පවුරක් හදාගෙන 90% ක් තමන්ගේ පැත්තට එනකොට 10% ක් අනෙක් පැත්තට කඩාගෙන යන්න බලාගෙන ඉන්න කොට, 10% තමන්ගේ පැත්තට ඇවිල්ලා 90% අනෙක් පැත්තට යනවා දකින කොට තමයි නයා මැරුණු අහිකුණ්ඨකයා වාගේ අද මේ ඉස්සරහාට වෙලා ඉන්නේ. එහෙම නැත්නම් පසුගිය කාලවකවානුවල හිටියේ මීට වඩා බොහොම ගාම්භීර විධියට. අද ජේනවා නයා මැරුණු අහිකුණ්ඨකයා වාගේ. නයා මැරුණු අහිකුණ්ඨකයා වගේ. දැන් වැඩේ කරගෙන යන්න අලුත් නයෙක් අල්ල ගන්න ඕනෑ. මෙන්න මේ තත්ත්වය නිසා තමයි දකුණේ කල්ලිවාදී දේශපාලන කණ්ඩායම් මේ තත්ත්වය උතුරේ ගිනි තියලා දකුණු අවුළුවන්න උත්සාහ කරන උත්සාහයටයි අහු වෙන්න හොඳ නැත්තේ කියලා මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා නිවැරැදිව කිව්වා.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විග්නේෂ්වරන් මැතිතුමා තව දන්න කාරණයක් තිබෙනවා. නීතිය තුළ මේක මෙහෙම වාගේම, නීතිය තුළදී මේකට ඉඩකඩක් හසරක් නැතුව වාගේම විග්නේෂ්වරන් මහත්මයා දන්නවා, ප්‍රභාකරන් මේ යෝජනාව ගෙනැල්ලා, උතුරට වෙනම ඊළමක් ඉල්ලලා, නැගෙනහිරට වෙනමම ඊළමක් ඉල්ලලා ප්‍රභාකරන් නැවතුනේ අඩි 08 ක් යට බව. විග්නේෂ්වරන් මහත්තයා දන්නවා මේ යෝජනාවේ අවසාන ප්‍රතිඵලය ඉදිරියට ගියොත් එහෙම ඒ අඩි 08 යට විග්නේෂ්වරන් මහත්මයාටත් යන්න වෙන විත්තිය. මේ විග්නේෂ්වරන් මහත්තයා නොදැන නොවෙයි මේ යෝජනාව ගෙන එන්නේ. ප්‍රභාකරන්ට වුණු දේට වඩා දෙයක් සිංහල ජනතාව දේශපාලන වශයෙන්, පක්ෂ වශයෙන් බෙදිලා වෙන් වෙලා හිටියාට රට ජාතිය කියන තැනදී අපි ඔක්කෝම එක තැනකට එකතු වෙනවා. ඒ එකතු වීම ඇතුළේ ප්‍රභාරකන් අඩි 08 ක් යට යනකොට විග්නේෂ්වරන් මහත්තයාත් ඒ අඩි 08 යට යනවා කියන කාරණය දැනුවත්ව දකුණේ ඕනෑකමට තමයි මේ යෝජනාව ගෙන එන්නේ. එහෙම නැත්නම් මේ මොහොතේ මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ - නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව අද මේ සභාවේ සම්මත වෙයි. සම්මත වුණාට පස්සේ මේ සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මකභාවය ඇති කරන්න ඕනෑ මේ රටේ ජනාධිපතිවරයා විසින්. අගමැතිවරයා විසින් නොවෙයි. ජනාධිපතිවරයා තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව රටේ ආරක්ෂාව භාරව ඉන්න, රටේ ඒකීයභාවය ආරක්ෂා කරන්න ඉන්න තැනැත්තා. ඒකීයභාවය සහ රටේ ආරක්ෂාව, ආරක්ෂා කරන්න ඉන්න තැනැත්තා විසින් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කරලා උතුරු පළාත් සභාව මේ ගත්තු තීරණය සම්බන්ධයෙන්, යෝජනාව සම්බන්ධයෙන්, දිවුරුමට පිටින් ගිහිල්ලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනවලට පිටින් ගිහිල්ලා රට දෙකඩ කරන්න ඕනෑ කියලා ගත්තු යෝජනාව සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් වහාම උතුර පළාත් සභාව සම්බන්ධයෙන් තීරණයක් ගන්න ඕනෑ තත්ත්වය මේ මොහොතේ පැන නැඟිලා තිබෙනවා.

ඒ නිසා ඉතිහාසයේ සිදු වුණු දේ තමයි නැවත, නැවත වර්තමානයේ සිදු වෙමින් තිබෙන්නේ. ඒක කියමනක්. නැවත වර්තමානයේ අලුතින් දේවල් සිද්ධ වෙන්නේ නැහැ. ඉතිහාසයේ සිදු වුණු දෙය නැවත නැවත අලුතෙන් සිදු වෙනවා හැරුණු කොට වර්තමානයේ අලුතින් යමක් සිදු

නොවෙයි කියලා තිබෙන්නේ. වර්ධරාජා පෙරුමාල් මහත්තයා උතුරු මහ ඇමැති වෙලා ඉන්න වෙලාවේදී මේ හා සම්බන්ධව, මීට ඔබ්බට ගිහිල්ලා ඊළාම් කොඩිය ඔසවලා තමයි ඒ අවස්ථාවේ තමන්ගේ මේ තත්ත්වය ප්‍රකාශයට පත් කරන්න යෙදුණේ. ඒ නිසා පාලකයා කවුද කියන එක අනුව නොවෙයි. නායකයා කවුද කියන එක අනුව නොවෙයි. උතුරේ මිනිස්සුන්ගේ සිතැඟිවලට නොවෙයි මේ දේශපාලඥයෝ වැඩ කරන්නේ. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා උතුරේ මිනිස්සුන්ගේ ඕනෑ එපාකම්වලට අදාළව ගෙනාපු යෝජනාවක් නොවෙයි මේක කියලා. මම පුන පුනා කියන කාරණය තමයි ඒක උතුරේ ද්‍රවිඩ ජනතාවට අදාළ නැහැ. ද්‍රවිඩ ජනතාවට බලපාන තත්ත්වයකුත් නොවෙයි. ද්‍රවිඩ ජනතාවගේ භාෂා ප්‍රශ්නයත් නොවෙයි. මේක දකුණේ ඕනෑ එපාකමට ගෙනාපු යෝජනාවක්. මේක අද අපි සාකච්ඡාවට භාජනය නොකර තිබුණා නම්, මේ කාරණය මේ මැයි 01 වැනිදායින් පස්සේ එළැඹෙන සතිය ඇතුළත මේක වුණාද නැද්ද කියන ගාණට හොයා ගන්න නැතුව යනවා. මේක මැයි 01 වැනිදා ඉලක්ක කරලා ගහපු ගැටයක් විතරයි. ඒ ගැටයේ ප්‍රතිඵලයකුත් කිරුළපනට ගේන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ නිසා මම මීට වැඩිය යමක් කියන්නේ නැහැ. මම කල්පනා කරන්නේ මේක අවසාන වශයෙන් සිංහල, මුස්ලිම්, ද්‍රවිඩ කියන භේද බින්න වුණු ජාතියක් වෙනුවට ඉන්දියාවේ විධියට ශ්‍රී ලාංකික කියන ජාතියක් විධියට, සිංහල, මුස්ලිම්, ද්‍රවිඩ කියලා බෙදෙන්නේ නැතුව ශ්‍රී ලාංකික කියන පදනමින් හිතන්න පුළුවන් රටක් හදන්නට, අගමැතිතුමාගේ වෙහෙසට, ජනාධිපතිතුමාගේ වෙහෙසට මේ යහපාලන ආණ්ඩුවේ වෙනසට අත්වැලක් වෙලා මේ කටයුතු සාර්ථක කර ගැනීමට හැකියාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. Sirikamal Filician de Silva M.P.C] left the Chair and Hon. Lalith Ellawala M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ යෝජනාව සඳහා අදහස් දැක්වීමට තවත් ගරු මන්ත්‍රීවරු 13 දෙනෙක් ඉන්නවා. ඒ නිසා කථාවල් හැකිතරම් කෙටි කරනවා නම් හොඳයි. මීළඟට ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ යෝජනාව මේ සභාවට ඉදිරිපත් කරපු නිශාන්ත වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාටත්, ඔබතුමා මට අවස්ථාව ලබා දීම ගැනත් ප්‍රථමයෙන් ස්තුතිවන්ත වෙනවා. අපි මේ යෝජනාව ගෙනාවේ බස්නාහිර පළාත් සභාව තුළට උතුර නියෝජනය කරන විග්නේෂ්වරන් මහ ඇමැතිතුමාගේ පළාත් සභාව තුළ මේ යෝජනාව ගෙනැල්ලා සම්මත කරලා, මේක යෝජනාවක් විධියට පිළි අරගෙන තිබෙන මොහොතක. නමුත් මෙතැන කථා කරපු සමහර ගරු මන්ත්‍රීවරු මේක මේ බස්නාහිර පළාත් සභාවට ගේන්න ඕනෑ යෝජනාවක් නොවෙයි විධියටත් කථා කළා. නමුත් අපි සභාවක් නියෝජනය කරන මන්ත්‍රීවරු විධියට ආත්ම ගෞරවත්වයක් ඇතුව සමස්තයක් ලෙස පළාත් සභාවල් තුළ යම්කිසි වැරදි තීන්දු තීරණ ගන්නවා නම්, ඒ තීන්දු තීරණ මොනවාද කියලා ජනතාව දැනුවත් කිරීම, ඒවාට විරුද්ධත්වය ප්‍රකාශ කිරීම මහජන නියෝජිතයින් වශයෙන් අපට අයිතියක් තිබෙනවා. ඒ නිසයි නිශාන්ත වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව මේ පළාත් සභාවට ඉදිරිපත් කළේ. අපි දන්නවා, අපේ රටේ අවුරුදු ගණනාවක් තිබුණු ප්‍රශ්න අපට අමතක වෙලා නැහැ. අපි දන්නවා අපි එවකට ජාතිවාදය අවුස්සලා, නොයෙකුත් නොයෙකුත් ක්‍රමවලින් අපි ජාතීන් අතර භේද ඇති කෙරුවා. අර 83 කළු ජූලියක් ගැන කථා කළා. ඒ වාගේම ඊට කලින් වුණු දේවල් ගැන කථා කෙරුවා. සාකච්ඡා කෙරුවා. මෙවැනි දේවල්වලින් තමයි ජාතීන් අතර බෙදීම් ඇති වුණේ.

ඒ වාගේම තමයි ජාත්‍යන්තර වශයෙන් අපට නොයෙකුත් බලපෑම් ඇති වුණේ එවැනි දේවල් තුළින්. විශේෂයෙන් 83 ඇති වූ දේවල්වලින්. ඊට පස්සේ තමයි අපි මේ රට ජාතීන් වශයෙන් බෙදිලා, ආගම් වශයෙන් බෙදිලා, ඒ වාගේම භාෂාවල් වශයෙන් බෙදිලා, කුල භේද වශයෙන් බෙදිලා මේ රට කෑලි, කෑලිවලට කැඩී යන අවස්ථාවක් ආවා. ඒ අවස්ථාවේදී ප්‍රභාකරන් නමැති ත්‍රස්තවාදියා

[ ගරු ජානක සූරියබණ්ඩාර ]

නායකත්වය දෙමින් පිහිටුවා ගත්ත ඒ සංවිධානය, මේ ශ්‍රී ලංකාව තුළ විතරක් නොවෙයි. ජාත්‍යන්තරයේ පවා ඉතාමත් භයානක ත්‍රස්තවාදී ව්‍යාපාරයක් බවට පත් වුණා. ඉන්දියාවේ රජීව් ගාන්ධි අගමැතිතුමා ඝාතනය කෙරුවා. අපේ රටේ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා, ඒ වාගේම අපේ රටේ හිටපු නායකයන්වන ලලිත් ඇතුලත්මුදලි, ගාමිණී දිසානායක, ඒ වාගේම හමුදාවේ නායකයන්, ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන්, සාමාන්‍ය වැසියන් දහස් ගණනක් ඝාතනය කෙරුවා. මේ අවස්ථාව තුළ රට පාලනය කළ හැම නායකයෙක්ම උත්සාහ කෙරුවා සිංහල, මුස්ලිම්, දෙමළ භේදයක් නැතිව මේ යුද්ධය මැඩ පවත්වන්න.

මට මතකයි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මැතිනිය අපේ ජෙනරාල් රත්වත්තේ මහත්මයාව මුල් කරගෙන ආරක්ෂක ඇමති විධියට මේ යුද්ධය ඉවර කරගෙන ගියා. එයට ජාත්‍යන්තර වශයෙන් බලපාලා ඉන්දියාවෙන් අපට පරිප්පු, හාල්, සීනි උඩින් දාන්න ගත්තා. ඒ වෙලාවේ යුද්ධය නතර කෙරුවා. ඒ යුද්ධය නතර කෙරුවාට පස්සේ 2001 දී එක්සත් ජාතික පක්ෂ රජය රට පාලනය කරන්න ගත්තා. ඒ කාලය තුළ එල්.ටී.ටී.ඊ. සංවිධානයත් එක්ක සංහිඳියාවෙන් වැඩ කරන්න ඕනෑය කියලා මේ වාගේ ගිවිසුම් ගහගෙන ඒ අයට පහසුකම් දීගෙන, ඉන්දියන් හමුදාව ගෙනත් දාගෙන - ඉන්දියන් හමුදාව ගෙනාවේ නැහැ. ඊට ඉස්සෙල්ලා ගෙනාවේ. ගෙනල්ලා නොයෙකුත් ගනුදෙනු කරලා සංහිඳියාව ඇති කරන්න බැලුවා. එල්.ටී.ටී.ඊ. කාරයන්ව යහමගට ගෙන්න පුළුවන්ද කියලා බැලුවා. ඒ කාල සීමාව තුළ ඒ අය කෙරුවේ ඒ අයගේ බලය තහවුරු කරගත්ත එක විතරයි. ඒ අය ඒ ප්‍රදේශ තමන්ගේ පරිපාලන දිස්ත්‍රික්ක බවට පත් කර ගත්තා. තමන් නඩු අහන්න ගත්තා. ඒ ප්‍රදේශයට යනවා නම් බලපත්‍රයක් ඇතිව යන්න ඕනෑ. අපි මඩු වන්දනාවේ යනවා නම් අපේ තිබෙන බඩු මුට්ටු ඔක්කොම චෙක් කරනවා. අපට ඕනෑ විධියට ගිහිල්ලා එන්න බැහැ. ඒ වාගේ තත්ත්වයක් ඇති වුණා. ඒ ඇතිවීම තුළින් තමයි 2005 අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා රට භාර ගත්තේ. එතුමා රට භාරගන්න කොට මේ රට ගිනි අරගෙන තිබුණේ. ජාත්‍යන්තර වශයෙන් නොයෙකුත් ප්‍රශ්න ඇති වෙමින් තිබුණා. ජාත්‍යන්තර වශයෙන් එල්.ටී.ටී.ඊ. එක පිළි අරගෙන තිබුණා. එතුමාට මේ යුද්ධය කරගෙන යන කොට ජාත්‍යන්තර වශයෙන් අර වාගේ බලපෑම් ආවා. චන්ද්‍රිකා මැඩම් කාලයේ වාගේ. නමුත් එක එක්කෙනාගේ දේශපාලන න්‍යායවල් තිබෙනවා. එක එක්කෙනා දේශපාලනය කරන විධි තිබෙනවා. එක එක්කෙනා රට පාලනය කරන ආකාරයන් තිබෙනවා. ඒ විධියට ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා කිසි කෙනෙක් කියන දෙයක් ගණන් ගත්තේ නැහැ. එතුමාට උවමනා කරලා තිබුණේ මේ යුද්ධය ඉවර කරන්න විතරයි. අපට සහයෝගය දෙන රටවල් වලින් අපි උදව් අරගෙන ඒ යුද්ධය ඉවර කළා. අපේ ජනතාව දහස් ගණනක් පන්සල්වල, පල්ලිවල, කෝවිල්වල වෙඩි තියලා මරලා - අපේ බෞද්ධ සිද්ධස්ථානයක් වන අනුරාධපුරයේ ශ්‍රී මහ බෝධිය ළඟ පවා වෙඩි තියලා මරපු ඒ භයානක ත්‍රස්තවාදය මේ රටින් තුරන් කරලා දැම්මා. හැබැයි, භයානක ත්‍රස්තවාදය රටින් තුරන් කෙරුවාට ජාත්‍යන්තර වශයෙන් අපි පසුබෑමකට ලක් වෙලා තිබුණා. අපි නොයෙකුත් නොයකුත් වැරැදි වැඩ කරලා තමයි මේ යුද්ධය ඉවර කෙරුවේ කියලා. නමුත් අපි අනිවාර්යයෙන් පිළිගන්න ඕනෑ. මොන ක්‍රමයකින් හරි අපි දුක් වින්ද, අපේ දරුවෙකුට, අපට පාරේ බැහැලා යන්න බැරි තත්ත්වයකට තිබුණු මේ රට මේ තත්ත්වයට ගෙනාවේ එතුමයි කියන එක අපි පිළිගන්න ඕනෑ. ඒ යුද්ධය ඉවර කරපු එක පැත්තෙන්. නමුත් සංහිඳියාව, සහජීවනය, අප අතර තිබුණු අවිශ්වාසය නැති කරගෙන හිටියේ නැහැ අපි. අපි ඒවා ඔක්කොම එහෙන්මම තියාගෙන තිබෙද්දී තමයි අපේ ආණ්ඩුවට, ගරු ජනාධිපතිතුමාට ගෙදර යන්න සිද්ධ වුණේ. ඊට පස්සේ අපේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු ලේකම්තුමා ඇවිල්ලා එතුමා රටේ ජනාධිපතිතුමා වුණා. එතුමා ජනාධිපතිතුමා වුණාට පස්සේ එතුමා කල්පනා කෙරුවා, මේ යුද්ධය ඉවර කෙරුවා නම්, මම රටට සාමය ගේන්න ඕනෑ. මම රටේ සංහිඳියාව ඇති කරන්න ඕනෑ. මම ජාතීන් අතර භේද ඇති කරන්න හොඳ නැහැ. ජාත්‍යන්තරය පිළිගන්න විධියට අපේ රට නිවැරැදි කරන්න ඕනෑ. අපි ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක් වෙන්න ඕනෑ.

ඒ නිසා තමයි එතුමා සංහිඳියාව, සහජීවනයට යම් යම් ආයතන ඇති කරලා දෙපැත්තේ තිබුණු මතභේද නැති කරන්න, තිබුණු ප්‍රශ්න නැති කරන්න. මේ ජාතිය මෙහෙමයි, මේ ජාතිය මෙහෙමයි කියලා ජාති භේද නැතිව, ආගම් කුල භේද නැතිව එකම ශ්‍රී ලංකාවක් තුළ ජීවත් වෙන්න පුළුවන් වතාවරණයක් හදාගෙන යන්නේ. මේ යන එක තමයි සහජීවනය කියන්නේ. මේ සහජීවනයට බාධාවක් තමයි විග්නේෂ්වරන් ඉදිරිපත් කරපු මේ යෝජනාව. අපි එක භූමියක් තුළ, අපි එක අම්මාගේ දරුවන් වාගේ සිංහල,

[ගරු ජානක සූරියබණ්ඩාර ]

මුස්ලිම්, දෙමළ, මැලේ මොන ජාතිය හරි කමක් නැහැ. එකට ජීවත් වෙන්න ඕනෑ. අපට කිසි ප්‍රශ්නයක් නැහැ. අපි යුද්ධයෙන් බේරලා දුන්නා. දැන් සාමය තිබෙනවා. දැන් සහජීවනය ඇති කරගෙන යනවා. රටේ සංහිඳියාව තිබෙනවා. අපි ඔක්කොම කථා කරනවා. අපි යාපනයේ යනවා. යාපනේ මිනිස්සු මෙහෙට එනවා. අපට කිසි ප්‍රශ්නයක් නැහැ. මේ ප්‍රශ්නය තිබෙන්නේ කාටද? මේ ප්‍රශ්නය තිබෙන්නේ ප්‍රභාකරන්ගේ නැට්ට අල්ලගෙන ඉන්න ජාතිවාදීන්ට. මම හිතන්නේ විග්නේෂ්වරන් කියන්නේ ජාතිවාදියෙක් තමයි. ඒ නිසා අපේ මේ සභාවේ විරෝධය තිබෙන්නේ ජාතියටවත් නොවෙයි. පක්ෂයටවත් නොවෙයි. පක්ෂ පාට බෙදිලා නැහැ. එහෙමනම් එදා අපේ ජනාධිපතිතුමා යුද්ධ කරන කොට සමහර අය කිව්වා, කොහෙද යනවා කියලා කිව්වාම යන්නේ වෙන කොහෙද කියලා. බාල්දු කෙරුවා. යුද්ධය කරන්න දුන්නේ නැහැ. කඩාකප්පල් වැඩ කෙරුවා. නමුත් අපි එහෙම කරන්නේ නැහැ. මේක හරි. මේ යන ක්‍රමය අපි පිළිගන්නවා. මේ රටේ සහජීවනයෙන් අපි ජීවත් වෙන්න ඕනෑ. අපි වෙන් වෙන්න හොඳ නැහැ. මම මේ අවස්ථාවේදී අපේ පළාත් සභාව තුළින් ඒ ගෙනාපු යෝජනාව ස්ථිර කරන ගමන්ම මේක මේ විධියට ගියොත් අර කිව්වා වාගේ දකුණේ ගැටුම් ඇති වෙනවා. මේක කුමන්ත්‍රණයක්ද කියන්නත් බැහැ. අර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ. අපේ නීතිඥ මහත්මයා. මේ කුමන්ත්‍රණයක්ද කියන්නත් බැහැ. අපේ බලය හීන කරන්න කරපු දෙයක්ද කියන්නත් බැහැ. මේ ප්‍රකාශය. ඒ නිසා අපි මේ ප්‍රකාශය තරයේ හෙලා දකින අතරම එවැනි දෙයක් අපේ ජීවිතේ තිබෙන තාක් කල් සහ අපේ ඉදිරි පරම්පරාව ජීවත් වෙලා ඉන්න තාක් කල් මේ රටේ පසුගිය වකවානුවේ වුණු ඒ බේදවාචකය, ඒ මිනීමරු ත්‍රස්තවාදය, එහෙම නැත්නම් ලේ වැගිරීම්, රට විනාශ කරපු ඒවා නැවත නොවේවා කියා ප්‍රාර්ථනා කරමින් මේ යෝජනාවට මම එකඟත්වය පළ කරනවා. බොහොම ස්තූතියි.

**ගරු ලෙනාඩ් කාරුණරත්න**
Hon. Leonard Karunaratne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ අවස්ථාවේදී නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවමින් ගෙනෙන ලද මේ යෝජනාවට වචන කීපයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාවේ යෝජක වශයෙන් කටයුතු කරන නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට මා ප්‍රථමයෙන් සිහිපත් කර සිටිනවා, මීට මාස කිහිපයක පටන් ඔබතුමාගේ අදහස, ඔබතුමාගේ සංකල්ප මේ සභාව තුළ ක්‍රියාත්මක කරනවාට බරපතළ ලෙස විරුද්ධ වුණු, ඒ සඳහා බාධා කළ කණ්ඩායම අද මේ යෝජනාව ඉදිරිපත් කරන කොට උණුසුම් ප්‍රතිචාරයක් දක්වමින් එය පිළිගත් ආකාරය පිළිබඳව මම හිතන්නේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාම ඒ පිළිබඳව නැවත වතාවක් සිහිපත් කරනවා නම් හොඳයි කියලා මම විශ්වාස කරනවා.

මේ අවස්ථාවේදී අපි දන්නවා, ඒ උතුරු පළාත් සභාවේ මේ වන විට ඉදිරිපත් වුණු යෝජනාව, සම්මත වුණු යෝජනාව නිසා මුළු රටේම දේශපාලන කරළිය උණුසුම් වුණා. ඒ නිසා ඒ දේශපාලන කරළිය උණුසුම් වන කොට දේශපාලන සංවේදී අපි සියලුදෙනාම ඒ පිළිබඳව දැඩි අවධානයක් යොමු කරනවා. ඒ නිසා තමයි අද දවසේ මේ රීති අත්හිටුවලා බස්නාහිර පළාත් සභාව මේ යෝජනාව සාකච්ඡාවට භාජනය කරන්නේ. ඒ නිසා විශේෂයෙන්ම මම පෞද්ගලිකව අදහස් කරනවා, මේ යෝජනාව පදනම් කර ගනිමින් මේ මොහොත වන විට දකුණේ ක්‍රියාත්මක වන අන්තවාදී, ජාතිවාදී කණ්ඩායම්වලට මේ යෝජනාව පදනම් කරගෙන බොරදියේ මාළු බාන්නට අවස්ථාව ලබා නොදිය යුතුයි කියන එක මා විශ්වාස කරනවා.

ඒ නිසා විශේෂයෙන්ම යහපාලනය වෙනුවෙන් පෙනී සිටින අය. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ අනිකුත් මහජන මන්ත්‍රීවරුන් මේ යෝජනාව සම්බන්ධව, විශේෂයෙන්ම මෙවැනි අවස්ථාවක අපි ක්‍රියාත්මක විය යුත්තේ සිහි කල්පනාවෙන්. ඒ වාගේම බොහොම පැහැදිලිව මේ දැන් රටේ ඇති වෙලා තිබෙන වර්තමාන සහජීවනය, ජාතික සංහිඳියාව සහ ආගමික සහජීවනය කඩාකප්පල් නොවන ආකාරයට අපි සියලු දෙනාම ක්‍රියාත්මක විය යුතුයි කියලා මා විශ්වාස කරනවා. විශේෂයෙන්ම මේ මොහොතේදී මේ යෝජනාව ගැන අහලා, අර පුංචි කාලයේ අහලා තිබෙනවා හාවා තල්ගෙඩිය වැටෙන කොට ඒ සද්දෙට බය වෙලා ලෝකය පෙරළෙනවා කියලා කෑ ගහගෙන බය වෙලා දුවනවා වාගේ කලබල වෙලා මේ මොහොතේ, මේ යහපාලන රජය යටතේ ඇති වෙලා තිබෙන ජාතික සමගිය සහ සහජීවනය විනාශය වන ආකාරයෙන් කටයුත්තක් අපි නොකළයුතුයි කියන එක මා පෞද්ගලිකව විශ්වාස කරනවා.

[ගරු ලෙනාඩ් කාරුණාරත්න]

අපි දන්නවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනිම යෝජනාවන් පසුගිය දශක හතක, අවුරුදු හැත්තෑවක, අසූවක කාලය පුරාවට මේ ලංකා දේශපාලන ඉතිහාසය තුළ ගෙනාවා. විශේෂයෙන් උතුරු - නැගෙනහිර ද්‍රවිඩ ජනතාව නියෝජනය කරන දේශපාලඥයින්. විශේෂයෙන්ම පනහට පනහ ඒ ඉල්ලීම, ඒ වාගේම ෆෙඩරල් ඉල්ලීම, ඒ වාගේම වෙනම රාජ්‍ය පිළිබඳ ඉල්ලීම් නොයෙකුත් ආකාරයේ නොයෙකුත් අවස්ථාවන්වලදී ඔවුන් තමන්ගේ මැතිවරණ ඉලක්ක කරගෙන, ඒ වාගේම දේශපාලන බලය ලබා ගැනීමේදී එවැනි ඉල්ලීම් ගෙනාවා. නමුත් ප්‍රායෝගිකව මේ රට තුළ ඒ ඉල්ලීම් ක්‍රියාත්මක කරන්න හැකියාවක් ලැබුණේ නැහැ. ඒකට අවස්ථාව ලැබුණෙත් නැහැ.

ඉතින් එහෙමනම් මේ යෝජනාව පිළිබඳවත් අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ යෝජනාව කවදාවක්වත් ක්‍රියාත්මක වන යෝජනාවක් නොවෙයි. එම නිසා මෙතැනදී අපි වඩාත්ම සංවේදී විය යුත්තේ අද මේ රීති අත්හිටුවලා, මේ අවස්ථාවේදී අපි අත් දෙක උස්සලා, පොළවේ අඩි හප්පලා, උගුරේ ලේ රහ වනතුරු කෑ ගැහුවාට බස්නාහිර පළාත් සභාව හරහා මේ යෝජනාව සම්මත කර ගත්තාට අපට ඔවුන්ගේ යෝජනා - ෆෙඩරල් යෝජනා මේ රට තුළ ක්‍රියාත්මක කරනවා නම් ඒකට බලපෑමක් ඇති කරන්න පුළුවන්කමක් අපට මේ හරහා ලැබෙනවාද? මම විශ්වාස කරන්නේ එහෙම වෙන්නේ නැහැ. එහෙම වෙනවා නම් අපි කළ යුතු වෙන්නේ අද දවසේ උතුරු - නැගෙනහිර සිටින ද්‍රවිඩ ජනතාව, ඒ ප්‍රදේශවල සිටින ද්‍රවිඩ දේශපාලඥයන් විසින් මෙවැනි ජාතිවාදී, ආගම්වාදී අදහස් තුළින් ඔවුන්ව නොමග යවන්න උත්සාහ කරනවා නම් ඒකට විරුද්ධව අපි එම මතවාදය පරාජය කළ යුතුයි කියන එකයි මා අදහස් කරන්නේ. ඉතින් ඒ නිසා අපි ක්‍රියාත්මක විය යුත්තේ, මේ දකුණේ දේශපාලනය කරන මහජන නියෝජිතයන් වශයෙන් ඒ ජාතිවාදී දේශපාලන නායකයින්, උතුරේ හෝ වේවා. දකුණේ හෝ වේවා. ඒ දේශපාලන නායකයින් ගෙන යන මතවාදය, ඔවුන් මේ රටේ ජනතාව නොමඟ යවන්නට ගන්නා උත්සාහය මතවාදයන් වශයෙන් අපි පරාජය කළ යුතුයි. ඒකට කුමක්ද කළ යුත්තේ?

අපේ ඉතිහාසය අරගෙන බැලුවොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසය පුරාවටම මේ රටේ ද්‍රවිඩ, මුස්ලිම් ජනතාව තමන්ගේ ඉල්ලීම් ඉදිරිපත් කළා. ඒ ඉල්ලීම් ඉදිරිපත් කරන්න ඔවුන්ට යම්කිසි හේතුවක්, පදනමක් තිබුණා. නමුත් ඒ කිසිදු හේතුවකට පසුගිය ඉතිහාසය පුරාවට මේ රටේ දකුණේ දේශපාලඥයින් අවස්ථාව ලබා දුන්නේ නැහැ. පසුගිය කාලය පුරාවටම අපි දන්නවා, විශේෂයෙන්ම ව්‍යවස්ථාදායක බලය බෙදා හැරීම පිළිබඳව, ව්‍යවස්ථාදායක බලය බෙදා හැරීම පිළිබඳව අවශ්‍යතාවය මේ රට තුළ තිබුණා. එවැනි අවශ්‍යතාවයක් මේ රටේ භූගෝලීය වශයෙන්, දේශපාලනය වශයෙන්, සමාජයීය වශයෙන් මේ රට තුළ තිබුණා. නමුත් ඒකට ඉඩක් ලබා දුන්නේ නැහැ. විශේෂයෙන්ම, මේ රටේ සිටින දකුණේ දේශපාලන අන්තවාදී නායකයින්. දේශපාලඥයින්. එදා ඒ පිළිබඳව සංකල්පයක් වශයෙන්, ප්‍රතිපත්තියක් වශයෙන් බලය බෙදා හැරීම එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා ප්‍රකාශයට පත් කළා. ඔවුන්ගේ මතය ප්‍රකාශයට පත් කළා. ඩඩ්ලි සේනානායක මැතිතුමා, ඒ වාගේම සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, ඒ වාගේම චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය බලය බෙදාහැරිය යුතුයි කියන මතය ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගත්තත් එය ක්‍රියාත්මක කරන්න දකුණේ දේශපාලන නායකයින්, අන්තවාදීන් ඉඩ දුන්නේ නැහැ.

ඒ වාගේම භාෂාව පිළිබඳ ගැටලුව, ද්විභාෂා සංකල්පය මේ රට තුළ ක්‍රියාත්මක කරන්න දුන්නේ නැහැ. එයට උත්සාහ ගත්ත ඩඩ්ලි සේනානායක මැතිතුමා සහ අනිකුත් රාජ්‍ය නායකයන්ගේ ඒ උත්සාහයන් විරෝධතා හමුවේ ඔවුන්ට එය හකුලා ගන්න සිද්ධ වුණා. අවසානයේ සිද්ධ වුණේ මොකක්ද? උතුරු - නැගෙනහිර බහුතරයක් සිටින ද්‍රවිඩ සහ මුස්ලිම් ජනතාවගේ මූලික ඉල්ලීම්වලට, දකුණේ දේශපාලන අන්තවාදීන් ඉඩ නොදෙන කොට ඔවුන් ත්‍රස්තවාදී සංවිධාන වශයෙන් හැදිලා උතුරු - නැගෙනහිර ඇතුළු ඒ පාදක මූලික කරගෙන, කේන්ද්‍රගත කොට ගෙන දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් යුධමය වශයෙන් සහ මතවාද වශයෙන් ඔවුන් ශක්තිමත් වුණා. අවාසනයේ වුණේ මොකක්ද? වසර ගණනාවකට පස්සේ කොළඹ නගරයේ බෝම්බ පිපිරෙන කොට තමයි දකුණේ ඉන්න අපටත් ඇස් ඇරුණේ. ඒ දක්වා අපි හිටියේ උතුරු - නැගෙනහිර ජනතාවගේ මූලික අයිතිවාසිකම් අඩු ගණනේ ඔවුන්ට ඔවුන්ගේ පරිපාලන දිස්ත්‍රික්කවල, ඔවුන්ගේ කථා කළ යුතු භාෂාවෙන්, ගනුදෙනු කළ යුතු අයිතියවත් ලබා නොදිය යුතුයි කියන මතයේ හිටපු අපට කොළඹ බෝම්බ පුපුරලා අපේ ජීවිත, අපේ ඥාතියාගේ ජීවිත, අපේ දේපළ විනාශ වන

කොට තමයි අපේ ඇස් ඇරුණේ. අන්න එතකොට තමයි 1987, අපි බොහොම ගෞරවයෙන් සිහිපත් කරන්න ඕනෑ. සියලුම රාජ්‍ය නායකයන් මේ අවශ්‍යතාවය දැකලා, මේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණත්, ප්‍රතිපත්තිමය වශයෙන් පිළිඅරගෙන තිබුණත්, ආත්ම ශක්තියක් තිබුණේ නැහැ බලය බෙදා හැරීමේ ඒ සංකල්පය ක්‍රියාත්මක කරන්න. ව්‍යවස්ථානුගත කරන්න. අන්න ඒකයි අපි කිව්වේ, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා අපි ගෞරවයෙන් සිහිපත් කරන්න ඕනෑ. ඒ ආත්ම විශ්වාසය එතුමාට තිබුණා. ඒ බලය බෙදා හැරීමේ සංකල්පය දශක ගණනාවක් පුරා රාජ්‍ය නායකයන් පැහැර හරිද්දී ඒ සංකල්පය මේ පොළව මත ක්‍රියාත්මක කරන්න එතුමාට ආත්ම ශක්තිය තිබුණා. මොන තරම් බාධාවන්, දේශපාලන වශයෙන් ඔහුට මොන තරම් අවාසි වුණත් එය ක්‍රියාත්මක කළා. එදා වසර 40 කට, 50 කට ඉහතදී ප්‍රතික්ෂේප කරපු ඒ සංකල්පය, බලය බෙදා හැරීමේ සංකල්පය දශක හතරකට, පහකට පස්සේ අද මුළු රටම පිළි අරගෙන තිබෙනවා.

ඉතින් ඒ නිසා මේ මූලික අයිතීන් විශේෂයෙන්ම ද්‍රවිඩ ජනතාව, සිංහල ජනතාව අතර තිබෙන්නා වූ, අප අතර තිබෙන්නා වූ මේ අසමානතාවය, මේ අවිශ්වාසය, සැකය දුරු වෙන්න මම විශ්වාස කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මේ සැකය දුරු වෙන්න නම් අප අතර තිබෙන්නා වූ මේ භාෂාමය ගැටලුව විසඳාගත යුතුයි. ඒක තමයි ප්‍රධාන වශයෙන් විය යුත්තේ. මේ දක්වා මේ ප්‍රශ්නය දුරදිග ගියේ, අපට හැකියාවක් ලැබුණේ නැහැ, සිංහල ජනතාවට හැකියාවක් ලැබුණේ නැහැ ද්‍රවිඩ භාෂාව කථා කරන පුද්ගලයන්ගේ අවශ්‍යතාවය තේරුම් ගන්න. සිතුම් පැතුම් තේරුම් ගන්න. ඔවුන්ගේ සංස්කෘතිය, ඔවුන්ගේ වටිනාකම තේරුම් ගන්න අපට හැකියාවක් ලැබුණේ නැහැ. ඒ වාගේම ද්‍රවිඩ ජාතිකයාට හැකියාවක් ලැබුණේ නැහැ, සිංහල ජාතියේ අපේ තිබෙන අවශ්‍යතාවය, සංස්කෘතිය වටිනාකම තේරුම් ගන්න. බාධාව මොකක්ද? භාෂාව තමයි බාධාව බවට පත් වුණේ. ඒ බාධාව නිසා තමයි අද මේ ප්‍රශ්නය මේ දක්වා දුරදිග ගිහිල්ලා අද තිස් වසරක ඉතාමත්ම කෲර, ම්ලේච්ඡ යුද්ධයකින් අපේ රට විනාශයට පත්වුණේ. අපේ රට ආගාධයට පත් වුණේ. එහෙමනම් ඒ භාෂාව මග හරින්න, ඒ බාධාව ඉවත් කරන්න අවශ්‍ය වටපිටාව මම හිතන්නේ තවමත් මේ රට තුළ ස්ථාපනය වෙලා නැහැයි කියලා මා පෞද්ගලිකව විශ්වාස කරනවා. ඒකයි මම කිව්වේ, අපි මෙතැනදී මොනතරම් හයියෙන් කථා කළත්, මොනතරම් උගුර ලේ රහ වනතුරු කථා කරලා පොළොවේ අඩි හප්පලා කෑ ගැහුවාට හෙට දවසේ ඵෙඩරල් ක්‍රමයක් උතුරු - නැගෙනහිර ඇති වෙනවා නම් ඒක වළක්වන්න, ඒකට බාධාවක් කරන්න, ඒකට බලපෑමක් කරන්න අපට මේ පළාත් සභාව හරහා මේ ඇති කරන සංවාදය තුළින් හැකියාවක් ලැබෙයිද? මම විශ්වාස කරනවා, නැහැ. මම විශ්වාස කරනවා, දකුණේ දේශපාලනය කරන අපට පුළුවන්කම තිබෙන්න ඕනෑ, උතුරට ගිහිල්ලා උතුරේ ජනතාවට මේ පිළිබඳව අපේ මතය ප්‍රකාශ කරන්න. අපේ තිබෙන අදහස ඔවුන් සමඟ හුවමාරු කරගන්නට. තිබෙන බාධාව මොකක්ද? භාෂාව.

අද ලංකාව පුරා අපි යන ඕනෑම තැනක, හැම නගරයකම තිබෙනවා, මාස 06 න් ඉංග්‍රීසි භාෂාව උගන්වනවා. මාස 03 න් ඉංග්‍රීසි භාෂාව උගන්වනවා. මම යෝජනාව කරනවා. මේ යෝජනාව හරහා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන අප සියලු දෙනාට ද්‍රවිඩ භාෂාව කථා කිරීමේ හැකියාව ප්‍රගුණ කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දෙන්න. අපි තමයි මේ මතවාදය පරාජය කළ යුත්තේ. උතුරේ අන්තවාදී දේශපාලන පක්ෂ, දේශපාලන නායකයන් මෙවැනි ඔවුන්ගේ පටු දේශපාලන අවශ්‍යතාවයන් වෙනුවෙන් මැතිවරණ ඉලක්ක ගත කරන කොට, මෙවැනි යෝජනා ගෙනැවිල්ලා රට ගිනි තියන්න හදන කොට දේශපාලන වශයෙන් උතුරු - නැගෙනහිරට ගිහිල්ලා දකුණේ දේශපාලනය කරන අපි සිංහල, ද්‍රවිඩ දේශපාලනය කරන අපි සියලුම දෙනා එකට ගිහිල්ලා ඒ මතවාදය පරාජය කිරීමේ හැකියාව තිබෙන්න ඕනෑ. නමුත් අවාසනාවකට අපට අද හැකියාවක් ලැබිලා නැහැ. මොකද අපට ඒ භාෂාව කථා කරන්න බැහැ. මේ පළාත් සභාව නියෝජනය කරන සියලුම ද්‍රවිඩ මහජන නියෝජිතයන්ට හොඳට සිංහල කථා කරන්න පුළුවන්. ඔවුන්ට ඔවුන්ගේ මතය ප්‍රකාශ කරන්න පුළුවන්. නමුත් අපට අපේ තිබෙන ශක්තිය, අපට මේ පිළිබඳව තිබෙන විරෝධතාවය අපට සන්නිවේදනය කරගන්න හැකියාවක් නැහැ. මේ පටු, ඒ වාගේම ජාතිවාදී දේශපාලනය පරාජය කරන්නට උතුරට, නැගෙනහිරට ගිහිල්ලා අපට අවශ්‍ය දායකත්වය ලබා දෙන්නට හැකියාවක් නැහැ. මොකද, භාෂාව පිළිබඳව ගැටලුව තිබෙන නිසා. මම යෝජනා කරනවා, මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට. අනිවාර්ය කරන්න. අද රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී ද්‍රවිඩ භාෂාව සම්බන්ධයෙන් කඩඉම්

[ගරු ලෙනාඩ් කාරුණාරත්න ]

විභාගයක් පැවැත්වෙනවා. මම හිතනවා දේශපාලනය කරන අපටත් භාෂාව පිළිබඳව එවැනි යම්කිසි පුහුණුවක් ලබා දීම ඉතාම වැදගත් වෙයි. අප අතර තිබෙන්නා වූ අවිශ්වාසය, සැකය දුරු වෙන්නේ, අප එකිනෙකා අතර තිබෙන සමානතාවයන් හා අසමානතාවයන් හඳුනාගත්තොත් පමණයි. ඒකට අපට අවශ්‍යම කරන සාධකය තමයි භාෂාව. ඉතින් ඒ නිසා භාෂාව පිළිබඳව රජය මීටත් වඩා - විශේෂයෙන්ම ද්‍රවිඩ භාෂාව අප පුහුණු කළ යුතුයි කියනවා. ඒ සඳහා රජය මීට වඩා සාධනීය ක්‍රියා මාර්ග ගත යුතුයි කියන එකත් මා විශ්වාස කරනවා.

ඒ එක්කම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලෝකයේ ප්‍රවණතාවය තිබෙන්නේ, ජාතිවාදය පදනම් කරගෙන තමයි දේශපාලන කටයුතු ඉදිරියට ගෙන යන්නේ. ඒක ආසියාවේ වෙන්න පුළුවන්. මැද පෙරදිග වෙන්න පුළුවන්. දකුණු ඇමරිකාවේ වෙන්න පුළුවන්. ඒ සියලු රටවල්වල අද ජාතිවාදය සහ ආගම්වාදය පදනම් කරගෙන තමයි බලය ලබා ගැනීමට තිබෙන පහසුම සහ කෙටිම මාර්ගය වශයෙන් දේශපාලනඥයා හඳුනාගෙන තිබෙන්නේ. ඒක ලංකාවේත් හරිම අපූරුවට ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම සුළු පක්ෂ බොහෝවිට ක්‍රියාත්මක වෙන්නේ ජාතිවාදය සහ ආගම්වාදය පදනම් කරගෙන. නමුත් මතක තියාගන්න. අද මේ වන විට රටේ ඉන්න දකුණේ බහුතර සිංහල ජනතාව ජාතිවාදය ප්‍රතික්ෂේප කරනවා. ඔවුන් අද හොඳ අවබෝධයකින් සිටිනවා. ඒ නිසා නැවත වතාවක් උතුරු පළාත් සභාවේ විග්නේෂ්වරන් මෙවැනි යෝජනාවක් සම්මත කළාට දකුණේ ජනතාව ඒකට කිපෙන්නේ, ඒකට කළබල වෙන්නේ නැහැ. ඒ නිසා අද සමහර දේශපාලන පක්ෂ උත්සාහ කළාට තමන්ගේ නැති වී ගිය ඒ රාජ්‍ය බලය, තමන්ගේ නැති වී ගිය ඒ පවුල් බලය නැවත ලබා ගැනීමේ අසාර්ථක උත්සාහක නිරත වන මේ ඒකාබද්ධ විපක්ෂයට මේ හරහා වාසි ලබා ගැනීමේ හැකියාවක් නැහැයි කියන එක මම ප්‍රකාශ කරනවා. හැබැයි, විශේෂයෙන්ම එවැනි දේශපාලන කණ්ඩායම්වලට ඒ ජාතිවාදය නැමැති මධුවිත පානය කරන්න හොඳ කට ගැස්මක් විග්නේෂ්වරන් මහ ඇමතිවරයා මේ ෆෙඩරල් යෝජනාව හරහා නම් ලබා දුන්නායි කියලා මම විශ්වාස කරනවා. නමුත් ඒකට දකුණේ සමස්ත බහුතර ජනතාව ඒ පිළිබඳව හොඳ අවබෝධයකින් සිටින්නේ. ඒ පිළිබඳව අපට විශ්වාසයි. දකුණේ ජනතාව මෙය අවබෝධ කරගෙන හෙට දවසේ ඉතාමත්ම සංසුන්ව, ඒ වාගේම උපේක්ෂා සහගතව මේ ගැටලුවේදී අවශ්‍ය සහයෝගය රජයට ලබා දෙයි කියලා අපි විශ්වාස කරනවා. විශේෂයෙන්ම මෛත්‍රී - රනිල් ඒ පාලනයෙන් යුක්තව මෙවැනි රට බෙදීමේ ක්‍රියාවලියක් සිද්ධ වෙන්නේ නැහැ. එය බොහොම පැහැදිලිව ප්‍රතිපත්තිමය වශයෙන් ඒ වාගේම එවැනි ගැටලුවක් මේ රට තුළ ඇති වෙන්නේ නැහැයි කියන එක යහපාලනය නියෝජනය කරන මන්ත්‍රීවරුන් වශයෙන් අපට ඒ සහතිකය ලබා දෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා නැවත වතාවක් නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට මා ප්‍රකාශ කරන්නේ, මේ හරහා ඔබතුමා නැවතත් සිහි කල්පනාවට ගත යුතුයි. ඔබතුමා ප්‍රතික්ෂේප කරපු කණ්ඩායම අද අත්පොළසන් දෙනවා. මොකද, ඔවුන්ට මේ දවස්වල යන එනමන් නැතිව හිටියේ. ඔවුන්ට යන එනමන් නැතිව මාතෘකාවක් නැතිව සිටියේ. ඒ මාතෘකාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ඉතාමත්ම උණුසුම් ප්‍රතිචාරයක් ලැබුණායි කියලා අපි දැක්කා. ඒ නිසා මේ යෝජනාව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මේ යෝජනාව සභා සම්මත වුණාට හෙට දවසේත් මේ මහ පොළවේ ක්‍රියාත්මක නොවන යෝජනාවක් කියන එක සිහිපත් කරමින් මම නවතිනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon.Presiding Member

සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. තවත් මන්ත්‍රීවරු නව දෙනෙක් විතර කථා කරන්න ඉන්නවා. මොකද, හැමෝටම හොඳ අදහස් තිබෙනවා. හොඳට කථා කරන්න පුළුවන් අය ඔක්කොම ඉන්නේ. ඒ නිසා තමන්ම කාලය පොඩ්ඩක් කළමනාකරණය කර ගත්තොත් හොඳයි. නැත්නම් ලොකු වෙලාවක් යයි. මීළඟට අපි ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමාට ආරධනා කරනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. JagathAngage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම කාලය වෙන් කර දීම සම්බන්ධයෙන් ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. උතුරු පළාත් සභාව විසින් මේ රටේ පරිපාලන ව්‍යුහය වෙනස් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිබඳව නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කිරීම පිළිබඳව මේ සභාවේ මතය ප්‍රකාශ කරන්න අවස්ථාවක් සලසා දීම පිළිබඳව මම අනේකවාරයක් ස්තුතිවන්ත

වෙනවා. මොකද අපි මේ පරිපාලන ව්‍යුහය වෙනස් කරන්න ගිහිල්ලා, මේ රටේ ජනතාව අතර ඇති වුණු මානසික වේදනාවන් සංසිඳවන්න බැරිව ඇති වුණු විනාශයන්ට මුහුණ දීපු රටක පුරුවැසියන් විධියට, මේ තත්ත්වය පිළිබඳව යම් විධියක මෙවැනි සංවාදයක යෙදීම ඉතාමත්ම කලෝචිත ක්‍රියාවක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන්නේ, රටක ඉතාමත් උත්තරීතර ලියවිල්ල. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටේ ජනතාව පිළිගන්නවාද? ඒ රටේ ජනතාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ඒ රට තුළ ජීවත් වෙනවාද කියන මට්ටම තුළ තමයි ඒ රට තුළ විනය ගරුක සමාජයක් තිබෙනවාද? නැද්ද? කියන එක තීන්දු වෙන්නේ. ඒ නිසා මේ ප්‍රශ්නය ඉතාමත් බැරෑරුම් ප්‍රශ්නයක් වෙනවා. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටේ ජීවත්වන සියලුම ජනතාව පිළිගන්නවාද? නැද්ද? කියන කාරණාව. දැන් බස්නාහිර පළාත් සභාව කියලා පළාත් සභාවක් තිබෙනවා. මේ පළාත් සභාව සකස් වෙලා තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයට අනුකූලව. ඒ පළාත් සභාවේ ලේකම්වරයෙක් ඉන්නවා. ඒ පළාත් සභාවට සභාපතිවරයෙක් ඉන්නවා. පළාත් සභාව තුළ සාකච්ඡා කරන්න න්‍යාය පත්‍රයක් සභා කටයුතු කාරක සභාවේදී සකස් කරනවා. සභා කටයුතු කාරක සභාව තුළ න්‍යාය පුස්තකයට ඇතුළත් වන යෝජනාවක් හෝ යම්කිසි ලියවිල්ලක් පිළිබඳ කථාවක් මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගැළපෙන එකක් මිසක් නොගැළපෙන කිසිම යෝජනාවක් න්‍යාය පුස්තකයට ඇතුළත් වෙන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හෝ ඔබ එසේත් නැත්නම් උතුරු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විග්නේෂ්වරන් මැතිතුමා මේ ශ්‍රී ලංකාවේ කුමන පළාතක් නියෝජනය කරමින් හෝ මන්ත්‍රීවරයෙක් වෙන්න ඉස්සෙල්ලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඔහු යම්කිසි ප්‍රතිඥාවක් දෙනවා. මේ ප්‍රතිඥාව 157 අ (7) වන ව්‍යවස්ථාව හා 161 ඇ(iii) වන ව්‍යවස්ථාවට අනුකූලව විග්නේෂ්වරන් මැතිතුමා නම්,

*"වී. විග්නේෂ්වරන් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කරන බවට ද ශ්‍රී ලංකාවේ දේශය තුළ වෙන ම රාජ්‍යයක් පිහිටුවීමට, කෙළින් ම හෝ අන්‍යාකාරයකින්, ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී ආධාර දීම, අනුබල දීම, අනුග්‍රහය දැක්වීම, මුදල් යෙදවීම, ධෛර්ය දීම හෝ දේශනා කිරීම නොකරන බවට ද ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි/දිවුරුම් දෙමි."*

කියලා තමයි වැඩේට එන්නේ. මේ ව්‍යවස්ථාදායක සභාව තුළ අසුන් ගන්නේ. මට තිබෙන ඊළඟ ගැටලුව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරු පළාත් සභාවේ ලේකම්වරයෙක් ඉන්නවාද? මේ ලේකම්වරයා මේ ශ්‍රී ලංකාවේ තනතුරක් ලබපු අයෙක්ද? ඔහු විසින් මෙවැනි යෝජනාවක් මේ න්‍යාය පුස්තකයට ඇතුළත් කිරීම හෝ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට රාජ්‍ය නිලධාරියෙක් හැටියට එකඟ වුවාද කියන ප්‍රශ්නය මට තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ ප්‍රතිඥාවට අනුව මේ යෝජනාව උතුරු පළාත් සභාවේ න්‍යාය පුස්තකයට හෝ න්‍යාය පත්‍රයට ඇතුළත් වීම මහා නීත්‍යානුකූල නොවන ක්‍රියාවක්. ඒ නිසා අද දවසේ මෙවැනි සංවාදයකට තුඩු දීලා තිබෙන්නේ, රටේ මූලික වශයෙන් මහා දැවැන්ත අර්බුදකාරී ප්‍රශ්නයක් බවට මේ ප්‍රශ්නය අද මේ ගහනය වෙලා තිබෙන්නේ, මේ පළාත් සභාව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම නිසා. මේක ඉතා පැහැදිලියි. මේක අපි කවුරු මොන විධියට තර්කයක් ඉදිරිපත් කළත්, මොන විධියට කාරණා ඉදිරිපත් කළත් අද මේ මතවාදය සමස්ත ශ්‍රී ලංකාවේ ජනතාවගේ මනසට ඍජුව විෂබීජයක් ඇතුල් කරන යෝජනාවක් බවට පත් වෙලා හමාරයි.

මේ යෝජනාව ඉදිරිපත් කරන එක සාධාරණයි. ඒක විවේචනය කිරීම අසාධාරණයි කියලා තමයි අර ගරු මන්ත්‍රීවරු තර්ක කළේ. අර අන්තිමට කථා කරපු අපේ ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා බොහොම හොඳ කථාවක් කරලා අන්තිමට යහපාලන ආණ්ඩුවේ මැයි පෙළපාලියේ ඇඟට වැදුණු වේදනාව නිසා ඒක අර කිරි කළයට ගොම ටිකක් දා ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා දේශපාලන ප්‍රශ්න විතරක් නොවෙයි. රටක සමස්ත ජනතාවගේ අනාගතය පිළිබඳව තීන්දු තීරණ ගන්න ප්‍රශ්න. ඒ නිසා මේවා සාකච්ඡා කිරීම ජාතිවාදී කුලයට ඇතුළත් වෙනවා නම්, එය ඒ රටේ විශාල අවාසනාවක්. ඒ නිසා අද මේ මොහොත වන විට පැහැදිලිවම කියන්න තිබෙන්නේ, උතුරු පළාත් සභාව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඈත් වෙලා තනිව හුදකලාව තමන්ට ඕනෑ හිතුවක්කාර කටයුතු කරනවා කියන කාරණාවයි. ඒක අතිශය භයානක කටයුත්තක්.

[ ගරු ජගත් අංගගේ ]

විග්නේෂ්වරන් මැතිතුමා කියන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන නොදන්න විද්වතෙක් නොවෙයි. එතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එක අකුරක් නැර හොඳට කියවපු කෙනෙක්. එතුමාගේ පළාත් සභාවේ ඉන්න ලේකම්වරයා රාජ්‍ය නිලධාරියෙක් හැටියට මේ පිළිබඳව වගඋත්තර සැපයිය යුතුයි ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාට, අග්‍රාමාත්‍යවරයාට හෝ අදාළ පළාත් සභා කටයුතු පිළිබඳ අමාත්‍යවරයාට. මේක අතිශය භයානක කාරණාවක්. මේ රටේ නෛතික රාමුවට අභියෝගයක් ඉදිරිපත් කරමින් - එහෙමනම් මේ පළාත් සභාවේ අපටත් පුළුවන් වෙන්න ඕනෑ දමිළ ජනතාව සමූල ඝාතනය කළ යුතුයි කියලා. කවුරුවක්වත් එහෙම ගේන්නේ නැහැ. මනුෂ්‍යයන් හැටියට අපට එහෙම ගේන්න බැහැ. අපි මනුෂ්‍යත්වයට ආදරය කරනවා. සියලු ජාතීන්ට ආදරය කරනවා. මේ රටේ ජනගහනයෙන් ප්‍රධාන නගරය වන කොළඹ අග නගරයේ ඉන්නේ, ජන අනුපාතය අනුව නගරයේ 70% වකට කිට්ටු වෙන්න ඉන්නේ සුළු ජාතිකයන්. අපි ඔවුන්ට හිරිහැර හිංසා කරන්නේ නැහැ. අපි වෙනම රාජ්‍යක් හරි ගස්ස ගන්නවා. ඕගොල්ලෝ යන්න උතුරට කියලා කියන්නේ නැහැ. නමුත් රටේ තිබෙන භයානකම තත්ත්වය තමයි අද පළාත් සභාවක් හැටියට උතුරු පළාත් සභාව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අභියෝග කිරීම.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ප්‍රශ්න - අර අපේ කවුද මන්ත්‍රීවරයෙක් කථා කරලා කිව්වා, නිය පොත්තෙන් කඩන්න තිබෙන දේ පොරවෙන් කපන්න තියන්න හොඳ නැහැයි කියලා. ඒ නිසා ගරු මෛත්‍රීපාල සිරිසේන අපේ රටේ ජනාධිපතිතුමා විධායකය හැටියට, ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ව්‍යවස්ථාදායක සභාවේ නායකයා හැටියට මේ ප්‍රශ්නය සුළු කොට නොසළකා මේ පළාත් සභාව මේ ආකාරයෙන් හිතුවක්කාරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමෙන් කටයුතු කිරීම පිළිබඳව වහාම පරීක්ෂණයක් පවත්වලා නිසි පියවර, නිසි තීන්දු ගත යුතුව පවතිනවා. එසේ නැත්නම් හෙට අනිද්දා වන කොට - දැන් අනික් කාරණාව මුස්ලිම් ජනතාවට හොඳ - මම මේ ජාතිවාදය අවුස්සනවා නොවෙයි. අපට මතකයි පසුගිය එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදය ක්‍රියාත්මක වන කොට උතුරේ එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදය මූලාරම්භය වෙලා නැගෙනහිරට ඇවිල්ලා මුස්ලිම් ජනතාවට කරපු විනාශයන්. කාත්තන්කුඩි පල්ලියේ ආගම අදහපු අහිංසක මිනිස්සු මරා ඝාතනය කළ හැටි අපට සිහිපත් වෙනවා. ඔවුන්ට මොනතරම් වද හිංසා කළාද කියලා අපි දන්නවා. දැන් එක පරිපාලන ඒකකයක් බවට මේක පත් කරනවා විතරක් නොවෙයි. මේ පළාත් සභා දෙක එකතු කරලා පාර්ලිමේන්තුවක් හදන්න ඔවුන්ට යෝජනාවක් හැටියට මේ ලියවිල්ල ඉදිරිපත් කරන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව තිබෙන අයිතිවාසකම මොකක්ද කියන කාරණාව දැඩි ලෙස මතු වෙනවා. ඒ විතරක් නොවෙයි. ප්‍රධාන අමාත්‍ය වී. විග්නේෂ්වරන් ඉන්න මේ සභාව තුළ මේ යෝජනාව සම්මත වෙනවා. එසේ සම්මත කරගන්න තිබෙන අයිතිය මොකක්ද කියන ප්‍රශ්නය අපේ හදවතට මහා විශාල වේදනාවක්.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දීර්ඝ වශයෙන් මේ පිළිබඳව සාකච්ඡා කළ යුත්තේ නැහැ. එහෙම අවශ්‍යතාවයක් නැහැ. මේකේ බැරෑරුම්කම පිළිබඳව මේ සභාවේ ඉන්න උගත් ගරු මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් කථා බහ කළා. මේක ලංකාවේ අධිකරණයට පමණක් නොවෙයි. ව්‍යවස්ථාදායකයට, විධායකයට, අධිකරණයට මහත් අභියෝගාත්මක කාරණාවක් බව ප්‍රකාශ කරමින්, මේ තත්ත්වය පිළිබඳව ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් ජාතිය ඉදිරියේ ප්‍රකාශයක් කළ යුතුයි. මේ පිළිබඳව ගන්නා තීරණය සම්බන්ධයෙන්, ක්‍රියා කරන ආකාරය පිළිබඳව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව කරපු මේ ක්‍රියාව නිවැරැදි කිරීමට හැකියාවක් තිබෙනවාද? එසේ නැත්නම් ඒ වෙනුවෙන් කුමක්ද කළ යුත්තේ කියන කාරණාව පිළිබඳව. එය එසේ සිදු වේ යැයි බලාපොරොත්තු වෙමින් ඔබතුමා මට කාලය වෙන් කරදීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. LakshmanNipunaArachchi

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙන එන බවට උදේ මගේ අතට යෝජනාව දුන්නාට පස්සේ ඇත්තටම මම මගේ පැත්තෙන් කනගාටු වුණා. දෙමළ ජාතිවාදයට උඩගෙඩි දීම සඳහා මොකටද මේ බස්නාහිර පළාත් සභාව පාවිච්චි කරන්නේ කියලා. නමුත් එතුමාගේ මතය. මම එතුමාට ඒ අදහස කිව්වේ නැහැ. නමුත් ඊට පස්සේ මේ සාකච්ඡාව යන අතර මම කල්පනා කළා, මන්ත්‍රීවරුන්ගෙන් මේ සම්බන්ධව ඇත්ත අදහස් ටික එළියට එන නිසාම ඒක යම්කිසි ආකාරයකින් සාකච්ඡා කිරීමේ හොඳකුත් තිබෙනවා

කියලා. ඒක ඇතුළේ මම මුලින් විශ්වාස කරපු අර ජාතිවාදය සම්බන්ධ මතුවීම් මේ සාකච්ඡාව හරහා මතු වුණා. ඒකත් වුණා. අනික් පැත්තත් වුණා. දැන් මේකේ දෙමළ ජාතිවාදය විතරක් නොවෙයි. මුස්ලිම් ජාතිවාදයත් මතු වුණා. මොකද, හේතු වෙලා තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අපේ රටේ ජාතිවාදය කියලා කියන්නේ, හොඳට කර වුණු පොල් කොළ වාගේ. පුංචි ගිණි කූරක් ළඟට තියන්න ඕනෑ. මේක ඇවිළිලා යනවා. ඉතින් අපි විශ්වාස කරන්නේ, අද රටේ මේ තත්ත්වය ටිකක් වෙනස් වෙලා තිබෙනවා. ඒ නිසා මේවාට කලබල වෙන්නේ නැහැ. ඒ නිසා අර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඇත්තටම මේ සම්බන්ධව අවබෝධයක් නැතිව පිටින් ඉන්න කෙනෙකුට හිතෙන්න පුළුවන්, බොහොම කලබල වෙලා බස්නාහිර පළාත් සභාවට මේ යෝජනාව එනකොට එහෙමනම් දැන් විග්නේෂ්වරන්ට පුළුවන් ගෙදරල් දිනාගෙන වෙනම රජ්‍යයක් හදාගන්න. ඒක තමයි මේ කළබල වෙලා තිබෙන්නේ කියලා.

දැන් අපි දන්නවා, මේ යෝජනාව සම්මත වුණාට රටේ මධ්‍යම ආණ්ඩුව යටතේ තිබෙන ප්‍රතිපත්තිය හරියට තිබෙනවා නම්, බෙදුම්වාදය ප්‍රතික්ෂේප කරනවා නම් මේක යථාර්ථයක් බවට පත් වෙන්නේ නැහැ. නමුත් අපි කල්පනා කරන්න ඕනෑ, විග්නේෂ්වරන් වාගේ මහ ඇමති කෙනෙක් උතුරු පළාත් සභාවේ ඉඳන් මෙවැනි යෝජනාවක් සම්මත කරන්නේ ඇයි? ඔන්න ඕකයි අපි වටහා ගන්න ඕනෑ. මෙවැනි යෝජනාවක් උතුරු පළාත් සභාවේ සම්මත කරගන්න හේතුව තමයි, ඒක තමයි දෙමළ ජාතිවාදය. දෙමළ ජාතිවාදයට වෙන කිසි දෙයක් නැහැ. ඒ නිසා දෙමළ ජාතිවාදය නිසා මෙහේ දකුණේ සිංහල ජාතිවාදය ඇවිස්සෙනවා. ඒ වාගේම සිංහල ජාතිවාදය නිසාත් දෙමළ ජාතිවාදය ඇවිස්සෙනවා. ඒ නිසා විග්නේෂ්වරන්ලාට ඕනෑ වෙලා තිබුණේ - ඒ ගොල්ලෝ අසමත් වෙලා තිබෙනවා, උතුරු පළාත් සභාවක් හදා ගත්තාට පස්සේ - උතුරු පළාත් සභාව කියලා කියන්නේ දැන් ගෙදරල්වලට යන්න ඕනෑ තැනට අඩියක් තියලා ඉවරයි. ඒ අඩිය තුළ ඒ අය ඉන්නේ. ඒ අඩිය එතැනට තියලා තිබෙන්නේ. ඒගොල්ලෝ ඒවා දිනා ගත්තා. 1987 ඉන්දු - ලංකා ගිවිසුම කියලා කියන්නේ ඒක. ඒ ඉන්දු - ලංකා ගිවිසුමට විරුද්ධ වෙන්න හේතුව ඒක. ඒ ඉන්දු - ලංකා ගිවිසුමට එරෙහිව ජනතාව පාරට බැස්සේ ඒකයි. නමුත් ඒ අය සමත් වුණා, යම් පියවරක් එවකට හිටපු පාලකයින්ගෙන් ගෙදරල් සඳහා යන්න අවශ්‍ය ඉඩක් හදාගන්න. ඒ ඉඩ තමයි පාවිච්චි කරන්නේ. නමුත් ඒ ඉඩ පාවිච්චි කළාට අද ඒ දෙමළ ජාතිවාදය පෙන්නලා තිබෙනවා, තමන්ට උතුරේ ජනතාවගේ ප්‍රශ්න විසඳන්න බැහැයි කියලා. ඒ නිසා අද උතුරු පළාත් සභාව එහේ ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් දෙන්න අසමත් වෙලා තිබෙනවා. ඒක උතුරේ ජනතාව දන්නවා. ඒ නිසා ඒ අයට තිබෙන්නේ ඒ උතුරේ ජනතාව සතුටු කරන්න. ඒ ජනතාවගේ ප්‍රශ්න විසඳන එක නොවෙයි තිබෙන්නේ. බොහොම ලෙහෙසි කාරණය තමයි ඒ උතුරේ ජනතාවට කියන්න, මෙන්න අපි උතුරේ පළාත් සභාව යටතේ උඹලාගේ මේ වෙනම රාජ්‍යය කියන ඒ සිහිනය නැති වෙලා නැහැ. ඒක පෝෂණය කරනවා. ඒකට අවශ්‍ය යෝජනාව අපි සම්මත කරනවා කියලා. ඒක තමයි මේ විග්නේෂ්වරන්ලා උතුරු පළාත් සභාවේ සම්මත කර ගත්ත යෝජනාවේ, ඒගොල්ලන්ගේ උවමනාව. මොකද, විග්නේෂ්වරන් වාගේ මහ ඇමති කෙනෙකුට හිතන්න දෙයක් නැහැ, මෙවැනි යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා මුළු රටේ සමස්ත ජනතාවගේ ඔළුවට මොකද වෙන්නේ? එහෙම නැත්නම් සිංහල ජනතාවගේ මනසට මොකද වෙන්නේ? ඒක කොයි ආකාරයෙන් බලපානවාද කියන ප්‍රශ්නය ඇත්තටම විග්නේෂ්වරන්ලාට නැහැ . එහෙම උවමනාවක් නැහැ.

හැබැයි, අපි වගකියන්නේ රටකට. අපි දන්නවා, දෙමළ ජාතික සන්ධානයට මුළු රටට වග කියන්න බැහැ. අපි පිළිගන්න ඕනෑ ඒ අය එක්තරා ජන කොටසක් නියෝජනය කරන්නේ. ඒක නිසා තමයි දෙමළ ජාතික සන්ධානය කියලා කියන්නේ. දෙමළ. ජාතිකත්වය නමින් ඒ පක්ෂය හඳුන්වලා තිබෙන්නේ ඒකයි. ඒ නිසා ඒ අය සමස්ත රටක් නියෝජනය කරන්නේ නැහැ. හැබැයි, බස්නාහිර පළාත් සභාව තුළ නියෝජනය කරන අපි සමස්ත රටක් නියෝජනය කරනවා. ඒ නිසා අපට හිතන්න තිබෙන්නේ අන්න ඒක. අපි කවුද නියෝජනය කරන්නේ. ඒ නිසා අපි ඒකත් එක්ක ගැටෙන්න යෝජනාවක් ගෙනැල්ලා ඒක පෝෂණය කරනවා නම්, හැබැයි මෙහේ ජීවත් වන අපි ඔක්කොම මිනිස්සු. අපට එකට ඉන්න ඕනෑ. අපට එක රටක් තිබෙන්න ඕනෑ කියන මිනිස්සු එතැනට එකතු වෙමින් තිබෙන දෙමළ ජනතාවගේ මනසට ඒක ප්‍රශ්නයක් වෙනවා. ඒක ගැනයි අපි හිතන්න ඕනෑ. ඒක තමයි අපි විශ්වාස කරන්නේ. මේ සාකච්ඡාව - විග්නේෂ්වරන්ලා ඒ කරන දේම අපිත් මෙහේ බස්නාහිර පළාත් සභාවේ, ඒකට එරෙහිව තවත් යෝජනාවක් ගෙනැල්ලා ඒක හරහා තව ඒකත් එක්ක අපි ගැටෙන්න ඕනෑ නැහැයි කියන විශ්වාසය, අපට තිබෙන්නේ ඒකයි.

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

ඒ නිසා අපි හිතනවා, සිංහල ජාතිවාදය මත යැපෙන අයට, මේක හරහා ලොකු රුකුළක් එනවා. ඒ අයට ලොකු සතුටක් මේකෙන් එනවා. ඒ ගොල්ලෝ ඒ සතුට ප්‍රයෝජනයට ගන්නවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, දැනුවත්ව හෝ නොදැනුවත්ව මා නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙනෙන එක සම්බන්ධව මට ගැටලුවක් නැහැ. මොකද අපි දන්නවා, එතුමා අද ජාතික හෙළ උරුමය කියලා කිව්වාට අර දෙමළ ජාතික සන්ධානය වාගේම තමයි එතුමන්ලාගේ දේශපාලනය පටන් ගත්තේ සිහල උරුමය කියලා. ඒක තමයි පස්සේ ජාතික හෙළ උරුමය කියලා බවට පත් වුණේ. නම වෙනස් කළා. නම වෙනස් කළාට ඒ අයගේ අධ්‍යාත්මය වෙනස් වුණේ නැහැ. ඒ අය තවම ඉන්නේ එතැන. ඒකයි මේ ප්‍රශ්නේ. එතැන ගැටලුවක් තිබෙනවා. ඒ නිසා මම පුදුම වෙන්නේ නැහැ, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන්. එතුමන්ලා එතැනින් වෙනස් වෙලා නැහැ.

ඉතින් මට පුදුම තිබෙන්නේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේක එන්න තිබුණේ ජනතා විමුක්ති පෙරමුණෙන් කියලා. අන්න ඒක තමයි එතුමාට වැරදුනු තැන. "මව් බිම නැත්නම් මරණය" කියලා හිතපු කට්ටියගෙන් තමයි මේ යෝජනාව එන්න ඕනෑ කියලා. ඔන්න ඕක තමයි දේශපාලන පරිසරය තේරුම් ගන්න බැරි නොහැකියාව. මම ඒකට පුදුම වෙන්නේ නැහැ. මොකද, එතුමා නියෝජනය කරන්නේ කොමියුනිට්ස් පක්ෂය. මොකද, කොමියුනිට්ස් පක්ෂයේ තරුණයින්ට අපි සම්බන්ධ වැරදි චිත්‍ර දීලා තිබෙනවා, පැරණි කොමියුනිට්ස් නායකයන්. කලින් කොමියුනිට්ස් නායකයන්. ඒගොල්ලන්ට කිහිප දෙනෙක් හරි, විශ්ව විද්‍යාල මට්ටමින් හරි තරුණයින් කිහිප දෙනෙක් එකතු කරගන්න කොමියුනිට්ස් පක්ෂයට තිබුණු එකම දේ තමයි අපි සම්බන්ධව වැරදි මත, වැරදි අදහස් ඔළුවට ඔබ්බොන එක. ඉතින් ඒකට අහුවුණු මන්ත්‍රීවරයෙක් තමයි මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා. ඒ නිසා එතුමා තවමත් හිතන්නේ ඒ විධියට. අපි "මව්බිම නැත්නම් මරණය" කියන සටන් පාඨය ගෙනාවේ මේ රටට විදේශ ආක්‍රමණයක් සිදු වුණු වෙලාවේ. ඉන්දියානු ආක්‍රමණයක් සිදු වුණු වෙලාවේ. රජිව් ගාන්ධිලා මෙහෙට ඇවිල්ලා පරිප්පු හලන වෙලාවේ තමයි අපි ඒ සටන් පාඨය තෝරා ගත්තේ. වාමාංශික ව්‍යාපාරයේ සටන් පාඨ එහෙම තෝරනවා. ඒක පිදෙල් කැස්ත්‍රෝලා කියුබාවේත් ඒ සටන් පාඨය තේරුවා, කිසියම් අවස්ථාවකදී තමන්ගේ යුතුකම් ඉෂ්ට කරන්න. ඒක තමයි අපිත් පාවිච්චි කළේ. එහෙම නැතිව අපි ජාතිවාදී පදනමින් මේ "මව්බිම නැත්නම් මරණය" කියන සටන් පාඨය පාවිච්චි කළේ නැහැ. ඉතින් එතුමා එහෙම හිතුවාට අද කොමියුනිට්ස් පක්ෂය එහෙම නොවෙයි. මේ ළඟදී දයා අල්විස් මහත්මයාගේ මළගෙදරදී මට ඩිව් ගුණසේකර මැතිතුමා හම්බ වුණා. ඒ අය ඉන්නේ හොඳ හැඟීමකින්. අපේ දේශපාලනය සම්බන්ධයෙන් කලින් තිබුණු හැඟීම නොවෙයි තිබෙන්නේ. අපි සම්බන්ධයෙන් හොඳ හැඟීමක් ඒ අයට තිබෙනවා. ඉතින් ඒක නිසා මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඉන්නේ අර ඒ අයට පොවපු, ඒ අයගේ ඔළුවට දාපු ඒකේ පරණ නායකයන් අපි සම්බන්ධව දාපු චිත්‍රය තුළ තමයි. ඉතින් ඒ නිසා මම මේක සම්බන්ධව වැඩිපුර කථා කරන්න යන්නේ නැහැ. ගොඩක් මන්ත්‍රීවරු මේ සම්බන්ධව කථා කරපු නිසා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේක හරහා අපි රටක් විධියට කල්පනා කරලා, මේ සභාවට ගෙනෙන්න තිබුණේ, අපි සමගිය ගොඩනඟා ගන්න ඕනෑ. උතුරු පළාත් සභාව තුළ මෙවැනි තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ ඇත්තටම උතුරේ ජනතාවගේ ජාතිවාදී අදහස පෝෂණය කිරීමට ප්‍රයෝජනයට ගැනීම සඳහා. ඒ නිසා එහෙම නොවෙයි කියන අදහස මේ පළාත් සභාව තුළින් ඇත්තටම රටට ගියා නම් වඩාත් වටිනවා කියන අදහස ප්‍රකාශ කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. IsuraDevapriya- Chief Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාව පිළිබඳව බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට වචන කිහිපයක් එකතු කරන එකෙත් වැදගත්කමක් තිබෙනවා. මොකද, නැත්නම් මේ යෝජනාව සම්මත වන කොට මාධ්‍යවලට තවත් මාතෘකාවක් වෙයි, මේ යෝජනාවේදී බස්නාහිර පළාතේ මහ ඇමතිතුමා වචන දෙකක් කථා කළේ නැහැයි කියලා. මේ පිළිබඳව අලුත් ව්‍යවස්ථාදායක සභාවේදීත්, විවිධ මාධ්‍ය වැඩ සටහන්වලට සම්බන්ධ වුණු වේලාවේදීත් විවිධ මාධ්‍යයන් මේ ගැන ඇහුවා. ඉඩම් බලතල ගැන, පොලිස් බලතල ගැන. ඒ වාගේ උතුරෙන් එන ප්‍රශ්න පිළිබඳව. මම මේ සම්බන්ධව ප්‍රති උත්තර දීලා තිබෙනවා.

එකක් තමයි, විග්නේෂ්වරන් මහත්මයා දීර්ඝ කාලයක් කොළඹ ජීවත් වුණු සිංහල පරිසරයක හැදුණු වැඩුණු මනුස්සයෙක්. උගත් බුද්ධිමතෙක්. නමුත් එතුමා එක පාරටම උතුරේ මහ ඇමතිවරයා වුණාට පස්සේ, එතුමා උතුරට ගියාට පස්සේ මේ කොළඹ දී තිබුණු සිංහලකම, සිංහල මිනිස්සුන් එක්ක තිබුණු සම්බන්ධතාවය නැති වෙලා ගිහිල්ලා එතුමා ආර්. සම්බන්ධන් විපක්ෂ නායකතුමාටත් වඩා, එල්.ටී.ටී.ඊ. එකටත් වඩා එහා ගිය ජාතිවාදී ස්වරූපයෙන් තමයි මේ පළාත් සභාවේ මහ ඇමතිවරයා විධියට කටයුතු කරන්නේ. අපිත් මේ ගැන දන්නේ නැති කාලයේ ඒ පොලිස් බලතල ගැන, ඉඩම් බලතල ගැන අපි කථා කළා.

ඒ විතරක් නොවෙයි. මේ පළාත් සභා ක්‍රමය මේ රටට හඳුන්වලා දෙන කොට මේකට විරුද්ධව අපි පාසල් යන ශිෂ්‍යයන් හැටියට වැඩිහිටියන් එක්ක එදා අපි පාරට ආවා. අපට මතකයි, රණසිංහ ප්‍රේමදාස මැතිතුමාත් එදා මේ පළාත් සභා පිහිටුවන එකට විරුද්ධව හිටියේ. ෆෙඩරල් ක්‍රමයක් ගැන හැමෝම කථා කරනවා. හැබැයි, මේ පළාත් සභාවක් පිහිටුවලා මේ තරම් යන කොට අපි ෆෙඩරල් පිළිගන්නේ නැති, අපි ප්‍රතික්ෂේප කරන ෆෙඩරල් ක්‍රමයක්, අපි කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් අද මේ පළාත් සභා හරහා ක්‍රියාත්මක වෙලා තිබෙනවා. නමුත් මෙතැන තිබෙන වැදගත්කම තමයි එදා මේ විසි අවුරුද්දකට ආසන්න යුද්ධ කාලය තුළදී මේ යුද්ධයේ කුරිරුකම, භයානකකම, බිහිසුණුකම දැක්කාම සමහර නායකයන් මේ කොටස දීලා හරි මේ ප්‍රශ්නය විසඳගමුයි කියන මානසිකත්වයට ආවා. ඒ වෙනුවෙන් උද්ඝෝෂණ, පෙළඹවීම් තිබුණා. දැන් අද ඒකාබද්ධ විපක්ෂයේ ඉන්න වාසුදේව නානායක්කාර ගරු මන්ත්‍රීතුමන්ලාත් එදා ඒ සටනේ හිටියා. උතුරු - නැගෙනහිර කඩලා දෙන්න ඕනෑය කියන අය හිටියා. නමුත් අද ඒ ගොල්ලෝ, ඒ අයගේ දේශපාලන මතය වෙනස් කරලා අද වෙනත් කඳවුරුවල ඉඳන් කෑ ගහනවා. නමුත් මේ රටේ ප්‍රශ්නය තවමත් ඉවර වෙලා නැහැ. දැන් යුද්ධය අපි ඉවර කළා. අපට ඒකට සතුටුයි. හැබැයි, ඒකෙන් වෙන්නේ මිනිස්සු මැරෙන්නේ නැති එක විතරයි. අපේ ආර්ථික මර්මස්ථානවලට, ඒ වාගේම අපේ රජයේ තැන්වලට, පූජනීය ස්ථානවලට බෝම්බ පිපිරෙන්නේ නැති එක විතරයි සිද්ධ වෙන්නේ. නමුත් ඊට වඩා භයානක විධියට මේ රටේ ත්‍රස්තවාදයට ඒක ලියලමින් තිබෙනවා. ඒ සඳහා ජාත්‍යන්තර වශයෙන්වත්, දේශීය වශයෙන්වත් ඒක ක්‍රියාත්මක වෙන්න අවශ්‍ය පසුබිමක් සකස් වෙමින් යනවා. නමුත් ආරක්ෂක අංශ උතුර සහ නැගෙනහිර තිබෙන ඒ සියලු ක්‍රියාකාරකම් මැඩ පවත්වලා තිබෙනවා. එවැනි තත්ත්වයක් නිර්මාණය වෙන්නේ නැහැ. දැන් අපට පැහැදිලියි, එවැනි තත්ත්වයක්නිර්මාණය වෙන්න පසුබිමක් සකස් වෙන්නේ නැහැ. නමුත් ත්‍රස්තවාදයට පණ දෙන්න පුළුවන් බලවේග ඒවා නැති වෙලා නැහැ මේ ත්‍රස්තවාදීන් එක්ක. ඒ නිසා මේ පිළිබඳව දකුණට ඉතාමත්ම වැදගත්කමක් තිබෙනවා. ඒ නිසා දැන් ත්‍රස්තවාදය ක්‍රියාත්මක වෙන්නේ ආයුධ අරගෙන සංවිධානය වෙලා නොවෙයි. දැන් ඒ අය ක්‍රියාත්මක වෙන්නේ මොළේ පාවිච්චි කරලා. ඒක නිසා ජාතික වශයෙන් සිංහල හරි, දෙමළ හරි, මුස්ලිම් හරි නැත්නම් මේ රටේ ජීවත්වන මිනිස්සු එකම රටක් හැටියට, එකම ජාතියක් හැටියට හිතනවාට වඩා එහා ගිහිල්ලා ආගම් වශයෙන්, භාෂා වශයෙන් බෙදෙන්න ගියොත් එහෙම ඒක නැවත වතාවක් ත්‍රස්තවාදයකට අත වනන තත්ත්වයක් තමයි අපට දකින්න පුළුවන්කම ලැබෙන්නේ.

දැන් අපත් මහ ඇමතිවරු වෙලා ඉන්නවා. දැන් ඒ කාලයේ අපි නිකන් මන්ත්‍රීවරු හැටියට ඉන්න කොට අපි හිතුවා, පොලිස් බලතල තිබුණා නම් හොඳයි. ඉඩම් බලතල තිබුණා නම් හොඳයි. දැන් මහ ඇමතිවරයා හැටියට මම ඉන්න කොට මට එහෙම ලොකු උවමනාවක් නැහැ. මේ අපි එකම රටක ඉන්නේ. අපට මොකටද? හැබැයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මණ්ඩලයට මම කිව්වා, පළාත් සභාවකට විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී යම් රජයේ ඉඩමක අයිතියක් තිබෙනවා නම් සහ අපේ පළාතේ තිබෙන ඉඩමක් වෙන රජයේ වැදගත් ව්‍යාපෘතියකට වෙන් වෙනවා නම් ඒකට ඒ පළාත් සභාවේත් අනුමැතිය ලබා ගත යුතුයි කියලා. ඒ වාගේම පොලිසිය සම්බන්ධයෙන්, ඒ පොලිස්පති පත් කර ගැනීමේදී ඒ පළාත් සභාවේ මහ ඇමතිවරයාටත් නියෝජනයක් කරන්න පුළුවන් නම් ඒකේ ඇති වරදක් නැහැ. මොකද, අගමැතිතුමාට සහ කථා නායකතුමාටත් තමන්ගේ මතයක් ප්‍රකාශ කරන්න පුළුවන් නම් එක් එක් පළාත් සම්බන්ධයෙන් වැදගත් තීන්දු ගැනීමේදී පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරුන්ටත් අවස්ථාවක් දෙන්න ඕනෑය කියන යෝජනාව මම කරලා තිබෙනවා. ඉතින් ඒ නිසා මම පැහැදිලිව කියන්නේ, මේ භාෂාව පදනම් කරගෙන පළාත් සභා සංස්ථාපනය කිරීම වැරැදියි. ඒ නිසා මේකට බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට මාගේ විරුද්ධතාවය මම ප්‍රකාශ කරන අතර, මේ පිළිබඳව ජනාධිපතිතුමාගේත්,

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

අගමැතිතුමාගේත්, ඒ වාගේම උතුරේ ආණ්ඩුකාරතුමාගේත් අවධානය යොමු කළ යුතු යැයි මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙලාව ලබා දීම ගැන පළමුව ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මෙවැනි යෝජනාවක් ගෙන ඒම ගැන අපි නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. රටේ පවතින යම් ප්‍රශ්නයක යථාර්ථය, ගැටලුවක් ගැන කථා කරන්න පළාත් සභා මන්ත්‍රීවරුන් විධියට අපි යෝජනාවක් ගෙනාවාම මේ සමහර මන්ත්‍රීවරුන්ට තිබෙන්නේ, ජාතික හෙළ උරුමය කියන ඇලජික් එක. සමහර මන්ත්‍රීවරුන්ට ජාතික හෙළ උරුමයේ යකා වැහිලා තිබෙනවා. තොයිලයක් කරලා අයින් කරන්න වෙනවා. මොකද හොඳ දෙයක් ගේන කොට හොඳ දෙයට සහයෝගය දීම කාගේත් යුතුකමක්. මහින්ද මහත්තයා යුද්ධය කරන කාලයේ සම්පූර්ණයෙන්ම අපි එතුමාට සහයෝගය දුන්නා. ඒකීය රටක් වෙනුවෙන් අපි එදත් පෙනී සිටියා. අදත් පෙනී සිටිනවා. මහින්ද මහත්මයාත් එක්ක එකට ඉන්න කාලයේ එතුමා වැරැදි තීරණයක් ගත්තොත් අපි ඒකට විරුද්ධවත් කථා කළා. අපි අදත් මොන එකේ හිටියත් රටට වින කොටනවා නම්, ඒ වෙනුවෙන් කථා කරන්න අපි සැදී පැහැදී ඉන්නවා.

සමහර මන්ත්‍රීවරුන් කථා කළා, විශේෂයෙන්ම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කථා කළා, මේක අපේම ප්ලෑන් එකක් කියලා. දකුණේ ජාතිවාදය අවුස්සන්න කියලා. එතකොට අපි අහන්න කැමැතියි. මෙවැනි දේවල් ඉස්ස්රහාට එන කොට ටී.වී. එක ඉස්සරහා වැඩිපුරම මාධ්‍ය සාකච්ඡා පවත්වන්නේ කවුද? අපිද? එතකොට එතුමන්ලාද මේ දකුණේ ජාතිවාදය අවුස්සන්නේ? එතකොට එතුමන්ලාගේම ප්ලෑන් එකක්ද මේක? අපි එතුමාගෙන් අහන්න කැමැතියි. මොකද, එතුමන්ලා මෙතැනදී ජාතික හෙළ උරුමය යෝජනාව ගේන කොට තමයි ඒක වැරිදි. ජාතික හෙළ උරුමයත් එක්ක තිබෙන ඇලජික් එක නතර කරලා රටේ තිබෙන ප්‍රශ්න ගැන කථා කරන්නය කියලා මම සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. ඒක අපි කාගේත් වගකීම. රටේ ප්‍රශ්නයක් ගැන කථා කරන කොට ජාතිවාදියෝ කියනවා. අපි රටේ ප්‍රශ්න ගැන හැමදාම කථා කළා, අපට ජාතිවාදියෝ කිව්වාට. තමන්ගේ ජාතියට වින කරන කොට ඒකට කථා කිරීම අපේ වගකීමක්. විග්නේෂ්වරන් මහත්මයා උතුරේ මේ යෝජනාව ගේනකොට බස්නාහිර පළාත ශක්තිමත් පළාතක් විධියට අපට යුතුකමක් තිබෙනවා, මේ යෝජනාව ප්‍රතික්ෂේප කරන්න. අපි හැමෝගෙම ඒක වගකීමක් සහ යුතුකමක්. මෙතැනදී ජාතිවාදය අවුස්සන්නවත්, උඩගෙඩි දීමවත් නොවෙයි කෙරිය යුත්තේ. එතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කරලයි මේක ගේන්නේ. අපි දන්නවා, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාත්, ගරු ජනාධිපතිතුමාත් මේකට එකඟ නැති බව. අපි එතුමන්ලාට තව අවධාරණය කරනවා, බස්නාහිර පළාත විධියට මේකට නීතිමය ක්‍රියාමාර්ගයක් ගන්න ඕනෑ. අපේ ජගත් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ එතුමා දිවුරා ප්‍රකාශ කරලා තමයි මේකට ඇවිල්ලා තිබෙන්නේ. ඒකීය රට තුළ ජීවත් වෙනවා කියන පොරොන්දුව පිටයි එතුමා ඇවිල්ලා තිබෙන්නේ. ඉතින් ඒ නිසා ඒකට ක්‍රියා මාර්ගය ගන්න එක අපේ නායකයන්ගේ වගකීමක් බව මම අවධාරණය කරනවා.

ඒ වාගේම අපි කථා කරන්න හිටපු ගොඩක් දේවල් ගොඩක් අයගෙන් විවිධ අදහස් පළ වුණා. මම හිතනවා ජාතියක් විධියට අපට දෙමළ මිනිස්සු එක්කවත්, මුස්ලිම් මිනිස්සු එක්කවත් වෛරයක් නැහැ. අද දෙමළ මිනිස්සුත්, සිංහල මිනිස්සුත්, මුස්ලිම් මිනිස්සුත් මේ බස්නාහිර පළාත තුළ සමගියෙන් ජීවත් වෙනවා. උතුරෙත් දෙමළ මිනිස්සු සතුටෙන් ජීවත් වෙනවා. හැබැයි, විග්නේෂ්වරන් මහ ඇමතිතුමාට තමයි මේ ජාතිවාදය අවුස්සන්න උවමනා වෙලා තිබෙන්නේ. එතුමා ප්‍රභාකරන්ගේ නැට්ටේ එල්ලිලා අද ඊළාම් එකක් හදන්න හදනවා. මම හිතන්නේ, ඒක එතුමාගේ තිබෙන අදහසක්. මම හිතන්නේ ඒක කවදාවක්වත් එතුමාට මේ රටේ ඉෂ්ට කරගන්න ලැබෙන දෙයක් නොවෙයි. නමුත් එතුමා අදහසක් දාලා බලනවා පොඩ්ඩක්, අර මොකක් හරි හරි ගියොත් ඒක එහෙමයි කියන එක. ඔළුව දාලා පොඩ්ඩක් බලනවා කොහොමද උත්තර දෙන්නේ. කොහොමද වෙන්නේ කියන එක. අපි එතුමාට කියන්න කැමැතියි. මේ රට වෙනුවෙන්, ජාතිය වෙනුවෙන් අපි එදත් පෙනී සිටියා. අපි අදත් පෙනී සිටිනවා. අපි හෙටත් පෙනී සිටිනවා. කවුරුත් එක්ක කොහොම හිටියත් ඒක අපේ වගකීම කොට සලකනවා. ඒ නිසා අපට ජාතිවාදී ලේබල් ගැහුවාට අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි ඒක ගෞරවයක් ලෙස පිළිගන්නවා. කිසිම ගැටලුවක් නැහැ. සම ජාති, සම ආගම් ඔක්කොම ගැන කථා කරන

[ගරු නිරෝෂා අතුකෝරල ]

අයට වැඩිය මගේ ජාතිය මට වටිනවා. නමුත් අනික් ජාතිත් එක්කත් අපට සමගියෙන් ඉන්න පුළුවන්. අපි කියනවා, පොල්වත්තක ගොටු කොළ හැදෙන්නත් පුළුවන්. ඒ ගොටුකොළවලට හැදෙන්න අපි කිසි දවසක අවහිර කරන්නේ නැහැ. නමුත් පොල් වත්ත, පොල් වත්ත වෙන්න ඕනෑ මිසක් පොල් වත්ත කවදාවක්වත් ගොටු කොළ වත්ත වෙන්නේ නැහැ. ඒ නිසා මම ජාතිවාදියි. මගේ ජාතිය ගැන මම කථා කරනවා, එදා වාගේම අදත්. ඒ නිසා අපි මේ අවස්ථාවේ පළාත් සභාවේ මන්ත්‍රීවරියක් විධියට විග්නේෂ්වරන් මැතිතුමා ගෙනෙන ලද යෝජනාවට මගේ විරෝධතාවය තරයේ ප්‍රකාශ කරමින්, මට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. GaminiThilakasiri - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද නැගෙනහිර ඒකාබද්ධ ෆෙඩරල් විසඳුමක් යන තේමාව යටතේ උතුරු පළාත් සභාවට ගෙනෙන ලද යෝජනාව පිළිබඳව එහි ප්‍රධාන අමාත්‍යවරයාට ඒ පිළිබඳව බස්නාහිර පළාත් සභාවේ අප්‍රසාදය පළ කිරීම සඳහා නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාවට අදාළව වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන මම ඉතාමත්ම ස්තුතිවන්ත වෙනවා. අද සියලු ජාතීන් අතර සමගිය ඇති කිරීමට ගරු ජනාධිපතිතුමා ගත්තා වූ උත්සාහය පිළිබඳව මා ප්‍රථමයෙන්ම අගය කළ යුතුයි. අනවශ්‍ය අර්බුදයක් ගෙන ඒම සඳහා මේ අවස්ථාවේදී උතුරු පළාත් සභාව මේ යෝජනාව ගෙනල්ලා තිබෙනවා. මේ රට පසුගිය කාල පරිච්ඡේදයේ දේශපාලන නායකයින් හැම කෙනෙක්ම යුද්ධයෙන් වුණු කරදර, හිරිහැර පිළිබඳව අමුතුවෙන් සඳහන් කරන්න දෙයක් නැහැ. පසුගිය කාලපරිච්ඡේදය තුළ මුළු රටම වෙලා ගත්ත යුද්ධයෙන් අපි නිදහස් වෙලා අද මේ රටේ සියලුදෙනාටම එකට ජීවත් විය හැකි පරිසරයක් හදාගෙන යන වෙලාවක අතිගරු ජනාධිපතිතුමා එතුමා බලයට පත්වීමෙන් පසු උතුර - නැගෙනහිර කියලා නොවෙයි. ඒ සෑම පළාතකටම එක හා සේවය කරමින් හොඳ සංහිඳියාවකින් මේ රට ඉදිරියට ගෙන යන්නට විශාල උත්සාහයක් අරගෙන තිබෙන මොහොතක උතුරේ ප්‍රධාන අමාත්‍යතුමා මේ ගෙනාපු යෝජනාව අපි බස්නාහිර පළාත් සභාව නොවෙයි, මම හිතන්නේ පක්ෂ පාට භේදයකින් තොරව බැලුවොත් මුළු රටම විරුද්ධ වන යෝජනාවක්. මම විශ්වාස කරනවා, උතුරු ප්‍රදේශයේ ජීවත් වන උදවිය දීර්ඝ කාලයක් තිස්සේ මේ ප්‍රශ්නවලට මැදිහත් වෙලා සිටියා. යුද්ධයෙන් බැට කාපු පළාතක්. අද මේ වන විට ඒ ජීවත්වන කෙනෙක්වත් මේ යෝජනාවට පක්ෂපාතීත්වය දක්වයි කියලා අපට විශ්වාස කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අද අපි සියලු දෙනාටම අවශ්‍ය වෙලා තිබෙන්නේ මේ රට තුළ හොඳ සංහිඳියාවකින් ජීවත් වීමයි.

මම පුවත්පතක දැක්කා, අපි මේ යෝජනා ගෙනෙන්න ප්‍රථම එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ෆෙඩරල් යෝජනාව ප්‍රතික්ෂේප කරනවා. මේකට එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්තුමා පක්ෂය වෙනුවෙන් ප්‍රකාශයක් කරලා තිබෙනවා. අපේ කණ්ඩායම වෙනුවෙන්, ජනාධිපතිතුමාගේ කණ්ඩායම වෙනුවෙන් අපේ මහින්ද සමරසිංහ ඇමතිතුමා මේ ගැන විශේෂ විග්‍රහයක් කරලා තිබෙනවා. පළාත් සභාවක යෝජනා ඕනෑ තරම් අපි ගෙනල්ලා සම්මත කර ගන්නවා. අපි දන්නවා, මේ පළාත් සභාවේත් අපි අනන්ත අප්‍රමාණ යෝජනා ගෙනැල්ලා සම්මත කර ගන්නවා. ඒවා අතළොස්සක්වත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. සමහරවිට එයාගේ ජනප්‍රියත්වය ගොඩනගාගන්න, එයාගේ ජාතිය අතර එයා නායකයෙක් බව පෙන්වන්න මේ යෝජනාව ගෙනැල්ලා මුළු රටම කැළඹීක් බවට පත් කරන්න උත්සාහ ගන්න ඇතියි කියලා මම විශ්වාස කරනවා. නමුත් එතුමා විශ්වාස නොකරන්න ඇත්තේ එම යෝජනාව ගෙනාවාම මේ හැම දේශපාලඥයෙකුම සද්ද නොකර කට වහගෙන ඉඳියි කියලා. මේ යෝජනාව සම්මත වෙලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව මේ දේශපාලඥයින් හැටියට අපට වැඩ කරන්න පුළුවන්කමක් නැහැ. අපි ඕනෑම තරාතිරමක මන්ත්‍රීවරයෙක්, ඇමතිවරයෙක් ඒ ආයතනය තුළ මන්ත්‍රීකමක්, ඇමතිකමක් ලබා ගන්න කොටම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟ වෙලා, අපි අත්සන් කරලා ප්‍රතිඥාව දීලා තමයි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා කිසිම ආකාරයකින් මෙවැනි යෝජනාවක් ගෙනැල්ලා සම්මත කරලා තවදුරටත් මේවායේ වැඩ කටයුතු කරගෙන ගියොත් අපි විශ්වාස කරනවා, ඒකට අවශ්‍ය තීන්දු තීරණ අතිගරු ජනාධිපතිතුමා ගනියි කියලා. මුළු රට තුළම බොහොම සංහිඳියාවකින් ජීවත්වන පරිසරයක් අද ගොඩනැගිලා තිබෙනවා. අපි දන්නවා, පසුගිය කාලපරිච්ඡේදය තුළ ආණ්ඩුව වෙනස් වුණත් මේ සංහිඳියාව කියන එක නැති වුණු නිසා. සෑම පක්ෂයකම විවිධ පුද්ගලයින් තමන්ගේ දේශපාලන වාසි තකාගෙන යම් යම් මෙවැනි තීන්දු තීරණවලට ඇබ්බැහි වෙලා

[ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා]

ඉන්නවා. තම තමන් පෞද්ගලිකව තීන්දු තීරණ ගන්නවා. රටක් වශයෙන් අපි බැලුවොත් මේ ගෙනාපු යෝජනාවට අපට කිසිසේත්ම පක්ෂ වෙන්න පුළුවන්කමක් නැහැ. ඉතාම බරපතළ ප්‍රශ්නයක් බවට මෙය අද පත් වෙලා තිබෙනවා. ඒ නිසා තව තව දේවල් ඉස්සරහාට මතු වෙන්න පුළුවන්.

අපි දන්නවා, පසුගිය දවස්වල තරාතිරම කුමක් වුවත් අවසර නැතිව හමුදා කඳවුරකට එහෙම යන්න බැහැ. අපි දන්නවා. දැන් මෙතැනදී ඒ පිළිබඳවත් කථා කරන්න ඕනෑ. හමුදා කඳවුරක් කියන්නේ ලෙහෙසියෙන් පහසුවෙන් කිසිම කෙනෙකුට එකවර යන්න පුළුවන්කමක් නැහැ. සමහරවිට එතුමා නොදැනුවත්ව මේ වැඩේ කළාද? දැනුවත්ව කළාද කියන්න බැහැ. නමුත් එතුමා ඉන් පසුව විවිධ ප්‍රකාශ කරලා තිබුණා. ඒ කෙසේ වෙතත් හමුදාවක් තිබෙන තැනකට යන්න පුළුවන්කමක් නැහැ. දැනුවත් නොකර. මෙවැනි ප්‍රශ්න උතුර - නැගෙනහිර ප්‍රදේශවල වරින් වර ඇති වෙනවා. මම විශ්වාස කරනවා. අපි ඒ තරම් කලබල විය යුතු නැහැ. අපි ක්‍රමානුකූලව මේ ප්‍රශ්නවලට උත්තර දීලා, ක්‍රමානුකූලව ඒ අයගේ මොළය හදන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. කාලයක් තිස්සේ බලාපොරොත්තු වුණු දේවල්. අපි දන්නවා, විග්නේෂ්වරන් මැතිතුමා කිව්වාම මෝඩයෙක් නොවෙයි නේ. විනිශ්චයකාරවරයෙක්. එතුමා රට තුළ ඕනෑම දෙයකට තීන්දු තීරණ ගත්ත කෙනෙක්. එහෙමනම් ඒක වෙලා තිබෙන්නේ, එතුමා මේ යෝජනාව ගෙනාපු එක තමයි මේකේ තිබෙන බරපතළම වැරැද්ද. නීතිය නොදන්න කෙනෙක් නොවෙයි. ඒ නිසා මේ රටේ පසුගිය කාලපරිච්ඡේදය තුළ ජනාධිපතිතුමාත්, අගමැතිතුමා ඇතුළු සියලුම දෙනා අපේ මන්ත්‍රීවරු, කැබිනට් මණ්ඩලය ඇපි හැම කෙනාම නිරන්තරයෙන්ම බලාපොරොත්තු වෙන්නේ මේ රට තුළ අපි සියලු දෙනාටම හොඳ සංහිදියාවකින් ජීවත් වීමේ පරිසයක් ගොඩනගා ගැනීම සඳහායි.

ඒ නිසා මෙවැනි අවස්ථාවක අද බස්නාහිර පළාත් සභාව තුළ මේ යෝජනාව ගෙනැල්ලා අප සියලු දෙනාටම ඒ වෙනුවෙන් වචන ස්වල්පයක් කථා කිරීමට නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගත්තා වූ උත්සාහය පිළිබඳව අගය කළ යුතුයි. ඒ නිසා පක්ෂ පාට භේදයකින් තොරව මේ යෝජනාව අපි ප්‍රතික්ෂේප කරනවා. මෙවැනි යෝජනා මින් මතුවටවත් - විග්නේෂ්වරන් මහ ඇමතිතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා. ජනතාව කුපිත කරවන, සංහිදියාවට බාධාවන අයුරින් මින් ඉදිරියට එම පළාත් සභාව තුළ මෙවැනි යෝජනා ගෙනෙන්න කටයුතු කරන්න එපා කියන පණිවුඩයත් මම මේ අවස්ථාවේදී දන්වා සිටිනවා. ඒ නිසා මම දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නේ නැහැ. අපි සියලු දෙනාම බලාපොරොත්තු වෙන්නේ එකම තැනකට යන්න. එකම රටක් තුළ සාමය, සමගිය, සංහිදියාව තුළ ජීවත් වීමේ අයිතිය හැම කෙනෙක්ම බලාපොරාත්තු වෙනවා. උතුරු ප්‍රදේශයේ සෑම ජනතාවක්ම අවුරුදු ගණනාවක් විඳපු දුක් කන්දරාව අයින් කරලා මේ පරිසරය තුළ ජීවත්වීම සඳහා ගන්නා වූ උත්සාහය සඳහා අපි සියලුමදෙනා පක්ෂ පාට භේදයකින් තොරව මේ රට තුළ සාමය සංහිදියාව ඇති කිරිම සඳහා අපි කැප වීමෙන් වැඩ කටයුතු කරන්න ඕනෑය කියන පණිවුඩය දෙමින්, නැවත මතක් කර සිටිනවා. මින් ඉදිරියට මෙවැනි යෝජනා නැවත වතාවක් මේ රට තුළ ගෙන ඒමෙන් වැළකී සිටින්නය කියලා විග්නේෂ්වරන් ප්‍රධාන අමාත්‍යතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා බොහොම පොඩි නින්දක් ගිහිල්ලා ඉඳලා, නින්දෙන් නැඟිටලා හීනයක් දැකලා ඇවිල්ලා වාගේ මේ යහපාලන ආණ්ඩුව ගෙනෙන්න බොහොම ශක්තියක්ව කටයුතු කරපු, රාජපක්ෂගේ පරම්පරාව හොරු කියපු, උතුරු - නැගෙනහිර ජනවාර්ගික ප්‍රශ්නයක් නැහැයි කියපු අය - මේකේ ඔක්කොම යෝජනා මාලාව තිබෙනවා. මෙම යෝජනාව ගෙන ඒම ගැන - මම ජාතිවාදියෙක් නොවෙයි. මොකද මම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ ආණ්ඩුව කාලයේ සුදු නෙළුම, තවලම මුළු ලංකාව වටේම වව්නියාවේ සිට කතරගමට වනතුරුම අරගෙන ගියා. විජය කුමාරතුංග සහෝදරයා එක්ක උතුරේ තිබුණු යුද්ධය කාලයේ සොල්දාදුවෝ නිදහස් කරගන්න උතුරේ කඳවුරුවලට ගිහිල්ලා, ඒ කට්ටිය එක්ක කථා කරලා ඒ යුද්ධය සම්බන්ධව, අපි බලය බෙදීම සම්බන්ධව කථා කරපු අයගෙන් එක්කෙනෙක්. අද තුන්දෙනෙක් මිය ගිහිල්ලා. මමයි, ෆීලික්ස් පෙරේරායි විතරයි දැනට ඉන්නේ. ඔසී අබේගුණසේකර මිය ගිහිල්ලා. ඒ හිටපු අයගෙන්. එහෙම හිටපු පුද්ගලයෙක් හැටියට තමයි අද මම මේ ප්‍රශ්නයට කථා කරන්නේ. රාජ්‍ය නායකයෝ රාශියක් යටතේ මේ ප්‍රශ්නය

අපි - මම පටන් ගන්න යන්නේ 1815 න්. 1815 ඉඳලා 2005 දක්වා. දීර්ඝ විස්තරයක් තිබෙනවා. කියවන්න බැහැ. මේ ප්‍රශ්නය සම්බන්ධව ගහපු ගිවිසුම්. 1815 උඩරට ගිවිසුම. 1815 ශ්‍රී ලංකා ෆෙඩරල් ක්‍රමය අවශ්‍ය ඇයි? මම හිතන්නේ මේ කිසි කෙනෙක් මෙතැන ඉඳලා මේවා කියවලා දැන ගෙන නොවෙයි මේ කථා කරන්නේ. යුද්ධය ආවා. ගහ ගත්තා. එල්.ටී.ටී.ඊ. ය හැදුණා. වෙඩි තියා ගත්තා. එහේ ජේ.ආර්.ගේ ආණ්ඩුව කාලයේ වෙනම පළාත් සභාවක් පිහිටුවන්න, වෙනම හමුදාවක් පිහිටුවන්න ගිහිල්ලා ඒකෙන් හිටපු මහ ඇමතිවරයාව තහනම් කළා. මේ ටික තමයි. මේ ලෙඩේ ලංකාවට ගෙනාවේ සුද්දෝ තමයි. පෘතුගීසි, ලන්දේසි, ඕලන්ද, ඉංග්‍රීසින් ගෙනැල්ලා දාපු මේ විෂබීජය. බලන්න ඒ කාලේ පත් කළා මේකට. කවුද පත් කළේ? පත් කළා පළමුවැනි ආණ්ඩුකාරතුමා. පළමුවැනි ආණ්ඩුකාර ධුරය හෙබවූ සර් රොබට් බ්‍රවුන්රිග්. අපි අහලා තිබෙනවා ඉස්කෝලේ යන කාලයේ. බ්‍රවුන්රිග් ආණ්ඩුකාරතුමා. මේ අපේ නීතිඥ මහත්තයා මේ ගැන හොඳට දන්නවා. අපි ඉස්කෝලේ යන කාලේ මේවා ඇහුවා. නමුත් අපි මේවා කියවලා තිබුණේ නැහැ. දේශපාලනයට ආවාට පස්සේ තමයි අපට මේවා කියවන්න සිද්ධ වුණේ.

දැන් බලන්න ගිවිසුම් ගණනාවක් ගැහුවා. 1815 ඉඳලා සුද්දා ගෙනැත් දාපු විෂ බීජය, එදා ඉඳලා ගහලා ගහලා ඇවිල්ලා - ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, ජේ.ආර්. ජයවර්ධනට ආවා. ජේ.ආර්. ජයවර්ධනට එන කොට මේ ප්‍රශ්නය මහා බැරෑරුම් තත්ත්වයට පැන නැගිලා තිබුණා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ ජේ.ආර්. ජයවර්ධන මහත්තයා උතුරට ගිහිල්ලා උතුරේ ජනතාවට සියලුම මැතිවරණ වේදිකාවල කිව්වා, උතුරේ දෙමළ භාෂාව කථා කරන මිනිස්සුන්ට යම් පාලන බලයක් දෙනවාය කියලා. බණ්ඩාරනායක මැතිනියව පැරැද්දුවොත්. මහේෂ් අලේමේදා ගරු මන්ත්‍රීතුමා මේ ගැන ටිකක් කිව්වා. බණ්ඩාරනායක මැතිතුමා මේක දැක්ක නිසා මේ ප්‍රශ්නය දිහා දැකලා මෙතුමා එදා තිබුණු පාර්ලිමේන්තුවේ සහ පත්තරයකට ලියලා ලෝකයේ රටවල්වල තිබෙන ෆෙඩරල් ක්‍රමය ගැන කිව්වා. එතකොට ඒ ෆෙඩරල් ක්‍රමය තිබෙන රටවල් දිහා බැලුවාම ඒකේ තියෙනවා - මුළු රටටම බලපාන කරුණු සාකච්ඡා කිරීම සඳහා මන්ත්‍රණ සභා එකක් හෝ දෙකක් හෝ ඔවුන්ට ඇත. ඇමරිකා එක්සත් ජනපදය. ඒ වාගේම තිබෙනවා ඔස්ට්‍රේලියාව. ඊට පස්සේ තිබෙනවා දකුණු අප්‍රිකාව. ඊට පස්සේ තිබෙනවා ස්විස්ටර්ලන්තය. අන්න දැන් මේ ලෝකයේ ක්‍රමය දිහා බලලා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එදා බණ්ඩාරනායක මහත්තයා ගෙනාපු යෝජනාවත් එක්ක සම්බන්ධ කරලා ගෙනාවා, මේ අය ඉන්දියාවත් එක්ක කථා කරලා ගෙනාවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය. මේගොල්ලන්ට බලය බෙදන්න කියලා. උඹලා තුවක්කු ගත්ත අය මේකෙන් නතර වෙයල්ලා. උතුරේ දෙමළ භාෂාව කථා කරන මිනිස්සුන්ට මේ ප්‍රශ්නය විසඳලා දෙන්න තිබුණා. දැන් උතුරේ ජනතාව සම්බන්ධව කථා කරන කොට ඒ දෙමළ භාෂාව සම්බන්ධව කථා කරපු මිනිස්සු, ඒ උතුරේ තුවක්කු ගත්ත මිනිස්සු - මම කනගාටු වෙනවා අපේ සුළු ජාතීන් නියෝජනය කරන අපේ දෙමළ ජාතික ගරු මන්ත්‍රීතුමා මෙතැන නැති වීම ගැන. අපේ කොළඹ සහ කන්ද උඩරට ඉන්න සුළු ජාතීන්. අපේ ඉන්දියානුවන් 5% ක් ඉන්නවා. සුළු ජාතීන්. එතකොට වතුකරයේ සුළු ජාතීන්. කොළඹ ජීවත් වන අපි. අපේ මහරගම මේ නාරාහේන්පිටින් මෙහාට කොළඹ නගරයට ආවොත් 5% ක් සුළු ජාතීන්. ඒගොල්ලන් උතුරට සම්බන්ධ නැහැ. උතුරේ දෙමළ භාෂාව කථා කරන අය නොවෙයි ඒගොල්ලෝ. ඒගොල්ලෝ ඉන්දියන් භාෂාව එක්ක එකතු වුණු, ඒ විවාහ කර ගත්ත අය. දෙමළ භාෂාවක් ඒගොල්ලන්ගේ තිබෙන්නේ.

ඊට පස්සේ නැගෙනහිර එදා හිටපු මුස්ලිම් නායකයන්. එතකොට උතුරු - නැගෙනහිර ඒකාබද්ධ කරන්නය කියලා ඉන්දියන් ගිවිසුමත් එක්ක ගැහුවාම ඒකට විරුද්ධව උසාවියට ගිහිල්ලා, ඒක අයින් කරලා උතුරු - නැගෙනහිර වෙන් කළා. එතකොට උතුරු - නැගෙනහිර වෙන් කළාම ඒ උතුරු නැගෙනහිර අයින් කරන යෝජනා අනුව ඊට පස්සේ මේකේ සාම ගිවිසුම් රාශියක් ඇති කර ගත්තා. එතකොට මේ සාම ගිවිසුම් ඇති කර ගෙන තිබෙන ආකාරයට අද බලන්න. ඉස්සෙල්ලාම ආර්. ප්‍රේමදාස මැතිතුමා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගෙන් පස්සේ යුද්ධයෙන් මෙම අර්බුදය නිමා කර ගන්න බැරි වුණා. ඊට පස්සේ ප්‍රේමදාස මැතිතුමා ඉන්දියාවෙන් ගෙනාපු හමුදාව ඉවත් කරලා ඒකට අපි විසඳුමක් දෙනවාය කියලා කිව්වාම ප්‍රේමදාස මැතිතුමාව මරලා දැම්මා. ඊළඟට චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ඇවිල්ලා අර මම කලින් කිව්වා වාගේ සුදු නෙළුම, තවලම කියලා ගෙනැල්ලා ඒක ජපානයේ සාකච්ඡා කරලා, ඉන්දියාවේ සාකච්ඡා කරලා, මංගල සමරවීර මැතිතුමා සමඟ එකතු වෙලා විශාල පහනක් අනුරාධපුර, වව්නියාව බෝඩරයේ පත්තු කරලා මේක සාමය කියලා පෙන්නුවා. එල්.ටී.ටී.ඊ. සංවිධානය

[ගරු උපාලි කොඩිකාර ]

ඉවර කළාද? නැහැ. එයිටත් වඩා එන්න එන්න එල්.ටී.ටී.ඊ. සංවිධානය ලෝකයේ තිබුණු හොඳම ආයුධ භාවිතා කරන්න හොඳම යුධ පුහුණුව අරගෙන අපේ සිංහල බෞද්ධ මිනිස්සු විතරක් නොවෙයි. මුස්ලිම් මිනිස්සුන්ට, වතුකරයේ දෙමළ මිනිස්සුන්ට සුළු ජාති දෙමළ මිනිස්සුන්ට සියලුම අයට ගැහුවා. එතකොට නිශාන්ත වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා මේ අර්බුදය තේරුම් අරන් නැහැ. මේ කථා කරපු සියලුම දෙනා තේරුම් අරන් නැහැ. ඇයි අපේ සුළු ජාතීන්. අපේ සුළු ජාතීන්, දෙමළ ජාතීන් වෙනුවෙන් කවුද කථා කරන්නේ. මනෝ ගනේෂන් ගරු මන්ත්‍රීතුමා මෙහේ හිටියා සුළු ජාතීන්ගේ නායකයා කියලා. වතුකරයේ හිටියා තොණ්ඩමන් මහත්තයා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ මිනිස්සුන්ගේ ප්‍රශ්න කථා කරනවාද? නැහැ. තව කැරැල්ලක් එනවා. අනිවාර්යයෙන්ම මේ විග්නේෂ්වරන් ගෙනාපු යෝජනාව දාපු ගමන් වතුකරයේ කන්ද උඩරටින් එනවා ඊළඟ ප්‍රාන්තය, ඒ කියන වෙනම ෆෙඩරල් එක ඉල්ලලා. ඊළඟ ෆෙඩරල් එක එනවා නැගෙනහිරට. මුස්ලිම් ජනතාව අයි.එස්. එකත් එක්ක එකතු වෙලා ඊළඟට අපට වැඩේ දෙනවා. මේක තමයි සත්‍ය. අපේ රටට ඊළඟට වෙන දේ. ඊළඟ පරම්පරාවට වෙන දේ. මේක තමයි වෙන්නේ. අද බලන්න ඇමරිකාව. ඇමරිකාව ගහනවා ඇෆ්ගනිස්ථානයට. ඇමරිකාව ගහනවා අනෙකුත් මුස්ලිම් රටවල්වලට. ඒගොල්ලන්ට බෝඩර් එකක් නැහැ. සෙන්ටර් එකක් නැහැ. ළඟ ඉඳන් ගහන්නේ. ලංකාව තමයි බිලි ගහන්න තැන.

ඒ නිසා තමයි ඒ විග්නේෂ්වරන් උන්නැහේ ෆෙඩරල් එක ගේන්න එහෙට දාන්නේ. මේක විග්නේෂ්වරන්ගේ ඕනෑකමට නොවෙයි. මේක රනිල් වික්‍රමසිංහ ඇමරිකාවත් එක්ක ජිනීවා මානව අයිතිවාසිකම් එක්ක අර ඔබතුමා කිව්වා වාගේ යුරෝපා රටවල්වල 37% ක් ජීවත් වන දෙමළ මිනිස්සුන්ගේ අයිතිවාසිකම් දිනලා, වෙනම රටක් ඒගොල්ලන්ට හදලා දෙන්න මිලියන 20 ක් ලෝකයේ ඉන්න දෙමළ ජනතාවට, ඉන්දියාවේවත් කැල්ලක් නැති මිනිස්සුන්ට, මැලේසියාවේ කැල්ලක් නැති මිනිස්සුන්ට දෙන්න යන කුමන්ත්‍රණය තමයි මේක. මේකේ ගිවිසුම ගැහුවේ කවුද? කවුද ගැහුවේ? මෙන්න ඉන්නවා මිනිස්සු දෙන්නා. කවුද මේ මිනිස්සු දෙන්නා. මේ ගිවිසුමේ තිබෙනවා. මොකක්ද තිබෙන්නේ? රනිල් වික්‍රමසිංහත්, මෛත්‍රීපාල සිරිසේනත් ගැහුවා. මොකක්ද? දින 100 න් වැඩ 100 යි කියලා. මහින්ද රාජපක්ෂ 2015 ගහපු ගිවිසුම් ඔක්කොම දිහා බලලා, පාර්ලිමේන්තුවේදී කිව්වා මෙන්න මහින්ද රාජපක්ෂගේ ප්‍රකාශය. මේකේ තිබෙනවා. සර්ව පාක්ෂික නියෝජිත සමුළුව පත් කළා. පත් කරලා මහින්ද රාජපක්ෂ කිව්වා. මොනවාද? නොබෙදුණු රටක්. බහුතර සම්මුතියෙන් අපි රටක් නිර්මාණය කරන්න සියලුම ජාතීන්ට එක හා සමානව ජීවත් වෙන්න පුළුවන් නිර්මාණය කරන්න රාජපක්ෂ මැතිතුමා ගහලා තමයි යුද්ධය අවසන් කරලා, එල්.ටී.ටී.ඊ. ය පරාජය කරලා ඒ පැත්ත සංවර්ධනය කරලා මේ බලය බෙදන්න යන කොට තමයි මේ දෙන්නා එක්කහු වෙලා ආණ්ඩුව පැරැද්දුවේ. උඹලාට වෙනම රාජ්‍යයක් දෙනවා. ඒ ප්‍රශ්නය එළි කරපු එක්සත් ජාතික පක්ෂයේ හිටපු මහා ලේකම් තිස්ස අත්තනායක මැතිතුමා. (බාධා කිරීම්) දැම්මා කූඩුවට. දැන් තිස්ස අත්තනායක නඩුවක් දාන්න ඕනෑ රනිල් වික්‍රමසිංහටයි, මෛත්‍රීපාල සිරිසේනටයි, විග්නේෂ්වරන්ටයි විරුද්ධව. මේ ගිවිසුමට මාව කූඩුවට දැම්මේ ඇයි?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය අපි මෙහෙම කථා කළා. මෙතුමා කිව්වා වාගේ. මේක ගිනි තියන්න ආයිත් පුළුවන්කමක් නැහැ. තරුණ මන්ත්‍රීවරුත් ඉන්නවා. මධ්‍යම වයසේ කට්ටියත් ඉන්නවා. අපේ දරුවන්ට රටක්. 1815 අර ගහපු ගිවිසුම එක්ක. එතකොට බලන්න එළාර දුටුගැමුණු යුද්ධය. ඇයි ආවේ? එහෙම නම් මේක එදා ඉඳලා තිබුණේ සුද්දා ගෙනාපු විෂබීජය මේ. ඒ සුද්දාගේ විෂබීජය ඉවර කරන්න තමයි මේ ගිවිසුම් අද මේ කෝට්කාරයාත්, මේ නැෂනල්කාරයාත් ගහලා තිබෙන්නේ. ඒකට හවුල් තියපු, ඒකට පක්කිලි සර්විස් ගහපු මෙතුමාගේ නායකයා චම්පික රණවක. මේ චම්පික රණවකගේ ගෝලයා අද ගේනවා නැවත බෙදුම්වාදයට විරුද්ධ වෙලා. එහෙම ෆෙඩරල් රාජ්‍යයක් දෙන්න බැහැ කියලා. අපි කියන්නේත් දෙන්න බැහැ. අපට සියලුම ජාතීන්ට එකතු වෙලා එකට ජීවත් වෙන්න පුළුවන් රටක් ඕනෑ. ඒකට අපි පක්ෂයි. නමුත් මේගොල්ලෝ අරහෙම කියපු රාජපක්ෂ මැතිතුමාව පරාජය කරන්න ඕනෑ නිසා, මේ රට බෙදන්න නොදෙන නිසා, බෙදන අයට උදව් නොකර නිසා මේගොල්ලෝ ගැහුවා. මේ කෝට්කාරයායි, නැෂනල්කාරයයි. මේක තමයි ඇත්ත. දැන් එහෙම නම් මෙතැනින් අප මොකක්ද කරන්න ඕනෑ. මෙතැනින් මේ නැවත මේ ගහන විග්නේෂවරන්ගේ යෝජනා ගැන කථා කරන එක නොවෙයි යුතුකම. විග්නේෂ්වරන්ගේ පස්සේ ඉන්න මිනිස්සු කවුද? ඩයස් පෝරාව? ඊළම ගැන කථා කරන මිනිස්සු. සුළු ජාතික පක්ෂ ටික කථා කරන

ඒගොල්ලන්ගේ පළාත්වල ඉන්න අපේ කුලභේදය වාගේම එහෙත් කුලභේදය අනුව ඉන්න ඒ නායකයෝ. මේගොල්ලෝ එක්කහු කරන්න ඕනෑ. (බාධා කිරීමක්)

විග්නේෂ්වරන් මේ යෝජනා ගෙනාවාය, ෆෙඩරල් දුන්නා, නැත්නම් ෆෙඩරල් එක වෙනම පළාතක් හැදුනාය. දැන් ෆෙඩරල් දෙන්න දෙයක් නැහැ. රාජසිංහ රජතුමාගේ කාලයේත් තිබුණා. ඒ කාලේ හිටියේ කවුද? මේ පළාත් අලුත් දෙයක්ද? මුහන්දිරම්. ඇහැලේපොළ මුහන්දිරම්. පළමුවැනි අදිකාරම් සහ කෝරළේ දිසාව. (බාධා කිරීම්) දැන් කෝරලේ දිසාවේ -

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බලන්න මේ 1815 මම කිව්ව අර සුද්දා පත් කරපු ආණ්ඩුකාරවරයාගේ කාලයේ තිබුණු දිසාවල් බලන්න. දැන් මේකේ තිබෙනවා පළමු අදිකාරම් සහ කෝරළගේ දිසාව. මොල්ලිගොඩ වලව්ව. දෙවැනි අදිකාරම් සහ සබරගමුවේ දිසාව පිළිමතලාව. මේ වාගේ දිසා 16 ක් එදා තිබිලා තිබෙනවා. අද 09 යි තිබෙන්නේ. අද තිබෙන්නේ මොනවාද? පළාත් 09 යි. එදා දිසා 16 ක්. කවුද බෙදුවේ? සුද්දා. සුද්දා බෙදුවා දිසා 16 ක්. එතකොට සුද්දා බෙදපු දිසා 16 ක්. එතකොට තිබුණේ නැහැ මුස්ලිම් පළාතක්. එතකොට තිබුණේ නැහැ උතුරේ දෙමළ පළාතක්. එහෙම තිබුණේ නැහැ. ආණ්ඩුකාරවරයා යටතේ දිසා භාර - මේ දැන් මහ ඇමතිවරු ඉන්නේ. අර පොලීසියේ නියෝජ්‍ය පොලිස්පතිවරු ඉන්නේ. ඒ වාගේ තමයි. ඒ වාගේ පළාත්. එතකොට දැන් එහෙම නම් අපි මේ යෝජනාවට - අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා මේ යෝජනා දෙන්න ඕනෑ, චම්පික රණවක හරහා පාර්ලිමේන්තුවට. අද මේක සම්මත වුණත් සංශෝධන සහිතව මේ හැන්සාඩ් එක යවන්න. මෙතුමාගේ යෝජනාව අපි මෙතැනින් අනුමත කරන කොට මෙතුමාගේ නායකයා මේක පාර්ලිමේන්තුවට ගේන්න ඕනෑ. ගේන්නේ නැහැ. ලියලා තියා ගන්න. මාධ්‍යවල හෙඩ් ලයින් දාන්න. චම්පික රණවක මේක ගේන්නේ නැහැ. ඇයි භයයි. කාටද භය? චම්පික රණවකගේ ඇමතිකම ගලවනවා මෙයා. නැෂනල් කෝට් අය. එතකොට මෙතුමා බලනවා - එක්සත් පෙරමුණ කඩා ගෙන යනවා. කඩා ගෙන යන කොට මේක චම්පිකට නැති වෙනවා. එතකොට චම්පිකගේ නැති වෙනවා මෙගා පොලිස් එක. මෙගා පොලිස්. (බාධා කිරීම්) දැන් මෙතුමාට වුණු එකේ අනික් එක වෙනවා. මෙතුමා කෑ ගහලා, බොරු කියලා කියලා රාජපක්ෂව පරාජය කරලා, මෛත්‍රීපාලව ගෙනැල්ලා, මෙතුමා අපේ සන්ධානයේ ඉඳලා, යූ.එන්.පී. එකෙන් ඡන්දය ඉල්ලලා, ආයිත් මේකේ ඇමති වෙලා, අපි විශ්වාස භාංගයක් ගෙනැල්ලා පරාජය වුණා වාගේ අරයාටත් වෙනවා ඔය ටික. ඔන්න වෙන දේ? ඒ නිසා මම බොහොම ස්තුතිවන්ත වෙනවා. දැන්වත් පොඩ්ඩක් මොළේ පෑදිලා, ඒ ගැන තේරුම් අරන් මේ යෝජනාව පළාත් සභාවට ගෙන ඒම ගැන. මගේ කාලය ඉවරයි. තව ගොඩක් කරුණු තිබෙනවා. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. 1815 ඉඳලා මේ රටේ ගහපු ගිවිසුම් ටික සම්මන්ත්‍රණයක් තියලා ඉස්සෙල්ලාම බලය බෙදන්න කථා කරන අපේ මහාචාර්ය, ආචාර්යවරුන් ඉස්සෙල්ලා මේ පොත් ටික කියවලා රජ කාලේ ඉඳලා මේ රට පාලනය කරපු පෘතුගීසීන්, ඉංග්‍රීසීන්, ඕලන්දය, ලන්දේසි. මේ ටික තේරුම් කරලා දීලා බලය බෙදීම ගැන කථා කරන්න කටයුතු කරන්න කියලා ඉල්ලනවා.

දැන් බලන්න. ඩඩ්ලි චෙල්වනායගම් ගිවිසුම. ගැහුවා වඩුක්කෝඩේ ගිවිසුම. අපි මේ ඉස්කෝලේ යන කාලයේ ළපටි කොල්ලෝ. පොඩි පැටව්. මොන්ටිසෝරි. තවමත් යනවා. මේක බෙදා ගන්න බැරිව. තවම විසඳගන්න බැහැ. අපි ඉපදිලත් නැහැ. එතකොට 1972 බණ්ඩාරනායක මැතිනිය ගැහුවා ජනරජ ව්‍යවස්ථා ගිවිසුම. ඊට පස්සේ කන්ද උඩරට අපේ දෙමළ වතුවලට ගැහුවා සිරිමා ශාස්ත්‍රී ගිවිසුම. තවමත් යනවාද? තවමත් දෙමළ කට්ටිය අර වතුවල ඉන්නවා. කිව්ව දේ, සියයට පනහට පනහ වුණාද? නැහැ. ඒ නිසා අපි මේ රටේ සිංහල, මුස්ලිම්, දෙමළ ඇයි මේ කථා කරන්නේ නැත්තේ කතෝලික මිනිහා ගැන. ක්‍රිස්තියානි අය ගැන. එහෙම නම් ඒ අයටත් අයිතියක් තිබෙනවානේ මේකෙන් කොටසක් ඉල්ලන්න. මුස්ලිම් මන්ත්‍රීවරු ඇයි කථා කරන්නේ නැත්තේ ඒගොල්ලන්ගේ අයිතිය ගැන. අපි මේ කුලවාදී දෙමළ කණ්ඩයාමක් ගැන තමයි අපි මේ කථා කරන්නේ. ඒ පළාත්වල සුළු ජාති කුලයේ මිනිස්සුන්ව යට කර ගෙන බලය බෙදා ගන්න හිටපු නායකයෝ තමයි ඔක්කොම දෙමළ ජනතාව මූලා කර ගෙන ඇවිල්ලා තිබෙන්නේ. ඉස්සර අපේ ගමේ ගම්මුලාදෑනියා පත් කරනවා වාගේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon.Presiding Member

ගරු මන්ත්‍රීතුමා, අදහස් දැක්වීමට තවත් මන්ත්‍රීවරු ගණනාවක් ඉන්නවා. ඒ නිසා -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

බොහොම ස්තුතියි කාලය ලබා දීම සම්බන්ධව. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. මොළේ පොඩ්ඩක් පෑදිලා ලියලා තියා ගන්න. නැවත මෙතුමා ඡන්දය ඉල්ලන්නේ, මහින්ද රාජපක්ෂ හදන එක්සේසත් කරන රටේ අපේක්ෂකයෙක් හැටියට කියලත් ලියලා තියා ගන්න. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon.Presiding Member

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [ලලිත් එල්ලාවල මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. Lalith Ellawala M.P.C] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ගරු ලලිත් වර්ණකුමාර මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. අද දිනයේ රීති අත්හිටුවලා ගෙනාපු යෝජනාව ගැන කථා කරන්න ලැබීම වාගේම මම විශ්වාස කරනවා, ඇත්තටම අපි මෙවැනි යෝජනාවක් පළාත් සභාව තුළින් ගෙන ආ යුතුද කියලා. මොකද, අපි මහජන නියෝජිතයෝ හැටියට ජනතා පරමාධිපත්‍යයෙන් තේරී පත් වෙලා අපි රටේ නායක අතිගරු ජනාධිපතිතුමා ඉස්සරහා දිවුරුම් දෙනවා. මේ රටේ ආණ්ඩුවට කවදාවත් පෙරළන්න, ඒකට හානියක් වන වැඩ පිළිවෙළවල් අපි වක්‍රවත්, ඍජුවවත් කරන්නේ නැහැයි කියලා. එහෙම නැත්නම් රට තුළවත්, රටෙන් පිටතවත් අපි මේ ආණ්ඩුවට විරුද්ධ වැඩ පිළිවෙළක් කිසි දිනක කරන්නේ නැහැයි කියලා පොරොන්දු දෙනවා. ඒ පොරොන්දුත් එක්ක තමයි අපි මේ මහජන නියෝජිතයන් හැටියට ඉන්නේ. ඉතින් මම හිතන්නේ උතුරු පළාත් සභා මන්ත්‍රීතුමන්ලාත්, ඒ මහ ඇමතිතුමන්ලාත් ඒ පොරොන්දුවම වෙලා තිබෙනවා. එහෙම නම් මේ පළාත් සභාවේ ඒගොල්ලන් ගෙනෙන රට වෙනස් කරන්න, මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ වෙනස් කරන්න යෝජනා එළිපිටම ගෙනෙන කොට ඒකට තීන්දු තීරණ ගත යුත්තේ අපේ රජය, අපේ රජයේ නායකයෝ කියන එකයි මම දකින්නේ. මොකද, ඒක කොටසක් ගෙනාවාම එක ක්‍රමයකුත්, තව කොටසක් ගෙනාවාම ඒකට වෙන වැඩ පිළිවෙළකුත් ගෙනියනවා නම් ඒක මම හිතන්නේ සාර්ථක නැහැ. නමුත් ඇත්තටම අද කථා කරපු වැඩ පිළිවෙළ තුළ විශේෂයෙන්ම මේ කාරණාව පිළිබඳව එක එක්කෙනා එක එක විධියට අදහස් හුවමාරු කළා. විශේෂයෙන්ම අපේ හිටපු අමාත්‍යතුමා. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ මැතිතුමා. එතුමා මේ යෝජනාව ගෙනෙන කොට අපි මේ යෝජනාව ගැන 2015 ජනවාරි 08 වැනිදාටත් ඉස්සෙල්ලා කථා කළා. අපි කිව්වා, මේ වැඩ පිළිවෙළ තුළ ඇයි මේ ඒකීය කියන කොටස මේකට ඇතුළත් කරන්න බැරි. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඒකීය රාජ්‍යයක් හැටියට සඳහන් කරන කොට වෙනත් පාර්ශවවල ප්‍රතිපත්ති ප්‍රකාශනවල මේ ඒකීය කියන කොටස ඇතුළත් කරන්න පසුබට වුණේ ඇයි කියන එක අපි ඇහුවා. අපි එදා කියපු දේ තමයි අද වෙන්නේ. එදා ඒ දේට සහයෝගය දීලා, ඒ තිබුණු රජය පෙරළන්න, හිටපු ජනාධිපතිතුමාව ගෙදර යවන්න සහයෝගය දීපු ඒ පක්ෂයේම අය තමයි අද ඇත්තටම මෙවැනි යෝජනා ගෙනැල්ලා තිබෙන්නේ. එහෙම නම් අපි එදා දැකපු දේ අද ඒ අය කියන එක ගැන, අද අපි ඇත්තටම සන්තෝෂ වෙනවා. පහුවෙලා හරි ඒ බුද්ධිය පෑදුනා නම්, පහුවෙලා හරි ඒ ගැන හිතනවා නම්, රටක් හැටියට හිතනවා නම් ඒ ගැන අපි ඇත්තටම ආඩම්බර වෙනවා.

ඒ වාගේම මෙතැන නොයෙක් අය කිව්වා, 2005 දී මහින්ද මහත්තයා සල්ලි දීලයි ගත්තේ කියලා. එහෙම නම් එතුමා දරුණු ලෙස යුද්ධයක් තිබෙන කාලයේ ගුවනින් යන්න පුළුවන්, වතුරෙන් යන්න පුළුවන්, ගොඩ බිමෙන් යන්න පුළුවන් ත්‍රස්තවාදීන් ඒ තරම් ශක්තිමත්ව ඉන්න කාලයේ සල්ලි දීලා හරි ඒ ආණ්ඩුවක් ගත්තා සුළු ඡන්ද ප්‍රමාණයකින් හරි. හැබැයි, ඊට ඉස්සෙල්ලාත් ජනාධිපතිවරු කිහිප දෙනෙක් යුද්ධය කළා. ඒ යුද්ධය කරපු සමහර ජනාධිපතිවරුන්ගෙනුත් අපි අහලා තිබෙනවා, ආයුධ දීපු අය ඉන්නවා. සල්ලි දීපු අය ඉන්නවා. එහෙම දීලත් යුද්ධය නිමා කළේ නැහැයි කියන එක අපි කවුරුත් දන්නවා. නමුත් මහින්ද රාජපක්ෂ මැතිතුමා 2005 දී එතුමාගේ සම්ප්‍රාප්තියත්

එක්ක සල්ලි දීලා හරි අරගෙන උන්ව නැති හංගස්ථාන කරපු එක ගැන අපි ආඩම්බර වෙන්න ඕනෑ. ගොඩක් අය කියනවා එපමණ දුන්නා. මෙපමණ දුන්නා කියලා. දීලා අද වන කල් ඒක තිබුණා නම් තමයි ඒකේ වරද තිබෙන්නේ. දීලා ඒක බොහොම අවුරුදු පහකට දීපු කාලය තුළ, අවුරුදු තුනක් වාගේ කෙටි කාලයකින් එතුමා ඒක සම්පූර්ණයෙන්ම සුද්ධ කරලා දුන්නා. ඒ දුන්නා විතරක් කියන්නේ, සමහර රටවල ත්‍රස්තවාදය නිමා වුනාම අපි දකිනවා මාසයකට දෙතුන් වතාවක් කාර් බෝම්බ කියයි. පෙට්‍රල් බෝම්බ කියයි. කොහේ හරි බෝම්බයක් පත්තු වෙනවා. නමුත් 2005 ඉඳලා මේ මොහොත වන කල් තවම මම හිතන්නේ, සමහර විට මේ ඊයේ පෙරෙයිදා මොනවා හරි බෝම්බ අහු වුණාට පත්තු වුණේ නැහැ. එතුමාගේ වැඩ පිළිවෙළ තුළ. එහෙම ආපු රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය එහාට ගිහින් මේ ජනතාවට, සෑම ජාතිකයෙකුටම සමානව සලකන්න ඕනෑය කියලා අවුරුදු ගණනක් නොතිබුණු පළාත් සභාව උතුරට දුන්නා. සමහර අය අද කියන්නේ, ඒක දුන්න එකත් වැරදියි කියලා. මේ අය මම දන්නේ නැහැ කොයි පැතිවල ඉඳන් කථා කරනවාද කියලා. ඒ අයට ප්‍රජාතන්ත්‍රවාදය ඒ රට තුළ ක්‍රියාත්මක කිරීම නිසා ඒ අයිතීන් සමානව දුන්නා. නමුත් එතුමාගේ පාලන කාලය තුළ ඒ පළාත් සභාව කවදාවත් මෙවැනි යෝජනා ගෙන ආවේ නැහැ. මේ ජනවාරි 08 වැනිදා පහු වෙන කල් ඒ හිටපු මහ ඇමතිතුමාම තමයි එදා හිටියේ. ඒ අය එහෙම යෝජනා ගෙනාවේ නැහැ. එහෙම ගේන්න දෙන්නෙත් නැහැ. මම දන්නවා ගෙනාවා නම්, එතැනම ඒක ඒ නොගැනෙන තැනට, ගේන්නේ නැති තැනට ඒගොල්ලෝ හිටියේ. ඒ නිසා 2015 ජනවාරි 08 වැනිදායින් පස්සේ මම හිතන්නේ, ඒ තිබුණු භයිය, ඒ තිබුණු භය සැක, එහෙම නැත්නම් තමන්ට ඒ නව රජයක්, නව ජනාධිපතිවරු පත් කර ගන්න උදව් කරපු ඒවායේ ප්‍රතිඵල හැටියට තමයි, තමන්ට ඕනෑ දේවල් විය යුතුයි කියන අදහස තුළ ඒ අය ඉන්නේ.

අපි දැක්කා, මේ මෑත දවසක කියනවා. දෙමළ ජනතාවට ඒ සාධාරණය නොවුණොත් නැවතත් ආයුධ අතට ගන්නවා. ඒ වාගේම එල්.ටී.ටී.ඊ. නායක ප්‍රභාකරන් කරපු කාර්යය හරි. අසාධාරණයක් වුණු නිසා එහෙම කළේ කියන තැනට අද ඒ අය පත් වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ 2015 ජනවාරිවලින් පස්සේ තමයි විශේෂයෙන්ම මේ කාරණාව තුළ වැඩි කොටසක් හැටියට මෙවැනි අර්බුදවලට මුහුණ දෙන්න වුණේ. මොකද, ඊට ඉස්සෙල්ලා අපි දැක්කා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ මුස්ලිම් ජනතාවට කරන්න පුළුවන් උපරිම සේවය - සමහර වෙලාවට නැගෙනහිර පළාතේ ගියාම අපට හිතුනා අපේ පැතිවලට මොනවාද කරලා තිබෙන්නේ කියලා. ඒ පැතිවල නගර මහා අලුතෙන්ම හදලා, අලංකාරව හදලා ඒ පහසුකම් කොපමණ දීලා තිබෙනවාද? උතුර බේරා ගත්තාට පස්සේ උතුරේ අපි මුලම ගියා. යුද්ධය ඉවර වුණ ගමන්. ඊට පස්සේ නැවත මාස හය හතක් යන කොට ඒ මංමාවත්වල දියුණුව අපි දැක්කා. එහෙම සාධාරණය කරලා තිබුණා, එතුමා. එතුමා ඒ යුද්ධය ඉවර කරලා යන වැඩ පිළිවෙළ තුළ තමයි මේ රට වෙනස් වුණාම, ඒ අයගේ බලාපොරොත්තු, ඒ අයගේ ඉල්ලීම් දිනා ගෙන යන වැඩ පිළිවෙළක් හැටියටයි මම දකින්නේ. ඒ ඉල්ලීම් දිනා ගෙන යන කොට උපාලි කොඩිකාර අපේ හිටපු ඇමතිතුමා කිව්වා වාගේ තිස්ස අත්තනායක මහත්තයා අපේ පැත්තට ඇවිල්ලා එතුමා කිව්වා, මෙන්න මෙහෙම ගිවිසුම් තිබෙනවා. ඒ පක්ෂයේ එතැන ඉඳලා අන්තිම මොහොතේ ආවේ. නාම යෝජනා දවස්වලම. එතුමා කිව්වා මෙන්න මෙහෙම දේවල් තිබෙනවා. මෙන්න මෙහෙම වෙනවා. මෙන්න මෙහෙම එකඟතාවයන් තිබෙනවාය කියලා. එදා කවුරුවත් පිළිගත්තේ නැහැ. අපි කිව්වාට කවුරුවත් පිළිගත්තේ නැහැ. ඊට පස්සේ එතුමා ටික කාලයකින් ආණ්ඩුව ආවාට පස්සේ බන්ධනාගාරගත කරලා නඩුවක් දුන්නා. නමුත් නඩුවක් ලබා දුන්නාට, බන්ධනාගාරගත වුණාට අද එතුමා කියපු දේවල් තමයි මේ සිද්ධ වෙන්නේ. එහෙම නම් එතැන අපට අද ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, එතුමා කියපු දේවල් බොරුයි කියන්න බැහැ නේ? අද පොළොවේ ප්‍රායෝගිකව සිද්ධ වෙනවා. එහෙම පොරොන්දු මොනවා හරි තිබෙනවා. ඒ පොරොන්දු තමයි යන්නේ.

හැබැයි, මට කනගාටුයි. අපේ සමහර එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා මේක හරවන්න හැදුවා ඒකාබද්ධ විපක්ෂයට මාතෘකාවක් නැතිව මේ ගත්ත එකක් කියලා. මෙහෙන් තමයි ඒක යැව්වේ කියලා. මම කියන්නේ එහෙම නොවෙයි. රටක් ගැන හිතන්න. මව්බිම ගැන හිතන්න. පටු දේශපාලන විධියට හිතන්න එපා. අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා අද ඒ පටු දේශපාලනයෙන් මිදිලා මව්බිම ගැන හිතලා තිබෙනවා. අරමුණ, පරමාර්ථය මොකක් වුණත් අපට පෙනෙන දේ එතුමා හිතලා තිබෙනවා. එදා අපි කියපු තැනට අද එතුමා ඇවිල්ලා තිබෙනවා. නමුත් සමහර අය කියනවා අහවලාගේ අහවලා ඉන්නේ. මෙහෙන් යවන ඒවා තමයි එහෙම එන්නේ. එහෙම යැව්වාය කියමුකෝ. මෙහෙන් කුමන්ත්‍රණ හරි

[ ගරු ලලිත් වර්ණකුමාර ]

එහෙට කරන්න කිච්චා නම් රජයක් හැටියට, නායකයෝ හැටියට ඒවා මැඩ පවත්වන්න ඕනෑ. එහෙම නොවෙන්න ඊට වඩා බලයක් දෙන්න පුළුවන් ආණ්ඩුවක් හැටියට මැඩ පවත්වන්න වැඩ කටයුතු කරන්න පුළුවන් කියන එක ඇත්තම අපි දන්නවා. අපි අද මොනවා හරි දෙයක් කථා කළොත් ඇත්තටම ජාතිවාදය කියනවා. නමුත් ජාතිවාදය කියන්නේ - අපි යම්කිසි කෙනෙකුට මොකක් හරි කථා කළොත් ජාතිවාදය කියනවා. නමුත් ඒ අය අපට කරන කෙනෙහිලිකම්. කියන කතන්දර. මේ සියලුම ද්‍රවිඩ ජනතාව නොවෙයි. සියලුම මුස්ලිම් ජනතාව නොවෙයි. සමහර ජනතාව. එතකොට ජාතිවාදයක් නැහැ. එතකොට කිසිම ප්‍රශ්නයක් නැහැ. ඇත්තටම ඒ අපට විතරයි. මේ සිංහල අපට තමයි, මේ දකුණේ අපට තමයි වැඩිම අසාධාරණය වෙලා තිබෙන්නේ අද මේ විධියට බැලුවොත් එහෙම. වැඩිම අසාධාරණය වෙලා තිබෙන්නේ ඇත්තටම අපටයි.

දැන් මේ යෝජනාව. සමහර අය කියනවා අපේ පළාත් සභාවේ යෝජනාවක් ගෙනාවාම ගණන් ගන්න දෙයක් නැහැ. ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මොන අපරාධයක්ද මේ වෙන්නේ. අප විසින්ම මේ පළාත් සභා හැල්ලු කර ගන්නාවා නේ? පළාත් සභාවේ යෝජනාවක් ගෙනාවාම ක්‍රියාත්මක වෙන්නේ නැත්නම්, අපි නොගෙන ඉන්න ඕනෑ. ලැජ්ජා වෙන්න ඕනෑ. හැබැයි, මම කියන්නේ උතුරේ පළාත් සභාව තුළ ගන්න යෝජනා අපේ මේ බස්නාහිර ගන්න යෝජනා වාගේ හිතන්න එපා. අපි හැල්ලු වුණාට ඒගොල්ලන්ගේ ලොකු දුර ගමනක් එක්ක තමයි ඒ යෝජනා ගන්නේ. ලංකාවෙන් විතරක් නොවෙයි. ඉන්දියාවෙන් විතරක් නොවෙයි. ජාත්‍යන්තරයත් එක්ක ගන්න යෝජනාවක් හැටියට තමයි කවදා හරි ඔය යෝජනා පත් වෙන්නේ. අන්න එතැනදී අපට හැමදාමත් උඩ බලාගෙන ඉන්න වෙයි. අපේ අනෙක් පළාත් සභා වාගේ නොසිතා මේක සෙල්ලමකට නැතිව මේ මූලාරම්භයක් වෙන්න පුළුවන්. මේක දුර ගමනක් යන වැඩ පිළිවෙළක් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් මේකේ අන්තිම කෙළවර වෙන්නේ එදා 80 ගණන්වල පූලිය වාගේ පටන් අරගෙන මේ රට නැවතත් මිනීවලවල් ගොඩක්, එකා උඩ එකා මැරිලා වැටෙන වැඩ පිළිවෙළවල්, පාරේ මිනී කපා ගෙන ලේ උතුරලා යන වැඩ පිළිවෙළක් බවට පත් වෙයි මේ කාරණාව හරියට ඉස්සරහාට නොගියොත්. ඒ තුළ මම විශේෂයෙන්ම කියන්නේ පක්ෂ භේද මොනවා තිබුණත්, සියලු ජනතාවට සම අයිතිවාසිකම් දිය යුතුයි. නමුත් ඒකේ එක ක්‍රමයක්, එක ධජයක් යටතේ යන වැඩ පිළිවෙළක් ලෙස ක්‍රියාත්මක විය යුතුයි. සංහිඳියාව තමයි කියලා කියනවා. සංහිඳියාව තිබෙනවා. මොකක්ද? අපේ ජාතික ගීය දෙමළෙන් ගායනා කළා. එතකොට සංහිඳියාව ඒක හරි. ඊළඟට පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකකම දුන්නා, දෙමළ ජනතාවට. ඒ දෙකට ඇරෙන්න වුණු සංහිඳියාවක් කියන්න. ඒ දෙක විතරමයි මේ සංහිඳියාව තුළ ගැබ් වෙලා තිබෙන්නේ. ඊට එහා ගිය සංහිඳියාවක් කොහේද තිබෙන්නේ? එහෙම සංහිඳියක් දෙනවා නම්, එහෙම සංහිඳියාවක් තිබෙනවා නම් මේ වාගේ යෝජනා උතුරෙන් එන්න විධියක් නැහැ නේ? ඒ අයට සම දේවල් දෙනවා නම්, ඒ අයට සම අයිතිවාසිකම් දෙනවා නම් මෙවැනි යෝජනා ගෙනැල්ලා වෙනත් ආණ්ඩු, භාෂාවට අනුව ප්‍රාන්ත වෙන් කරන්න කථා කරන්න ඕනෑ නැහැ නේ? මේ ප්‍රාන්ත මේ විධියට වෙන් කරන්න අවශ්‍ය වෙන එකක් නැහැ. මම හිතන්නේ, මේ යන වැඩ පිළිවෙළත් එක්ක මේ ඉදිරියට එන එක්ටා ගිවිසුම් අනං මනං එක්ක මේක ප්‍රාන්ත දෙකක් හැටියට අපි කඩන්න ඕනෑ නැහැ. එක ප්‍රාන්තයක් හැටියට ඉන්දියාවටම දෙන්න වෙන කාලය මහා දුරක් නැහැයි කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මුලින්ම ස්තූතිවන්ත වෙනවා අද මේ වැදගත් ප්‍රශ්නය අරඹයා නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව සම්බන්ධයෙන් අපට කරුණු කිහිපයක් කියන්න අවස්ථාව ලැබීම පිළිබඳව. අපි විශ්වාස කරනවා අද මේ සාකච්ඡා වන ප්‍රශ්නය, මේ සාකච්ඡා වන කාරණාව මේ රටේ දේශපාලන ඉතිහාසය තුළ ඉතාමත්ම වැදගත් කාරණාවකට නැකම් කියන දෙයක් හැටියට තමයි අපට සලකන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා මේ පිළිබඳව රටක් හැටියට, රටක නියෝජනය කරන උදවිය හැටියට, විශේෂයෙන්ම මහජන නියෝජිතයන් හැටියට වඩාත් වගකීමෙන් යුතුව මේ ප්‍රශ්නය දිහා බලලා කටයුතු කිරීම අපේ යුතුකම වෙනවාය කියලයි අපි විශ්වාස කරන්නේ. ෆෙඩරල් ක්‍රමයක් ඉල්ලීම තුළම, වෙනම ප්‍රාන්ත ආණ්ඩුවක් ඉල්ලීම තුළම ඒක වෙනම රාජ්‍යයක් ඉල්ලනවාය කියන අදහස අපට පිළිගන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. ෆෙඩරල් ක්‍රමයක් කියන්නේ, වෙනම රටක් හැටියට කොහොමවත් පිළිගැනීමක් ඇති වෙන්නේ නැහැ. අපේ රටේ ඒකීය

ආණ්ඩුවක් තිබෙන්නේ. ඒ ආණ්ඩුව තුළ මෙවැනි යෝජනාවක් ගෙන ඒම පමණක් ඒක වෙනම රටක් හැටියට යන්නවත්, ඒක මම නම් විශ්වාස කරන විධියට නීතියේ බාධාවකට හේතු වන කාරණාවක් වෙනවාය කියලා අපට විශ්වාස කරන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඕනෑම කෙනෙකුට මෙවැනි අර්බුදකාරී ප්‍රශ්නයක් පිළිබඳව සාකච්ඡාමය අදහසක් ඇති කරන්න යෝජනාවක් හැටියට ගේන්න තිබෙන අයිතිය අපට වළක්වන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. මම පුද්ගලිකව විශ්වාස කරන්නේ නැහැ. පිළිගන්නේ නැහැ. අපට ෆෙඩරල් ක්‍රමයක් අවශ්‍යයි කියලා. නමුත් එවැනි යෝජනාවක් ගෙන ඒමේ අදහස කාටවත් වළක්වන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. ඒ තුළ මේ පිළිබඳව සාකච්ඡාවකට ඇති වන ඉඩක් තමයි ඇති වෙන්නේ කියන කාරණාව තමයි සඳහන් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම ෆෙඩරල් යෝජනාව අපේ රටට අලුත් දෙයක් වෙන්නේ නැහැ. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත් පැහැදිලි කළා වාගේ 1926 දී බණ්ඩාරනායක මැතිතුමා, අපේ හිටපු අගමැතිතුමා තමයි ඒ යෝජනාව මුලින් ගෙනැල්ලා තිබෙන්නේ. ඊට පස්සේ නැවත දෙමළ අය නොවෙයි. දෙමළ ජනතාව නොවෙයි මේ යෝජනාව ගෙන ආවේ. නැවතත් මේ යෝජනාව ගෙන ආවේ උඩරට ජාතිකයින්. ඒ අය තමයි උඩරට, පහතරට, උතුර වශයෙන් පළාත් තුනකට මේක වෙන් කරන්න ඕනෑය කියන ෆෙඩරල් යෝජනාව ගෙනාවේ. ෆෙඩරල් යෝජනාවක් දෙමළ පක්ෂවලින් ආපු යෝජනාවක් බවට අපේ රටේ ඇති වුණේ නැහැ. අපේ රටේ දෙමළ පක්ෂයක් හැටියට ෆෙඩරල් ප්‍රශ්නය ඇති වුණේ මේ අර්බුදය නිසාම තමයි. 1949 දී වතුකරයේ ජනතාවගේ අයිතීන් වෙනුවෙන් කටයුතු කරන්න සූදානම් නොවුණු අවස්ථාවේ තමයි චෙල්වනායගම් මහත්තයාට සිද්ධ වුණේ ෆෙඩරල් පක්ෂයක් ආරම්භ කරන්න. නමුත් එතුමා 1952 දී මහා මැතිවරණයට ඉදිරිපත් වුණු අවස්ථාවේ යාපනයේ ජනතාවම, උතුරේ ජනතාවම ෆෙඩරල් ක්‍රමය ප්‍රතික්ෂේප කළා. චෙල්වනායගම් මහත්තයා තරඟ කරපු කන්කසන්තුරේ ආසනයෙන් එතුමාව පරාජය කළා. අඩු ගණනේ එදා දෙමළ ජනතාවවත් ෆෙඩරල් ක්‍රමයක් ඕනෑය කියන තැන හිටියේ නැහැ. ඒ යෝජනාව තිබුණේ, අපේ පහත රට මිනිස්සුන් අතරේ. ඉතින් ඒ ආකාරයට තමයි මේ ෆෙඩරල් යෝජනාව ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා මම හිතනවා, මේ ෆෙඩරල් ක්‍රමය ලෝකයේ බොහෝ රටවල්වලත් ක්‍රියාත්මක වෙනවා. ඒ ක්‍රියාත්මක වන රටවල්වල වෙනම රටක් ඒ අයට ලැබිලා නැහැ. ඇමරිකාවේ වෙන්න පුළුවන්. ස්විස්ටර්ලන්තයේ වෙන්න පුළුවන්. එහෙම නැත්නම් දකුණු අප්‍රිකාවේ වෙන්න පුළුවන්. ඉන්දියාවේ අර්ධ ෆෙඩරල් ක්‍රමයක් තිබෙනවා වෙන්න පුළුවන්. ඒ කිසිම රටක ෆෙඩරල් ක්‍රමයක් තිබුණාය කියලා වෙනම රටකට යන්න ඉඩකඩක් තිබිලා නැහැයි කියන කාරණාව විශේෂයෙන්ම සිහිපත් කරන්න වෙනවා. ඒ වාගේම 52 ඡන්දයට පෙර අවස්ථාවලදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටවපු අවස්ථාවේත් ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයත් පෙනී සිටියේ එකම ආසාවක් පිළිබඳ තත්ත්වයක නොවෙයි. 56 දී තමයි එකම ආසාවක්, සිංහල භාෂාවක් විතරක් වන තැනට මේ රට ආවේ.

ඒ අවස්ථාවේ වාමාංශිකයන් හැටියට තමයි එදා පෙන්නුම් කළේ. එක භාෂාවක් ආවොත් රටවල් දෙකක් වෙනවාය. අපට භාෂාවල් දෙකක් හැටියට ඉන්න පුළුවන් නම් එක රටක් හැටියට ඉන්න පුළුවන්ය කියන තත්ත්වය පිළිගන්න සූදානමක් වුණේ නැහැ. භාෂාමය පිළිබඳ අයිතිය හේතු කර ගෙන තමයි තිස් අවුරුදු යුද්ධයක් කරා මේ රට යන්න සිද්ධ වුණේ. අද යුද්ධය අවසන් වෙලා තිබෙනවා. යුද්ධය පරාජය කරන්න පුළුවන් වෙලා තිබෙනවා. ත්‍රස්තවාදය පරාජය කරන්න පුළුවන් වෙලා තිබෙනවා. ඊට පස්සේ උතුරේ පාරවල් හදන්න පුළුවන් වෙලා තිබෙනවා. නැගෙනහිර පාරවල් හදන්න පුළුවන් වෙලා තිබෙනවා. නමුත් මිනිසුන් අතරේ තිබෙන ජාතික සංහිඳියාව ගොඩ නගන්න පුළුවන්කමක් ඇති වෙලා නැහැ. ජාතීන් අතරේ සහයෝගය ගොඩ නගන්න තවම පුළුවන් වෙලා නැහැ. විශ්වාසය ගොඩ නගන්න පුළුවන්කමක් ඇති වෙලා නැහැ. ඒ අවිශ්වාසය මම හිතනවා, පදනම් වෙනවා මෙවැනි ෆෙඩරල් යෝජනා නැවත නැවත ඉස්මතු කරන්න. උතුරේ ජාතිවාදීන්ට ඒ අවස්ථාව උදා කරලා දීලා තිබෙනවා. විග්නේෂ්වරන් මහත්තයා ගෙනාපු මේ යෝජනාව උතුරේ ජාතිවාදයට ඉඩ දෙනවා වාගේම අද අපි දකුණේ මේ යෝජනාව ගෙන ඒමත් දකුණේ ජාතිවාදය ඉස්මතු කරන්න හේතු වෙනවාය කියන කාරණාව තමයි අපි විශේෂයෙන්ම සඳහන් කරන්න වෙන්නේ. ඒ නිසා අපි බලය බෙදීමත් එක්ක ඉන්න අය. බලය බෙදලා, බලය පහළට කාන්දු වෙලා, මේ රටේ සියලු දෙනාට ඒ බලයේ කොටස්කරුවන් වෙන්න ඉඩකඩ සලස්වලා, ඒ අයට තමන්ගේ සංස්කෘතිය, තමන්ගේ දේශපාලනය, තමන්ගේ සභ්‍යත්වය සියලු කාරණා ආරක්ෂා කර ගෙන කටයුතු කරන්න රට තුළ ඉඩක් තිබෙන්න ඕනෑ. ඒ ඉඩකඩ අපි

[ ගරු කීර්ති කාර්යවසම් ]

අහුරන්න කටයුතු කළොත්, ඒ පිළිබඳව ඇති වෙන්න තිබෙන සංවාදයකට ඉඩකඩ දෙන්න කටයුතු නොකළොත් එහෙම නැවත වතාවක් මේ රටේ කනගාටුදායක තත්ත්වයකට, අනතුරුදායක තත්ත්වයකට මේ රට යොමු කරන්න හේතු වෙනවාය කියන එකයි අපි විශ්වාස කරන්නේ. මේක මේ රටේ ජනාධිපතිතුමා තේරුම් අරගෙන තිබෙනවා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේක තේරුම් ගත්ත නිසා තමයි මැයි 01 වැනිදා එතුමා මැයි දිනය වෙනුවෙන් එතුමා කරපු කථාවේදීත් සඳහන් කළේ. දෙමළ මිනිස්සුන්ට උතුරේ ජනතාවට මෙවැනි යෝජනාවක් ගේන්න, මෙවැනි අදහසක් ගේන්න ඉඩකඩ තිබෙනවාය කියන කාරණාව. අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට ඒක තේරුම් යන්නේ නැති එක තමයි, මෙවැනි දේකට ඉඩ, මෙවැනි සංවාදයකට ඉඩක් තිබෙනවාමය කියන එක එතුමාට තේරුම් ගන්න බැරි නිසා කියන කාරණවා මේ දකුණේ නැවතත් මේ ජාතිවාදය ඉස්මතු කරන්න ගන්න උත්සාහයක් හැටියටයි අපි දකින්නේ. ඒ නිසා අපි උතුරේ විග්නේෂ්වරන් මහ ඇමතිතුමා ගෙනාපු යෝජනාවට අපි විරුද්ධ වෙනවා වාගේම දකුණේ මෙවැනි ජාතිවාදී මතවාදයන් නැවත ගොඩ නගන්න, තම තමන්ගේ දේශපාලනය ආරක්ෂා කර ගන්න, තම තමන්ගේ පැවැත්ම ආරක්ෂා කර ගන්න මේ ගන්නා උත්සාහය රට නැවතත් අනතුරකට දාන තත්ත්වයකට හේතු ගන්න නිසා අපි මේ යෝජනාවටත් අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා, යෝජනාවට විරුද්ධව කථා කළේ. අතින් අල්ලා ගෙන, යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීතුමාගේ අතින් අල්ලාගෙන තමයි කිව්වේ. මීළඟට අශෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු අශෝක දයාරත්න**
Hon.Ashoka Dayarathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ජාතික හෙළ උරුමයේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට. දේශපාලන පක්ෂ මොන මතිමතාන්තර දැරුවත් හොඳ කොන්දක් තියාගෙන ජාතික හෙළ උරුමය අද මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධව මගේ ගෞරවනීය ස්තුතිය මම පුද කරනවා. අපි දේශපාලනික වශයෙන් අද මේ මෙපමණ වැදගත් අවස්ථාවකදී මේ සභාවේ ඇත්ත වශයෙන්ම විපක්ෂයක් නැහැ. ආණ්ඩු පක්ෂයේ කිහිප දෙනෙකු විතරයි මේ යෝජනාවට පක්ෂ වෙලා තිබෙන්නේ. ඇයි මෙහෙම සිද්ධ වෙලා තිබෙන්නේ කියලා ලොකු ගැටළුවක් තිබෙනවා. කෙනෙකුට කථා කරන්න දුන්නේ නැහැ. කෙනෙකුව විවේචනය කරමින් තමයි උදේ ඉඳලා මේ සභාවේ හිටියේ. පක්ෂ දේශපාලනය තුළ. ජනතා විමුක්ති පෙරමුණ එක අදහසක්. එක්සත් ජාතික පක්ෂය එක අදහසක්. හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභාව නියෝජනය කරනවා අපේ රණවිරුවෝ තුන් දෙනෙක්. මම හිතන්නේ, අපට තිබෙන වේදනාව. මේ පුවත්පත්වල පළවීමේදී අපි දැක්කා,

*'කොටින්ගේ සන්නද්ධ අරගලය සාධාරණයි.'*

මේක අප්‍රේල් මාසේ 20 වැනිදා ලංකාදීප පත්තරේ සම්බන්දන් මැතිතුමා කරපු ප්‍රකාශයක්. මට ලොකු වේදනාවක් ඇති වුණා. මම රණවිරුවකු හැටියට සෘජුවම මේ යුද්ධයට සම්බන්ධ වුණු රණවිරුවෙකු හැටියට. ඒ වාගේම මම හිටපු ත්‍රිවිධ හමුදාව, පොලීසිය ආබාධිත රණවිරු සංවිධානයේ සභාපතිවරයා. අපි තමුන්නාන්සේලා එකට සට්ටනය කරලා තිබෙනවා විවිධ මාධ්‍යවල. ඒ සෑම අවස්ථාවකදීම මට ලොකු වේදනාවක් ඇති වුණා. මොකද හේතුව මම හිතන්නේ, මේ පළාත් සභාව තුළ ඉන්න බොහෝ මන්ත්‍රීවරු - මේ 30 වසරක් පුරා පැවති මේ යුද්ධයෙන් අසරණ වුණු, අතපය අහිමි වුණු. ඇස් දෙකයි, අත් දෙකයි, කකුල් දෙකයි නැති සොල්දාදුවෝ අද ඉන්නවා රණවිරු සෙවනේ. අභිමංසලවල. ගිහිල්ලා බලලා තිබෙනවාද කියලා මට සැකයක් තිබෙනවා. අනිවාර්යයෙන්ම ඒගොල්ලන්ගේ දුක සැප බැලුවා නම්, ඒගොල්ලන් එක්ක කථා කළා නම්, මේ කරපු ප්‍රකාශයේ කොයි තරම් බැරෑරුම්කමක් තිබෙනවාද කියලා තේරෙනවා. 26,000 කට අධික පිරිසක් මේ යුද්ධයෙන් මිය ගියා. 30,000 කට අධික පිරිසක් ආබාධිත තත්ත්වයට පත් වුණා. වැන්දඹුවන් දහස් ගණනක් බිහි වුණා. පියා අහිමි වුණු දරුවෝ සිය ගණනක් බිහි වුණා. මේ ප්‍රශ්නය දේශපාලනික වශයෙන් අපි පිල් බෙදා ගෙන කථා කළත්, තමන්ගේ වාසියට කථා කළත් හැබැයි මේකේ වේදනාව තිබෙන්නේ, ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ මේකට කැප වුණු රණවිරුවන්ට සහ ඒ පවුල්වලට.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම 1972 දී හමුදාවට බැඳුනේ. 1973 දී තමයි ඉස්සෙල්ලාම මම යාපනයට ගියේ. එදා ඉඳලා අපි යාපනයේ රාජකාරී කළේ. අනවසරයෙන් ඉන්දියාවෙන් ලංකාවට, යාපනය අර්ධද්වීපය හරහා ලංකාවට එන හොර බඩු අල්ලන්න තමයි අපි යාපනයට ගියේ. මේක වර්ධනය වෙලා, වර්ධනය වෙලා විශේෂයෙන්ම 1976, 1977, 1978 වන කොට මේ සභාවේ ඉන්න බොහෝ දෙනාට මතක ඇති ශ්‍රී ප්‍රශ්නයක් ආවා. ඒ වෙලාවේදී මම යාපනයේ හිටියේ. ශ්‍රී ලංකා පාබල හමුදාවේ. අමිර්තලිංගම් ඒ හිටපු විපක්ෂ නායකවරයාගේ නෝනා අපේ මුහුණ ඉස්සරහාට ඇවිල්ලා ආම් නායි කියලා අපට බැන්නා. ඒ වාගේම සිංහලයා මරලා ඒ හමෙන් සපත්තු හදන්න ඕනැය කියලා කිව්වා. මෙන්න මෙහෙම තමයි මේ ජාතිවාදය ඇවිස්සුනේ. අද මේ කොටසක් කථා කරනවා මේක වෙන්නේ නැහැ. මේවා බොරුවට කියනවා. මේ දේශපාලන පක්ෂ - හෙළ උරුමය ජාතිවාදය අවුස්සනවා. නැහැ. ඇත්ත කථාව මේකයි. මෙහෙම තමයි ආවේ. අද මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, දිවංගත ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාට. එතුමා 1987 දී මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන කොට පළාත් සභාවලට ඉඩම් බලතල සහ පොලිස් බලතල දුන්නේ නැහැ. ඇයි ඒ? එතුමා බොහෝ දුර දැකලා තමයි ඒ දේ නොදුන්නේ.

ඒ වාගේම 1990 දී දිවංගත ආර්. ප්‍රේමදාස ජනාධිපතිවරයා ඉන්න කොට 1990 දී වර්ධරාජා පෙරුමාල් කොඩිය ඉස්සුවා. අන්න ප්‍රේමදාස ජනාධිපතුමාට කොන්දක් තිබුණා, ඒ පළාත් සභාව විසුරවලා ඔහුව ඒ මහ ඇමති තනතුරෙන් අයින් කරන්න. හැබැයි, අද ඊට වඩා ලොකු වෙනසක් අපි දකිනවා. මම දන්නේ නැහැ මේ වෙනස මොකක්ද කියන එක. විශේෂයෙන්ම 2009 දී මේ යුද්ධය අවසන් කරලා, විශේෂයෙන්ම 2009 ඉඳලා 2014 වන තෙක් කවදාවත් ඔය ටී.එන්.ඒ. සංවිධානය වෙනම ෆෙඩරල් ක්‍රමයක් ඉල්ලුවේ නැහැ. වෙනම රාජ්‍යයක් ඉල්ලුවේ නැහැ. ඔය කිසිම යෝජනාවක් ගෙනාවේ නැහැ. නමුත් මේ 2015 ජනවාරි 08 වැනිදායින් පස්සේ තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මේ වෙනස්කම් ඇති වෙලා තිබෙන්නේ. අපි පහර ගහනවා නොවෙයි. මේකට මොකක් හරි දෙයක් තිබෙනවා. ඒ නිසා තමයි විශේෂයෙන්ම ජගත් අංගගේ අපේ හිටපු සභාපතිතුමාට, ඇමතිතුමාට මම හුඟක් ස්තුතිවන්ත වෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් පවා මේ දිවුරුම් දෙන කොට කරපු ප්‍රකාශය. එතුමා ඉතාමත්ම හොඳට විග්‍රහ කළා. එහෙම නම් ඒ ලේකම්වරයාට අයිතියක් තිබෙනවාද මේක න්‍යාය පුස්තකයට ගේන්න. විග්නේෂ්වරන් ප්‍රධාන ඇමතිතුමා මේ රට දෙකඩ නොකරනවාය කියලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟ වෙනවාය කියලා දිවුරුම් දීපු මහ ඇමතිතුමාට මේ වාගේ යෝජනාවක් ගෙනැල්ලා සම්මත කර ගන්න පුළුවන්ද? මෙතැන යටි අරමුණක් තිබෙනවා. අවුරුදු 30 ක් පුරා මේ යුද්ධය තිබිලා, මේ යුද්ධය නිම කරපු හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා රට සංවර්ධනය කළා. මේ රටේ ත්‍රස්තවාදයට හිස ඔසවන්න දුන්නේ නැහැ. ඒක තමයි මම කිව්වේ, 2009 සිට 2014 වන තෙක් ඔය ටී.එන්.ඒ. සංවිධානය කොහේද හිටියේ? මේ වාගේ යෝජනා ගෙනාවාද? එහෙම නම් ඇයි මේ යෝජනා ගේන්නේ? මේකට තිබෙන එකම දේ. මම දකින දේ. විශේෂයෙන්ම ජනවාරි 08 වැනිදායින් පස්සේ 2015 දී ඇමරිකාව, නෝර්වේ වාගේ රටවල්වලින් අනිසි බලපෑම් තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම අපි මේ රටේ දේශපාලනය පැත්තකට දාලා මේ ප්‍රශ්නය - මේක ප්‍රධාන ප්‍රශ්නයක්. මේගොල්ලෝ හිතනවා දෙන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම වත්මන් අතිගරු ජනාධිපතිතුමාට, ඒ වාගේම අග්‍රාමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒගොල්ලෝ කිව්වා, මේක කවදාවත් දෙන්නේ නැහැයි කියලා. පිළිගන්නවා. නමුත් මේක මේ විධියටම යට ගහලා, මේ විධියටම ඒගොල්ලන්ට ඕනෑ ප්‍රකාශ කරන්න ඉඩ දුන්නොත් මේ රට විශාල වෙනසකට පත් වෙනවා. දකුණේ අග්‍රාණ්ඩුකාරතුමා. ඊයේ පත්තරේ එතුමා සටහන් කරලා තිබුණා. එතුමාගේ අකමැත්ත. මේකට තීරණයක් ගන්න කියලා. ඒ වාගේම මේ ප්‍රකාශවලින් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජාතිවාදය ඇවිස්සෙනවා.

*"වෙනම රටක් ඉල්ලන විග්නේෂ්වරන් වහාම අත්අඩංගුවට ගත යුතුයි."* සිංහල රාවයේ මහා ලේකම් මාගල්කන්දේ සුදත්ත හිමි.

උන් වහන්සේට ඒ වාගේ ප්‍රකාශයක් කරන්න අයිතියක් තිබෙනවා. ඉතින් මෙතැනදී තමයි අපි මේ ජාතිවාදයක් කියලා අපි දේශපාලන පක්ෂ වශයෙන් බෙදිලා මේ ප්‍රශ්නයට අපි මුහුණ දෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම නැවත වරක් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට, අගමැතිතුමා ඇතුළු මේ රජයට අපි ස්තුතිවන්ත වෙනවා මේ වාගේ ප්‍රකාශ කිරීම සම්බන්ධව. මෙතැනින් බැහැර නොකර මේ රටේ ප්‍රධානම ප්‍රශ්නය, රටේ අවුරුදු 30 ක් තිබුණු ප්‍රශ්නය රණවිරුවන් දහස් ගණනක් මිය ගිය ප්‍රශ්නය,

[ ගරු අශෝක දයාරත්න ]

තමන්ගේ අත් පා හැම දෙයක්ම පූජා කළේ මේ වෙනුවෙන්. ඉතින් ඒ නිසා විශේෂයෙන්ම මේකට විශාල විසඳුමක් පාර්ලිමේන්තුව තුළ දිය යුතුයි. පාර්ලිමේන්තුවේ මේ සම්බන්ධව සංවාදයක් ඇති කළ යුතුයි. පාර්ලිමේන්තුවේ මේ සම්බන්ධව විපක්ෂ නායකවරයා - ඇත්ත වශයෙන්ම අද විපක්ෂ නායකවරයා කථා කරන්නේ, උතුරු නැගෙනහිර ගැන විතරයි. මේ රටේ ප්‍රශ්න ගැන එතුමා කථා කරන්නේ නැහැ. ඒ වාගේම විපක්ෂ නායකවරයකුට මේ වාගේ ප්‍රකාශයක් කරලා අද පාර්ලිමේන්තුවේ ඉන්න පුළුවන්ද කියලා ගැටළුවක් තිබෙනවා. නමුත් එතුමා කරන්න ඕනෑ ඔක්කොම ප්‍රකාශ කරලා අර හමුදා කඳවුරට ඇතුළු වුණා. අග්‍රාමාත්‍යවරයා මෙතැනදී - මට හරි කනගාටුදායකයි අග්‍රාමාත්‍යතුමාගේ කථාව. එතුමා කිව්වා, විග්නේෂ්වරන් ආවා. කඳවුරට ගියේ නැහැ. කඳවුර ඇතුළෙන් ගිහිල්ලා වටේ එතුමාගේ ඉඩම් ටික බලලා ආපහු ගියාය කිව්වා. හමුදා කඳවුරක් ඇතුළට ඇතුළු වෙන්න පුළුවන්ද? කැබිනට් රැස්වීමකදී තවත් ඇමතිවරයෙක් කිව්වා, එහෙම නම් ඒ බැරියර් එකේ හිටපු සොල්දාදුවා අත්අඩංගුවට ගන්න ඕනෑය කිව්වා. මේ රජයේ ප්‍රධාන ඇමතිවරයෙක් කියනවා. එතැනත් දැම්මේ අර සොල්දාදුවාට. දැන් ඒ සොල්දාදුවා වෙඩි තිබ්බා නම් මොකද වෙන්නේ? ඒ නිසා ඒ වාගේ වැරදි ප්‍රකාශ කරමින්, තවත් අපේ සොල්දාදුවන්ව අසරණ තත්ත්වයට පත් කරනවා. මම විශේෂයෙන්ම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගෙනාපු කාලෝචිත සහ ඉතාමත්ම විශිෂ්ට ගණයේ යෝජනාවට මම මගේ එකඟත්වය පළ කරනවා. ඒ වාගේම විග්නේෂ්වරන් මහ ඇමතිවරයා ගෙනාපු මේ යෝජනාව තරයේ ප්‍රතික්ෂේප කරමින් ගරු මහ ඇමතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගේත් සහයෝගයට මෙයට ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි**
Hon. Rev. Thebuwana Piyananda Thero

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගිහිල්ලා ගිහිල්ලා වල්ගේ විතරක් ඉතිරි වෙනවාය කිව්වා වාගේ අවසානයේදී හරි වචන කිහිපයක් ප්‍රකාශ කරන්න ලැබීම පිළිබඳව සන්තෝෂයට පත් වෙනවා. ඒ වාගේම විශේෂයෙන් අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට අපේ ස්තූතිය පිරිනමනවා. අද දවසේ අපේ රටේ ඉදිරිපත් විය යුතු ඉතාමත්ම වැදගත් කාලෝචිතම මාතෘකාවක් අපේ පළාත් සභාවට ඉදිරිපත් කරලා, අදහස් උදහස් විමසන්න අවස්ථාව සලසා ගැනීම පිළිබඳව. විවිධ අදහස් අපේ විවිධ පක්ෂවල මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රකාශ වුණා. අපේ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාත් අන්තිම වෙලාවේ මේ ජාතිවාදය පිළිබඳව කථා කළා. මේ ජාතිවාදය කියන එක එක එක්කෙනා අර්ථවත් කර ගන්නේ කොයි විධියටද කියන එක මට තේරෙන්නේ නැහැ. දැන් හුඟක් වෙලාවට අපි අපේ ජාතිය පිළිබඳව හැඟීමකින් කථා කළොත් මේක ජාතිවාදය. මම දන්නේ නැහැ එහෙම ජාතිවාදයක් පිළිබඳව. ඒක ජාතික හැඟීම. තමන්ගේ ජාතිය පිළිබඳව, තමන්ගේ ජාතියට හානියක් වෙනවා නම් ඒ වෙලාවේ එයට විරුද්ධව කථා කිරීම, ඒ වෙනුවෙන් පෙනී සිටීම ඒක තමන්ගේ ජාතිකත්වය පිළිබඳ හැඟීම.

හැබැයි, ඒ හැඟීම තිබුණාය කියලා අනික් ජාතීන් පාගා දාලා කටයුතු කරනවා නම් එතැනදී ජාතිවාදයක් වෙන්න පුළුවන්. දැන් උදාහරණයකට අපේ අර්ෂාඩ් නිසාම්ඩීන් ගරු මන්ත්‍රීතුමා. දැන් මේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගෙන් ප්‍රකාශ වුණු ප්‍රකාශයක්. ඒ වෙලාවේ ඒ ගරු මන්ත්‍රීතුමා සභාවේ හිටියෙත් නැහැ. කොහේ හරි ඉඳලා ඇවිල්ලා තමන්ගේ ජාතිය වෙනුවෙන් පෙනී සිටියා. ඒක හරි. තමන්ගේ ජාතියට එතුමියගේ ප්‍රකාශයෙන් යම් හානියක් වුණාය කියන එක පිළිබඳව වහාම පෙනී සිටියා. ඉතින් මේක ජාතිවාදය නොවෙයි. එතුමා අපිත් එක්ක බොහොම සුහදව කටයුතු කරනවා. ඒ නිසා දැන් අපි ජාතික හෙළ උරුමය හැටියට, විශේෂයෙන්ම බෞද්ධ භික්ෂූන් වහන්සේලා හැටියට මම නම් ඉතාම පැහැදිලිව කියනවා, මම මේ සභාවේ පෙනී සිටින්නේ පැහැදිලි ලෙස සිංහල බෞද්ධ ජනතාව වෙනුවෙන්. ඒකට මට ජාතිවාදියි කියලා හඳුන්වනවා නම් මම ඒක ගෞරවයක් හැටියට පිළිගන්නවා. මම මේ සභාව නියෝජනය කරන්න පත් වුණේ, සිංහල බෞද්ධ ජනතාවගේ ඡන්දවලින්. ඒක මම ආඩම්බරයක් හැටියට සලකනවා. මම ඒ සිංහල බෞද්ධ ජනතාවගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් මම මේ සභාවේ පෙනී සිටිනවාය කියන එක මම ඉතාම පැහැදිලිව ප්‍රකාශ කරනවා. මම ඒකෙන් අදහස් කරන්නේ ඒක මතු කර ගෙන මම මුස්ලිම් ජාතිකයන් හරි, ද්‍රවිඩ ජාතිකයන් හරි වෙනත් ජාතිකයන් එක්ක විරසක වෙලා, ඔවුන් එක්ක ගැටුම් ඇති කර ගෙන, එහෙම කටයුතු කරනවා කියන එක නොවෙයි. ඔවුන් එක්කත් අපි සුහදව කටයුතු කරන ගමන් මගේ ජාතිය වෙනුවෙන්, මගේ ආගම වෙනුවෙන් පෙනී සිටීම ජාතිවාදය හෝ ආගම්වාදය හෝ වරදක් හැටියට හෝ මම කොයි

වෙලාවකවත් පිළිගන්නේ නැහැ. ඉතින් ඒ නිසා මේ ප්‍රශ්නය අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා අද සභාවට ඉදිරිපත් කරපු කාරණය උතුරේ මහ ඇමතිවරයා උතුරු පළාත් සභාවේ සම්මත කර ගත්ත මේ යෝජනාව පිළිබඳව නිහඬව අපට සද්ද නැතිව බලාගෙන ඉන්න පුළුවන්කමක් නැහැ. දැන් බොහෝ දෙනෙක් අද මෙතැන කථා කළා. මේක දකුණේ ගැටුම් ඇති කරන්න කරන කථාවක්. ඒ නිසා මේකට අපිත් අහුවෙලා අපිත් මේ කථා කරනවාය කියලා. මේ ඉතිහාසයත් එක්ක බැලුවාම අපට පැහැදිලියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතිහාසය තුළ මේ ද්‍රවිඩ ජාතිකයින් උතුරේ අවශ්‍යතා වෙන්න පුළුවන්. නැගෙනහිර අවශ්‍යතා වෙනුවෙන් වෙන්න පුළුවන්. කාලයෙන් කාලයට ඒගොල්ලෝ විවිධ ආකාරයෙන් පෙනී සිටීමින් විශාල ලෙස තමන්ගේ ජයග්‍රහණ කරා ඔවුන් ගමන් කරලා තිබෙනවා. ඒක ඔවුන්ගේ අයිතිය වෙන්න පුළුවන්. නමුත් ඒ තුළ අපේ අයිතීන් හුඟක් අපට නැති වෙලා තිබෙනවා. මම හිතුවා, අද කවුරු හරි මන්ත්‍රීවරයෙක් කථා කරයිද කියලා මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් කථා කරන වෙලාවේ. යුද්ධය ආරම්භ වන වෙලාව වන කොට යාපන අර්ධද්වීපයේ, යාපනයේ පැහැදිලි වශයෙන් සිංහල මිනිස්සු අඩු ගණනේ 27,000 කට වැඩිය සිටියා. අද එක සිංහලයෙක් නැහැ. කවුද මේ ගැන කථා කරන්නේ. එතකොට මේක අපේ ජාතියට වුණු අසාධාරණයක් නොවෙයිද? පාර්ලිමේන්තුවේ කථා කරන්නේත් නැහැ. පළාත් සභාවේ කථා කරන්නේත් නැහැ. වෙනත් තැනක කථා කරන්නේත් නැහැ. දැන් මේක ගැන අපි කථා කරන එක සිංහලයෝ හැටියට, බෞද්ධයෝ හැටියට හාමුදුරුවරු හැටියට මේක ජාතිවාදයක්ද? මම ළඟ ලේඛන තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1505 වන කොට යාපනයේ නියෝජනය. සිංහල බෞද්ධයෝ 66% ක් යාපනයේ ජීවත් වුණා. මුස්ලිම් ජනයා 19% යි. ද්‍රවිඩ ජනතාව 15% යි. 1505 දී. දැන් මේ තත්ත්වය දිගින් දිගටම වෙනස් වුණු හැටි. පෘතුගීසි යුගයේ, ඕලන්ද යුගයේ වෙනස් වුණු හැටි. 1505 වන කොට 66% ක් සිංහල බෞද්ධයෝ වාසය කරපු ප්‍රදේශය. අද සිංහල බෞද්ධයෙක් බෙතකට හොයා ගන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඉතින් මේ තත්ත්වය ඉදිරියේ අපි මේක බලාගෙන නිහඬව ඉන්නවාද? මේක කථා කළොත් වරදක්ද? එතකොට නැගෙනහිරටත් අපි මේ තත්ත්වය එන්න ඉඩ දීලා බලාගෙන ඉන්නවාද? (බාධා කිරීමක්) ඒ නිසා ඇත්තටම මම කනගාටු වෙනවා විපක්ෂයේ කවුරුවත් නැති එක ගැන. කොන්ද තිබෙන යූ.එන්.පී. කාරයෝ ඒ කාලයේ හිටියා. මම ළඟ තිබෙනවා, 1983 අවුරුද්දේ සිරිල් මැතිව් ඇමතිවරයා එක්සත් ජාතික පක්ෂයේ. එතුමා යුනෙස්කෝවට ඉදිරිපත් කරපු වාර්තාවක් පිළිබඳ සටහන. ඉතාම පැහැදිලිව සංඛ්‍යා ලේඛන සහිතව, සිතියම් සහිතව එතුමා පැහැදිලිව ඉදිරිපත් කරලා තිබෙනවා උතුරේ සහ නැගෙනහිර සිංහල බෞද්ධයාගේ අයිතිය පිළිබඳව. අද එහෙම කථා කරන්න කොන්ද තිබෙන නායකයෙක් එක්සත් ජාතික පක්ෂයේ නැති වීම ගැන ඇත්තටම අපි කනගාටුවට පත් වෙනවා. ඒ නිසා මේ තත්ත්වය තුළ, මේ යෝජනාව අපි නිහඬව මේක සාකච්ඡා නොකළ යුතු කාරණයක් හැටියට කවුරු හරි කල්පනා කරනවා නම්, ඒක බරපතළ වරදක්. දැන් මේ කාරණය ගැන හුඟක් කථා වුණු නිසා මම කථා නොවුණු පැත්තක් පිළිබඳව විනාඩි කිහිපයක් කථා කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම ඒ සමඟම ප්‍රකාශ වෙලා තිබෙනවා විශේෂයෙන්ම උතුරේ බෞද්ධ සිද්ධස්ථාන පිළිබඳව. පැහැදිලි ලෙසම ප්‍රකාශයක් කෙරිලා තිබුණා. සම්බෝධි විහාරය. කෝකිලායි. මේ පන්සල හදන්න ගියාම පන්සලක් අවශ්‍ය නැහැයි කියන ප්‍රකාශය කරලා මේකට විරුද්ධත්වය ප්‍රකාශ කරලා තියෙනවා. ඊළඟට නාගදීපයේ බුදු පිළිමය ඉදි කිරීම පිළිබඳව දැඩි විරෝධතාවයක් ප්‍රකාශ කරලා, ඒකට සමුද්‍ර ආරක්ෂක අධිකාරියෙන් අවසරය ලබා ගත යුතුයි ආදී විවිධ කාරණා ඉදිරිපත් කරලා උතුරේ බෞද්ධ සිද්ධස්ථාන ඇති කිරීම පිළිබඳව දැඩි විරෝධතාවයක් මේ සමඟම මේගොල්ලෝ තුළින් ඉස්මතු වේ ගෙන යනවා. කෝකිලායි, මේ විහාරස්ථානය ඇත්තටම යුද්ධය ආරම්භ වෙන්න කලින් සිංහල පාසලක් තිබුණු භූමියක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යුද්ධයෙන් පස්සේ මේ ස්ථානය අධ්‍යාපන අධ්‍යක්ෂවරයා, ඒ වාගේම පළාතේ ප්‍රාදේශීය ලේකම්වරයා සිද්ධස්ථානයක් හදන්න ලිඛිතව අවසර ලබා දීලා තිබෙනවා. ඒ දෙන්නාම ද්‍රවිඩ ජාතිකයෝ. ප්‍රාදේශීය ලේකම්වරයාත්, අධ්‍යාපන අධ්‍යක්ෂවරයාත් දෙන්නාම ද්‍රවිඩ ජාතිකයෝ. ලිඛිතව අවසර දීලා තිබෙනවා මේ ස්ථානයේ සිද්ධස්ථානයක් ඉදි කිරීම පිළිබඳව. එතකොට එහෙම තිබෙන තත්ත්වය තුළ තමයි මේකට විරුද්ධත්වය ප්‍රකාශ කරලා මේ විදියට කටයුතු කරන්නේ. මම උදාහරණයක් වශයෙන් පෙන්වන්නම්. අපේ ඉතිහාසයේ සිතියම් වෙනස් වෙනවා. මේ සිතියමේ ඉතාම පැහැදිලිව තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උතුරේ බෞද්ධ සිද්ධස්ථාන පිහිටා තිබුණු ආකාරය පිළිබඳව.

[ ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි ]

අහලේ පරිමාණයට හරි ගස්වපු සිතියම. නමුත් අද තිබෙන සිතියම්වල මේ සිද්ධස්ථාන එකක්වත් නැහැ. ඒ නිසා ඉතිහාසය වෙනස් කරනවා. අපේ ඉතිහාසය වෙනස් කරනවා. දීර්ඝ කාලීනව, සැලසුම් සහගතව ඉතිහාසය වෙනස් කරනවා. පත පොත වෙනස් කරනවා. සිතියම වෙනස් කරනවා. පාසල් විෂය නිර්දේශය තුළ පවා මේවා නැති කරනවා. ඒ නිසා ක්‍රමානුකූලව, සැලසුම් සහගතව සිංහලයාගේ, බෞද්ධයාගේ අයිතිවාසිකම් මේ ප්‍රදේශවලින් නැති කිරීමේ, ඉවත් කිරීමේ, විනාශ කිරීමේ, සැලසුම් සහගතව වැඩ පිළිවෙළවල් අරගෙන යනවා. ඉතින් මේ තත්ත්වය තුළ විශේෂයෙන්ම බෞද්ධ භික්ෂූන් වහන්සේලා හැටියට ඉතිහාසයේ ජාතිය රැක්ක මුර දේවතාවෝ හැටියට වර්තමානයේ ජීවත් වන අපට - පාර්ලිමේන්තුවේ ඉන්නවාද? පළාත් සභාවේ ඉන්නවාද? සිවිල් සමාජය තුළ ඉන්නවාද කියන එක නොවෙයි. මේවා ඉදිරියේ අපට නිහඬව ඉන්න පුළුවන්ද කියන කාරණය තමයි අපට ඇති වෙලා තිබෙන ප්‍රශ්නය. ඒ නිසා හුඟක් දෙනෙක් මේක සරළව කථා කරන්න පුළුවන්. බොහොම සරළව කථා කරනවා. දකුණ අවුස්සන්න, විග්නේෂ්වරන් මෙහෙම කථා කරනවා කියලා. එහෙම කියලා අපට මේක දිහා නිහඬව බලාගෙන ඉන්න පුළුවන්කමක් නැහැ. මම මේ මතක් කළේ, කරුණු කිහිපයක් විතරයි. ඉතාම සැලසුම් සහගතව අපේ ඉතිහාසය කඩින් කඩ, කඩින් කඩ වෙනස් වෙලා. 1505 දී 66% ක් යාපනයේ ජීවත් වුණු සිංහල බෞද්ධ ජනතාව අද එකම සිංහලයෙක්වත් නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේකට අපට විශාල භයක් තිබෙනවා.

ඒ වාගේම ලෝකයේ හැසිරීම දිහා බැලුවාම අපි දන්නවා බෞද්ධකමට වුණු තත්ත්වය. මෑත මේ පෙරදිග අපේ ආසන්නයේ රටවල්. අපි දන්නවා ඉන්දුනීසියාව, බංගලාදේශය, පකිස්ථානය මේ රටවල් අපි දන්න මෑත ඉතිහාසයේ ඉතාම හොඳ බෞද්ධ රටවල්. ඇෆ්ගනිස්ථානයේ තමයි බාමියන් බුද්ධ ප්‍රතිමා, ලෝකයේ විශාලම බුද්ධ ප්‍රතිමා තිබුණේ. මේවා ඩයිනමයිට් දාලා විනාශ කළා. එතකොට මේ ඉතිහාසය තුළ අපට භයක් ඇති වෙන්නේ නැද්ද? තව නුදුරේ මේ තත්ත්වය ලංකාවට අත් වෙනවාය කියන එක. ඒ ගැන භයක් අපට ඇති වෙන්නේ නැද්ද? ඇෆ්ගනිස්ථානයට වුණු දේ ලංකාවට වෙයිද? ඉන්දුනීසියාවට වුණු දේ ලංකාවට වෙයිද? පාකිස්ථානයට, බංගලාදේශයට වුණු දේ ලංකාවට වෙයිද? කියන භය පැහැදිලිව අපට තිබෙනවා. උතුරු නැගෙනහිරින් දැන් ඒ සිද්ධිය දැන් සිද්ධ වේගෙන එනවා. දකුණට දැන් ඒක ක්‍රමානුකූලව ගමන් කරනවා. ඒ නිසා මේවා ඉදිරියේ අපට නිහඬව ඉන්න පුළුවන්කමක් නැහැ. අන්න ඒ නිසා නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා මේ ඉදිරිපත් කරපු යෝජනාව හරහා මේ විධියේ අදහස් ප්‍රකාශ කරලා, අපේ විරෝධය මේ පිළිබඳව ප්‍රකාශ නොකරවත් අපි නිශ්ශබ්දව හිටියොත් මම හිතන්නේ, තවදුරටත් අපි භික්ෂූන් වහන්සේලා හැටියට අපි අපේ වගකීම, යුගයේ කාර්යභාරය, අපි ඉෂ්ට කළේ නැහැයි කියලා අපට අනිවාර්යයයෙන් පසුතැවිලි වෙන්න සිද්ධ වෙනවා. කාල වේලාව හුඟාක් ගිහිල්ලා තිබෙන නිසා මම දිගට කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඉතිහාසයත් එක්ක ගත්තාම වර්තමානය වන කොට හද කැකෑරවෙන විශාල භීතියක් සහ අවාසනාවන්ත තත්ත්වයක් සිංහල බෞද්ධයා හමුවේ මේ රටේ තිබෙනවා. ඒ නිසා මේක තවදුරටත් ඉදිරියටත් සිද්ධ වෙන්න දෙනවාද? ඒ සිද්ධ වන ව්‍යසනය ඉදිරියේ කථා කරන එක ජාතිවාදයක් ද කියන එක මම ඔබ හැම දෙනාගෙන්ම ප්‍රශ්න කරනවා. මම මීට වඩා කාලය ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ඒ නිසා මේ තත්ත්වය, මේ පිළිබඳව විශේෂයෙන් උතුරු පළාත් සභාව සම්මත කර ගත් යෝජනාව පිළිබඳව පැහැදිලි ලෙස අපේ විරෝධතාවය අපි ප්‍රකාශ කරන අතරේ ඉදිරියටත් කවුරු ජාතිවාදය හැටියට හැඳින්නුවත් සිංහල බෞද්ධයාගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටිය යුතු හැම අවස්ථාවකදීම අපි නිර්භයව පෙනී සිටිනවාය කියන කාරණය මතක් කරමින්, අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිය ප්‍රකාශ කරමින්, හැම දෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

තවත් කථා කිහිපයක් තිබෙනවා. ඒ නිසා සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ඒ පිළිබඳව සැලකිලිමත් වන ලෙස ඉල්ලමින් මීළඟට සාහි රහීම් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාව මේ සභාවට කාලෝචිත යෝජනාවක්. මෙහිදී පක්ෂ විපක්ෂ සෑම දෙනාගේම අදහස් උදහස්, ගරු මන්ත්‍රීවරු 104 දෙනාගෙන්ම අදහස් මේ අවස්ථාවේදී මෙම සභාවට ඉදිරිපත් කරන්න හැකියාවක් ලැබිලා තිබෙනවා. ෆෙඩරල් ක්‍රමය සම්බන්ධව එතුමා ගෙනෙන ලද අදහස සම්බන්ධයෙන් අප කාටවත් වැරැද්දක් කියලා කියන්න බැහැ. ඒ කියන්නේ බස්නාහිර පළාතට මහජන නියෝජිතයන් හැටියට අපේ ගරු මන්ත්‍රීතුමන්ලා පත් කරලා මේ සභාවට ඇවිල්ලා කථා කරන්න, තමන්ගේ අදහස හෙළිදරව් කිරීමට අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒකේදී සමහර මන්ත්‍රීවරුන් මේකට විරුද්ධ වෙන්න පුළුවන්. සමහර මන්ත්‍රීවරුන් කැමැත්තෙන් කථා කරන්න පුළුවන්. නමුත් මේකේදී අපි දකිනවා. මේ ෆෙඩරල් ක්‍රමය සමහර දේශපාලකයන් තමන්ගේ දේශපාලනය වර්ධනය කිරීම සඳහා හුඟක් කල් පටන් ජාති බේදය ඇති කරලා - මගේ කාලය තුළ අපි දැක්කා 1983 කළු ජූලිය. කළු ජූලිය මතක් වන කොට මුළු ලංකාවේම ඉන්න දෙමළ ජනතාව පුච්චලා, ගිනි තියලා විනාශ කරලා, එතුමන්ලාගේ පොඩි ප්‍රශ්නය ලොකු ප්‍රශ්නයකට ගෙනිහිල්ලා, අවුරුදු 30 ක යුද්ධයක් කරලා ලොකු විනාශයක් රට තුළ සිදු වුණා. ඒක මුස්ලිම්ද, සිංහලද, බෞද්ධද, කතෝලිකද කියලා නොවෙයි. හැම එක්කෙනාටම භයෙන් ජීවත්වන වාතාවරණයක් සැලසුවා. නමුත් මේකේදී දේශපාලකයන් කාලයෙන් කාලයට, දේශපාලනඥයන් අවුරුදු පහෙන් පහට තමන්ගේ ඡන්දය එකතු කිරීමට ජාති බේදය ඇති කරලා, ජාතිබේද ප්‍රශ්නය ඇති කරලා සැහෙන්න ගැටුම්වලට ගෙනිහින් තිබෙනවා.

ඒ වාගේම තමයි විග්නේෂ්වරන් උතුරේ මහ ඇමතිතුමා ෆෙඩරල් ක්‍රමය අවශ්‍යයි කියලා මේ යෝජනාව ගෙනැල්ලා සම්මත කරලා තිබෙනවා. නමුත් මම Internet එක හරහා බැලුවා, එතුමා පත්තරයට සාකච්ඡාවක් දීලා තිබෙනවා, **சமஸ்திய இனவாதம் தலை தூக்குவது என்பது பைத்தியக்காரத் தனம்** ෆෙඩරල් ක්‍රමය ගෙන ඒම වැරැදියි කියලා හිතෙනවා නම් - තමන්ට ඔළුව නරක් වෙලා හරි මොනවා හරි ප්‍රශ්නයක් එතුමා කියනවා. නමුත් එතුමා මේ දෙමළෙන් දාලා තිබෙන්නේ. එතුමා ඒ යෝජනා ගෙනල්ලා, කැනඩා, ඕස්ට්‍රේලියා, ඉන්දියා වාගේ රටවලත් මේ ෆෙඩරල් ක්‍රමය පවත්වාගෙන යනවා. නමුත් මෙහිදී යම්කිසි සාධාරණත්වයක් එයාලට ඉටු වෙන්න ඕනෑය කියන එක තමයි එයාලා බලාපොරොත්තු වෙන්නේ. නමුත් ෆෙඩරල් ක්‍රමය කියන කොට අද රට තුළ සැහෙන්න බයක් ඇති වෙලා තිබෙනවා. අද ලොකු විනාශයක් වෙන්න යනවා. කෑඩී බිඳී යන්න යනවා කියලා. නමුත් මේ වාගේ දේවල් අපේ රට තුළ ගේන කොට පළාත් සභාව 1988 පිහිටුවන කොටත් මේ ලොකු විනාශයක් ඇති කළා. මිනිස්සු මැරුවා. ඉල්ලන කට්ටියට වෙඩි තිබ්බා. ඊට පස්සේ මන්ත්‍රීවරු පත් වුණාට පස්සේ මන්ත්‍රීතුමන්ලාට නිදහසේ මේ සභාවේ එන්න බැරිව ලොකු කෝලාහලයක් ඇති වුණා. ඒ දවස්වල මට මතකයි පළාත් සභාවට තරග කළේ, එක්සත් ජාතික පක්ෂයයි, තව අනිකුත් පක්ෂ තමයි. නමුත් ප්‍රබල පක්ෂ දෙකක් තුනක් ඒකට විරුද්ධ වුණා. නමුත් එයාලා දැන් පළාත් සභාවට ඇතුළත් වෙලා දැනට ඒ තුළ ක්‍රියාත්මක කරනවා. නමුත් මේකේදී අපේ ස්වාමීන් වහන්සේ කිව්වා වාගේ උතුර පළාත්වල, වඳින ස්ථානවල් හදන්න නොදීම අපේ මීගමුව පළාතේත් ඔය වාගේ සිද්ධීන් ඇති වෙලා තිබෙනවා. මීගමුවේ තමන්ගේ ඉඩමේ, තමන්ගේ ප්‍රදේශයේ, ආගම අදහන්න පල්ලියක් බඳින්න වුණොත් සමහර කල්ලි ඒකට ඉඩ දෙන්නේ නැහැ. ඒ කියන්නේ පල්ලියේ දහම් පාසලක්, තමන්ගේ ආගම අදහන්න දවසකට පස් පාරක් යන්න ඕනෑ. මාසයකට 150 පාරක් යන්න ඕනෑ. අවුරුද්දට 1800 පාරක් යන්න ඕනෑ. ඒ වාගේම තමයි මරණයක් වුණාම අනිවාර්යයෙන්ම පල්ලියට ගෙනි යන්න ඕනෑ. ඒ වාගේම කසාදයක් බඳිනකොට පල්ලියේ කටයුතු කරන්න ඕනෑ. නෝම්බි දවසට දවස් 30 ම යන්න ඕනෑ. අවුරුද්දට 2430 ක් අපි ආගම කියන්න අනිවාර්යයෙන්ම පල්ලියට යන්න ඕනෑ.

නමුත් මේකේ සමහර කට්ටිය පල්ලි ළඟ ළඟ දැක්කොත් හිතනවා මේ මුළු රටම අල්ලන්න යනවා. පල්ලි හදලා තිබෙනවා කියලා. නමුත් අවුරුද්දට 2500 කට වැඩිය ආගම කියන්න ස්ථානයකට කවුද යන්නේ. මේක තේරුම් ගන්න ඕනෑ. නමුත් ඇතුළේ අපි වාගේ බුද්ධිමත් හොඳ මන්ත්‍රීවරුන් ඉන්නවා. ඒක තේරුම් ගන්න. මේක තේරුම් අරගෙන අවුරුද්දකට 2500 ට වැඩිය ආගම කියන්නේ කොහොමද? කොච්චර අමාරුවෙන් හරි, ළඟ පල්ලියක් බැඳලා හරි ඒ ආගම කියන්න ඕනෑ. නමුත් ඒක බංකර් හදනවා. ලොකු ලොකු ප්‍රශ්න ඇති කරනවා. මේ රටේ අපි ඉපදිලා, සිංහල අම්මලාගේ කිරි බීලා හැදුණු ළමයි අපි. කවදාවත් අපි මේ රටට ද්‍රෝහිකමක් කරන්න හිතලත් නැහැ. හිතන්නෙත් නැහැ. කවදාවක්වත් ඒ වාගේ දෙයක් වෙයි කියලා විශ්වාස කරන්නත් එපා.

[ ගරු ෂාෆි රහීම් ]

ඒ වාගේම තමයි ඒක මේ සභාවේ කියන්න කැමැතියි. මෙහිදී සමහරු බොරු ප්‍රචාර කර කර මේක විදේශ බලවේගය, විදේශ මුදල්වලට යටත් වෙලා මේ ප්‍රශ්නය ඇති කරලා මුළු ලංකාවේම වෙනම ප්‍රශ්නයක් ඇති කරන්න ලොකු උත්සාහයක් කරනවා. නමුත් ඒකේදී ඉවසීමෙන් කටයුතු කරන එක හැම කෙනාගේම අත්‍යවශ්‍ය දෙයක්. ඒකේදී අපි බලාපොරොත්තු වෙනවා සිංහල, බෞද්ධ, මුස්ලිම් හැම එක්කෙනාම එකමුතුයි. අපි බුද්ධිමත්ව ඉදිරියේදී රට දියුණුව සඳහා යන වැඩපිළිවෙළ අපි කථා කරලා මේ කටයුත්ත කරන්න ඕනෑය කියනවා. ඒ වාගේම අපි නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට ස්තුති කරන්න ඕනෑ. මේ සභාවට මේ වාගේ දේවල් ගෙනල්ලා කථා කරලා මේ අදහස් උදහස් එක එක්කෙනාගේ එළි දැක්වීමට එතුමා උදව් කරපු එකට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. UpulMahendraRajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට හිතෙනවා ඇති අද ගරු මන්ත්‍රීතුමන්ලා පස්වරු තුන පසුවන තුරුත් මෙහි සිටියේ, අපත් උදේ ඉඳලා හවස් වනතුරුම හිටියේ මේ රට ජාතිය ගැන කැක්කුමක් අපටත් තිබෙන නිසා. එතකොට මේ විග්නේෂ්වරන් කියන පුද්ගලයා වැඩක් නැති යෝජනාවක් උතුරු පළාත් සභාවේ කළා කිව්වාට අපට ජාතියක් වශයෙන් හැඟීමක් තිබෙනවා. අපේ රටේ අනන්‍යතාවය, අපේ රටේ ස්වෛරීභාවය කවුරු හරි විනාශ කරන්න උත්සාහ කරනවා නම්, අපි මේ රටේ උපන්න මිනිස්සු වශයෙන් අපට ඒ වෙනුවෙන් සටන් කරන්න, ඒ වෙනුවෙන් පෙනී සිටින්න අයිතියක් තිබෙනවා. අපටත් මේ පොත් ටිකත් අරගෙන ගෙදර යන්න තිබුණා. එහෙම ගියා නම් දැන් අපි ගෙදර. නමුත් අපට තිබෙන යුතුකම ඉටු කරන්න ඕනෑ. ජනතාව අපට ඡන්දය දීලා පත් කළේ මේ පණිවුඩය ගෙනි යන්න. ඒ නිසා අද මේ පණිවුඩය නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා මේ සභාවට ගෙනෙන කොට මම එච්චර කැමැත්තක් දැක් වූයේ නැහැ. මොකද, එහෙම කැමැත්තක් දැක් වූයේ නැත්තේ අපි ගම්වලට ගිහිල්ලා මිනිස්සුන්ට අනන්ත අප්‍රමාණව කිව්වා. ඔය යහපාලන ආණ්ඩුව මේ රටේ පත් කරන්න එපා. එක්සත් ජාතික පක්ෂය, හෙළ උරුමය, එහෙම නැත්නම් මේ කොටි සංවිධාන එකතු වෙලා මේ රටේ නැවත පාලන බලයක් ගත්ත දවසට මේ රටට වෙන දේ අපි කිව්වා. අපි කිව්වා මිනිස්සුන්ට නාගදීපයට වන්දනා කරන්න යන්න හම්බ වෙන්නේ නැහැ. අපි කිව්වා මිනිස්සුන්ට දඹකොළපටුන වඳින්න යන්න හම්බ වෙන්නේ නැහැ. එදා ශ්‍රී මහා බෝධිය ගෙනාපු තැනට යන්න ලැබෙන්නේ නැහැ. අපි කිව්වා මේකට ඡන්දය දෙන්න එපා. මේක මේ රට විනාශ කරන මර උගුලක් කියලා කිව්වා. අද ඒක අතේ පත්තු වෙලා තිබෙනවා. අද නිකන් ඔව්, නැහැ, බැහැ ප්‍රශ්නයක් වාගේ. මේ ප්‍රශ්නය ගෙනල්ලා තිබෙනවා. උතුරේ යුද්ධය නැති කරලා තිබෙනවා කියලා කියනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නම කියන්න කවුරුවක්වත් කැමැති වෙන්නේ නැහැ. එතුමා මේ රටේ ජනාධිපතිවරයා, මේ රටේ යුද්ධය නැති කරපු නිසා තමයි මේ හැම කෙනාටම අද රට ගැන කථා කරන්න පුළුවන්කම ඇති වෙලා තිබෙන්නේ. අද මේක ආරම්භයක්. අපි මේ පළාත් සභාවේ තව අවුරුදු ගණනාවක් ඉන්නවා. ඉන්න කොට අපට සම්බන්දන්ලාගේ, එහෙම නැත්නම් විග්නේෂ්වරන්ලාගේ යම් යම් යෝජනාවලට මීට වඩා පෙළ ගැහිලා කථා කරන්න තිබෙන අවදි ඉස්සරහාට ඇති වෙනවා. මේවා තිස්ස අත්තනායක හෙළි කරපු නිසා තමයි එතුමාට හිරේ යන්න සිද්ධ වුණේ. එතුමාට ඒ පක්ෂයේ සාමාජිකත්වය නැතිවෙලා ගියේ. ඒ නිසා බුද්ධිමත් ජනතාව මේවා ගැන ඇහුවා නම්, අද අපට මේ වාගේ වැලපෙන්න සිද්ධ වෙන්නේ නැහැ. අපට ජාතියක් වශයෙන් කෙළින් හිටගන්න තිබුණා.

අපි දන්නවා, මේ රටේ බිහි වුණු එක එක දෙමළ නායකයන් හිටියා. අපි කියනවා, පොන්නම්බලම් අරුණාචලම්, එහෙම නැත්නම් වෙඩි තියලා ඝාතනය කළ අමිර්තලිංගම් ඒ වාගේ දෙමළ නායකයන් මේ රටේ බිහි වෙලා ඔවුන්ගේ අවසාන ඉලක්කය වුණේ, ෆෙඩරල් ක්‍රමයක් සඳහා මේ රට අරගෙන යන්න. ඔවුන් විවිධ මතවාද රට තුළ ඇති කළා. ඇති කළා විතරක් නොවෙයි. එදා 1977 මේ පාලන බලය එන කොට විපක්ෂයට, දෙමළ සන්ධානය බලයට ආවා. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා කල්පනා කළා දෙමළ ජාතියක් විපක්ෂයට ආවොත් රටට වෙන දේ එතුමා තේරුම් අරගෙන මනාප දේශපාලන ක්‍රමයක් මේ රටට හඳුන්වලා දීලා විපක්ෂයට දෙමළ සන්ධානයක් නොඑන්නට වගබලා ගත්තත් අද මොකද වෙලා තිබෙන්නේ? අද සම්බන්ධන් විපක්ෂ නායක කරලා තිබෙනවා. ඔහු මේ රටේ වැට් බද්ද ගැන කථා කරනවාද? සිංහල බෞද්ධයන් ගැන කථා කරනවාද? හාමුදුරුවරුන් හිරේ දානවා. කථා කරනවාද? දකුණේ

මිනිස්සුන්ට වෙන දේවල් කථා කරනවාද? ඔහු කථා කරන්නේ යාපනයේ දෙමළ මිනිස්සුන්ට වන අසාධාරණය විතරයි. ඔහු හමුදා කඳවුරුවලට යන්නේ ඉඩම් අයිතීන් ලබා ගන්න. ඔවුන් හමුදා කඳවුරුවලට ගිහිල්ලා ඒ හමුදාවට සමච්චල් කරන්නේ. ඔහු හිතන්නේ ඒ දෙමළ ජනතාව ගැන විතරයි. විපක්ෂ නායක නම් මේ කම්කරු දිනයේ පෙනී සිටින්න තිබුණා. අද මේ වැට් බද්ද ගැන, සිංහල අපේ මිනිස්සුන්ට නොලැබෙන රෙදි වවුවරය ගැන, එහෙම නැත්නම් බඩු මිල ඉහළ යාම ගැන විපක්ෂ නායකවරයා කථා කරන්නේ නැහැ. කොටි හවුල් ආණ්ඩුවක් මේ රටේ ඇති කරලා, මේ කැළේ ඉන්න කොටි කැවෝ කැවෝ කියන කොට ඒකට විරුද්ධව යෝජනා ගෙනෙන්න සිද්ධ වෙලා තිබෙනවා. නමුත් සිංහල ජාතීන් වශයෙන්, මේ රටේ ජීවත්වන මිනිස්සුන් වශයෙන්, බෞද්ධයන් වශයෙන්, අපේ හාමුදුරුවන් කිව්වා වාගේ අපට වගකීමක් තිබෙනවා. ඒ වගකීම ඉටු කරන්න අපි කවදාවක්වත් පස්සට යන්නේ නැහැ. ඒ නිසා අපි ඒ සම්බන්ධයෙන් වගබලා ගන්නට ඕනෑ.

ඉරාකයට වුණු දේ ගැන අපි කිව්වා. ඒකාධිපතියෙක් කියලා සුදාම් හුසේන්ව මරලා දැම්මා. ගඩාෆිව මරලා දැම්මා. ඒ රටවල්වලට අද වෙලා තිබෙන දේ ගැන ජේනවා නේද? ඒ නිසා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රට නිදහස් කරලා දීලා, උතුරේ මිනිස්සුන්ට සංවර්ධනය ගෙනාවා විතරක් නොවෙයි. මේ සංහිඳියාව ඇති කරන්න උත්සාහ කළා. ආණ්ඩුව එකතු වෙලා කළාට සංහිඳියාව ඇති කරන්න පුළුවන්කමක් නැහැ. විපක්ෂ නායකකම දුන්නාට සංහිඳියාව ඇති කරන්න පුළුවන්කමක් නැහැ. මිනිස්සුන්ගේ හදවත් තුළ මෛත්‍රී, කරුණා, මුදිතා ඇති වෙන්නට ඕනෑ. මිනිස්සු තුළ වෛරය නැති වෙලා යන්නට ඕනෑ. එහෙමනම් වෛරය ඇති වුණේ - 1983 ජූලි කලබල ඇති කළා. ඊට පෙර ජනතාවට විවිධ ප්‍රශ්න ඇති කළා. පුස්තකාල ගිණි තිබ්බා. මිනිස්සු මරලා දැම්මා. මේවා කළාට පස්සේ මිනිස්සුන්ගේ සිත් තුළ ඇති වෛරය නැති කරන්න තවදුරටත් පුළුවන් කියලා විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා මේ නොගැලපෙන දීගේ කන්න ගිහිල්ලා තමයි මේවා සිද්ධ වෙලා තිබෙන්නේ. අපි මේවා හෙළා දකිනවා. අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ හිටපු ගරු ඇමතිතුමා මේ වාගේ යෝජනාවක් ගෙනාවට එතුමාට අපි ස්තුතිවන්ත වෙනවා වාගේම ඔබතුමා මේ පළාත් සභාවේ ගරු නියෝජ්‍ය සභාපතිවරයා හැටියට මම මේ කියන්නේ. මේ ආරම්භයක් විතරයි. ඉදිරි කාලය තුළ මීට වඩා අපි සන්නද්ධ වෙන්න වෙයි. කරුණු කාරණා සොයන්න වෙයි. මීට වඩා පෙළගැහෙන්න වෙයි. පළාත් සභාවක් වශයෙන් එකමුතු වෙන්න වෙයි. උතුරු පළාත් සභාවේ ගෙනෙන්නා වූ යෝජනාවලට අපට මේ රට තුළ විවිධ අරගලයන් කරන්න සිද්ධ වෙයි. එදාට අපි හැම කෙනාම රටත්, ජාතියත්, ආගමත් ගැන හිතලා පෙළ ගැහෙමු කියලා ඔබ හැම කෙනාටම ආරාධනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාම කාලෝචිත යෝජනාවක් නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා මේ සභාවට ඉදිරිපත් කරපු වෙලාවේ, අද මේ සභාවේ මුළු දවසක් පුරා බහුතරයක් අදහස් දක්වද්දී විපක්ෂය පාර්ශවයෙන් බොහෝ දෙනෙක්, පක්ෂ කිහිපයක නායක කාරකාදීන් බොහෝ දෙනෙක් අදහස් ප්‍රකාශ කරලා, මේ සභාවට කරුණු පෙන්වා දෙන්නට උත්සාහ කළා. මේක එතරම් කලබල විය යුතු යෝජනාවක් නොවේය. මේක ජාතිවාදය අවුස්සන යෝජනාවක්ය. උතුරේ ජාතිවාදය අවුස්සද්දී දකුණේ ජාතිවාදය එක පැත්තකින් මේ අවුස්සන්න හදන වැඩක්. මේක නොකරනවා නම්, ගෙනාවේ නැත්නම් හොඳයි කියලා තමයි කිව්වේ. බොහොම සුළු කාරණාවක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා, මේ වර්තමාන ආණ්ඩුවේ බොහෝ දෙනාට මේ සිද්ධ වෙන දේවල් සුළු දේවල්. අර වාවකච්චේරියෙන් මරාගෙන මැරෙන බෝම්බකරුවකුගේ ඇඳුම් කට්ටලයක් හමු වුණා. ඒක සුළු දෙයක්. පරණ බඩුවක්. පරණ බඩු සහ සුළු දේවල් තමයි දැන් සිද්ධ වෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ තෙබුවන පියනන්ද හාමුදුරුවෝ කිව්වා වාගේ මේ ගැන කථා කිරීම ජාතිවාදයක් වෙන්නේ නැහැ. ඇයි? මෙතැන බරපතළ කාරණාවක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව හරහා කාරණා දෙකක් සිද්ධ වෙනවා. එකක්, අපි විරුද්ධ වෙන්නේ රට බෙදීමට යෝජනා කිරීම. අනික් කාරණාව තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක්. බරපතළ කාරණයක්. මේ විරුද්ධ වෙන්නේ රට කඩන යෝජනාවටයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් රජයේ වගකිවයුත්තෝ මේ වන කොට කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. මේක බරපතළ

[ ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක]

කාරණාවක්. අපේ ජගත් අංගගේ හිටපු ගරු ඇමතිතුමා සඳහන් කළා උතුරු පළාත් සභාවේ ලේකම්වරයා මේ යෝජනාව න්‍යාය පුස්තකයට එන කොට දන්නේ නැද්ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වෙනවාය කියලා. ඒක ගත්තාම රජයේ නිලධාරියාත් දැන දැන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්න සහාය දීලා තිබෙනවා. අපි යෝජනා කරනවා ජනාධිපතිතුමාට සහ අගමැතිවරයාට. මේ විෂය භාර අමාත්‍යවරයාට. උතුරු පළාත් සභාව මේ යෝජනාව සම්මත කිරීම හරහා රජයේ නිලධාරියා ගත් ක්‍රියාමාර්ගයට විරුද්ධවත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නය කියලා. ප්‍රධාන ඇමතිවරයා පමණක් නොවෙයි.

ඒ වාගේම අපි ස්තුතිවන්ත වෙනවා. එක්සත් ජාතික පක්ෂයේ මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් කොන්ද කෙළින් තියාගෙන කටයුතු කරපු නායකයෙකු තමයි ආර්. ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා. 1990 වසරේ උතුරු පළාත් සභාවේ මේ වාගේ යෝජනාවක් ආපු වෙලාවේ පළාත් සභාව විසිරෙව්වා. කොන්දක් තිබුණා. අද මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා මේ ආණ්ඩුව සංහිඳියාව ඇති කරන්න යනවාය කියලා ඒ සංහිඳියාවට විරුද්ධව උතුරු පළාත් සභාව ගත් යෝජනාව සම්මත කිරීම තුළ මේ ආණ්ඩුවේ නායකයන්ට කොන්දක් තිබෙන්න ඕනෑ, මේ පළාත් සභාව විසුරුවන්න. අපි විතරක් සංහිඳියාව පෙන්නුවාට බැහැ. අර කිව්වා වාගේ නියපොත්තෙන් කඩන්න තිබෙන දේ පොරවෙන් කොටන්න දක්වා මේ ප්‍රශ්නය උඩු දුවන්න පුළුවන්. ඒකට හේතු සාධක ගණනාවක් තිබෙනවා. පසුගිය දිනවල සිද්ධි. ආර්. සම්බන්දන් විපක්ෂ නායකතුමා බලහත්කාරයෙන් කඳවුරකට ගියා. අර අපේ රණවිරු අශෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අන්තිමට රණවිරුවන්ගේ වරද. මොකක්ද? අර ගේට්ටුව උස්සලා ඉඩ දුන්න එක තමයි වරද. ආණ්ඩුවේ ප්‍රධානීන්ගේ මාධ්‍ය සාකච්ඡාවල ප්‍රකාශ වෙන්නේ. ඒ එතැන රාජකාරියේ හිටපු හමුදා නිලධාරියා යන්න ගේට්ටුව ඇරලා අවසරය දුන්න එක තමයි වරද. එහෙම නැතිව බලහත්කාරයෙන් ගිහිල්ලා නොවෙයි. මේ සුරංගනා කථා කියන්නේ. මේවා සිද්ධ වන කොට මේවා ගැන කථා කිරීම ජාතිවාදයක්ද කියලා අපි අහනවා. මේ අමු අමුවේ සිද්ධ වෙන්නේ රටේ ජාතික ආරක්ෂාවට බරපතළ තර්ජනයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මේ ආණ්ඩුව නියෝජනය කරන ඇමතිවරු මේ කාරණා සම්බන්ධයෙන් මාධ්‍ය සාකච්ඡාවල කිව්වේ මොනවාද? මෙතැන මගේ අතේ තිබෙනවා රිවිර පුවත්පතේ 2016 අප්‍රේල් මස 28 වැනිදා. අකිල විරාජ් කාරියවසම් එක්සත් ජාතික පක්ෂයේ ලේකම්තුමා සඳහන් කරනවා. මාධ්‍යවේදීන් අහනවා, ෆෙඩරල් රාජ්‍ය ප්‍රශ්නයක් ගැන මේ රට තුළ කථා වෙනවා. ඒ ගැන එක්සත් ජාතික පක්ෂයේ මතය කුමක්ද? කිසිම විටක මේ රට තුළ ඒකීය රාජ්‍යයක් ඇති වෙන්න දෙන්නේ නැහැයි කියලා කියනවා. හැබැයි, එතුමා ඒ එක්කම කියනවා මේ ප්‍රශ්නය ගැන මීට වඩා ජනාධිපතිවරයා, අගමැතිවරයා දරන මතය මොකක්ද කියලා. නැහැ. ඒගොල්ලන්ට මේවාට උත්තර දෙන්න තරම් කාලයක් නැහැයිලු. මේ බරපතළ ප්‍රශ්නයක්. රටේ ජනාධිපතිතුමාවත්, අගමැතිතුමාවත් රටේ බරපතළ ප්‍රශ්නයක් පිළිබඳව, ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව විමසුවාම ජනාධිපතිතුමාට හෝ අගමැතිතුමාට මේවාට උත්තර දෙන්න අවශ්‍ය නැහැයිලු. මෙන්න තත්ත්වය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක සාමාන්‍ය ප්‍රශ්නයක් නොවෙන්නේ මේ මාධ්‍යයේ සඳහන් වෙනවා බරපතළ කාරණයක්. මේ ඊයේ පෙරෙයිදා මේ රටට ආපු ස්වීඩන් විදේශ ඇමතිතුමිය. මේ රටට ආපු වෙලාවේ උතුරේ පළාත් සභාවේ මේ යෝජනාව එතුමියට ඉදිරිපත් කරලා. මේ මාධ්‍ය වාර්තා කරනවා. මේවා සාමාන්‍ය ප්‍රශ්න වෙන්නේ කොහොමද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ස්වීඩන් විදේශ ඇමතිතුමිය සඳහන් කරනවා උතුරට ෆෙඩරල් රාජ්‍යයක් ස්ථාපිත කළ යුතු බවට උතුරු මහ ඇමති ඉදිරිපත් කළ යෝජනාව ස්වීඩන් විදේශ ඇමතිනී මාකොට් වෝල්ස්ටෝන් පිළිගෙන ඇත. මේ දිවයින පත්තරේ වාර්තා කරන්නේ. 2016 අප්‍රේල් මස 20 වන සිකුරාදා. මේක ලෝකය පිළිගන්නවා. ස්වීඩන් රට පිළිඅරගෙන. අර සඳහන් කරපු මේ ආණ්ඩුව හදන්න එක්කහු වුණු ඇමරිකාව, ප්‍රංශය, ජර්මනිය, බ්‍රිතාන්‍යය, නෝර්වේ රටවල්වල රාජ්‍ය නායකයෝ මේ යෝජනාව පිළිගන්නවා. ඒක තමයි ඇත්ත තත්ත්වය. ඉන්දියාව ප්‍රධාන කොට. ඒ නිසා මේ සිද්ධ වීගෙන යන්නේ නැවත ආපස්සට හැරවීමක්. යුධ ජයග්‍රහණය ලබලා සාමය ඇති වුණු රට නැවත වතාවක් දෙකඩ කරන ව්‍යාපාරය මේ ආරම්භ වෙමින් සිටින්නේ. මේවා සිද්ධ වෙන කොට අපට ඇස් කන් පියාගෙන ඉන්න පුළුවන්ද කියන කාරණාව මතු වෙනවා. ඒවා ගැන අහන කොට විපක්ෂයේ - මහා ආණ්ඩුව

නියෝජනය කරන පළාත් සභාවේ විපක්ෂයේ පාර්ශවය නියෝජනය කරන පක්ෂ ඔක්කොම අඳ, ගොළු, බිහිරෝ වාගේ කියනවා, ජාතිවාදය අවුස්සන්න හදනවාය කියලා. මේක කනගාටුදායක තත්ත්වයක්. ජාතිවාදය ඇවිස්සීමක්ද? ජාතිවාදය ඇවිස්සීමක්ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම ජාතිවාදය ඇවිස්සීමක්ද? මේක ජාතිවාදය කියන්නේ කොහොමද? ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මේ රටේ ජාතික ආරක්ෂාව ඉතාම බරපතළ අනතුරකට යනවා. දැන් පසුගිය දිනවල මාධ්‍ය වාර්තා කරලා තිබුණා, අද අපේ ආරක්ෂක හමුදාවන් ප්‍රතිසංවිධානය කරන්න එනවා. කොහෙන්ද? බ්‍රිතාන්‍යයෙන්. මේ පුවත්පත් වාර්තා කරලා තිබෙනවා. ලෝකයේ ප්‍රබලම බලගතුම ත්‍රස්තවාදී සංවිධානය පරාජය කළේ අපේ ආරක්ෂක හමුදාව. එවැනි දක්ෂ හැකියාවන් තිබෙන ආරක්ෂක හමුදාවක් ප්‍රතිසංවිධානය කරන්න එන්නේ අයිඑස් ත්‍රස්තයන්වත් පරද්දන්න බැරි වුණු බ්‍රිතාන්‍යය. විහිළුවට කාරණාවක්. හැබැයි, ඩොලර් බිලියන ගණනක් බ්‍රිතාන්‍ය දෙන්න යනවා අපේ ආරක්ෂක හමුදා ප්‍රතිසංවිධානය කරන්න. අපි දන්නේ නැහැ මොකක්ද මේ කරන්න යන ප්‍රතිසංවිධානය කියලා. මේ කරන්න යන්නේ වෙන කිසිවක් නොවෙයි. ආරක්ෂක හමුදා දියාරු කරන වැඩ පිළිවෙළක්. රටේ ජාතික ආරක්ෂාව. අපි මේ වෙලාවේ සඳහන් කරනවා. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කරමින් එතුමා අවසානයේදී කිව්වා, රට බෙදුණොත් ආපහු දේශපාලනය කරන්න වෙන්නේ නැති බව. ඒක තමයි 2015 ජනවාරි 08 වැනිදාට ඉස්සෙල්ලා අපි කිව්වේ. අද මේ යහපාලන ආණ්ඩුව ඇවිල්ලා ඒක තමයි මේ සිද්ධ වෙමින් පවතින්නේ. අපේ ප්‍රධාන ඇමතිතුමාත් දැන් ටිකකට කලින් කිව්වා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

ඒක බරපතළ තත්ත්වයක්. ඒ නිසා මේ සිද්ධ වී ගෙන යන්නේ මේ අවාසනාවන්ත ඉරණම. මේ තත්ත්වයට අපි මුහුණ දුන්නේ නැත්නම් -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කිව්වේ, මිනිස්සු මැරෙන්නේ නැති වුණාට, අපි යුද්ධය ඉවරයි කිව්වාට, ඩයස් පෝරාව හරහා මේ ත්‍රස්තවාදයේ කුමන්ත්‍රණය නැවතිලා නැහැ නේ? ත්‍රස්තවාදය මතු වෙන්න තිබෙන අවකාශය නැති වෙලා නැහැයි කියන එක. නමුත් මම කිව්වේ නැහැ -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා එහෙම කියන්න එපා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එහෙම කියන්න හොඳ නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

එකම පක්ෂයේ ඉඳලා, එකම කණ්ඩායමේ ඉඳලා එහෙම දේවල් කරන්න එපා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපි වැඩේ ඉවර කර ගත්තාට ජාත්‍යන්තරය වැඩේ ඉවර කරලා නැහැ. මම කිව්වේ ඒකයි.

**ගරු ගුණසිරි ජයනාත්** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

මම ඒක ඉල්ලා අස් කර ගන්නවා. එතුමා එහෙම කිව්වේ නැත්නම්. හැබැයි, එවැනි අදහසක් එතුමා ඉදිරිපත් කළා. හැන්සාඩ් වාර්තාව බලන්න. කෙසේ වෙතත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ ආරක්ෂාව දුර්වල කරනවා කියන්න තව එක කාරණයක් මම සඳහන් කරනවා. මාධ්‍ය වාර්තා කරලා තිබෙනවා. කොටි නඩුවලට පෙනී සිටින්නන් හමුවට ත්‍රස්ත විමර්ශන ලොක්කා කැඳවීම ගැන අප්‍රසාදය. මේ දිවයින පත්තරේ වාර්තා කරලා තිබෙන්නේ. 2016 අප්‍රේල් මස 20 වන බදාදා. මේ කියන්නේ පොලීසිය. හමුදාවන්. මොකක්ද කියන්නේ, කොටි නඩුවලට පෙනී සිටින්නන් හමුවට ත්‍රස්ත විමර්ශන ලොක්කා කැඳවීම ගැන අප්‍රසාදය. වැඩිදුර වාර්තාව - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවා සුළුවට හිතන්න පුළුවන්ද? එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ත්‍රස්තවාදීන්ගේ නඩු කටයුතු වෙනුවෙන් පෙනී සිටින බවට මත පළ වී ඇති නීතිඥවරයෙකුගේ ප්‍රධානත්වයෙන් රැස්වන මානව හිමිකම් කොමිෂම හමුවේ කරුණු දැක්වීම සඳහා පොලිස් ත්‍රස්තවාදී විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂවරයා කැඳවීම පිළිබඳව පොලිස් දෙපාර්තමේන්තුව දැඩි අප්‍රසාදය පළ කර සිටී. මේ පොලිස් දෙපාර්තමේන්තුව කියන්නේ. මේවා රටේ ආරක්ෂාවට බරපතළ ප්‍රශ්නයක් නොවෙයිද කියන එක අපි අහනවා. (බාධා කිරීම්)

[ ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක]

එහෙම තමයි තමුන්නාන්සේලා කියන්නේ. මේවා තමුන්නාන්සේලා ගණන් ගන්නේ නැති බව අපි දන්නවා. ඒක තමයි එක්සත් ජාතික පක්ෂයේ හිටපු ලේකම් තිස්ස අත්තනායක 2015 ජනවාරි 08 වැනිදාට ඉස්සෙල්ලා කිව්වේ. ඒ තමුන්නාන්සේලා ගහපු හොර ගිවිසුම කියන එක නිසා තමයි එදා එතුමා කිව්වේ. හැබැයි, එතුමාව හිරේට දැම්මා. මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරපු විග්නේෂ්වරන්ලාව සම්බන්ධන්ලාව හිරේට දාන්න මේ ආණ්ඩුවට කොන්දක් නැහැ. ඒ නිසා මේ රටේ ජාතික ආරක්ෂාව බරපතළ අනතුරක තිබෙන වෙලාවේ තමයි අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා පළාත් සභාවට මේ යෝජනාව ගේන්නේ. හිටපු ඇමතිතුමා. ඒ නිසා මේ තත්ත්වය බරපතළ අවධානමක්. මේ තත්ත්වය සඳහා මේ රටේ රාජ්‍ය නායකයෝ අනිවාර්යයෙන් ක්‍රියාමාර්ග ගන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට මේ ආණ්ඩුවේ ක්‍රියාමාර්ග ගැන සැකයක් තිබෙනවා. ඇයි? මම ඒකට උදාහරණයක් කියන්නම්. ඔබතුමාට මතක ඇති. 2002 දී මේ රටේ අගමැතිවරයා හැටියට හිටියේ අද අගමැතිතුමාමයි. එතුමා 2002 දී මේ රටේ අගමැති වෙලා පාර්ලිමේන්තුවට හොරා ගැහුවා සාම ගිවිසුමක්. ගැහුවාද? නැද්ද? ඒ නිසා මේ අගමැතිතුමා ගන්න ක්‍රියාමාර්ග ගැන අපට බලවත් සැකයක් තිබෙනවා. මොකද, ඔහුගේ උදාහරණ තිබෙනවා ඉතිහාසයේ රටට හොරෙන්, පාර්ලිමේන්තුවට හොරෙන් ගත්ත ක්‍රියාමාර්ග. තමුන්නාන්සේලා හොරෙන් කරන නිසා. ඒ නිසා අද තමුන්නාන්සේලා මොනවා කිව්වත් (බාධා කිරීම්) අපට එතැනත් ප්‍රශ්නයක් තිබෙනවා. ඇයි? ජනාධිපතිතුමා මේ එක්සත් ජාතික පක්ෂයත් එක්ක ගිවිසුමකට ගිහිල්ලා තිබෙනවා. අවුරුදු දෙකකක්. ඉතින් මේ අවුරුදු දෙක තුළ අගමැතිවරයා ගන්න ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ජනාධිපතිතුමා කොහොම හැසිරෙයිද කියන එක ගැන අපට ගැටළුවක් තිබෙනවා. මම ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක් වුණත්. ඒ නිසා ඉතිහාසයේ රනිල් වික්‍රමසිංහ ගරු අගමැතිතුමාගේ ක්‍රියාකාරීත්වය තුළ මේ යෝජනාව ක්‍රියාත්මක වෙන්න නම් අද බොහෝ දෙනෙක් කියනවා පාර්ලිමේන්තුවේ සම්මත වෙන්න ඕනෑය කියලා. ඉතින් දෙයියනේ 2002 දී රනිල් වික්‍රමසිංහ මහත්තයා පාර්ලිමේන්තුවෙන් අහලා නොවෙයි සාම ගිවිසුම ගැහුවේ. ඒ වාගේ පාර්ලිමේන්තුවෙන් අහන්නේ නැතිව මේක දුන්නොත් දෙයියන්ගේ පිහිටයි කියලා තමයි කියන්න තිබෙන්නේ. බොහොම ස්තුතියි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දින මේ පළාත් සභාවට මා විසින් ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධයෙන් පක්ෂවත්, විපක්ෂවත්, ඒ වාගේම විවිධ පැතිමානයන්ගෙනුත් මෙම යෝජනාවට අදාළව කරුණු පැහැදිලි කළා. අදහස් දැක්වුවා. විශේෂයෙන්ම කියන්න ඕනෑ. එම අදහස් දැක්වීම්වලදී අපේ සමහර ගරු මන්ත්‍රීතුමන්ලා උපහාසාත්මකව, අපහාසාත්මකව, ඒ වාගේම අවමානයට ලක් වන ආකාරයෙනුත් යම් අදහස් දැක්වීමක් කළා පෞද්ගලිකව මට. ඒ කිසිවක් පිළිබඳව මගේ කිසිදු ආකාරයක සැලීමක් නැහැ.

විශේෂයෙන්ම කියන්න ඕනෑ. මේ තනතුරු, වරප්‍රසාද, මැති ඇමතිකම් තිබුණත් නැතත් මීට දශක කිහිපයකට පෙර සිට මේ රටේ ඒකීයභාවය වෙනුවෙන් ජාතික හෙළ උරුමය විධියට අපි එදා පෙනී සිටියා. එදා ප්‍රධාන පක්ෂ දෙකේ තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල රටේ ඒකීයභාවය ගැන සඳහන් කරන්න කැමැති වුණේ නැහැ. ඔවුන් එදා පෙනී සිටියේ නොබෙදුනු රටක් වෙනුවෙන්. ඒ වාගේම සමහරු කිව්වේ මේ රට එක්සත් රටක් කියලා. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන රටේ ඒකීයභාවය තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනවලට ඇතුළු කරන්න තරම්වත් පිට කොන්දක් තිබුණේ නැහැ. ඒ වෙනුවෙන්, රටේ ඒකීයභාවය වෙනුවෙන් එදා අපි නොබියව පෙනී සිටියා. රටේ ජාතික කොඩිය අතට අරගෙන පාරට බැහැලා ඒ වෙනුවෙන් කථා කරන්න, ජාතික කොඩිය රටේ ජනතාව අතට පත් කරන්න එදා අපි ජාතික හෙළ උරුමය විධියට කටයුතු කළා. ජාතික ගීය උස් හඬින් අපි හඬ නගා ගායනා කළා. අද බොහෝ දෙනෙකුගේ කටින් ඒක අහනවා දකින්න ලැබීම ඇත්තටම සතුටක්. නමුත් එදා හුඟ දෙනෙකු අතේ තිබුණේ නිල්පාට, කොළ පාට, රතු පාට කොඩි. අද අපි දැකලා තිබෙනවා, මහජන රැස්වීම්වල, පෙළපාලිවල, උද්ඝෝෂණවල ඉදිරියෙන් ගෙනියනවා ජාතික කොඩිය. ජාතික ගීය උස් හඬින් ගායනවා කරනවා. ඒ මේ රටේ ජාතික සංකේත. ජාතික ගීයත් ඒ වාගේමයි. ඒ වාගේම ජාතික කොඩියත් ඒ වාගේමයි. රටේ ඒකීයභාවයත් ඒ වාගේමයි. ඒ නිසයි අපි කිව්වේ, රටේ ඒකීයභාවය කියන එක අනුලංඝණීය කොන්දේසියක් විධියට.

ඒ වාගේම විශේෂයෙන්ම කියන්න ඕනෑ, අපේ සහෝදර ගරු මන්ත්‍රීතුමා, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා. එතුමා ඉතා බරපතළ ප්‍රකාශයක් කළා. මේ රට දැනටම ෆෙඩරල් රාජ්‍යයක් කියලා. එහෙම ෆෙඩරල් රාජ්‍යයක් කියලා එතුමා කියනවා නම්, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පැහැදිලිවම ඒක ඇතුළු වෙන්න ඕනෑ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දෙවැනි වගන්තියේ පැහැදිලිව සඳහන් කරලා තිබෙන්නේ ශ්‍රී ලංකාව ඒකීය ජනරජයක් කියලා. එතුමා කියනවා, මේ රට ෆෙඩරල් රාජ්‍යයක් වෙලා කියලා. ඒක ඉතාම බරපතළ ප්‍රකාශයක්. ඒ ප්‍රකාශය පැහැදිලිවම මම ප්‍රතික්ෂේප කරනවා විතරක් නොවෙයි. ඒකට මගේ බලවත් කනස්සල්ල සහ විරෝධය මම මේ වෙලාවේ මතු කරන්න කැමැතියි. මොකද, මේ රට ෆෙඩරල් කරා ගෙනයාමේ පළමු පියවර තමයි 1987 ඉන්දු - ලංකා ගිවිසුමෙන් තැබුවේ. ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ 1988 බෙදුණු නඩු තීන්දුවක් ලබා දීලා තිබෙන්නේ. ඒ බෙදුණු නඩු තීන්දුව තුළින් තමයි රටේ ඒකීයභාවය පිළිබඳ තීන්දුව සුරක්ෂිත වෙලා තිබෙන්නේ. එහෙම නැත්නම් එදා තමයි මේ රට ෆෙඩරල් රාජ්‍යයක් බවට පත් කිරීමේ පියවර තැබුවේ. එහෙම නම් මේ පියවරෙන් පියවර දැන් 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් මේ රටේ බලය බෙදීම සඳහා පියවරක් තැබුවා. ඊළඟ පියවර තමයි 13 ප්ලස් කියලා ඉල්ලන්නේ. 13 ප්ලස්වලින් එහාට ඊළඟට ෆෙඩරල් රාජ්‍යයක්. ඒ කියන්නේ මොකක්ද? පැහැදිලි බල බෙදීමක් මේ ඉල්ලන්නේ. බලය විමධ්‍යගත කරන එකට අපි විරුද්ධ නැහැ. Decentralization කියන එකට අපි විරුද්ධ නැහැ. හැබැයි, Power Devolution කියන එක සම්බන්ධයෙන් අපි විරුද්ධයි. Power Devolution වලට අපි විරුද්ධයි. ඒ නිසයි අපි කියන්නේ. මෙන්න මේ කාරණය සම්බන්ධයෙන් අද මේ රට ඇතුළේ විවිධ මත අදහස් ඉදිරිපත් වෙනවා.

විශේෂයෙන්ම කියන්න ඕනෑ මේ රට ෆෙඩරල් කිරීම සඳහා දැවැන්තම ව්‍යාපෘතිය දියත් කළේ හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය. එතුමිය එදා ඇමරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව, ඇමරිකානු තානාපති කාර්යාලයේ සහයෝගය ඇතිව විශාල ව්‍යාපෘතියක්, විශේෂයෙන්ම මේ රටේ බහුතර සිංහල ජනතාවගේ මොළ සේදීම සඳහා, ඒ වාගේම විශාල මානසික යුද්ධයක් රට තුළ දියත් කළා. ඒ හරහා පොතයි ගඩොලයි, සුදු නෙළුම් ව්‍යාපාරය හරහා, තවලම ව්‍යාපාරය හරහා රට තුළ විශාල ව්‍යාපාරයක් කර ගෙන ගියා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එදා. එතුමිය තමයි එහි සභාපතිනිය විධියට, නායිකාව විධියට රට පුරා ගෙන ගිය ඒ මහා ව්‍යාපාරය තුළින් බලාපොරොත්තු වුණේ මේ රටේ ෆෙඩරල්වාදය පිළිබඳව තිබෙන බිය සැක තුරන් කරන්න. නමුත් ඒක පරාජය කරන්න පුළුවන්කම ලැබුණා. ඒ වාගේම තමයි එක්සත් ජාතික පක්ෂයේත් අදහස තිබුණේ මේ රට සම්බන්ධයෙන් බලය බෙදන්න ඕනෑ. උතුරට ස්වයං පාලනය දෙන්න ඕනෑ. ඒ වාගේම තමයි ෆෙඩරල් දෙන්න ඕනෑ. සහසන්ධීය රාජ්‍යයක් හදන්න ඕනෑ. Confederation විවිධ නම්වලින් විවිධ යෝජනා ගෙනාවා. ඒ පිළිබඳව රට පුරා විශාල ව්‍යාපෘති දියත් කළා. හැබැයි, ඒ සියල්ල පරාජය කරලා මේ රටේ ජාතික අරමුණක් ඇතිව, මේ රට එක රටක් විධියට තියා ගන්න ඕනෑය කියන අදහසයි අපි ගෙනාවේ. සමහරු කියනවා, අද මෙය ජාතික හෙළ උරුමය ලාභ ජනප්‍රියත්වය සඳහා ගෙනෙන යෝජනාවක් කියලා. අපට ලාභ ජනප්‍රිය සඳහා මේ වාගේ යෝජනා ගෙනැල්ලා ඡන්ද ලබා ගන්න නොවෙයි. අපේ ජනප්‍රියත්වය ගොඩ නගා ගන්න නොවෙයි. මේ රට ඉදිරියේ තිබෙන අභියෝගයක්. මේ අභියෝගය අද ඊයේ තිබෙන එකක් නොවෙයි. මේක දැන් දශක ගණනාවක් තිස්සේ තිබුණු අභියෝගයක්. මේක විටින් විට විටින් විට, ඉස්සරහාට ඇවිල්ලා තිබෙනවා. පරාජය කරලා තිබෙනවා. පස්සට තල්ලු කරලා තිබෙනවා. දැන් නැවත වතාවක් මේක ඉස්සරහාට එනවා. ඒක අපි කියන්න ඕනෑ. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා. උතුරු පළාත් සභාව පිහිටෙව්වා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පිළිතුරු කථාව කරන්න ඕනෑ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒ නිසා උතුරු පළාත් සභාව පිහිටුවීමෙන් පසුව අපි බලාපොරොත්තු වුණා උතුරු පළාත් සභාව රටේ අනෙකුත් පළාත් සභාවන් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි කියලා. ඒ නිසා විශේෂයෙන්ම මම කියන්න කැමැතියි අද මේ යෝජනාව ගෙන ඒමෙන් අදහස් කළේ අඩුම වශයෙන් මේ පළාත් සභාවටවත් පිට කොන්දක් තිබෙනවා. මොකද, අනික් පළාත් අටෙත් මහ ඇමතිවරුන්ගෙන් අපි ඉල්ලා සිටිනවා. කරුණාකරලා මේ සම්බන්ධව තමන්ගේ ස්ථාවරය පැහැදිලි කරන්න. මොකද, මීට කලින් අපි දැක්කා උතුරු පළාත් සභාව මේ ආකාරයටම කටයුතු කරලා

[ ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

තිබෙනවා. ඒ නිසා මීට ප්‍රථම මහ ඇමතිවරුන්ගේ සමුළුව පැවැත්වුණා. ඒකට උතුරේ මහ ඇමතිවරයා සහභාගී වුණේ නැහැ. ඒ වාගේම තමයි කැබිනට් මණ්ඩලයට එන්න කියලා කිව්වා. ඒකට සහභාගී වුණේ නැහැ. ඒ නිසා මේ ආකාරයට මේ උතුරු පළාත් සභාවේ කටයුතු කිරීම රටේ ඒකාග්‍රතාවයට, සංහිඳියාවට බාධාවක් නිසා විශේෂයෙන්ම අද මේ යෝජනාව මම ගෙනවා. ඒ සඳහා පක්ෂව, විපක්ෂව අදහස් දැක්වූ ඔබ සියලු දෙනාටම ස්තූතිය පුද කරමින්, විශේෂයෙන්ම මේ අවස්ථාව ලබා දීමත්, ඒ වෙනුවෙන් අදහස් දැක්වූ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාටත් මගේ ගෞරවපූර්වක ස්තූතිය පිරිනමමින් මේ රටේ ඒකීයභාවය වෙනුවෙන් මේ සභාවේ අපි සියලු දෙනාම එක්සත්ව, එක්සිත්ව පෙනී සිටිමුයි කියලා ඉල්ලා සිටිමින් මේ ෆෙඩරල් යෝජනාවත්, උතුරු පළාත් සභාවේ යෝජනාවත් ප්‍රතික්ෂේප කිරීම සඳහා ඔබ සියලු දෙනාම එකතු වෙන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු මන්ත්‍රීතුමා විසින් ගෙනාපු යෝජනාව අපි සම්මත කරනවා. නමුත් ඒ වාගේම උතුරු පළාත් සභාව මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා මේ යෝජනාව ගෙනාපු එක සම්බන්ධව අදාළ නිලධාරීනුත්, ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු මන්ත්‍රීවරු සියලු දෙනාම නීතිය අනුව කටයුතු කර අත්අඩංගුවට ගන්න කියලා. මම හිතන්නේ අපි ඉල්ලීමක් කරනවා. මම හිතන්නේ පළාත් සභාව විසුරවන්න කටයුතු කරන්න. ඊට අමතරව අපි මේ උතුරේ පළාත් සභාව ගෙනාපු යෝජනාවට විරුද්ධව අපි මේ අවස්ථාවේදී විරෝධය ප්‍රකාශ කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

අපිත් විරෝධය ප්‍රකාශ කරනවා. කිසිම ප්‍රශ්නයක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කාර්ය පටිපාටි රීති අත්හිටුවීමේ යෝජනාවට සහයෝගය දක්වලා දීර්ඝ වෙලාවක් විවිධ මත දරලා ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා අද මේ වාගේ විරෝධය පාලා සම්බන්ධ වීම පිළිබඳව සියලු දෙනාටම බොහොමත්ම ස්තූතිවන්ත වෙමින් සංශෝධන සහිත යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසනවා.

***ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් විමසන ලදින්, සභා සම්මත විය.***
*Question having put in the amended format, was adopted.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා ගරු මන්ත්‍රීවරු තම ආසනවලට යන්න. (බාධා කිරීම්) විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. විපක්ෂයේ සංවිධායකතුමා තනිවම හරි තමන්ගේ කාර්යභාරය ඉෂ්ට කරමින් දීර්ඝ වේලාවක් මේ සභාවේ හිටියා. ඒ වාගේම අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා. බොහොම ස්තූතියි.

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් මම මෙම සභාව කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 04.34 ට, 2016 මැයි මස 17 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 04.34 p.m till 09.30 a.m, on 17.05.2016.*